# ත්‍රිපිටක පරීක්ෂණය.

සම්පාදක:-

සද්ධර්මවාගීශ්වරාචාර්ය ශ්‍රී විමලකීර්ති

හිත්තටියේ

උදිත ස්ථවිරපාදයන් වහන්සේ.

# ග්‍රන්ථය සම්බන්ධයෙන් උතුමන්ගේ සතුට හා අදහස.

**ස්‍යාමෝපාලි මහානිකායේ මහානායක මාහිමියන් වහන්සේ ග්‍රන්ථය සම්බන්ධ ස්වකීය සතුට මෙසින් ප්‍රකාශ කරති.**

## නාම සම්මතියක්.

මාතර වැලිවේරියේ පුෂ්පාරාම විහාරාධිවාසී **හින්නටියේ උදිත** තැන විසින් "**ත්‍රිපිටක පරීක්ෂණය**" නමැති මාහැඟි ධර්ම පුස්තකයක් සම්පාදනය කළ බැවින් ඒ ගැණ ප්‍රමුදිතවූ අපේ අනුනායක කාරක මහා සඞ්ඝසභාසම්මතයෙන් යථොක්ත උදිත තැනට "**සද්ධම්මවාවිස්සරාචරිය සිරි විමලකිත්ති**" යන ගෞරව නාමය අද දින සම්මත කර දෙන්ට යෙදුනා ඇත. එම නිසා මෙතැන් පටන් ඒ තැන "**හිත්තටියේ සද්ධම්ම වාවිස්සරාචරිය සිරිවිමල කිත්ති උදිත**" යන නාමය ව්‍යවහාර කළ යුතු බව මෙසින් ප්‍රකාශ කරම්හ.

ඒ වගත් මෙසේම-

අනුනායක කාරක මහා සඞ්ඝ සභාවේ කැමැත්ත ලෙස මහනුවර උපෝෂිත පුෂ්පාරාම විහාරධ්‍යාධි පති ස්‍යාමෝපාලි මහානිකායේ මහානායක ස්ථවිරයන් වහන්සේ වම්හ.

**පහමුණේ ශ්‍රී සුමඞ්ගල.**

18. මැයි 1939
උපෝෂිත පුෂ්පාරාම විහාරය,
මල්වත්ත-මහනුවර.

විද්‍යෝදය මහා විද්‍යාලයාධිපති බද්දේගම ශ්‍රී පියරතනාභිධාන නායක මාහිමියන් වහන්සේ ග්‍රන්ථය ගැණ මෙසේ ප්‍රකාශ කරති.

---

**"ත්‍රිපිටක පරීක්ෂණය"** නමැති පොත බැලීමි. එය අටුවා ටීකා සහිත ත්‍රිපිටක පාලිය කියවා බලා බලවත් පරිශ්‍රමයකින් කරණ ලද කාලෝචිත ග්‍රන්ථයකි. සැවිසිනුත් කල්පනා කළ යුතු ඉතා වැදගත් කරුණු රාශියක් මෙහි විස්තර වෙයි. ස්වබුද්ධිය මෙහෙයා කරණු ලබන මෙබඳු ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථවලින් ශාසනයට හා භාෂාවටත් වටිනා මෙහෙයක් සැලසෙයි. මෙහි භාෂාවද මනොඥයි. විවාද සහිත කරුණු පිළිබඳ ස්වකීය මතය පැහැදිලිව දක්වා තිබේ. සාමාන්‍යයෙන් මෙය ලොකු කුඩා සැමටත් ප්‍රයෝජනවත් වූ වැදගත් ග්‍රන්ථයක් බව කිය හැකියි.

මේවගට-හිතවත්,

B. Piyaratana.

විද්‍යෝදය පරිවෙණාධිපති.

18. මැයි. 1939
විද්‍යෝදය පිරිවෙණ
මාලිගාකන්ද-කොළඹ

# සංඥාපනය.

**ත්‍රිපිටකපරීක්ෂණය**:- මේ ග්‍රන්ථයේ නාම ය යි. මෙයින් අදහස් කරණ ලද්දේ ත්‍රිපිටකපාලිය හා අර්ථකථා සම්බන්ධව තත්ත්ව ගවේශනයක් කිරීම යි. එය කොතරම් දුෂ්කර වූවක් ද යනු පැහැදිලි වන්නේ සාර්ථකථාපාලියේ ගම්භීරත්වය හා විශාලත්වය දන්නවුන් හට ය. සම්පූර්ණ තත්ත්ව ගවේශනයක් මෙහි නො මැති යි. ටීකා හා ධම්මසංග්‍රහයන් පිළිබඳ පරීක්ෂණය ද මීට ඇතුළත් නො වේ.

කාරුණු දෙකක් නිමිතිකර ගෙණ අප විසින් මේ ග්‍රන්ථය සම්පාදිත ය. පෙල අටුවා දෙක්හි සදෙස් තැන් ඇත්තාහ යි පවත්නා උද්ඝෝෂණය මේ සඳහා අප පෙළඹීමට හේතුවූ එක් කාරුණෙකි. සාමාන්‍යලොකයාගේ විමති දූර ලා ශ්‍රද්ධාභක්තිය තර කිරීමට ධර්මධර පඬිවරයන් මෙයින් පෙළඹවී ම දෙවන කාරුණ ය. පරිච්ඡෙද දොළසකින් අවසන් වූ මේ පළමු පරීක්ෂණයෙන් තර්ක මත රාශියක් හෙළිවෙ යි. විරොධමතරාශියක් බිඳවැටෙ යි. පරීක්ෂකයන්ට මාර්ගය පැදෙ යි. සත්‍යගවේශකයන්ට ඉඩකඩ සැලසෙ යි. ආධුනිකයන්ට මහත් ප්‍රයෝජනයක් අත් වන්නේ යි.

**දෝෂාවිෂ්කරණය**:- බෞද්ධග්‍රන්ථාවලිය ගැණ කලින් කල ගිහි පැවිදි උගත්තු නොයෙක් මත පහළ කෙරෙති. බෞද්ධයන් ජීවිතයටත් වඩා ගෞරවයෙන් සලකන ධර්මග්‍රන්ථයන්ට දෙස්වසයෙන් කිසිවක් කියනු ඇසීම ඔවුන්ගේ සිත් කකියවන කාරුණෙකි. එහෙත් දෙෂදර්ශකයන් කියන දෙස් එසේ ම දැයි සොයා බලා පිළියම් කොට එය ආරක්ෂාකර ගැණීමට ඉදිරිපත් වන්නෝ විරල වෙති. ධර්මය ආරක්ෂා කළ යුත්තේ තදීය ග්‍රන්ථ දුම් කව කවා පොත් ගුල් වල සඟසා තැබීමෙන් ය යි කිසිවකුගේ හැඟීම බව පෙණේ. ධාරණොද්ග්‍රහණය කිරීමට- ග්‍රන්ථිස්ථාන විසඳා ගැණීමට- ආකුලස්ථාන නිරවුල්කර ලීමට- අපපාඨ ඇද්දැ යි සොයා බලා බැහැර කිරීමට- නො වෙහෙසෙති. කොතරම් අපපාඨයක් වුවත් ඒ තබා අකුරක් වත් වෙනස් කිරීම ආනන්තරිය කර්මයටත් වඩා බර වරදක් කොට ඇතමෙක් සලකති. එය වනාහි සද්ධර්මය කෙරෙහි දක්වන නියම මමායනයකැ යි ද හඟවති. එසේ නම් කිසියම් හිතවතෙකුට දරුණු ගඩක් හටගත් කල ඊට කාරම් බෙහෙත් ආදිය නො ගැල්

විය යුතු ය. පිළියම් නො කළයුතු ය; කුමක් හෙයින් ද? යත්:- මමායතනය කාරණ හෙයිනි. ඒ නිසා එසේ ම තිබෙන්නට හැරිය යුතු ය. එවිට කුමක් විය හැකි ද යනු විමසා ගැනීම අපහසු නො වේ.

මධ්‍යස්ථතායෙන් යුත් කිසිවකු විසින් බුද්ධියේ හෝ ලේඛන යන්හි දුර්වලත්වයක් නිසා වාතීතමාතිකාසාර්ථකථාපාලිග්‍රන්ථයන්හි “මෙසේ මෙසේ දෝෂස්ථාන පැණෙති”යි කී කල සමහරු කාරුණු නො විමසා නිකම් ම බැණ වදිති. එය කෙසේ නම් යුක්තිසඟගත වන්නේ ද?. එසේ ඇතිකල නියම බෞද්ධයකු විසින් කළ යුත්තේ නිකම් ම බැණ වැදීම නො වේ. සදෙස් සේ කියූ තැන් ලොකානුකම්පාවෙන් නිදෙස් කර දක්වීම ය. නැතහොත් දොෂදර්ශක යන්ගේ විරොධමත වැදගත් හේතුයුක්ති දක්වා “ආකීර්ණ පරිකීර්ණ සම්පරිකීර්ණ”යෙන් හෝ මැඩලීම ය.

**විමංසනය;-** තවද අපේ ඇතැම් පඬිවරු නිදහස් බුද්ධියෙන් කරුණු ලබන පරීක්ෂණයට බලවත්විරොධය පහළ කෙරෙති. කෙබඳු යුක්තිධර්මයක් නිසා ද යි වටහා ගැනීම දුෂ්කර ය එය වරදක් නම් නිදහස් මත දරණ බෞද්ධ නො වූ කෙනෙකුට බෞද්ධ ධර්මය කෙරෙහි ප්‍රසාදය තබනු නො හැකි ය. බෞද්ධයකු විසිනුදු තබනු හැක්කේ අන්ධභක්තියකි. කෙබඳුධර්මයක් සඳහා වුවත් පිරිසිදු භක්තිප්‍රසාදයක් ඇතිවන්නට නම් පරීක්ෂණයට භාජන කළ යුතු ය.

විසඳනු නො හැකි ග්‍රන්ථිස්ථාන හෙළිකරලීම නිසා වරදූ යි කියන්නේ නම් එය ද බොළඳ කථාවෙකි. එබඳු තැන් වේ නම් එය අප විසින් ම හෙළි කළ යුතු ය. නො එසේ නම් අන් කවුරුන් විසින් හෙළි කළ යුතු ද?. අප විසින් එබඳු තැන් හෙළිකිරීම නුසුදුසු ය යි වසා තැබුවත් සෙස්සන් විසින් වසා තබනු ලැබේ ද?. හද පතුලට බැස ගිය අදහස්- භූ ගර්භයේ සැඟවී ගිය වස්තු ජාති- මනුෂ්‍යවිෂය ඉක්මවාගිය භූතශක්තිය ආදී සහස්‍රසංඛ්‍යාත අද්භූත දේ සොයා ගත් ලොකයා සමයාන්තරපර්යේෂණයකට වත් කළ ඔවුන්ටත් ආවරණය කළ හැකි ද?.

එහෙයින් එබඳු තැන් වේ නම් අපවිසින් ම මතුකර හේතු යුක්ති සසඳා බැලීම ශාසනගෞරවයට හේතුවන්නේ ය. එපමණක් නො වේ. කාරුණු විචාරණය නො කොට ධර්මය අන්තට කියන්

නට යාමෙන් සිදුවිය හැකි බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ පාන්නට ද නො ලැබෙන්නේ ය. කලකට පෙර කෙසේ වුවත් වර්තමානයෙහිත් වර්තමානයට වඩා නුදුරුඅනාගතයෙහිත් කිසිවක් කිතරම්ත් ම පිළිගන්නා අය දුර්ලභ විය හැකි යි. සමයාන්තරවාදීන් විසින් විසඳනු නොහැකි තැන දේවරහස යි කියන්නාක් මෙන් ඈදුරුපරපුරේ එන සැටිය යි කියා නිශ්ශබ්ද වූ පමණින් ඔහු නො සැනසෙති. කෙසේ නමුත් ඔවුන් ගේ සිත්වලට ප්‍රමාණ වන සාධක දක්විය යුතු ය සද්ධර්මය පිළිබඳ ව නියම හැඟීමක් පිරිසුදු භක්තියක් පහළ වන්නේ එවිට ය.

කරුණු මෙසේ හෙයින් නිදහස්පරීක්ෂණය වරදක් නො වේ. පෙරදුරන් මහොත්සාහයෙන් කළ ග්‍රන්ථාවලිය හැකිතාක් පිරික්සා බලා කාලාන්තරයෙන් වූ අසම්බන්ධස්ථානයක් වේ නම් අන්නට ඇඟිලි නො ගැසිය හැකි සේ පිරිසුදු කර තැබීම බෞද්ධපඬිවරයන් ගේ යුතුකම ය. බාහිරජනෝපලඬකාරාදිය සඳහා වෙනෙසෙන කාලයෙන් අඩක්වත් මේ සඳහා යොදන්නේ නම් වැදගත් ශාසන සංග්‍රහයක් වන්නේ ය.

තරමක් දුරට කරුණු පරීක්ෂාකළ අපට පෙණීගියේ දෝෂදර්ශකයන් කියන දෙස්වලින් වැඩිහරියක් නො විමසීමෙන් කියන ලද බව ය. බෞද්ධසාහිත්‍යය අතිවිශාල ය. එක් තැනෙක නො කියවුන දේ තව තැනෙකදී කියවෙති. එක් තැනෙක නොදක්වුන හේතුයුක්ති තවතැනෙක දී දක්වෙති. එ හෙයින් බොහෝදුර නො විමසා නිගමනයට බැසීම අන්තරාය දායක ය.

එසේ ම වර්තමානධර්මග්‍රන්ථයෝ වරින්වර නොයෙක් ක්‍රමයෙන් පතිත වූ අපපාඨ වලින් මුක්ත වූ වාහු ම නො වෙත්. දම්පියාටුවා වෙන් පමණක් වුවත් මීට වැදගත් සාක්ෂ්‍ය ලැබේ. ග්‍රන්ථයේ ආදි අවස්ථාවට වඩා දැනට කොතරම් වෙනස් පාඨවලින් ගහණ වී තිබේ දැ යි වටහා ගැණීමට තදීය පැරණි ගැටපදය හා සසඳා බැලිය යුතු ය. ග්‍රන්ථිපදකාරකයන් විවරණය කරණ ඇතැම්පාඨ වර්තමාන අටුවාවෙහි නොමැති යි. අටුවාවට වඩා විපර්යාස වූ ද විරොධ වූ ද පාඨයෝ ගැටපදයෙහි තන්හි තන්හි දක්නා ලදහ. මේ අනුව සෙසු අර්ථකථාවන්හිත් එබන්දක් නැතැ යි කෙසේ නිශ්චය කළ හැකිද?. දෙශනාපාලි ප්‍රදෙශයන් හා අර්ථකථාවන් සම්බන්ධව කල්පනා කළයුතු තැන් කීපයක් ද ප්‍රමාද පතිතය යි සැලකියහැකි තැන් හා අපට නො වැටහෙන හේතුයුක්තීන් පිට පවත්නා

කරුණු කීපයක් ද මෙහි දක්වෙන්නේ ය. විශාරද ධර්මධරයන්ගේ පරීක්ෂණය සඳහා ය. අපට දුරවබෝධ යයි හැඟුන තැන් හා ආකූල වූ තැන් පරීක්ෂණයෙන් සොයා ගත්තා වූ ද සොයාගත හැක්කා වූද බුද්ධිමතුන්ගෙන් ලොකය සිස් නො වේ. එතුමන්ගේ නිර්දයවාක් ප්‍රහාරයන්ට ලක් වුව ද කවරකුගෙන් නමුත් සත්‍යය ප්‍රකටවනු දක්ම අපගේ අදහස ය.

“කාමං රුප්පතු වා මා වා භුසං වා විකිරීයතු,
ධම්මං මෙ භණමානස්ස න පාපමුපලිප්පති.”

**විශෙෂ නිවේදනය:**-මේ ග්‍රන්ථය තෙමසකට අඩු කාලයකින් ලියවුනේ ය. බොහෝ කාලයක් ගතවූයේ සාට්ඨකථාපාලිග්‍රන්ථ කියවා බැලීමට ය. ග්‍රන්ථ කීපයක් හැර බොහොමයක් කියවන්නට හැකි වූයේ එක්වරක් පමණකි. හෙද වෙනත් කටයුතු සම්බන්ධයෙන් ඇති නොයෙක් අපහසුකම් මධ්‍යයෙහි ය. අපේ බලාපොරොත්තුව මෙයින් අවසන් නො වේ. කාලය විසින් ඉඩ පහසු කම් සලසන්නේ නම් පසුව මෙය මීටත් වඩා වැදගත් විශාලග්‍රන්ථයක් වන්නේ ය. අපේ අනවධානත්වයෙන් සිදු වූ සදොස් තැන් ද මෙහි විද්‍යමාන විය හැකියි. 162 පිටේ දක්වෙන “යෙධම්මා හෙතුපභවා” යන ගාථාව පිළිබඳ පරීක්ෂණය ඊට සාධකයෙකි. එහි තෙවන පාදය “තස්සච යො නිරොධො” යනුවෙන් වෙනස්කිරීම සදොස්බව හා පළමු පැවැතික්‍රමයම එනම්:-“තෙසං ච යො නිරොධො” යන්නම නිදොස් බව පසුව පෙණී ගියේ ය. පැරණි ලේඛනයක දක්නට ලැබීම හා වැඩිදුර කරුණු පරීක්ෂාකර බලන්නටත් නො ලැබීම ඒ සඳහා අපේ ප්‍රස්ඛලනයට හේතු වීය.

මුද්‍රණය ද ඉතාසුළුකාලයකින් අවසන් වූ හෙයින් වර්ණ යෝජකයන්ගේ ප්‍රමාදයෙනු දු සිදු වූ වැරැදි කීපයකි. අදහස වටහා ගැණීමට අපහසු නො වූ හ්‍රස්වදීර්ඝාදී සුළුවැරැදි හැර සැලකිය යුතු කීපතැනක් ශුද්ධිපත්‍රයෙන් දක්වෙන්නේ ය. අපේ හෝ මුද්‍රණශිල්පීන් අතින් සිදු වූ තවත් එබඳු තැන් වේ නම් පර්‍යාප්තිධරයන් විසින් කරුණාවෙන් දන්වා ලීම අපට මෙන් ම ශාසනයට ද අනුග්‍රහයකි.

විද්‍යොදයමහාවිද්‍යාලයාධිපති **බද්දේගම සිරි පියරතනාභිධාන නායකමාහිමියන් වහන්සේ** මෙහි ඇතැම් කරුණු ගැණ උපදෙස් දීමෙන් හා ග්‍රන්ථය පිළිගැණීමෙනුත් අපට බලවත් අනුග්‍රහ

යක් කර වදාළෝ ය. අගලවත්තේ ප්‍රතිරාජපරිවෙණාධිපති පිඹුරේ සිරි ධම්මානන්ද වාචිස්සරාභිධාන ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්මමහා සඞ්ඝසභාවේ ප්‍රධානනායකස්වාමීන්ද්‍රයන් වහන්සේ ද උපදෙස් දීමෙන් අපට වටිනා මෙහෙයක් ඉටු කොළෝ ය. විද්‍යෝදය මහා විද්‍යාලයෙහි උපප්‍රධානාචාර්ය්‍ය වැලිවිටියේ පණ්ඩිත සෝරත ස්ථවිරපාදයන්වහන්සේ හා ආචාර්ය්‍ය කළුකොඳයාවේ පඤ්ඤා සේඛර ස්ථවිරපාදයන් වහන්සේත් නොයෙක් ශාසනික ජාතික කටයුතු සම්බන්ධයෙන් ඇති බලවත් අනවකාශත්වයකින් යුතුව සිටිය දීත් අපකෙරෙහි කළ විශේෂානුකම්පාවෙන් මෙහි අවසානය දක්වා ශුද්ධිපත්‍රාවලෝකනය කොළෝ ය. එසේම ආචාර්ය්‍ය වැලිවිටියේ ධම්මරතන ස්ථවිරපාදයන් වහන්සේ ගෙන් හා ආචාර්ය්‍ය දෙවුන්දර වාචිස්සර ස්ථවිරයන් ගෙනුත් ලැබුනු උපදෙස් හා උපකාරත් අපට අතිශයින් ප්‍රයෝජනවත් වූහ. මුද්‍රණය කළ මහත්වරුද ඉතා සැලකීමෙන් කටයුතු කොළෝ ය.

"සබ්බසත්තා භවන්තු සුඛිතත්තා"

කිත්තපියේ උදිත ස්ථවිර
පුෂ්පාරාම විහාරය,
වැලිවේරිය,
මාතර.

# ශුද්ධි පත්‍රය.

| පිට-පෙළ | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|
| 13–18 | කුළුම්පසුත්‍ර | කුළුම්බසුත්‍ර |
| " –27 | " | " |
| " –32 | කුළුම්පස්ස | කුළුම්බස්ස |
| 15–17 | ගර්ජිතා | ගර්ජතා |
| 16– 1 | එපමණක් නො | එපමණක් නොව |
| 19–30 | කැපවන්නේ ය. | කැප නොවන්නේය. |
| 22–30 | විස්තරවෙයි | විස්තර කරති. |
| 25– 2 | නෙවෙති | නොවෙති. |
| 26–28 | එහෙයින් යනු 29 පෙළේ මොහු යනු හා යොද ගතයුතු. | |
| 29–30 | දසමාසය | දසමාසය දසමාසය |
| 30–10 | දෙනමවහන්සේ | දෙදෙනාවහන්සේ |
| 31– 4 | මතයක්ද වෙයි | මතයක්ද දක්වති |
| 33–14 | කපලතාවට | කල්පතාවට |
| 36–25 | සාරත්ථකථාපාලියට | සාත්ථකථාපාලියට |
| 48–10 | සාක්ෂියක් | සාක්ෂ්‍යයක් |
| " –14 | පටිපාටිය | පරිපාටිය |
| " –30 | " | " |
| 50–14 | මහාඅට්ඨකථාදීහුද | පච්චරියට්ඨකථාදීහුද |
| 51–30 | එක් ග්‍රන්ථයකට | එක් එක් ග්‍රන්ථයකට |
| 58– 2 | ඇරාධනය | ආරාධනය |
| 112–28 | විපබිම්බස්ස | පටිබිම්බස්ස |
| 128–32 | ප්‍රතිසම්භිදා ප්‍රාප්තයන්ගේ වශයෙන් දහසක්ද | ප්‍රතිසම්භිදාප්‍රාප්තයන්ගේ වශයෙන් දහසක්ද, සුක්ඛ විපස්සක යන්ගේ වශයෙන් දහසක්ද |
| 143–18 | පිරිදියි | පරිදියි. |

## සංකේත හා නිවේදනය.

ත්‍රි. මු. හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණයෙහි.

ශ්‍රී. ධ. ස. ශ්‍රී ධර්මාරාම සංස්කරණයෙහි.

මෙහි දැක්වෙන පෘෂ්ඨාංක ඒ ඒ කාලයන්හි මුද්‍රිත ග්‍රන්ථයන්ගේ වශයෙන් බෙහෙවින් වෙනස් විය හැකි බව සැලකිය යුතුයි.

මෙහි නැවත මුද්‍රණය අපටම අයත් වන්නේ ය.

# නිර්දේශ සූචිය.

පිට.

2 ත්‍රිවිධ ශාසනය
2 ධර්මසඞ්ගායනා
6 ත්‍රිපිටකපාලිය
I2 පාලිපරීක්ෂණය
17 අර්ථකථා නිෂ්පාදනය
20 අටුවාවෝ නම් කවරහු ද?
34 අර්ථකථා පරිපාටිය
49 අර්ථකථා සමානාසමානත්වය
53 නවීනඅටුවා කෙසේ සම්පාදිත ද?
102 අර්ථකථා සම්පාදකයෝ
122 අර්ථකථාපරීක්ෂණය
146 විවේචනය

# ත්‍රිපිටක පරීක්ෂණය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

1. ජිනවරවදනසරොජෙ—සඤ්ජාතා සෙතහංසිසඞ්කාසා,
සුරනරසරණං පරමං—වාණී මම මානසෙ චිරං රමතං.

2. විඝාතිතඝනතමසං—සද්ධම්මසඞ්ඝං ජිනං නමස්සිත්වා,
පොරාණිකපරියත්ති—විවරණ වීමංසනං කරිස්සාමි.

3. සො ච'යං මම විසයො-පරියත්ත්‍යණ්ණවගම්භීරතා ච කා,
සාගරතරණෙ පඞ්ගුල—දහරස්ස පරිස්සමොව පකති මෙ.

4. යතනෙ යා මති විචයෙ—සච්චගවෙසනහිතාය සා භවති,
යා ච ගතානුගතා සා—කුණ්ඨමතිති විබුධා පකාසෙන්ති.

5. සංසති බාලො අථවා-නින්දති සො සාධුභයෙන වා අඤ්ඤො,
මතිමන්තා එව'ස්මිං—භවන්ති පමිති විභජ්ජවාදඤ්ඤූ.

සියලු දතයුතු දෙය සර්වප්‍රකාරයෙන් දැන ලොවුතුරා බුදු බවට පැමිණි ශාක්‍යනායක බුදුරදුන් වහන්සේට මාගේ හෘදයඞ්ගම නමස්කාරය වේවා. ඒ සම්බුදුරදුන් වහන්සේ දීපඞ්කර මුනිඳුන් හමුවෙහි අතට පත් නිවන් සැපය හැර පියා බිහිසුණු සසර පැතුරුණු කම්කටුලුවලින් පෙළෙන අපමණ ලොකවාසීන් කෙරෙහි පතළ මහාකරුණාවෙන් සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි කියා ලියා නිමවා ලිය නොහැකි පීඩාවන්ට භාජන වෙමින් දානාදි සමතිස් පැරුම් පුරා අවිද්‍යාන්ධකාරයෙන් මූලා ව පැවති ලොකය ප්‍රඥාලොකයෙන් එකාලොක කරමින් බුද්ධත්වයට පැමිණ සදෙවක ලෝකයාගේත් මොහඳුරු නසනු පිණිස, ඔවුන් දුකින් මුදනු පිණිස පන්සාළිස් වසක් මුළුල්ලෙහි ධර්මානුශාසනය පැවැත්වූ සේක. තමන් වහන්සේගේ අභාවයෙන් ලෝකයාගේ හිත වැඩ සලසමින් එය ආරක්ෂා කරණු පිණිස සුපින්කොත් වූ මහා සඞ්ඝයා වහන්සේ ද ඇති කළ සේක.

## ත්‍රිවිධ ශාසනය.

ශිවඞ්කර වූ බුද්ධොත්තමයන් වහන්සේගේ අනුශාසනය පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ වශයෙන් ත්‍රිවිධ වන්නේ ය. පර්‍ය්‍යාප්ති ශාසනය නම් සියලු දුකින් මිදී ශාන්තිය ලබනු පිණිස දෙශනා කළ මාර්‍ගය යි; හෙවත් බුද්ධවචනය යි. සියලු බුද්ධවචනය විමුක්තිරසය වඤ්ජනය කාරණ හෙයින් රස වශයෙන් එකාවිධ ය. ධර්‍ම විනය වශයෙන් දෙපරිදි ය. ප්‍රථම මධ්‍යම පශ්චිම වශයෙන් හෝ විනය සූත්‍රාභිධර්‍ම වශයෙන් ත්‍රිවිධ ය. දීඝනිකාය, මජ්ඣිමනිකාය, සංයුත්තනිකාය, අඞ්ගුත්තරනිකාය, ඛුද්දකනිකාය වසයෙන් පඤ්චවිධ ය. සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල යන මොවුන්ගේ වශයෙන් නවවිධ ය. ධර්‍මස්කන්ධ වශයෙන් සුවාසූදහසෙකි.

ප්‍රතිපත්ති ශාසනය නම් ධර්‍මානුධර්‍ම ප්‍රතිපත්තිය යි; හෙවත් දෙශනා කළ ධර්‍මයට අනු ව පිළිපැදීම යි.

ප්‍රතිවෙධ ශාසනය නම් ධර්‍මානුකූල ප්‍රතිපත්තියෙන් ලබන ප්‍රතිවෙධය යි, හෙවත් සෝවාන් ආදි සතර මග සතර ඵලය හා නිර්‍වාණය අවබෝධ කිරීම යි. පර්‍ය්‍යාප්තියෙන් ප්‍රතිපත්තියත් එයින් ප්‍රතිවෙධයත් ලැබිය යුතු හෙයින් ද පර්‍ය්‍යාප්තියෙන් තොර ව ප්‍රතිපත්තියක් හා ප්‍රතිවෙධයක් නො ලැබෙන හෙයින් ද පර්‍ය්‍යාප්තිය ම මෙහි මුල් වන්නේ ය. එහෙයින් බුද්ධ පුත්‍රයන් වහන්සේ දිවි දෙවැනි කොට එය ආරක්‍ෂා කළසේක.

## ධර්‍මසඞ්ගායනා.

ධර්‍මරාජ වූ සම්බුදුන් වහන්සේ ජීවමාන ව වැඩ සිටිය දී පර්‍ය්‍යාප්ති සඞ්ගායනාවක් කිරීම අනවශ්‍ය වී ය. නානා ලබ්ධි ගතු වන් විසින් ධර්‍මවිලොප ඇති කිරීම- නොයෙක් විපරීත මත බහා ධර්‍මය විපර්‍ය්‍යාස කිරීම- නො කළ හැකි හෙයිනි. ශාසනභාරධාරීන් විසින් බුද්ධවචනය සඞ්ගායනා කොට සකසා පිළියෙල කොට තබන ලද්දේ පරිනිර්‍වාණයෙන් පසු ව ය. මහලු කල පැවිදි වූ සුභද්‍ර නම්

ප්‍රව්‍රජිතයෙක් අකාප්‍ය සමාදානයෙන් එක් කළ දෙයින් බුදුනට යාගු වක් පිළියෙල කොළේ ය. ඒ බව දත් බුදුන් වහන්සේ අකාප්‍ය සමාදානය ගැණ නිග්‍රහ කොට සිකා පද ද වදුරු ඔහුගේ යාගුව ප්‍රතික්‍ෂෙප කළ සේක. එයින් හටගත් කෝපය ඔහු සිත පොපියමින් කලක් පැවැත්තේ බුද්ධපරිනිර්‍වාණාවස්ථාවෙහි ක්‍ෂීණාශ්‍රවයන් ධර්‍මසංවෙග යෙන් ඇලළෙද්දී සෙස්සන් ශොකයෙන් කම්පිත වෙද්දී ඔවුන් මැදට පැමිණ "ඇවැත්නි! මේ මේ දෙය කැප ය අකැප ය යි කිය මින් අපට වෙහෙස කළ ශ්‍රමණභවත් ගෞතමයන් මිය ගිය පසු අපට කැමැති දෙයක් කරම්හ. අකැමැති දෙයක් හරුම්හ. එහෙ යින් ශොක නො කරව්; නො හඬව්" යනාදිය කීය. ඔහුගේ ඒ කර්‍ණ කටුක වචන ඇසූ එවකට ශාසනාධිකාරි ව සිටි මහකසුප් හිමියෝ ධර්‍මය සඞ්ගායනා කිරීමට සිතුවාහු සම්බුද්ධපරිනිර්‍වාණයෙන් තුන්වන මස ඇසළ පුණු පොහොයෙන් පස්වන දින රජගහ නුවර සප්තපර්‍ණිගුහාවෙහි දී අජාසත් රජුගේ අනුග්‍රහයෙන් පන්සිය යක් මහරහතන් හා එක් ව සත් මසකින් ප්‍රථමසඞ්ගායනාව කළහ.

වැදූරට භික්‍ෂූන් විසින් "කප්පති සිඞ්ගිලොණකප්පො" යනා දීන් උපදවා ලූ ශාසනවිලොපාදිය අසා ප්‍රථමසඞ්ගායනාවෙන් ශත වර්‍ෂයකට පසු විශාලා මහනුවර වාලුකාරුමයේ දී කාලාශොක රජුගේ අනුග්‍රහයෙන් යස, රෙවත, සබ්බකාමී මහා ස්ථවිරයන් ප්‍රමුඛ සත් සියයක් මහරහතන් විසින් අට මසකින් දෙවන සඞ්ගායනාව කරණ ලදී.

දෙවන සඞ්ගායනාවෙන් නෙරපා හළ අධර්‍මවාදීන් විසින් ඇති කළ අනෙකප්‍රකාර ශාසනවිපර්‍ය්‍යාසයන් නිසා බුද්ධ වර්‍ෂ දෙසිය අට ළොසකට පසු පැළලුප් නුවර අශොකාරුමයේ දී ධර්‍මාශොක රජ තුමන්ගේ අනුග්‍රහයෙන් මොග්ගලි පුත්ත තිස්ස මහා ස්ථවිර ප්‍රමුඛ දහසක් මහරහතන් විසින් නවමසකින් තුන්වන සඞ්ගායනාව කරණලදී. මොහු මහා සඞ්ගායනාවෝ යි.

තවද බුද්ධ වර්‍ෂ දෙසිය අට අසූවේ දී සිරිලක ථූපාරුමයේ දී දෙවන පැතිස් රජතුමන්ගේ අනුග්‍රහයෙන් සැටදහසක් පිරිවර කොට ඇති මහා මහින්ද අරිට්ඨ මහහිමියන් ප්‍රමුඛ අට අසූ රහතන් විසින් අනියමිත කාලයකින් කළ සඞ්ගායනාවක් හා ධර්‍මය ග්‍රන්ථාරූඪ කරණු පිණිස බුද්ධ වර්‍ෂ සිවුසිය සතළිසේ දී සිරිලක මාතුල දනව්වෙහි කිසියම් ජනපදාධිපතියකුගේ අනුග්‍රහයෙන් පන්සියයක් මහරහතන් විසින් එක් වර්‍ෂයකින් කළ සඞ්ගායනාවක් ද යි ලක්දිව දී කළ මේ දෙකත් සමග ප්‍රසිද්ධ සඞ්ගායනා පසෙකි.

ප්‍රථම සඞ්ගායනාව කළ පරිද්දෙන් සෙසු සඞ්ගායනාවෝත් කරණලදහ. විශෙෂය නම් දෙවන තුන්වන සඞ්ගායනාවන්හි දීත් පෙළට අළුතෙන් ධර්ම්ප්‍රදෙශ ඇතුළත් කිරීම පමණෙකි. ප්‍රථම සඞ්ගීති කාරකයන් තිපදවූ මහ අටුවාව සිවුවන පස්වන සඞ්ගායනාවන්ට නැගුන බවක් නො කියන ලදී. මහා සඞ්ගායනා තුණට නැගුනේ නම් මේ දෙකටත් නැගිය යුතු ය. නො නැගුනේ නම් පෙළ බසින් හෙළු බසට නැගීම නිසා විය යුතුය.

ප්‍රථමසඞ්ගීතිකාරක හිමියන් විනය සූත්‍රාභිධර්ම්මපිටකයෝ පිළිවෙළින් සඞ්ගායනා කොට ඒ ඒ ධර්ම්මප්‍රදෙශ "ආරක්‍ෂා කරව, සවකීය අතැවැස්සන්ට පුරුදු පුහුණු කරව"යි ඒ ඒ උතුමන්ට භාර කරණ ලදහ. කෙසේ ද? යත්:- විනය පිටකය උපාලි තෙරුන්ට ද, දීඝනිකාය ආනන්‍ද තෙරුන්ට ද,මජ්ඣිමනිකාය සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යයන්ට ද, සංයුත්තනිකාය මහ කසුප් තෙරුන්ට ද, අඞ්ගුත්තර නිකාය අනුරුඬතෙරුන්ට ද භාර කළහ. අභිධර්ම්මපිටකය වෙන් වශයෙන් කෙනෙකුන්ට භාර නො කොට තුමූ ම ධාරණය කොට ගත්හ.

කුද්‍රුගත් සඟිය පිළිබඳ ව පවත්නා බලවත් මත භෙදයෙන් පෙණෙනුයේ එය වෙන් වශයෙන් කෙනෙකුට භාර නො කළ බවෙකි. සමන්තපාසාදිකාවෙහි හා සුමඞ්ගලවිලාසිනියෙහි දක් වෙන විස්තරයන්හි සඳහන් නො වන නමුත් අටළොස් ගණයක පෙරැදුරන් විසින් ධාරණොද්ග්‍රහණයෙන් ත්‍රිපිටකය ආරක්‍ෂා කළ බව පෙණේ. පාරාජික භාණක, පාචිත්තිය භාණක, චුල්ලවග්ග භාණක, මහාවග්ග භාණක, පරිවාර භාණක, දීඝ භාණක, මජ්ඣිම භාණක, සංයුත්ත භාණක අඞ්ගුත්තර භාණක, ඛුද්දක භාණක, ධම්මසඞ්ගණී භාණක, විභඞ්ග භාණක, කථාවත්‍ථු භාණක, පුග්ගල පඤ්ඤත්ති භාණක, ධාතුකථා භාණක, යමක භාණක, පට්ඨාන භාණක, ජාතක භාණක යනු ඒ අටළොස් ගණය යි.

ඒ ඒ ගණයට අයත් තෙරුන් විසින් තමන් තමන්ට නියමිත දහම් කොටස් සිවුශතවර්ෂයකට අධික කාලයක් මුඛපාඨයෙන් ම ගෙණා බවත් පස් වන සඞ්ගායනාවේ දී මහ අටුවාවත් සමග ග්‍රන්ථාරූඪ කළ බවත් කියති. මීට කලින් මහ අටුවාව ලේඛන ගත ව නො තුබූ බව කියන නමුත් එසේ තුබුනේ ය යි අනුමාන කළහැකි හෙයිනුත් බුද්ධ කාලයෙහි පවා පටිච්චසමුප්පාදදි ඇතැම් ධර්ම්ම ප්‍රකාටසාංශ ලේඛන ගත කළ බව් ප්‍රෙණෙන හෙයිනුත් පෙළෙනුදු

කිසිවක් ලේඛනයෙහි නො පැවැත්තේ ම යයි නො සිතිය හැකි යි. එසේ නමුත් සියල්ල ම ප්‍රසිද්ධ වශයෙන් ග්‍රන්ථාරූඪ කරණ ලද්දේ මෙහි දී ය යි කිය යුතු යි

මේ සුප්‍රසිද්ධ සඞ්ගායනා පස හැර බු: ව: 757දී වොහාර තිස්ස රජ කපිල ඇමතියන් ලවා කරවූ ධම්මවිනිශ්චය හා 796 දී ගොඨාභය රජතුමන් කරවූ ශාසන ශොධනයක් ද වෙයි. මහානාම රජ තුමන් දවස බුද්ධඝොෂාදි ආචාර්‍ය්‍යවරයන් අපපාඨ දුරු කොට ආකූල ස්ථාන නිරවුල් කොට අර්ථකථා සම්පාදනයෙන් කළ පර්‍ය්‍යාප්ති ශොධනයෙන් පසු,

1071 දී අභයගරණ සලමෙවන් රජු දවස ජොතිපාල තෙරුන් විසින් ද

1410 දී සේන හෙවත් මුගසින්සෙන් රජු දවස ද

1669 දී මහලු විජයබා රජු දවස ද

1696 දී මහ පැරකුම්බා රජු දවස දිඹුලාගල කාශ්‍යප සඞ්ඝ රාජ තුමන් විසින් ද

1790 දී කාලිඞ්ග විජයබාහු රජතුමන් දවස දිඹුලාගල වනවාසි මෙධඞ්කර සඞ්ඝරාජතුමන් විසින් ද

1794 දී කලිකාල සර්‍වඥ පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමන් විසින් ද

1894 දී ගම්පල සේනාලඞ්කාර සෙනෙවිරදුන් දවස අමරගිරි වනවාසී වනරතන සඞ්ඝරාජයන් විසින් ද

1912 දී අලගක්කෝනාර් ප්‍රභු රාජයන් දවස ශ්‍රී ධර්‍මකීර්ත්ති සඞ්ඝරාජයන් විසින් ද

1936 දී වීරබාහු රජුන් දවස දෙවන ධර්‍මකීර්ත්ති සඞ්ඝරාජයන් හා ගලතුරුමූල මෛත්‍රෙය මහා ස්ථවිරයන් විසින් ද

2290 දී කීර්ත්ති ශ්‍රී රාජසිංහ රජු දවස සරණඞ්කර සඞ්ඝරාජයන් විසින් ද

2323 දී ශ්‍රී රාජාධි රාජසිංහ රජතුමන් දවස ද යි මෙසේ සුලු වශයෙන් කරණලද පර්‍ය්‍යාප්ති ශොධනයෝ ද රාශියෙකි.

# ත්‍රිපිටක පාලිය.

---

සියලු දතයුතු දෙය දැන සම්බුදු බවට පත් දම්රදුන් වහන්සේ දෙවියන් සහිත ලෝවැසියන්ගේ හිත පිණිස **"අනෙකජාති සංසාරං"** යනාදි ප්‍රථම බුද්ධ වචනය දෙශිත කාලයේ පටන් පරිනිර්වාණ මොහොතෙහි **"හන්‍ද දානි භික්ඛවෙ ආමන්තයාමි වො වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථ"** යන පශ්චිම බුද්ධ වචනය දෙශිත කාලය කෙළවර කොට ඇති පන්සාළිස් වර්ෂයක් මුළුල්ලෙහි දෙශනා කළ යම් පමණ භාෂිතයෝ වෙත් නම් ඒ සියල්ල පයර්‍යාප්ති නාමයෙන් දන්නේ ය. ඒ පයර්‍යාප්තිය විනය, සූත්‍ර, අභිධර්‍ම ය යි තුන්කොටසකට බෙදතලදී. පයර්‍යාප්තියට හා භාජන විශෙෂයකට ද පයර්‍යාය නාමයක් වූ පිටක නාමය සමග යොදා විනය පිටකය සූත්‍රපිටකය අභිධර්‍මපිටක ය යි ද කියන්නේ ය.

**විනය පිටකය:-** විශෙෂයෙන් භික්ෂු භික්ෂුණීන්ගේ කායවාක් සංයමය පිණිස දෙශිත ධර්‍මය විනය නම් වි ය. භික්ෂු භික්ෂුණීන්ගේ වශයෙන් ප්‍රාතිමොක්ෂ දෙකක් ද ඔවුන්ගේ ම වශයෙන් විභඞ්ග දෙකක් ද කඳුවත් දෙවිස්සක් ද පරිවාර සොළොසක් ද යන මොහු යි. ප්‍රාතිමොක්ෂ, පාරාජික, පාචිත්තිය, මහාවග්ග, චූලවග්ග, පරිවාර යන ප්‍රකරණයන්ගේ වශයෙන් ඒ සියල්ල දන්නේ යි.

එ හෙයින් කියන ලදී:-

"තෙසු පාරාජිකං ඛන්‍ධං පාචිත්තියමථාපරං,
භික්ඛුණීනං විභඞ්ගා ච මහාවග්ගො තථාපරෙ,
චූලවග්ගො පරිවාරො විනය පිටකං මතං"යි.

කුමක් හෙයින් මේ ධර්‍මයන්ට විනය නම් වී ද?. යත්:-

නානාප්‍රකාර විශෙෂ නයක්‍රම ඇති හෙයින් ද කායවාග්ද්වාර යන් මනා කොට හික්මවන හෙයින් ද විනයාර්ථ දත් ප්‍රාඥයන් විසින් මේ ධර්‍ම කොට්ඨාසයට විනය යි කියතලදී.

එහෙයින් කීහු:-

"විවිධවිසෙසනයත්තා විනයනතො චෙව කායවාචානං,
විනයත්ථ විදූහි අයං විනයො විනයොති අක්ඛාතො."

**සූත්‍ර පිටකය**:- සූත්‍රාන්ත ධර්ම දීඝ, මජ්ඣිම, සංයුක්ත අඞ්ගුත්තර, ඛුද්දක ය යි නිකාය පසකින් දත්තේය. බ්‍රහ්මජාල සූත්‍රය ආදි සතිසක් සූත්‍රයෙන් යුක්ත වූයේ දීඝ නිකාය නම් වෙයි. මූලපරියාය සූත්‍රය ආදි එක්සියදෙපණසක් සූත්‍රයෙන් යුක්ත වූයේ මජ්ඣිම නිකාය නම් වෙයි. ඔඝතරණ සූත්‍රය ආදි සත් දහස් සත්සිය දෙසැටක් සූත්‍රයෙන් යුක්තවූයේ සංයුක්ත නිකාය නම් වෙයි. චිත්තපරියාදාන සූත්‍රය ආදි නවදහස් පන්සිය සත් පණසක් සූත්‍රයෙන් යුක්ත වූයේ අඞ්ගුත්තරනිකාය නම් වෙයි. මේ සතර ආගම නාම යෙන් ද ගන්නේය.

ඛුද්දක නිකාය කොටස් පසළොසකින් යුක්ත වේ. ඛුද්දක පාඨ, ධම්ම පද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමාන වත්‍ථු, පෙත වත්‍ථු, ථෙර ගාථා, ථෙරී ගාථා, ජාතක, නිද්දෙස, පටි සම්භිදා, අපදාන, බුද්ධවංස, චරියා පිටක යන ප්‍රකරණයන්ගේ වශයෙන් ඔහුතුමූ දත යුත්තාහු ය.

එහෙයින් කියන ලදී:-

"දීඝමජ්ඣිමසංයුත්තා අඞ්ගුත්තරිකඛුද්දකා,
නිකායා පඤ්ච ගම්භිරා අත්‍ථතො ධම්මතොචිමෙ."

"ඛුද්දපාඨො ධම්මපදං, උදානං ඉතිවුත්තකං,
සුත්තනිපාතවිමානං, පෙතවත්‍ථුමථාපරං,
ථෙරා ථෙරී ච ජාතකං නිද්දෙසො පටිසම්භිදා,
අපදානං බුද්ධවංසො චරියාපිටකාමෙව ච,
පණ්ණරසප්පභෙදොයං නිකායො ඛුද්දකො මතො."

කුමක් හෙයින් මේ ධර්ම සූත්‍ර නම් වී ද යත්:-

ලෞකික ලොකොත්තරාර්ථයන් ප්‍රකාශ කාරණ හෙයින් ද මනා කොට වදාළ අර්ථ ඇති හෙයින් ද අර්ථයන් ප්‍රසව කාරණ- වගුරුවන-රක්නා හෙයින් ද අර්ථයන් එකාබද්ධ කාරණ හුයක් සමාන හෙයින් දූ යි යන මේ ෂට්ප්‍රකාරාර්ථයෙනි.

එහෙයින් කියන ලදී:-

"අත්‍ථානං සූචනතො සුවුත්තතො සවනතො ච සූදනතො,
සුත්තාණා සුත්ත සභාගතො ච සුත්තං සුත්තන්ති අක්ඛාතං."

**අභිධර්ම පිටකය**:- පරමාර්ථ ධර්මය ද කොටස් හෙවත් ප්‍රකරණ සතකින් දත්තේ යි. සතර විභක්තිඃකින් යුත් ධම්මසඞ්ගණිප්පකරණය, අටළොස් විභක්තිඃකින් යුත් විභඞ්ගප්පකරණය, තුදුස්

බෙදුමකින් යුත් ධාතුකථාප්පකරණය, ෂට්ප්‍රඥප්තියකින් යුත් පුග්ගලපඤ්ඤත්තිප්පකරණය, දහසක් සූත්‍රයෙන් යුත් කථාවත්ථුප්පකරණය, දශ යමකයකින් යුත් යමකප්පකරණය, සූවිසි ප්‍රත්‍යයකින් යුත් පට්ඨානප්පකරණය යන මොහු ඒ සත් ප්‍රකරණයෝ යි.

එහෙයින් කියන ලදී:-

"ධම්මසඞ්ගණී විභඞ්ගො ච ධාතුකථා තථා පරං,
තතො පුග්ගලපඤ්ඤත්ති කථාවත්ථුප්පකරණං.
යමකං අථ පට්ඨානං ඉමෙ සත්තප්පභෙදතො,
අභිධම්මොති පිටකං සම්මාසම්බුද්ධ දෙසිතං."

කුමක් හෙයින් මේ ධර්මයන්ට අභිධර්ම යන නාමය වීද? යත්:-

යම් හෙයකින් මෙහි භාවනාදීන් වෘද්ධිමත් වූ ද අරමුණු ආදීයෙන් හැඳිනිය යුතු වූ ද ඒකාන්තයෙන් පිදිය යුතු වූ ද ස්පර්ශාදීන්ගේ වශයෙන් පිරිසිඳින ලද්දාවූ ද කාමාවචරයන් කෙරෙන් අධික වූ ද ධර්මයෝ කියන ලද්දාහු ද, එහෙයිනි.

කියනලද මැ යි:-

"යං එත්ථ වුද්ධිමන්තො සලක්ඛණා පූජිතා පරිච්ඡින්නා,
වුත්තාධිකා ච ධම්මා අභිධම්මො තෙන අක්ඛාතො."

බුද්ධවචනය මෙසේ පිටකත්‍රයයකට බෙදා දැක්වීම සඞ්ගීතිකාරකයන් විසින් ම කරණ ලද්දක් නො වේ. උපාලි තෙරුන් වහන්සේට විනය පිළිබඳ අගතනතුරු පත් කිරීමෙන් විනය පිටකය ද පරමාර්ථ ධර්මය දෙවියන්ට දේශනා කිරීමෙන් අභිධර්ම පිටකය ද වෙන් කොට සෙසු සියලුම ධර්ම සූත්‍ර පිටකයට අයත් කිරීමෙන් තථාගතයන් වහන්සේ විසින් ම බෙදා වදාළ බව දෙශිත ක්‍රමයෙන් සැලකිය යුතු යි. එහෙයින් සඞ්ගීතිකාරකයන් විසිනුදු එසේ ම වෙන් කොට දක්වන ලදී.

**"යෙභුය්‍යෙන හි තීණි පිටකානි භගවතො ධරමාන කාලෙයෙව ඉමිනා අනුක්කමෙන සජ්ඣාසිතානි. තෙනෙව කමෙන පච්ඡාපි සඞ්ගීතානි. විසෙසතො විනයාභිධම්මපිටකානීති දට්ඨබ්බං".** භාග්‍යවතුන් වහන්සේ ජීවමාන ව වැඩසිටිය දී ම බොහෝ සෙයින් ත්‍රිපිටකය මේ ක්‍රමයෙන් හදාරණ ලද්දේ ය. ඒ ක්‍රමයෙන් ම පසුව සඞ්ගායනා කරණ ලද්දේ ය, විශෙෂයෙන් විනයාභිධර්ම පිටකයෝ ය යි දත යුතු ය- යනු විමති විනොදනීයෙහි (මුද්‍රිත 14 පිට) කියන ලද්දේත් එහෙයිනි.

කුමක් හෙයින් මෙසේ බෙදන ලද්දාහු ද? යත්:- බුදුරදුන් වහන්සේ සියලු බුද්ධවචනය ම දෙශනා කරණ ලද්දේ කරුණාවෙන් හා ප්‍රඥාවෙනි. කිසි ධර්මයක් දෙසීමට කරුණාව හේතු වී ය. කිසිවක් දෙසීමට ප්‍රඥාව හේතු වී ය. ඒ දෙකින් ම කිසි ධර්මයක් දෙශිත ය. විනයදෙශනාවට ප්‍රධාන වූයේ මහාකරුණාව යි. හිරි ඔතප් දෙකින් කෙළ පැමිණි භාග්‍යවතුන් වහන්සේ සාමාන්‍ය ලෞකික සාධූන් විසිනුදු දුරු කළ යුතු වූ "සිබරිණී වෙහි" යනාදි වචන ද කරණලද අපරාධයට සුදුසු ගර්හා වචන ද විනයදෙශනාවට මෙහෙයන ලද මහා කරුණාවෙන් යුත් සිතැතිසේක් මහ පිරිස් මැද වදළසේක ඒ ඒ ශික්ෂා පද පැණවීමට හේතු කරුණු අපෙක්ෂා කිරිමෙන් වෙරඤ්ජා ආදි ස්ථානයන්හි දී බොහෝ ශාරීරික පීඩාවන් ද විඳි සේක. විනයදෙශනාවට කරුණාව ප්‍රධාන ය යි කියන ලද්දේ එහෙයිනි.

සූත්‍රාන්ත දෙශනාවට කරුණා ප්‍රඥා දෙක ම මුල් වි ය. ඒ ඒ විනෙය ජනයන්ගේ ආශය අනුශය අධිමුක්ති චර්‍ය්‍යාදි විශෙෂ විභාග යන් පරිසිඳින ලද්දේ ප්‍රඥාවෙනි. එසේ පරීක්ෂා කොට බලා එක් එක් පුද්ගලයකු සඳහා වුව ද ස්වකීය පාදයෙන් හුදකලා ව හෝ යොදුන් ගණන් වඩිමින් ඔවුන්ගේ අදහස්වලට සරි ලන පරිදි ගැඹුරු වූ ධර්මාර්ථයන් සිත්වල පිහිටුවන ලද්දේ-නැතහොත් ධර්මාව බොධය කරවන ලද්දේ-මහා කරුණාවෙනි. සූත්‍රාන්ත දෙශනාවට කරුණාව හා ප්‍රඥාව ප්‍රධාන ය යි කියන ලද්දේ එහෙයිනි. අභිධර්ම දෙශනාවට ප්‍රඥාව ම ප්‍රධාන වී ය පරමාර්ථ ධර්මයන්ගේ යථාස්වභාවය ප්‍රතිවෙධයට සමර්ථ ප්‍රඥාව ඒ දෙශනාව පැවැත්වීමට ප්‍රධාන වූ හෙයිනි. මෙය අන් ක්‍රමයකින් කියතොත් බුද්ධශාසනය ලොව පහළ වූයේ කරුණාව හා ප්‍රඥාව නිසා ය යි කිය යුතු ය.

තවද බුඩවචනය ආඥා වොහාර පරමත්ථ වසයෙන් තෙපරිද් වෙයි. ආඥාදානයට සුදුසු වූ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රඥප්තිය බහුල කොට දෙශනා කරණලද හෙයින් විනය පිටකය ආඥාදෙසනා නම් වෙයි. ව්‍යවහාර කථාවෙහි දක්ෂ වූ උන්වහන්සේ විසින් ව්‍යවහාර කථා බහුල කොට දෙශනා කරණලද හෙයින් සූත්‍ර පිටකය වොහාරදෙසනා නම්. පරමාර්ථධර්ම දක්වීමෙහි සමර්ථ වූ උන්වහන්සේ විසින් පරමාර්ථ බාහුල්‍යයෙන් දෙශිත බැවින් අභිධර්මපිටකය පරමාර්ථදෙශනා නම්.

තවද යථාපරාධ ශාසනය, යථානුලොම ශාසනය, යථාධර්ම ශාසනය යි ක්‍රියා ද තෙපරිද් වන්නේ ය. කිසියම් සත්වකෙනෙක් බොහෝ අපරාධ ඇත්තාහු ද ඒ සත්වයෝ ඒ අපරාධයට සුදුසු පරිද්

මෙයින් අනුශාසනය කරන ලද්දැහු නු යි විනයපිටකය යථාපරාධ ශාසන නම්. නොයෙක් අදහස් අනුශය චරිත අධිමුක්තීන්ගෙන් යුක්ත වූ සත්ත්වයෝ ඔවුනට අනුලොම් වූ පරිදි මෙයින් අනුශාසනය කරණ ලද්දැහු නු යි සූත්‍රපිටකය යථානුලොම ශාසන නම්. පෘථිව්‍යාදි ධර්‍මපුඤ්ජමාත්‍රයක් වූ මේ සිරුර පිළිබඳ ව මම ය මාගේ ය යි මෙබඳු හැඟීමෙන් යුත් සත්ත්වයෝ මේ හේතුයෙන් මෙය හට ගත්තේ ය යි ධර්‍මය වූ පරිද්දෙන් මෙයින් අනුශාසන ය කරණ ලද්දැහු නු යි අභිධර්‍ම පිටකය යථාධර්‍ම ශාසන නම්.

තවද සංවරාසංවර කථා ය, දිට්ඨිවිනිවෙඨන කථා ය, නාමරූප පරිච්ඡෙද කථා ය යි කියා ද තෙපරිදි වන්නේ ය. සීමාව ඉක්මවා කැමැති පරිදි හැසිරීමට විරුද්ධ ව සංවරය මේ ය අසංවරය මේ ය යි මෙහි දක්වන ලද්දේ නු යි විනයපිටකය සංවරාසංවර කථා නම්. දෙසැටක් මිථ්‍යාලබ්ධීන්ට ප්‍රතිවිරුද්ධ ව දෘෂ්ටිවිදාරණය මෙහි කියන ලද්දේ නු යි සූත්‍රපිටකය දිට්ඨිවිනිවෙඨන කථා නම්. රාගාදීන්ට ප්‍රති පක්‍ෂ වූ නාමරූපයන් පිරිසිඳ දක්වීම මෙහි කියන ලද්දේ නු යි අභි ධර්‍ම පිටකය නාමරූපපරිච්ඡෙද කථා නම්.

තවද ශික්‍ෂාවන්ගේ වශයෙන් ද තෙපරිදි වන්නේ ය. විශෙෂ යෙන් අධිශිල අධිචිත්ත අධිප්‍රඥාවන් දක්වනලද හෙයින් පිළි වෙළින් විනයසූත්‍රාභිධර්‍ම පිටකයෝ අධිශීලශික්‍ෂා අධිචිත්තශික්‍ෂා අධිප්‍රඥාශික්‍ෂා නම් වෙති.

ප්‍රහාණයන්ගේ වශයෙනුදු තෙපරිදි වන්නේ යි. ව්‍යතික්‍රම ප්‍රහාණ පර්‍ය්‍යුත්ථාන ප්‍රහාණ අනුශය ප්‍රහාණයන් දක්වීම පිණිස ද පිළිවෙළින් විනයසූත්‍රාභිධර්‍ම පිටකයන් වදාළ සේක

මෙසේ බුද්ධවචනය දෙශනා–ශාසන–කථා නානාත්වයෙන් හා ශික්‍ෂා–ප්‍රහාණ ප්‍රභෙදයන්ගේ වශයෙන් පිටක තුණකට බෙදන ලද බව සැලකිය යුතු යි. මේ කොටියෙන් දක්වීමෙකි. විස්තර සමන්ත පාසාදිකාවෙන් හා තට්ටීකාවෙන් දන්නේ ය.

පර්‍ය්‍යාප්තිය පිටක තුණකට බෙදීම නිසා ඒ ඒ පිටකයන්ගේ වශයෙන් අර්‍ථය වෙසෙසා ගත යුතු තැනුදු වෙයි. එනම්:– ධම්ම අධම්ම විනය අවිනය යන මොවුන් පිළිබඳ ව සූත්‍රාන්ත විනය දෙකින් අර්‍ථය සැලකිය යුතු. ක්‍රමය උපසඳුව සුදනියෙහි (ශ්‍රී. ධ. ස. 8–38 පිට) එන පරිදි මෙ සේ යි.

"සුත්තන්තපරියායෙන තාව දස කුසලකම්මපථා ධම්මා අකුසලකම්මපථා අධම්මා." සූත්‍රාන්ත ක්‍රමයෙන් දශ කුශල කර්ම පථය ධර්ම නම්. දශ අකුශලකර්මපථය අධර්මනම්. "විනය පරියායෙන පන භූතෙන වත්ථුනා චොදෙත්වා සාරෙත්වා යථා පටිඤ්ඤාය කාතබ්බං කම්මං ධම්මො නාම. අභූතෙන පන වත්ථුනා අචොදෙත්වා අසාරෙත්වා අප්පටිඤ්ඤාය කාතබ්බං කම්මං අධම්මො නාම" විනය ක්‍රමයෙන් විද්‍යමාන වස්තුවෙන් චෝදනා කොට සිහි කරවා ප්‍රතිඥා වූ පරිදි කළයුතු කර්මය ධර්ම නම්. අසත්‍ය වස්තුවෙන් චෝදනා නොකොට සිහි නො කරවා ප්‍රතිඥා රහිත ව කළයුතු කර්මය අධර්ම නම්.

"සුත්තන්තපරියායෙන පන රාගවිනයො දොසවිනයො මොහවිනයො සංවරො පහානං පටිසඞ්ඛාති අයං විනයො නාම. රාගාදීනං අවිනයො අසංවරො අප්පහානං අප්පටිසඞ්ඛාති අයං අවිනයොනාම." සූත්‍රාන්ත ක්‍රමයෙන් රාග ද්වේෂ මෝහයන්ගේ විනයය සංවරය පහාණය පටිසංඛ්‍යානය යන මෙය විනය නම්. රාගාදීන්ගේ අවිනයය අසංවරය අප්පහාණය අප්පටිසංඛ්‍යානය යන මෙය අවිනය නම්. "විනයපරියායෙන වත්ථුසම්පත්ති ඤත්තිසම්පත්ති අනුසාවණසම්පත්ති සීමාසම්පත්තීති අයං විනයො නාම. වත්ථු විපත්ති-පෙ-පරිසවිපත්තීති අයං අවිනයො නාම". විනය ක්‍රමයෙන් වස්තුසම්පත්ති ඥප්ති සම්පත්ති අනුසාවණසම්පත්ති සීමාසම්පත්ති යන මෙය විනය නම්. වස්තු ආදීන්ගේ විපත්තිය අවිනය නම්. මේ වනාහී ධර්මාදීන්ගේ අර්ථය ඒ ඒ පිටකයන්ට අනු ව සලකන පරිදි යි.

තවද සම්බහුල නාමයේ අර්ථය විනය සූත්‍රාන්ත දෙකින් ගන්නා ක්‍රමය පපංචසූදනියෙහි (284) හා සුමඞ්ගලවිලාසිනියෙහි (ත්‍රි. මූ.33) දැක්වෙන පරිදි මෙසේ යි. "විනයපරියායෙන තයො ජනා සම්බහුලා සුත්තන්තපරියායෙන තයො තයො එව. තතො උද්ධං සම්බහුලා". විනයක්‍රමයෙන් තිදෙනෙක් සම්බහුල වෙති. සූත්‍රාන්තක්‍රමයෙන් තිදෙන තිදෙන ම ය. එයට වැඩි ගණනෙක් සම්බහුල වෙති.

තවද අස්සාස පස්සාස දෙකෙහි අර්ථය විනය සූත්‍රාන්ත දෙකින් ගන්නා ක්‍රමය සමන්තපාසාදිකාවෙහි (ත්‍රි. මූ. 294) දැක්වෙන පරිදි මෙසේ යි

"අස්සාසොති බහි නික්ඛමනවාතො, පස්සාසොති අන්තො
පවිසනවාතො, සුත්තන්තට්ඨකථාසු උප්පටිපාටියා ආගතං",

විනයක්‍රමයෙන් ආශ්වාසයයි කියන්නේ පිටත නික්මෙන වාතය යි. ප්‍රශ්වාසයයි කියන්නේ ඇතුළට පිවිසෙන වාතය යි. සූත්‍රාන්තාර්ථ කථාවන්හි මේ ක්‍රමය වෙනස් ව ආයේ ය. එනම්:- ආශ්වාස ය යි කියන්නේ ඇතුළට පිවිසෙන වාතයට ය. ප්‍රශ්වාස ය යි කියන්නේ පිටතට නික්මෙන වාතයට ය.

තවද විනයසූත්‍රාභිධර්ම තුනෙන් වෙන් වෙන් කොට අරණ්‍යය සලකන ක්‍රමය සම්මොහවිනොදනීයෙහි (ත්‍රි: මු: 258) දැක්වෙන පරිදි මෙසේ ය. **"විනයපරියායෙන තාව ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච අවසෙසං අරඤ්ඤන්ති ආගතං. සුත්තන්තපරියායෙන ආරඤ්ඤකං භික්ඛුං සන්ධාය ආරඤ්ඤකං නාම සෙනාසනං පඤ්චධනුසතිකං පච්ඡිමන්ති ආගතං. විනය සුත්තන්තා පන උභොපි පරියාය දෙසනා නාම. අභිධම්මො නිප්පරියාය දෙසනා නාම. අභිධම්මපරියායෙන ඉන්දඛීලතො බහි නික්ඛමිත්වාති".**

විනයක්‍රමයෙන් ගමත් ග්‍රාමොපචාරයත් හැර සෙස්ස අරණ්‍ය ය යි ආයේ ය. සූත්‍රාන්ත ක්‍රමයෙන් ආරණ්‍යක මහණහු සඳහා ආරණ්‍යක නම් සෙනසුන දුනු පන්සියයකින් ඔබ්බෙහි ය යි ආයේ ය. විනය සූත්‍රාන්ත දෙක ම පර්‍ය්‍යාය දෙශනාවෝ ය. අභිධර්මය නිෂ්පර්‍ය්‍යාය දෙශනා නම්. අභිධර්ම ක්‍රමයෙන් (අරණ්‍යය) ඉන්ද්‍රකීලයෙන් පිටත සිට ය යි ගත යුතු ය. මෙසේ පිටක භේදය සලකන අතර ම ඒ ඒ පිටකයන්ට අනු ව පර්‍ය්‍යාප්තියෙහි අර්ථය සැලකිය යුතු තැන් ඇත්තේ ය.

---

## පාලි පරීක්ෂණය.

---

ත්‍රිපිටක පර්‍ය්‍යාප්තිය ධර්මස්කන්ධප්‍රමාණයෙන් සුවාසූ දහසෙකැයි **"ද්වාසීතිං බුද්ධතො ගණ්හිං ද්වෙ සහස්සානි භික්ඛුතො"** යනු වෙන් ගොපක මෝග්ගල්ලාන බමුණාගේ ප්‍රශ්නයකට පිළිතුරු දීම් වශයෙන් අනඳ හිමියෝ වදාළහ. බුදුන් වහන්සේගෙන් දෙඅසූදහසක් හා භික්ෂූන්ගෙන් දෙදහසක් ධර්මස්කන්ධ ධාරණය කොට ගත් බව එහි අදහස යි. මෙයින් දෙසාළිස් දහසක් අභිධර්ම පිටකයේ ද විනය සූත්‍රාන්ත දෙක්හි එක්විසි දහස බැගින් ද ඇතුළත් වන බව කියති. කුමක් හෙයින් මෙසේ දෙශිතද? පර්‍ය්‍යාප්තිය මෙතෙක් ම ද? වර්තමානයේ ත්‍රිපිටක පාලියෙහි මේ සියල්ල සම්පූර්ණ ව පවත්නේ ද? යනු මෙහි දී සොයා බැලිය යුතු යි.

අනඳ හිමියන්ගේ යථොක්ත ප්‍රකාශයෙන් එවකට ත්‍රිපිටක පාලිය සම්පූර්ණ ව පැවැති බව හැඟේ. කෙසේ නමුත් පශ්චිම බුද්ධ වචනයෙන් ශ්‍රීමුඛදේශනාව වූ ධර්මස්කන්ධ දෙ අසූ දහස සම්පූර්ණ ව පැවති බවට සැකයෙක් නැති. එයින් පසු ශ්‍රීමුඛපාලියක් නො වූ හෙයිනි. ශ්‍රාවක භාෂිතය වූ ධර්මස්කන්ධ දෙදහසත් සම්පූර්ණ ව පැවති බව ගැහෙයි. එහෙත් පළමුවන දෙවන තුන්වන සඞ්ගායනා වලින්ද පෙළට එක් කළ බොහෝ ධර්ම ප්‍රදේශයෝ ඇත්තාහ. එහෙයින් මෙ කී ප්‍රමාණය සම්පූර්ණ වූයේ තුන්වන සඞ්ගායනා වෙන් බව හා ඒ සඞ්ගායනා වලින් ඇතුළත් විය හැකි දූයත් සමග එසේ ප්‍රකාශ කළ බව ද සිතිය යුතුයි.

පයසීපත්‍ය මෙ පමණක් නො වේ. පන්සාළිස් වර්‍ෂයක් මුළුල්ලෙහි වදළ තවත් බොහෝ බුද්ධ භාෂිත ඇතිවිය හැකිය. ප්‍රකීර්ණක වශයෙන් වදළ දූය පෙළට නො නැගුන බව ද ප්‍රථම ධර්මසඞ්ග්‍රාහක තෙරුන් විසින් මහ අටුවාවේ සුදුසු පරිදි සංග්‍රහ කළ බවද කියන ලදී. තවද සූත්‍රාන්ත වශයෙන් වදළ ඇතැම් බුද්ධවචන එක ම සඞ්ගායනාවකට වත් ඇතුළත් නො කළ බව පෙණේ.

**රාජෝවාද සූත්‍ර, තික්ඛින්ද්‍රිය, චතුපරිවත්ත, නන්දොපනන්ද දමන, අපලාල දමන, කුළුම්පසූත්‍ර, මග්ගකථාදි ධර්ම හා සීලූපදෙස ධුතඞ්ග, පඤ්ඤාආරම්මණ කථා, බුද්ධ කාරණ, ඤාණ වත්‍ථු, අසුභකථාදිය ද** බුද්ධ වචන නමුත් මහා සඞ්ගායනා තුණට ම නොනැගුන බව කඞ්ඛාවිතරණියෙහි (මුද්‍රිත 84 පිට) හා විනයත්‍ථ මඤ්ජූසාවෙහි ද (මුද්‍රිත193 පිට) කියති. කුමක් හෙයින් මෙතරම් බුද්ධ භාෂිත රැශියක් එක සඞ්ගායනාවකට වත් ඇතුළත් නො කොට බැහැර කරණලද ද? යනු අප්‍රකාශ යි. සඞ්ගායනාවට නො නැගීම නිසා ඒ ධර්මයෝ අභාවයට ගියහ. ශෙෂ ව පවත්නේ ඔවුන් ගේ නම් හා කිසි යම් පාඨයෙක් පමණෙකි.

මෙහි කී කුළුම්ප සූත්‍රයෙන් ශෙෂ වූ පාඨයක් මෙසේ යි; **"පුනචපරං භික්ඛවෙ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ඉද්ධිමා චෙතොවසිප්පත්තො අඤ්ඤදීසස්ස කුච්ඡිගතං ගබ්භං පාපකෙන මනසා අනුපෙක්ඛිතා හොති අහො වතායං තං කුච්ඡිගතං ගබ්භං න සොත්ථිනා අභිනික්ඛමෙය්‍යාති, එවම්පි භික්ඛවෙ කුලුම්පස්ස උපඝාතො හොති"** (චරියාපිටකට්ඨකථා ත්‍රි:මු: 126 පිට)

මෙයින් පෙණෙනුයේ අර්ථකථාකාලය දක්වා ඒ සූත්‍රාන්ත යන්ගේ අභාවය නො වූ බවෙකි. මේ ධර්මප්‍රදෙශයන් නියම බුද්ධ භාෂිත නම්, ඇතැම් පාඨ අටුවා වලටත් ඇතුලත් කළ හැකි නම් පෙරැදූරන් විසින් මේ තරම් ධර්ම රාශියක් ආරක්‍ෂා නො කිරීම විමසිය යුතු කරුණෙකි. එසේ ම අනඳ හිමියන් ප්‍රකාශ කළ ධර්මස්කන්ධ සඞ්ඛ්‍යාව සම්පූර්ණ වන්නේ මෙකී ධර්ම ප්‍රදෙශ සමග ද යනුත් ධර්මධර උතුමන්ගේ පරීක්‍ෂණයට භාජන වේවා.

වර්තමානයෙහි ත්‍රිපිටක පාලිය සම්පූර්ණ ව පවත්නේ ද? යන්න පිළිබඳ පරීක්‍ෂණය බෙහෙවින් දුෂ්කර ය. අපට පෙණෙන පරිදි බලවත් ඌනත්වයක් තිබෙන බව කිය යුතු ය. එය පහසුවෙන් දක්ක හැක්කේ සූත්‍රාන්ත ධර්මයන්ගෙනි.

"චතුත්තිංසෙව සුත්තන්තා තිවග්ගො යස්ස සඞ්ගහො,
එස දීඝ නිකායොති පඨමො අනුලොමිකො."

යන්නෙන් දික් සඟියෙහි වර්ග තුණකින් යුත් සූත්‍ර සිවුතිසෙකැ යි කියති.

"දියඩ්ඪසතසුත්තන්තා ද්වෙ ච සුත්තානි යත්ථ සො,
නිකායො මජ්ඣිමො පඤ්ච දසවග්ගපරිග්ගහො."

යන්නෙන් මැදුම් සඟියෙහි වර්ග පසළොසකින් යුත් සූත්‍ර එක්සිය දෙපණසකැ යි කියති. මේ දෙනිකායෙහි ප්‍රමාණය ගැණ සැකයට කරුණෙක් නැත්තේ ය.

"සත්ත සුත්තසහස්සානි සත්ත සුත්තසතානි ච,
ද්වාසට්ඨිං චෙව සුත්තන්තා එසො සංයුත්තසංගහො."

යන්නෙන් සංයුත්සඟියෙහි සූත්‍ර සත් දහස් සත් සිය දෙසැටෙකැ යි කියති.

"නව සුත්තසහස්සානි පඤ්ච සුත්තසතානි ච,
සත්තපඤ්ඤාසසුත්තානි සඞ්ඛා අඞ්ගුත්තරෙ අයං."

යන්නෙන් අඞ්ගුත්තර සඟියෙහි සූත්‍ර නවදහස් පන්සිය සත් පණසෙකැ යි කියති.

"බුද්ධපාඨො ධම්මපදං" යනාදීන් කුදුගත් සඟියෙහි බුද්ධපාඨාදි ධර්ම ග්‍රන්ථ පසළොසකැ යි කියති. අපට හැඟෙන පරිදි ඌනත්වය පෙණෙනුයේ මේ නිකායත්‍රයේ ය. කුදුගත් සඟියට වත්

ඇතුළත් විය යුතු ය යි කියහැකි ඇතැම් ධම්මදෙශනාවන්ගේ අවිද්‍යමානත්වය වඩාත් සැකයට කරුණු වූවකි. සැරියුත් හිමියන්ගේ පරිනිර්වාණය ගැණ:-

"උසභො යථා ඡින්නවිසාණකොසො
අභෙජ්ජනෙත්තා චරති පුරන්තරෙ,
තථා අයං විචරති සාරිපුත්තො
පරිනිබ්බුතං වන්දථ සාරිපුත්තං."

යනාදි ගාථා පන් සියයක් බුදුරදුන් වදාළබව සාරත්ථප්පකාසිනියෙහි (ත්‍රි: මූ: තෘතීය භාග 180 පිට) කියති. එසේ ම බ්‍රාහ්මණ සංයුත්තක වණ්ණනාවෙහි (ත්‍රි: මූ: 176 පිට) ධනඤ්ජානි බැමිණිය:-

"සචෙ මෙ අඞ්ගමඞ්ගානි කාමං ඡෙජ්ජසි බ්‍රාහ්මණ,
නෙවාහං විරමිස්සාමි බුද්ධසෙට්ඨස්ස සාසනෙ.
තාහං ඔක්කාවරධරා සක්කා රොධයිතුං ජිනා,
ධීතාහං බුද්ධසෙට්ඨස්ස ජිඥ වා මං පචස්සු වා."

යනාදීන් ධනඤ්ජානිගජ්ජිත නම් ගාථා පන්සියයක් කී බව කියති. තවද අනාගාමී ද්‍රෝණ බමුණා දෙලොස් දහසක් පදයෙන් බුදුන්ගේ ගුණවතා "ද්‍රෝණ ගර්ජිනා" නම් ගර්ජිනාවක් කෙළේ තථාගත පරිනිර්වාණයෙන් පසු ධාතු බෙදීමේ දී අර ගල කළ මල්ල රජදරුවන් මැද:-

"සුණන්තු භොන්තො මම එකවාක්‍යං
අම්හාකං බුද්ධො අහු ඛන්තිවාදො,
න සාධු යං උත්තම පුග්ගලස්ස
සරීරභඞ්ග සියා සම්පහාරො".

යනාදි ගාථා සියයක් කීබව ද කියති. මේ ආදිය පෙළට ඇතුළත් විය යුතු ය. තුන්වන සඞ්ගායනා කාලයේ සිටි තෙරවරුන්ගේ ගාථා සහ තාම්‍රපර්ණික තෙරවරුන්ගේ ගාථාත් පෙළට ඇතුළත් කළහැකි නම් සුත්‍රනිපාතාදියට වත් මේ ගාථා ඇතුළත් නො කිරීමට හේතුවක් නො පෙණේ. විශෙෂයෙන් මුලින් කී බුද්ධභාෂිත ගාථා හා ධනඤ්ජානිද්‍රෝණ ගර්ජිත දෙකත් සංග්‍රහ කළ යුතු ම ය. එහෙත් පෙළෙහි සඞ්ග්‍රහ වූ තැනෙක් තවමත් අපටහමු නො වී ය. පෙළෙහි තබා අටුවාවක වත් සම්පූර්ණයෙන් සඳහන් කළ තැනෙක් අප විසින් නො දක්නාලදී. මේ දහම්කොටස් යථෝක්තධර්මස්කන්ධ සංඛ්‍යාවට අයත් නො විය හැකි ද? යනු සෙවිය යුතු යි.

එපමණක් නො එක් සඟියක දක්වෙන සූත්‍රයෝ තවත් සඟිවල පෙණෙති. සතිපට්ඨාන සූත්‍රය දික් සඟි මැදුම් සඟි දෙක්හි ම පෙණේ. සංයුත් සඟියේ එන බොහෝ සූත්‍රයෝ අංගුත්තර සඟියේ ද එති. ඛුද්දපාඨයෙහි පෙණෙන මඞ්ගල, රතන, මෙත්තා සූත්‍රයෝ සුත්තනිපාතයෙහි ද වෙති. ධම්මපදයෙහි පෙණෙන ඇතැම් ගාථාවෝ උදානපාලියේ ද වෙති. සුත්තනිපාතයේ පෙණෙන ඇතැම් සූත්‍රයෝ මැදුම් සඟියේ ද වෙති. ථෙරගාථාවන්හි පෙණෙන ඇතැම් ගාථාවෝ අපදානයේ ද වෙති. චරියාපිටකයේ එන ගාථාවෝ ජාතක පාලියේ ද වෙති. මෙසේ එකිනෙකනිකායෙහි සමාන ව පෙණෙන ධර්ම වෙන්වෙන් වශයෙන් ගෙණ බැලූවත් ධර්මස්කන්ධ සඞ්ඛ්‍යාව සම්පූර්ණ නොවනසේ පැණේ.

එක් සඟියකට අයත් සූත්‍ර තවත් සඟියකට ඇතුළත් කරණලද්දේ දෙශනා කළ අවස්ථා සැලකීමෙනැ යි සමහරු කියති. එසේ නම් අන් සඟියක නො ව ඒ සඟියේ ම දක්විය යුතු ය. ඒ ඒ ධර්ම එක් එක් සඟියකට යොදන ලද්දේ වෙන් වෙන් ලකුණු සැලකීමෙනි. කිසි යම් ලක්ෂණයක් සලකා අඞ්ගුත්තර සඟියට ඇතුළත් කළ සූත්‍රයක් තවත් ලක්ෂණයක් හෝ හේතුවක් සලකා සංයුත් සඟියෙහි ද සංග්‍රහ කළ හැකි යි. එසේ කිරීම නිසා මෙසේ සමාන සූත්‍ර එකිනෙකෙහි ඇති වී ය යනු අපගේ හැඟීම යි.

කුදුගත් සඟිය පූර්වයෙහි පටන් මත භෙදයට භාජන වූවකි. දීඝ භාණකයෝ එය අභිධම්ම පිටකයට අයත් වෙති යි කියති. මජ්ඣිමභාණකයෝ සූත්‍ර පිටකයට ය යි කියති. අපදාන බුද්ධවංස චරියාපිටක පාලිප්‍රදෙශයන් කුදුගත් සඟියට තබා සූත්‍රපිටකයෙහි කොතැනකට වත් ඇතුළත් වන බවක් දීඝභාණකයෝ නො කියති. වෙන ඇතුළත් වන තැනකුදු නො දක්වති. විනයාභිධර්මපිටකයන්හිත් සංග්‍රහ විය නො හැකි බැවින් ඔවුන්ගේ මතය පරිදි ඒ ධර්ම ඇතුළත් කළ හැකි තැනක් නොමැති බැවින් ත්‍රිපිටක පාලියෙන් බැහැර ලිය යුතු වෙයි. කුදුගත් සඟියට ග්‍රන්ථ පසළොසක් අයත් වෙති යි කියන ලද්දේ එක් ආචාර්‍ය්‍ය මතයක් පරිදි ය.

“ඨපෙත්වා චතුරොපෙතෙ නිකායෙ දීඝමාදිකෙ,
තදඤ්ඤං බුද්ධවචනං නිකායො ඛුද්දකො මතො.”

යනුවෙන් දීඝනිකායාදී සතර හැර සෙසු සියලු බුද්ධ වචන ඛුද්දක නිකායේ සංග්‍රහ වෙති යි කියන ලද හෙයින් නෙත්තිප්පකරණාදිය ද ඊට ම අයත් වේ යි. පෙටකොපදෙසය හා තදට්ඨකථාවන් ගැණ නෙත්තිප්පකරණාදි අට්ඨකථාවන්හි කියන නමුත් එබන්දක් තව ම අප ඇස් ගැමූ නො වී ය.

නිද්දෙසපාලිය සුත්තනිපාතයෙන් ගත් සූත්‍ර කීපයකට අර්ථකථාස්වරූපයෙන් කළ විවරණයෙකි. පටිසම්භිදාමග්ගපාලිය ද එසේ යි. මේ දෙක ම සැරියුත් හිමියන්ගේ භාෂිතයෝ ය. කුදුගත් සඟියට අයත් ය යි සලකන නෙත්තිප්පකරණ පාලිය මහාශ්‍රාවක මහා කාත්‍යායන හිමියන් විසින් සද්ධර්ම නිරුක්ති ක්‍රම දැක්වීම් වශයෙන් කළ ග්‍රන්ථයෙකි. පෙටකොපදෙසය ද ඒ සඳහා ම උන්වහන්සේ විසින් කරණ ලද්ද යි කියති. පිටකයන්ගේ වර්ණනා ක්‍රම දැක්වීම සඳහා කළ හෙයින් පෙටකොපදෙසය යි කියන බව විමතිවිනොදනියෙහි පෙණේ.

පටිසම්භිදනෙත්තිප්පකරණාදිය අර්ථකථාස්වරූපයෙන් නො තබා පෙළට එක් කිරීමට ඇති හේතු නො පැහැදිලි ය. කුදුගත් සඟිය පිළිබඳ මේ කාරුණු හා මතභෙදයෝ විශාරද ධර්මධරයන්ගේ කල්පනාවට භාජන විය යුත්තාහු වෙති.

## අර්ථකථානිෂ්පාදනය.

ත්‍රිපිටක පර්‍ය්‍යාප්තිය වනාහි නානා නයින් විචිත්‍ර ය. ඉතා ගැඹුරු ය. රාගාදි රජසින් යුක්ත වූවන් විසින් අවබෝධය දුෂ්කර තර ය. බුදුරදුන් වහන්සේ බුද්ධත්වය ලබා සිවුවන සතියේ හා පස්වන සතියේත් සම්මර්ශනය කළ ධර්මය ලොකයාට දෙශනා කරණ පිණිස අටවන සතියේ දී මනෞත්සාහය හැඟවූයේ ද එහෙයිනි. සකෙලශීන්ට තබා නිකෙලශී උතුමන්ට පවා පහසුවෙන් අවබෝධ කළ නො හැකි ගම්භීරස්ථානයෝ ප්‍රවචනයෙහි ඇත්තාහ.

එක් ධර්මපෘච්ඡාවස්ථාවෙක්හි දී බුදුරදුන් වහන්නෝසේ විචාල ප්‍රශ්නයක් ධර්ම සේනාපති අග්‍රශ්‍රාවක සැරියුත් හිමියන් වහන්සේටත් විසඳනු නො හැකි ව **"භූතමිදං සාරිපුත්ත"** යනාදීන් බුදුරජනන් වහන්සේ ම දුන්, න්‍යායක්‍රමයෙහි පිහිටා සිට ගෙණ විසඳූ බව කියන ලදි. එසේ ම ශික්‍ෂාප්‍රඥප්තියට සුදුසු කාල මාත්‍රය පවා සැරියුත් හිමියන්වැනි උතුමන් විසිනුත් දුර්විඥෙය හෙයින් විනය පිටකාදි පර්‍ය්‍යාප්තිය හුදෙක් බුදුන් වහන්සේට ම විෂය වූවක් බව සාරත්ථදීපනියෙහි කියන ලදි. මෙහි මැනවින් තෙරපත් වූවෝ සම්බුදුවරයෝයි. පසේ බුදු වරයන්ටත් එබඳු විසද බවක් නො මැති යි. ඇත්තේ නම් එතුමන් වහන්සේටත් සර්වඥ ය යි කිය යුතු ය. පර්‍ය්‍යාප්තිය එතරම් ගැඹුරු ය. එතරම් නිපුණ ය.

එහෙයින් පශ්චිම ජනතාව සඳහා සම්බුද්ධපරිනිර්වාණයෙන් පසු අර්ථකථා නිෂ්පාදනය කළහ. අර්ථකථා වූව මනා කොළේ ත්‍රිපිටක පාලියේ සංක්ෂිප්ත ස්ථාන විස්තර කරණු පිණිස හා ග්‍රන්ථි ස්ථාන හෙළි කරණු පිණිසත් ය. එසේ කිරීමට ක්‍රම සතරක් පර්යාප්ති යෙහි ම එයි. සුත්ත, සුත්තානු ලොම, ආචරියවාද, අත්තනොමති යනු ඒ සතරයි.

**“පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානු යුඤ්ජිතබ්බං. කතමෙහි පඤ්චහි? සුත්තං න ජානාති, සුත්තානු ලොමං න ජානාති.”** උපාලිය, අඞ්ග පසකින් යුත් මහණහු විසින් අනුයොග නො කළ යුතු ය. කවර පසකින් දැ?යත්; සූත්‍රය නො දනී සූත්‍රානුලොමය නො දනී යනාදි පසිති. මෙසේ සූත්‍ර සූත්‍රානු ලොම දෙක ද, **“අනාපත්ති; එවං අම්හාකං ආචරියානං උග්ගහො පරිපුච්ඡාති භණන්ති”** අපගේ ආචාර්යයන්ගේ උද්ග්‍රහණ පරි පුච්ඡාවන් මෙසේ ය; ඇවැත් නැත්තේ ය- යනාදීන් ආචාර්ය වාදය ද **“අනාපත්ති ආවුසො සුපිනන්තෙන”** ඇවත, සිහිනෙන් (වන මොචනයෙන්) ඇවැත් නැත්තේ ය- යනාදීන් අත්තනො මතිය ද පෙළෙහි ම **දක්**වෙති. ත්‍රිපිටකාර්ථ වර්ණනය කළ යුත්තේ මේ සතර ක්‍රමයට අනු ව ය.

මෙහි සූත්‍ර නම් ත්‍රිවිධ සඞ්ගායනාවට නැගුනු පිටකත්‍රය යි. සියලු විනයපිටකය ය යි විනයාර්ථ වර්ණනාවෙහි වෙසෙසා කියන ලදී. සූත්‍රානුලොම නම් අනුලොම් කැපය යි; හෙවත් සතර මහා ප්‍රදෙශයෝ යි. ආචාර්යවාද නම් අර්ථකථා යි හෙවත් ධර්ම සංග්‍රාහක පන්සියයක් රහතන් විසින් තබන ලද පාලියෙන් තොර වූ බැස ගත් විනිශ්චයෙන් පැවැත්තාවූ අටුවා පාලිය යි. අත්තනොමති නම් ක්‍රම අනු ව බුද්ධියට අනු ව සැලකීමෙන් වූ තමන්ගේ වැටහීම යි. හෙවත් සූත්‍ර සූත්‍රානුලොම ආචාර්යවාදයන් හැර අනුමානයෙන් තමන්ගේ බුද්ධියට අනු ව ක්‍රම සැලකීමෙන් වැටහෙන අයුරු කීම යි. තවද සූත්‍රාභිධර්මවිනයාර්ථ කථාවන්හි ආ සියලු ථෙර වාදය අත්තනොමති නම් වෙයි.

මෙයින් අත්තනොමතිය සර්ව දුර්වල ය. එයට වඩා ආචාර්ය වාදය බලවත් වෙයි. එයටත් වඩා සූත්‍රානුලොමය ද සියල්ලට ම වඩා සූත්‍රය ද බලවත් වෙයි. ආචාර්යවාදයට සම නොවන කල අත්ත නොමතිය බැහැර කළ යුතු ය. සූත්‍රානුලොමයට නො ගැළපෙන කල ආචාර්ය වාදය ද සූත්‍රයට සම නො වන කල සූත්‍රානුලොමය ද ඉවත ලිය යුතු ය. සූත්‍රයෙහි බැහැර කිරීමෙක් නැත්තේ ය.

මේ වනාහි සුමඞ්ගල විලාසිනී මහාපරිනිබ්බාණ සූත්‍රවර්ණනාවෙහි හා සමන්තපාසාදිකා පඨමපාරාජික වර්ණනාවෙහිත් එන විස්තරයෙකි. ඒ වූ පරිද්දි සූත්‍රයෙහි බැහැර කළ යුතු දෑයක් නොමැති බව පැහැදිලි ය. බුද්ධභාෂිත හෙයිනි. සූත්‍රානුලොමයෙන් ධර්ම විනය තෝරා ගැනීමේ ක්‍රමය මිස අන් කිසි බුද්ධවචනයක් නැති. ආචාර්යවාද අත්තනොමති දෙක එසේ නො වෙයි. එහි බැහැර කළ යුතු දෑ ඇති විය හැකි ය.

සූත්‍රයට ආහච්චපද ය යි ද, සූත්‍රානුලොමයට රස ය යි ද, ආචාර්යවාදයට ආචරියවංස ය යි ද, අත්තනොමතියට අභිප්‍රාය යයි ද නාගසේන හිමියෝ ප්‍රකාශ කළහ. සූත්‍රනාමයෙන් සූත්‍රපිටකය ම ප්‍රකට වුව ද **"සකවාදෙ පඤ්ච සුත්තසතානි"** යනාදිය කථාවත්ථුප්පකරණයෙහි කියන ලද හෙයින් අභිධර්ම පිටකය ද **"එත්තකං තස්ස භගවතො සුත්තාගතං සුත්තපරියාපන්නං"** යනාදි මාතෘකාපාලිපාඨයෙන් හා **"සාවත්ථියා සුත්තවිභඞ්ගෙ"** යනාදි පරිවාරපාලිපාඨයෙනුත් විනය පිටකය ද කියනලද බැවින් ත්‍රිපිටක පාලිය ම මෙහි දී ගත්හ. **සුත්තං නාම තිස්සො සඞ්ගීතියො ආරුළ්හානි තීණි පිටකානි"** සූත්‍ර නම් සඞ්ගීති තුණට නැගුනු ත්‍රිපිටක පාලිය යි නෙත්තිප්පකරණ අටුවායෙහි (ත්‍රි: මු 69 පිට) කියේ එහෙයිනි.

සූත්‍රානුලොම ය යි දක්වූ සතර මහාපදෙසය ස්කන්ධක සූත්‍රාන්ත වශයෙන් දෙපරිදි ය.

1. මහණෙනි මෙය අකැප ය යි යමක් මා විසින් ප්‍රතික්‍ෂෙප නො කරණ ලද ද, අකැපයට අනුලොම් වේ ද, කැප බව වළකා ද, එය තොපට කැප නො වන්නේ ය.

2. මේ දෙය අකැප ය යි මා විසින් යමක් ප්‍රතික්‍ෂෙප නො කරණ ලද ද, එය කැපයට අනුලොම් වේ ද, අකැප බව වළකා ද, එය තොපට කැප වන්නේ ය.

3. මෙය කැප ය යි යමක් මා විසින් අනු නො දන්නා ලද ද, අකැපයට අනුලොම් වේ ද, කැපබව වළකා ද, එය තොපට කැප වන්නේ ය.

4. මෙය කැප ය යි යමක් මා විසින් අනු නො දන්නා ලද ද, කැපයටත් අනුලොම් වේ ද, අකැප බව වළකා ද, එය තොපට කැප වන්නේ ය.

මොවුහු ඛන්ධක සතර මහාපදෙසයෝ යි.

1. බුදුන් වහන්සේගෙන් ම අසන ලදී. උන්වහන්සේගේ සමීප යෙන් ම පිළිගන්නා ලදී.

2. අසවල් වෙහෙර සඞ්ඝ තෙමේ මහාස්ථවිර ය; ගණ නායක ය; උන්වහන්සේගෙන් අසන ලදී පිළිගන්නා ලදී.

3. අසවල් වෙහෙර දූත උගත් භික්ෂූන්ගෙන් ම අසන ලදී. පිළිගන්නා ලදී.

4. අසවල් වෙහෙර දූත උගත් උන්නාන්සේගෙන් ම අසන ලදී. පිළිගන්නා ලදී.

යන මොවුහු සූත්‍රාන්ත සතර මහාපදෙසයෝ යි.

මෙහි පළමුවැන්නෙන් බුදුරදුන්ගෙන් ඇසීම ද, දෙවැන්නෙන් සතර නමේ පටන් ඉහළ සඞ්ඝයාගෙන් ඇසීම ද, තුන්වැන්නෙන් දෙතුන් නමකගෙන් ඇසීම ද, සිවුවැන්නෙන් එක භික්ෂු නමක ගෙන් ඇසීම ද කියනලදී.

විනයවිනිශ්චයක දී ඛන්ධක සතර මහාපදෙසයත් ධර්ම විනිශ්චයක දී සූත්‍රාන්ත සතර මහාපදෙසයත් ප්‍රමාණ කොට ගත යුතු ය යි කියති. ආචාර්යවාද යන්නෙන් මුඛ්‍ය වශයෙන් මූල් මහ අටුවාව ද අමුඛ්‍ය වශයෙන් තදනුගත සියලු අර්ථකථා වර්ණිත යෝද ගැණෙති. අත්තනොමතියෙන් තත්තත්කාලීන ආගම ධාරී තෙරවරුන්ගේ වෙන් වෙන් මත හෙද ගණිති. හැම අටුවා වක් ම සූත්‍රාදි මේ සතර හෙදයට අනු ව කළ අර්ථවර්ණනයෙන් යුතු ව පවත්නේ ය.

## අටුවාවෝ නම් කවරහු ද?.

මේ වනාහි ග්‍රන්ථාන්තරයන්හි එකිනෙකට වෙනස් විවෙචනයන් ගෙන් ආකුල වූ වියතුන්ට පවා සෘජු ව පිළිතුරු දෙනු නො හැකි ප්‍රශ්නයෙකි. එහෙයින් ඒ සඳහා කරණ පරීක්ෂණය බලවත් පරිශ්‍රම යකින් කළ යුතු බව කිය යුතු නො වේ. **"තත්ථ තත්ථ පවත්තිත පකිණ්ණකදෙසනායෙව හි අට්ඨකථා."** ඒ ඒ තන්හි දී භාග්‍ය වතුන් වහන්සේ විසින් පවත්වන ලද ප්‍රකීර්ණක දෙශනාව ම අර්

කථා නම් වන්නී ය- යනු සාරත්ථදීපනියෙහි එන විස්තරයෙකි. මේ හැර ප්‍රකීර්ණක දෙශනාව ම අටුවා ය යි ඉදුරා ප්‍රකාශ කළ අටුවා පාඨයෙක් නැත්තේ ය.

මේ පාඨයෙන් තත්කාලීනාචාර්යයන් බැස ගත් නිගමනයෙන් අටුවා නම් ප්‍රකීර්ණක දෙශනාව ම මිස අන් කිසිවක් නො වන බව පහැදිලි ය. **"න හි භගවතා අබ්‍යාකතං නාම තන්තිපදං අත්ථි, සබ්බෙසංයෙව අත්ථො කථිතො සම්මාසම්බුද්ධෙනෙව තිණ්ණං පිටකානං අත්ථවණ්ණනාක්කමොපි භාසිතොති දට්ඨබ්බං."** භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදළ පාලි පදයෙක් නම් නැති. සියලු පදයන්ගේ අර්ථය දෙසන ලද්දේ ය. සම්බුදුන් වහන්සේ විසින් ම ත්‍රිපිටකාර්ථවර්ණනාව ද දෙසන ලද්දේ ය යි දත යුතු ය යනු ද එහි ම කියන ලද්දේත් එහෙයිනි. මෙහි දී ප්‍රකීර්ණකදෙශනාව නම් කුමක් දැ යි සෙවිය යුතු ව තිබේ.

**"ධම්මකථා නාම සන්ථාගාරඅනුමොදනාපටිසංයුත්තා පකිණ්ණකකථා වෙදිතබ්බා."** දහැම් කථා නම් සන්ථාගාර අනුමොදනා ප්‍රතිසංයුක්ත ප්‍රකීර්ණක කථා ය යි දත යුතු ය- යනු සාරත්ථප්පකාසිනියෙහි (ත්‍රි: මු: තෘතීය භාග 67 පිට) දක්වෙන ප්‍රකීර්ණක දෙශනාවක් පැවැත්වූ එක් අවස්ථාවකි. කිඹුල්වත ශාක්‍යයෝ සන්ථාගාරශාලාවක් කොට මඟුල් පිණිස බුදුපාමොක් සඞ්ඝයා ලවා පළමුවෙන් පරිභොග කරවූහ. ඒ අවස්ථාවෙහි බුදුන් වහන්සේ **"සීතං උණ්හං පටිහන්ති"** යනාදි ගාථා පෙළකින් හා **"අයම්පි ආවාසෙ ආනිසංසො අයම්පි ආවාසෙ ආනිසංසොති බහුදෙව රත්තිං අතිරෙකතරං දියඩ්ඪයාමං ආවාසානිසංසකථං කථෙසි. තත්ථ ඉමා තාව සබ්බගාථා ආරුළ්හා. පකිණ්ණකධම්මදෙසනා පන සඞ්ගහං නාරොහන්ති"** මෙසේත් ආවාසයෙහි අනුසස් වෙයි, මෙසේත් ආවාසයෙහි අනුසස් වෙයි යනාදීන් රාත්‍රියෙහි යාම එක හමාරකටත් වැඩි කාලයක් ගත වන තුරු ශාක්‍යයන්ට ආවාසානිසංස වදළෝ ය. එහි **"සීතං උණ්හං පටිහන්ති"** යනාදි ගාථා පමණක් සඞ්ගායනාවට නැගුනු බව ද ප්‍රකීර්ණක වශයෙන් දෙශනා කළ ආවාසානිසංස දහැම් කථාව නො නැගෙන බව ද කියන ලදී. මේ අනුව සලකන විට ප්‍රකීර්ණක කථාව නම් බුදුරදුන් වහන්සේ ඒ ඒ අවස්ථාවන්හි දී සූත්‍රාන්ත වශයෙන් නො ව සාමාන්‍ය දහැම් කථා වශයෙන් පවත්වන ලද දෙශනා බව පැහැදිලි වන්නේ ය. මෙයින් ම අර්ථකථා යුක්ත බව සාරත්ථදීපනී මතය යි.

**“ආචරියවාදො නාම ධම්මසඞ්ගාහකෙහි පඤ්චහි අරහන්තසතෙහි ඨපිතා පාළිවිනිම්මුත්තා ඔක්කන්තිකවිනිච්ඡයප්පවත්තා අට්ඨකථා තන්ති.”** ආචාය්‍ර්‍යවාදය නම් ධර්‍මසඞ්ග්‍රාහක පන්සියයක් රහතන් විසින් තබන ලද පාලියෙන් මුක්ත වූ ඖක්කන්තික විනිශ්චයෙන් පැවැත්තාවූ අර්‍ථකථා පාලිය ය යි සමන්තපාසාදිකා පඨමපාරාජිකවණ්ණනායෙහි (මුද්‍රිත 118 පිට) විස්තර වශයෙන් ද **“ආචරියවාදො නාම අට්ඨකථා.”** ආචාය්‍ර්‍ය වාදය නම් අර්‍ථකථා ය යි සුමඞ්ගලවිලාසිනී මහාපරිනිර්‍වාණසූත්‍රවර්‍ණනා වෙහි කොටියෙන් ද කියනලදී.

මෙහි දැක්වෙන **“පාලිවිනිම්මුත්ත ඔක්කන්තිකවිනිච්ඡය”** යන දෙ පදයෙන් අර්‍ථකථා නම් කිමෙක් දැ යි පැහැදිලි වන නමුත් ප්‍රකීර්‍ණකදේශනාව ම අර්‍ථකථා ය යි නිෂ්පර්‍යායයෙන් වටහා ගත් සාරත්‍ථදීපනීකර්‍තෲපාදයෝ එය ම නුදුටුවන් ව ඇති එහෙත් එතුමන්ගේ සෙසු වර්‍ණනයන්ගෙන් ඒ පදද්වය පිළිබඳ අභිසන්ධිය ම දක්වති. **“ආචරියා වදන්ති සංවණ්ණෙන්ති පාළිං එතෙනාති ආචරියවාදො”** ආචාය්‍ර්‍යයෝ මේ ප්‍රකීර්‍ණකදේශනාහේතු වෙන් පාලිය කියත්, වර්‍ණනා කරත් නු යි ආචරියවාද නමැ යි මෙසේ එතුමෝ ආචරියවාද යන්න ද විවරණය කරති.

**අසුත්තන්තනිබද්ධං පාළිවිනිම්මුත්තං ඔක්කන්තිකධම්මදෙසනං කත්වා”** යන සමන්තපාසාදිකාපාඨයට (මුද්‍රිත 113 පිට) ටීකා කරණ විමති විනෝදනී කර්‍තෲවරයෝ:-

**“අසුත්තන්තනිබද්ධන්ති තීසු පිටකෙසු පාළිසඞ්ඛාතසුත්තන්තවසෙන අරචිතං සඞ්ගීතිකාරෙහි ච අනාරොපිතං. තෙනාහ පාළිවිනිම්මුත්තන්ති. තෙන ච අට්ඨකථාසු යථානුරූපං සඞ්ගහිතන්ති දස්සෙති. එවරූපා හි පකිණ්ණකදෙසනා අට්ඨකථාය මූලං.**

**ඔක්කන්තිකදෙසනා නාම තස්මිං තස්මිං පසඞ්ගෙ ඔතාරෙත්වා ඔතාරෙත්වා නානානයෙහි කථියමානධම්මදෙසනා.”** යනාදි විමතිවිනෝදනී පාඨ දෙකින් (මුද්‍රිත 48 පිට) ඒ දෙපදය විස්තර වෙයි. ප්‍රථමසඞ්ගීතිකාරක උතුමන් විසින් ත්‍රිපිටකපාලියට නො නැගූ හෙයින් පාලිවිනිම්මුත්ත නම් වූ ද ඒ ඒ අවසරයෙහි බහබහා නානා නයින් දෙසනු ලබන හෙයින් ඖක්කන්තික නම් වූ ද ඒ මේ ප්‍රකීර්‍ණකදේශනාව අටුවාවන්හි සුදුසු පරිදි සඞ්ග්‍රහ කළ බව හා එය අර්‍ථකථාවන්ගේ මූලය බවත් ඒ පාඨ දෙකින් දැක්වෙන අදහස ය යි කිය හැකි ය.

සාරත්‍ථදීපනීමතය නො ගැළපෙන බව දුටු විමතිවිනොදනී කතුවරයෝ අට්ඨකථා නම් ප්‍රකීර්ණකදෙශනාව ම නො ව එය මූල් කොට ඇත්තක් ය යි කිහු. එසේ කී නමුදු ගථොක්ත පදඥය ඒ හිමියන්ට ද විශද වූ බවක් නො හැඟෙයි. **"භගවතො පකිණ්ණකදෙසනාභූතා ච සුත්තානුලොමභූතා ච අට්ඨකථා. යස්මා ධම්මසඞ්ගාහකත්ථෙරෙහි පාළිවණ්ණනාක්කමෙන සඞ්ගහෙත්වා වුත්තා තස්මා ආචරියවාදොති වුත්තා."** භාග්‍යවතුන්වහන්සේගේ ප්‍රකිර්ණකදෙශනා වූ ද සූත්‍රානුලොම වූ ද අර්ථකථාව යම් හෙයකින් ධර්ම සඞ්ග්‍රාහක තෙරවරුන් විසින් පාළිය වර්ණනා කිරීම් හේතුයෙන් සඞ්ග්‍රහ කොට කියන ලද්දී ද එහෙයින් ආචරිය වාද ය යි කියන ලදී. (මුද්‍රිත 103 පිට)

මේ ඒ හිමියන් ආචරියවාද යන්න විසඳූ පරිදි ය. එහි දී අර්ථකථාව සූත්‍ර සූත්‍රානුලොම දෙකින් යුක්ත බව ද කියති.

මේ සියලු විස්තරයක් ම කරණලද්දේ මුලින් කී සමන්ත පාසාදිකා පාඨදෙක සඳහා යි. ඒ පාඨදෙකින් විස්තර කරණලද්දේ පච්චරියාදි පශ්චාත්කාලික අටුවා නො ව මූල් මහඅටුවාව බව ඒ පාඨ වලින් ම පැහැදිලි යි. අර්ථකථානාමය සර්වප්‍රකාරයෙන් යොදන ලද්දේත් එයටම ය. එය කෙසේ නිෂ්පාදිත ද යන්න ගැණ ග්‍රන්ථයන්හි පෙණෙන මත භෙද වලින් ම අපට හැඟෙන පරිදි මෙසේ යි.

ජාතක ධම්මපද උදානගාථාදි පාලි ප්‍රදෙශ පමණක් බුදුරදුන්වහන්සේ වදාළහ. ඒ පාලි ප්‍රදෙශයන්ගේ විස්තර කථාවස්තු සංගීතිකාරක මහා ක්‍ෂීණාශ්‍රවයෝ ගළපා දූහ. එසේ ගළපා ලීමට බුදුන්වහන්සේ ම තන්හි තන්හි දී වදාළ දහැම් කථා නම් වූ ප්‍රකිර්ණක දෙශනාපාඨයෝ පිළිසරණ වූහ. ඒ දෙශනාපාඨානුසාරයෙන් ම ග්‍රන්ථස්ථාන හෙළි කළහ. විස්තරවර්ණනා ද කළහ. එසේ කළ කථාවස්තු හා විස්තර වර්ණනා පෙළෙහි නො ආහ. සූත්‍රාන්ත වශයෙන් පාලියට නො නැගුනහ. එහෙයින් පාලිවිනිමුක්ත ය යි කියන ලදහ. ප්‍රකීර්ණක දෙශනානුසාරයෙන් එය ම ගැබ් කොට බැස ගත් විනිශ්චයෙන් කළ හෙයින් ඔක්කන්තික විනිශ්චයෙන් පැවැත්තාහ යි කියන ලදහ.

බුද්ධමතාවලම්බි සඞ්ගීතිකාරක උතුමන් කළ හෙයින් තදර්ථ කථාවට ආචාර්ය්‍ය වාදය යි කියන ලදි. ආචාර්ය්‍යවාදය සූත්‍රානුලොමයන්ට සම නො වන කල බැහැර ලිය යුතු ය යි කීයේ ද එහෙයිනි. හුදෙක් ප්‍රකිර්ණදෙශනාව ම නම් බැහැර ලිය යුතු දැයෙක්

නො ලැබේ. ප්‍රකීර්ණකවශයෙන් නමුත් බුදුරදුන් විසින් බැහැර ලිය යුතු දෑයක් නො වදාරණ හෙයිනි. ත්‍රිපිටක පාලිය මෙන් ගරු කළයුතු වූ මහ අටුවාවේ ද ලේඛකයන්ගේ ප්‍රමාදයෙන් වූ කිසිවක් මිස බැහැර ලිය යුතු දෑයෙක් නො වී ය. පශ්චාත්කාලික පච්චරියාදි අටුවා ඒ අනුසාරයෙන් එය ම ගරු තන්හි තබා ලියන ලද නමුත් තදර්ථවර්ණනාවන්හි බැහැර ලිය යුතු දෑ වූහ. කුමක් හෙයින් ද? යත්:– තදර්ථවර්ණනා පුළුල් කිරීමට හා අතිරේක විස්තර දැක්වීම පිණිසත් බැහැරින් බොහෝ කරුණු එක් කිරීමෙ දී සූත්‍රාදියට සම නො වන කිසිවක් ප්‍රමාදයෙන් පතිත වූ හෙයිනි.

එපමණක් නො ව දම්රදුන් වහන්සේ කිසි පිටෙක වත් නො වදළ දෑය ද ආචාර්‍ය්‍යවරයන් විසින් ස්වකීය අර්ථකථාවන්හි සඞ්ග්‍රහ කරණ ලදී. එසේ සඞ්ග්‍රහ කළ නානාවිධ ප්‍රවෘත්ති අතුරෙහි අභූත හෝ අද්භූත හේතු සාධක උපමා කථා ද අටුවා වලින් දක්ක හැකි ය. මේ එක් නිදර්ශනයෙකි.

එක් ගම් වැසි මහල්ලකු සුරා සැලෙක රහ බොනු දුටු ධූර්තයෝ ඔහු පිය තනතුරේ තබා ගෙණ රහ බොන්නාහු ප්‍රයෝගයෙන් ඔහු ගේ ඇඳුම් හා ආභරණත් පැහැර ගණු කැමැති ව කතිකා කළාහු ය. "අපි එක්එක්කෙනා කථා කියමු. යමකු එය බොරු ය යි කියතොත් නැත් නම් නො අදහතොත් ඔහු දාසයකු කොට ඔහු සතු වස්තුව ගණිමුය යි නිශ්චය කොට නුඹත් කැමැති දෑ යි මහල්ලා ගෙන් ඇසූහ. එසේයයි කීකල එක් ධූර්තයෙක් මෙසේ කී ය.

පින්වත්නි! මවගේ බඩේ මා සිටිය දී මවට දිවුල් කෑමට දොළෙක් වී ය. ඕතොමෝ දිවුල් ගෙණෙන අනිකකු නැති බැවින් මා ම පිටත් කළා ය. මම ගොස් ගසට නැගෙන්නට හිණක් නැති බැවින් තෙමේ ම තමා පා ගෙණ මුගුරක් සේ ගසට වීසි කර ගතිමි. ගසේ අත්තෙන් අත්තට ගොස් ගෙඩි කඩා බසින්නට නො හැක්කෙම් ගෙට ගොස් හිණක් ගෙණවුත් ගසින් බැස මවට දිවුල් දිනිමි. එයින් එක් ගෙඩියක් මහ සැළියක් පමණ වී ය. මගේ මව එක තැන සිට එයින් සැටක් ම කෑවා ය මා එක ඔංඩොක්කුවෙන් ගෙණා ඒ ගෙඩිවලින් සෙසු ඒවා කුලසියයක් ඇති ගමෙක සියලු කුඩා මහලු අය කෑවාහ. එයින් අවසන් නො වූ ඉතිරි කොටස දෙළොස්රියන් අපේ ගෙයි සියලු බඩු බැහැර කොට පියස්ස දක්වා පිරවීමි. එයිනුදු අවසන් නො වූයෙන් මිදූලේ ගොඩක් කෙළෙමි. එය අසූරියනක් පමණ උස් පර්වතයක් මෙන් විශාල ගොඩක් වී ය යි කීය.

මෙසේ ඔවුනොවුන් කථා කී පසු ඒ සියල්ල අසා සිටි මහල්ලා ද "දරුවෙනි, රට විශාල නිසා මොවුහු නො ඇදහිය හැක්කාහු නෙවෙති. එසේ නමුත් මම ද කථාවක් කියමි. දරුවෙනි, අපේ පවුල ඉතා විශාල පොහොසත් එකකි. කෙත්වත්වලින් ඉතා විශාල එක කපු කෙත ය. එය කිරි ලක්ෂ ගණන් විශාල වූවකි. ඒ මැද අසූරියනක් පමණ උස් වූ මහ කපුගසෙක් වි ය. එහි අතු පසෙකි. අතු සතරෙන් ඵල නො ගත. තැගෙනහිර අත්තෙහි මහසැළක් පමණ ගෙඩියක් වි ය. එහි පලු සයෙක් වි ය. එක් එක් පලුව විශාල පුළුන් පිඩෙකි. මා රැවුල බා විලට ගොස් නහා එනවිට ඒ ඒ පුළුන් පිඩු පිපී තිබෙනු දක එකවරට ම ගත්තෙමි. ඒ පුළුන් පිඩු ශක්තිමත් දාසයෝ සදෙනෙක් වූහ මා හුදකළා බව දැන ඔහු මා හැර පලා ගියහ. මෙතෙක් සොයා නො දක්කෙමි. අද ඔවුන් දක්කෙමි ඔහු නම් තෙපි ය යි කියා එකවිට ම නැගිට ඔවුන්ගේ කෙස්වලුවලින් ගෙණ විනිශ්චයස්ථානයට ගොස් ලකුණු කියා දිවි ඇති තෙක් ඔවුන් දාසයන් කෙළේ ය. (පපංචසූදනී. ශ්‍රී. ධ. මුද්‍රිත 627 පිට.)

ප්‍රිය වුවත් මෙබඳු කථා බුදුරදුන් වහන්සේ කිසිවිටෙක වත් නො වදාරති. තවද මහපොළොව හා සාවකු අතර සිදු වූ සේ පෙණෙන මෙබඳු වූ ම උපමාකථාවක් මේ ග්‍රන්ථයේ ම (253 පිට) දක් වෙයි. මෙබඳු දෑ බුද්ධභාෂිත නො වන නමුත් මොවුන් දක්වීමට හේතු වූ මූලධර්ම බුද්ධභාෂිත වන හෙයින් පයර්‍යායයෙන් මොවු නට ද කිය යුත්තේ එසේ ම ය.

ධර්මදෙශකයෙකු හෙළ බසින් හෝ අන්‍ය දමිළාදි භාෂාවකින් හෝ වර්තමාන කාලයට අයත් වූ ධර්මානුකූල හේතු සාධක උපමා වලින් කිසියම් බණපදයක් ස්වකීය කෞශල්‍යය පරිදි නොයෙක් වර්ණනා කළත් එය බුද්ධදෙශනා ය යි කියන්නාක් මෙති. සද්ධර්මය මැනවින් සිත්වලට ගන්වනු කැමැති අර්ථකථාචාය්‍යීවරයෝ අවි රුද්ධ සේ මෙබඳු නොයෙක් උපමාකථාවලින් හා සිද්ධිවලින් ශක්ති පරිදි අටුවා පොෂණය කළහ. ධර්මරසය ප්‍රීතියෙන් හා පහසුවෙන් උරා ගැණීමට එය හේතු වන හෙයිනි.

දක්ෂ සූපකාරයෙක් භොජනයක් පිළියෙල කිරීමේ දී අනුභව යට නො ගන්නා ඇතැම් කුළු ද්‍රව්‍ය ද එයට ඇතුළත් කෙරෙයි. අනු භව කරණ තැනැත්තේ කුරුඳු පොතු ආදි ඒ කුළු ද්‍රව්‍ය බැහැර ලා එයින් ලත් රසය පමණක් අනුභව කෙරෙයි. එමෙන් නුවණැති තැනැත්තේ අර්ථසාධක උපමාවලින් ගතයුතු හරය පමණක් ගණී.

මෙසේ බැහැරින් ගත්තාවූ ද මෑත කාලයෙහි සිදු වූ බොහෝ ප්‍රවෘත්තිවලින් ගහන වූ ද වර්ණනා පමණක් නො ව දීඝභාණකාදී ඒ ඒ ආචාර්‍ය්‍ය පරම්පරාගත තෙරවරුන්ගේ ඇතැම් අසමාන මත භෙදයෝ ද අට්ඨකථාවන්හි විරල නො වෙති. බොහෝ ථෙරවාද වලින් සැලකියයුතු කීපයක් මෙසේ යි.

**පඤ්චවර්ගීය භික්ෂූහු:**-සිද්ධාර්ථ කුමාරයන්ගේ ලක්ෂණ පරීක්ෂා කළ රාම, ධජ, ලක්ඛණ, මන්ති, යඤ්ඤ, භොජ, සුයාම, සුදත්ත යන බමුණන් අටදෙනාගෙන් තිදෙනෙක් "බුදු හෝ වන්නේ ය, සක්විති හෝ වන්නේ ය" යි මතදෙකක් ප්‍රකාශ කළහ. පස්දෙනෙක් "මේ මහා පුරුෂයා ගිහිගෙයි නො වසන්නේ ය. එකාන්තයෙන් බුදු වන්නේ ය" යි ප්‍රකාශ කළහ. ඒ පස් දෙන එසේ ප්‍රකාශ කොට විතර්ක රහිත ව ම බෝසතුන් උදෙසා මහණපැවිද්දට පැමිණියාහු ය. අඤ්ඤ කොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාම, අස්සජි යන නමින් ප්‍රසිද්ධ පඤ්චවර්ගීය භික්ෂූහු නම් ඒ පස්දෙන යි. මේ එක් මතයෙකි. මෙතෙම එකාන්තයෙන් බුදු වන්නේ ය යි කී පස්දෙනා නො ව ඔවුන්ගේ දරුවෝ ය යනු දෙවන මතය යි.

මෙය නවීන මතයක් නො ව පැරණි අටුවාකරණයටත් පෙර සිට ඇති වූවකි. එහෙත් පැරණි අටුවාචාර්‍ය්‍යයන් විසින් දරුවෝ ය යන මතය ප්‍රතික්ෂෙප කරණලදී. ඒ පස්දෙනා කුඩා කල ම බොහෝ මන්ත්‍ර හදාළ බැවින් බමුණෝ ඔවුන් ආචාර්‍ය්‍ය පදවිවලට පත් කළහ. ඔහු ද "පසු ව නම් පුත්‍රදාරජටාවන් බිඳ දමා පැවිදි වන් නට නො හැක්කාහ යි ලදරු කල ම පැවිදි වූහ. "කලින් කල "පින් වත්හි, මහාපුරුෂයා මහාභිනික්ඛමනය කෙළේ දැ යි දුටුවන්ගෙන් ද විචාරති" තොපගේ මහාපුරුෂයෙක් කොහි ද? ඔහු ත්‍රිවිධ ප්‍රාසාද යන්හි තුන් වැදෑරුම් නළුවන් විසින් පිරිවරණ ලදු ව දෙවියෙකු මෙන් සැප විඳිනෝ ය "යි මිනිසුන් කී බස අසා "තව ම මහා පුරුෂයාගේ නුවණ මුහුකුරා නො ගියේ වනැ 'යි මෙසේ නාභිව වැස එහෙයින් මහබිනික්මන් කළ පසු උරුවෙල් දනව්වෙහි දී එතු මන් හා එක් වූහ. මොහු ලක්ෂණපරීක්ෂක බමුණෝ ම ය. (පපංච සූදනී-පාසරාසි සූත්‍ර වර්ණනා 386 පිට.)

**බෝසතුන්ගේ චුති චිත්තය:**-දෙව්ලොවින් චුත වන බෝස තුන් සව්ය චුතිචිත්තය නො දැන ගන්නා බව හා ප්‍රතිසන්ධිය මහා විපාක සිතින් වන බව එක් මතයෙකි. චුතිචිත්තය නො දන්නා

නමුත් චුතික්‍ෂණයෙහි චුත වෙමි යි දැන ගන්නා බව හා ප්‍රතිසන්ධිය උපෙක්‍ෂාසහගත සිතින් වන බව ත්‍රිපිටක මහාසීව තෙරුන්ගේ මතය යි. (පපංච සූදනී-අච්ඡරිය ධම්ම සූත්‍රවණ්ණනා 918 පිට.)

**ජේතවන විහාරපූජෝත්සවය:-** අනේපිඬු මහසිටු විසින් බුදුරදුන් වහන්සේ උදෙසා කරවූ ජේතවන මහා විහාර පූජෝත්සවය නව මාසයක් පැවැත්තේ ය යනු එක් මතයෙකි. පස්මසෙක යනු දෙවන මතය යි. තුන්මසෙක යනු තෙවන මතය යි. තුන් මසක් පැවැති බවට කිසිවකුගේත් විවාදයෙක් නැත්තේ ය. (මනොරථ පූරණී ත්‍රි. මූ. 208 පිට)

**ධර්ම සංගායනාවට අනඳ තිමියන්ගේ වැඩීම:-** පළමු වන ධර්ම සඞ්ගායනාවට රැස්වූ මහ තෙරුන්වහන්සේ ආනන්ද ස්ථවිරයන් වහන්සේට ආසනයක් ශෙෂ කොට තබා තමන් තමන්ට නියමිත ආසනවල වැඩ උන්හ. ඉන් කිසි කෙනෙකුන් වහන්සේ "ආනන්ද යෝ කොහි දැ?"යි විචාළ කල එබස දිව්‍යකණින් ඇසූ ආනන්ද ස්ථවිර යන් වහන්සේ තමන්වහන්සේගේ ආනුභාවය දක්වමින් පොළොව කිමිද ගෙණ වැඩ සවිය ආසනයෙහි පෙණීගියසේක යනු එක් මත යෙකි. උන්වහන්සේ වැඩියේ පොළොව කිමිද ගෙණ නො ව අහසින් ය යනු දෙවන මතය යි. මහාර්කථාචාර්ය අනුබුද්ධ බුද්ධඝොෂ ස්වාමි පාදයෝ ද එය එසේ හෝ නොසේ හෝ වේවා යි කියා නිශ්ශබ්ද වෙති. (සුමඞ්ගල විලාසිනී ත්‍රි. මූ. 8 පිට.)

**කුදුගත් සඟිය:-** අභිධර්ම පිටකයට කුදුගත් සඟිය අයත් වන්නේ ය යනු දීඝභාණක තෙරුන්වහන්සේගේ මතය යි. එය අභිධර්ම පිටකයට නො ව සූත්‍රාන්තයට අයත් වන්නේ ය යනු මජ්ඣිම භාණක තෙරුන්වහන්සේගේ මතය යි. (සුමඞ්ගල විලාසිනි ත්‍රි.මූ.11)

**ආර්ය තූෂ්ණීම්භාවය:-** සමථවිදර්ශනාවෙන් යුතු ව කථා නො කොට හිඳීම ආර්ය තූෂ්ණීම්භාවය යනු එක් මතයෙකි. වාක් සංස්කාරයට විරුද්ධ බැවින් ද්විතීයධ්‍යානය ය යනු දෙවන මතය යි. ඒ දෙක ම නො ව චතුර්ථධ්‍යානය ය යනු තෙවන මතය යි. (උදානාර්ථ කථා ත්‍රි. මූ. 73 පිට.)

**චතුපාරිශුද්ධි සීලය:-** ප්‍රාතිමොක්‍ෂ සංවර, ඉන්ද්‍රිය සංවර, ආජීව පාරිශුද්ධි, ප්‍රත්‍යයසන්නිශ්‍රිත යන සතර ම බුදුරදුන් වහන්සේ සීල නාමයෙන් දෙශනා කරණ ලද බව දීප විහාරවාසී සුම්මතෙරුන් වහන්සේගේ මතය යි. උන්වහන්සේගේ අතැවැසි ත්‍රිපිටක චූල

නාග තෙරුන් වහන්සේ ප්‍රාතිමොක්ෂ සංවරය ම සීලය බව හා සෙසු තුණ සීලනාමයෙන් දෙශනා කළ තැනක් නැතැ යි කියමින් ගුරුන් වහන්සේගේ මතය නො අනුදත්හ. බුදුගොස්හිමියෝ ද මේ සතර සීලනාමයෙන් ගණිති. (පපංචසූදනී–ආකඞ්ඛෙය්‍ය සූත්‍ර වණ්ණනා 126 පිට)

**සූකර මද්දවය:–** සූකර මද්දවය නම් ඉතා තරුණත් නො වූ ඉතා මහලුත් නො වූ දෙටු හූරෙකුගේ ප්‍රවෘත්ත මාංසය යි එක් මත යෙකි. පස්ගෝරසයෙන් පැසවන ලද මෘදු බතෙක යනු එක් මතයෙකි. චුන්දකර්මාර පුත්‍රයා විසින් බුදුරදුන් වහන්සේගේ පරිනිර්වාණය නො වේවා යි කියා පිළියෙල කොට දෙන ලද රසායන ශාස්ත්‍රයෙහි දැක්වෙන එක් රසායන විධියෙක යනු එක් මතයෙකැයි මෙසේ තුන් මතයක් සුමඞ්ගලවිලාසිනියෙහි (ත්‍රි: මු: 395 පිට) කියනලදී.

තවද මෘදු සිනිඳු මාංසය යි මහ අටුවාවේ කියන ලද ය යනු එකෙකි. හූරුමස් නො ව හූරන් විසින් මඩනා ලද හුණ ගොබය යනු එකෙකි. හූරන් විසින් මඩනා ලද පෙදෙස්හි හටගන්නා තයි හතුවර්ගයෙක යනු එකෙකි. රසායන බෙහෙතෙක යනු එකෙ කැයි සතර මතයක් උදානාර්ථකථාවෙහි (ත්‍රි: මු: 279 පිට) කියනලදී.

**නිරය පාලකයෝ:–** නිරයෙහි නරකපාලකයෝ නො වෙති. එහි උපන්නහුට අකුශලකර්මය ම කම් කටුලු කෙරෙයි යනු එක් මතයෙකි. එය එසේ නො ව මිනිස් ලොව වධ කරවන රාජ පුරුෂයන් මෙන් නිරයෙහි ද පාලකයෝ ඇත්තාහ යනු තවත් මතයෙකි. (සුමඞ්ගලවිලාසිනී ත්‍රි: මු: 586 පිට)

**තාවතිංස නාමය:–** තාවතිංස දිව්‍යලොකයට ඒ නාමය ලැබුනේ මචලග්‍රාමයෙහි දී මඝ මාණවකයන් සමග කලුරිය කොට එහි උපන් දෙව්පුතුන් තෙතිස්දෙනකුන් නිසා ය යනු එක් මත යෙකි සෙසු සක්වළවලත් තව්තිසා දෙව්ලෝ ඇති බැවින් මෙය නාමප්‍රඥප්තියක් බව බුදුගොස් හිමියෝ කියති. (සංයුක්තනිකාර්ථ වණ්ණනා–ත්‍රි: මු: 23 පිට)

**දෙවියන්ගේ කාමසේවනය:–** මිනිසුන් මෙන් දෙවියෝ ද ද්වයංද්වයසමාපත්ති වශයෙන් මෛථුන් දම් සේවනය කරති යනු එක් මතයෙකි. එසේ ද්වයංද්වය සේවනය කාරන්නෝ චාතුර්මහාරාජික තාව

තිංස දෙව්වරු පමණෙක, යාම දෙවියෝ ඔවුනොවුන් වැලඳ ගැනීම් මාත්‍රයෙන් ද තුසිත දෙවියෝ හස්තාමර්ශන මාත්‍රයෙන් ද නිම්මාණ රතී දෙවියෝ සිනාසීම් මාත්‍රයෙන් ද පරනිම්මිත දෙවියෝ බැලීම් මාත්‍රයෙන් ද කාමසෘත්‍යය සිද්ධ කරති යනු තවත් මතයෙකි. (සුමඞ්ගලවිලාසිනී-ත්‍රි: මු: 732 පිට)

**බාහිය දාරුචීරියට එහිභික්ෂුභාවය නො ලැබීමට හේතු:-** හෙතෙම කසුප් බුදුරදුන්ගේ ශාසනයෙහි මහණ දම් පුරන්නේ තම හට ලැබුනු ප්‍රත්‍යය තමන් ම පරිභොග කළ යුතුය යි කියා එක් භික්ෂුව කට එක් පාත්‍රයකින් හෝ සිවුරකින් සංග්‍රහ නො කළ නිසා එහිභික්ෂු භාවයට නො පැමිණියේ ය යනු එක් මතයෙකි හෙතෙම වනාහි බුද්ධ ශූන්‍ය ව පැවති කල්හි සොරෙක් ව දුනු ගී ගෙණ කැලයෙහි සොර කමින් ගැඩිරෙන්නේ පසේ බුදුවරයකු දැක පාසිවුරෙහි ලොබින් හියකින් විද පාසිවුරු ගත් බැවින් එහිභික්ෂුභාවයට නො පැමිණි යේ ය යනු දෙවන මතයයි. (උදානාට්ඨ කථා-ත්‍රි: මු: 66 පිට)

**සුප්පවාසාවගේ ගර්භමොචනය:-** සුප්පවාසා කොලිය දුහිතෘව සත් වස් සත් මස් සත් දිනක් මුඪ ගර්භ ව විසුවා ය. අවසානයේ දී "ප්‍රසූත වේදනාවෙන් පෙළෙන මෝ සුවපත් වේවා, නීරොගි පුත්‍රයකු ප්‍රසූත කෙරේවා "යි බුදුන් වහන්සේ වදළසේක. එකෙණෙහි ම ඕතොමෝ පුත්‍රයකු ප්‍රසූත කළා ය. ගෞතමයන්වහන්සේගේ ආශිර්වාදය නො වී නම් ඈ තවත් දුක් විඳින්නී ය යනු එක් මත යෙකි. උන්වහන්සේ එසේ වදලේ ඇයගේ කර්මය ක්ෂය වූ නිසා ය. එසේ නො වදළත් කර්මය ක්ෂය වූ හෙයින් ප්‍රසූත කළ යුතු ය යි තවත් මතයෙකි. (උදානාට්ඨ කථා-ත්‍රි: මු: 87 පිට)

**ආයුෂ්කල්පය:** බුදුරදුන් වහන්සේ "ඉදින් මම කැමැති වන් නෙම් නම් කල්පයක් අඩු ව හෝ වැඩි ව කල්පයක් ජීවත් වෙමි යි වදලේ ය. එහි කල්ප ය යි වදලේ මේ මහා භද්‍රකල්පයට ම බව මහා සීව හිමියෝ කියති. බුදුවරුන් වහන්සේලාගේ අස්ථාන ගර්ජනායෙක් නම් නැති. යම් සේ බෙලුව ගම දී උපන් මාරණාන්තික වේදනාව දසමසක් ම විෂ්කම්භණය කොට යටපත් කළ සේක් ද එසේ ම නැවතනැවත් සමාපත්තිවලට සමවැදීමෙන් දස මාසය විෂ්කම්භ නය කරමින් භද්‍රකල්පය ම වැඩ සිටින්නාහ. කුමක් හෙයින් වැඩ නො සිටියාහු ද යත්? උපාදින්නක ශරීරය දත් වැටීම් ආදි ජරා විකාරයෙන් මැඩෙයි. බුදුවරයෝ නම් දත් වැටීම් ආදි ජරාස්වභා

වයසකට නො පැමිණ ආයුෂයාගේ පස් වන කොටසෙහි දී මිනිසුන්ට ප්‍රිය මනාප කාලයේ දී ම පිරිනිවෙති. නො එසේ නම් බුද්ධානු බුද්ධ මහානුභාව ශ්‍රාවකයනුදු පිරිනිවිකල්හි හුදකලා සතුවක් මෙන් තරුණ සාමණේරයන් විසින් පිරිවරණ ලදු ව සිටිය යුතු ය. අනේ බුදුන්ගේ පිරිසක සැටි ය යි ගැරහිය යුතු බවට ද පැමිණෙන්නාහ. එබැවින් මහාභද්‍ර කල්පය ම නො සිටිති යනු ඒ හිමියන්ගේ මතය යි බුදුගොස් හිමියෝ එය නො පිළිගෙණ භද්‍රකල්පය නො ව එවකට මිනිසුන්ගේ පරමායුෂය (වසිසියය) කල්ප ශබ්දයෙන් ගතයුතු බව කියති. (සාරත්ථප්පකාසිනී–ත්‍රි: මු: තෘතීයභාග 198 පිට)

**සමාපත්තිය:**- එක් කලෙක සැරියුත් මුගලන් දෙනම වහන්සේ කපොත කන්දර නම් විහාරයක විසූහ. එහි දී අළුත කෙස් බහතලද සැරියුත් හිමියන්ගේ හිසට එක් යකෙක් ටොකු පහරක් දුනි. ඒ පහර මහාපර්වතකූටයක් වුවත් පැළී යාමට තරම් බලවත් එකෙකැ යි කියන ලදී. එකෙණෙහි ඒ හිමියන් සමාපත්තියකට සමවැද සිටි හෙයින් අනතුරෙක් නො වී ය. ඒ සමාපත්තිය ගැණ ආචාර්‍යමත තුණෙක් වෙයි. උපෙක්ෂාබ්‍රහමවිහාරසමාපත්ති ය ය යනු එකෙකි. සංඥවෙදයිතනිරොධසමාපත්තිය ය යනු එකෙකි. ආරුප්පපාදක ඵලසමාපත්තිය ය යනු එකෙකි. මේ සමාපත්ති තුණ ම ශරීරාරක්ෂණයට හේතු යි බොහෝ අය පසු ව කී සමාපත්තිය පිළිගණිති යි කියති. (උදානාර්ථකථා ත්‍රි: මු: 172 පිට)

**ථූණ බමුණුගම ප්‍රාතිහාර්යය:**–බුදුරදුන් වහන්සේ මහත් වූ භික්ෂු සඞ්ඝයා සැටූ ව මහාමණ්ඩල ජනපදයන්හි සැරිසරන්නාහු ථූණ නම් බමුණුගමට වැඩියෝ ය. එගම් වැසි බ්‍රාහමණගෘහපතීහු විරුද්ධකම් කරන්නාහු මුඩුමහණුන්ට පැන් නො දෙම්හ යි සියලු ළිං පොකුණු වැස්වූහ. බුදුන් වහන්සේ ඒ බව දැන ද බුදු බල දක්වනු පිණිස "ආනන්දය, පිපාසිතයෙමි. පැන් ගෙණෙව"යි වදළෝ. උන්වහන්සේගේ අදහස නො වැටහුනු අනඳහිමියෝ ගම්වැස්සන් කළ විප්‍රකාරය කීහ. බුදුරදුන් නැවත නැවතත් "පැන් ගෙණෙව"යි වදළ බැවින් අනඳහිමියෝ "මේ කිසියම් කරුණක් නිසා වනැ"යි තුන්වන වර පැන් ගෙණෙනු පිණිස වැඩියෝ ය. එවිට සියලු ළිං පොකුණු ඉතිරී ගලා යන මහා ජලෞඝයෙක් වී ය. ඒ මේ ප්‍රාතිහාර්යය පිළිබඳ මත තුණෙකි:– ථූණ බමුණු ගම් වැස්සන්ට භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි ප්‍රසාද ඇති වනු පිණිස ඔවුන්ට හිත කැමැති දෙවියන් විසින් කරණ ලද්දෙක යනු එක් මතයෙකි. උදපානයෙහි යට වසන නාරජු විසින් කරණ ලද්දෙක

යනු දෙවන මතය යි. මේ දෙමතය ම අහේතුක ය යි කියා බුදුරදුන්ගේ අධිෂ්ඨානයකින් වත් දෙවියන්ගේ බලයකින් වත් නො ව භාග්‍යවතුන් වහන්සේගේ පුණ්‍යානුභාවයෙන් ම වී ය යි තෙවන මතයක් ද වෙයි. (උදානාට්ඨකථා-ත්‍රි: මු: 267 පිට.)

**දබ්බ මල්ලපුත්‍ත හිමියන්ගේ පරිනිර්වාණය:**- දබ්බමල්ලපුත්‍ත හිමියෝ "මා පිරිනිවිය යුතු කාල ය"යි බුදුරදුන් වහන්සේට තමන්ගේ පරිනිර්වාණ කාලය දැන්වූහ. එසේ දන්වනලද්දේ උපවාදය නිසා ය යනු එක් මතයෙකි. තෙරුන් වහන්සේ ජරා දුර්වල කමක් වත් ගිලන් කමක් වත් නැති ව පිරිනිවන් පාන්නට අසන ලද්දේ කිසියම් කරුණක් නිසා ය. දූෂියෙහ මට මෛත්‍රිය භුම්මජක භික්ෂූහු අහේතුක පරිජි ඇවතකින් දෙස් නැගූහ. ඒ අධිකරණය සංහිදුනේ නමුදු ඔහු මට දෙස් කියති ඔවුන්ගේ වචන ඇදහූ අය ද මට අගෞරව පරිභව කෙරෙති. එහෙයින් මම දැන් පිරිනිවෙමි යි මෙසේ සිතිවුහන් කොට බුදුරදුන් විචාළ සේක-යනු තනමතිකයෝ විවරණය කෙරෙති. එහෙත් ක්ෂීණාශ්‍රවයෝ ආයුෂශෙෂ ව තිබිය දී අනුන්ගේ උපවාදදියකට හයින් පිරිනිවන් නො පාති. එසේ ම අනුන්ගේ ප්‍රසාදදියක් නිසා බොහෝ කල් ජීවත් වීමට ද වෑයම් නො කෙරෙති. එහෙයින් ඒ හිමියන් පිරිනිවීමට අසන ලද්දේ ආයුස්සංස්කාරය ක්ෂය වීමෙන් ය යනු දෙවන මතය යි. (උදානාට්ඨකථා-ත්‍රි: මු: 300 පිට)

**සැරියුත් හිමියන්ගේ ප්‍රශන:**- එක් දිනක ඵල සමවතින් සිටින සැරියුත් තෙරුන් වහන්සේට මෙබඳු කල්පනාවෙක් වි ය. කවර බුදුවරුන් වහන්සේගේ ශාසනය චිරස්ථායී වූයේ ද?කවර බුදුවරුන් වහන්සේගේ ශාසනය චිරස්ථායී නුවූයේ ද? යනු යි. මෙසේ කල්පනා කළ එතුමෝ ඵලසමවතින් නැගිට බුදුන්වහන්සේ කරා එළඹ මේ ප්‍රශ්නය විචාළහ. "ශාරීපුත්‍රය, විපස්සී, සිඛී, වෙස්සභූ යන තුන් බුදුවරුන්ගේ ශාසනය චිරස්ථායී නුවූයේ ය. කකුසඳ, කෝනාගම, කාශ්‍යප තුන් බුදුවරුන්ගේ ශාසනය චිරස්ථායී වූයේ ය යි බුදුන් වහන්සේ වදාළහ.

කිමෙක් ද සැරියුත් හිමියන් වහන්සේට තමන්වහන්සේගේ කල්පනාව පිළිබඳ විනිශචයක් කර ගන්නට බැරි ද? යනු මෙයින් පැන නගින ප්‍රශ්නයෙකි. මේ මේ බුදුවරුන්ගේ ශාසනය චිරස්ථායී වූයේ ය කියා හෝ නුවූයේ ය කියා නම් නිශචය කර ගත හැකි ය.

එහෙත් මේ හේතුවෙන් එසේ වූයේ ය යනු නිශ්චය කර ගත නො හැකි ය යි බුදුගොස් හිමියෝ කියති. ඒ ගැණ මහා පදුම තෙරුන් වහන්සේගේ මතය මෙසේ යි. සොළොස් වැදෑරුම් ප්‍රඥාවෙන් මස්තකප්‍රාප්ත සැරියුත් හිමියන්ට එය ද නිශ්චය කර ගැණීම එතරම් බරෙක් නො වේ. බුදුරදුන් වහන්සේ සමග එක තැන සිටින උන් වහන්සේ එය විනිශ්චය කිරීම තරාදිය තිබිය දී අතින් කිරා බැලීමක් මෙනැ යි වැටහී බුදුරදුන් විචාළ සේක යනු යි. (සමන්තපාසා දිකා-ත්‍රි. මූ. ප්‍රථමභාග 124 පිට)

**බුදුරදුන්ගේ විවේකවාසය:-** තථාගතයන් වහන්සේ විශාලා මහාවන කූටාගාර සාලාවෙහි දී භික්ෂූන් වහන්සේට අසුභ කථාව වදාළෝ ය. වදාරා "පිණ්ඩපාතය ගෙණ එන්නකු හැර අන් කිසිවෙකුත් නො එළඹේවා"යි අඩමසක් සමවතින් විසූසේක. ඒ අතර අසුභකථාවෙන් ජීවිතය පිළිබඳ හටගත් කලකිරීම් ඇති භික්ෂූහු ඔවුනොවුන් මරා ගත්තාහු ය. මිගලණ්ඩික නම් ශ්‍රමණ වේශධාරියා ලවා ද මරවා ගත්තාහු ය. බුදුන් වහන්සේ මේ බව දැන ම විවේක සැපයෙන් විසීමට සිතූසේක, මේ ගැණ මත දෙකෙක්.

බුදුන් වහන්සේ ස්වකීය ශ්‍රාවකයන් ඔවුනොවුන් මරා ගන්නා වුන් වළකන්නට නො හැකි වූයේ ය යි අනුන් කරණ උපවාදය නිසා විවේකවාසයට කැමැති වූහ යනු එක් මතයෙකි. බුදුගොස් හිමියෝ උපවාදය නිසා ය යනු මතිමාත්‍රයක් බව කියමින් ඒ මතය ප්‍රතිබාධනය කොට බුදුන් වහන්සේට එය වළකනු නො හැකි කාමීයක් නිසා ම 'අද මෙතෙක් මළෝ ය; අද මෙතෙක් මළෝ ය" යන ව්‍යසන කථාවන් අසමින් සිටිනු නො කැමැති ව මෙවිට භික්ෂූන්ගේ අදශීතය ම මැනව යි සලකා විවේකවාසයට කැමැති වූ බව කියති. (සමන්තපාසාදිකා-ත්‍රි. මූ. ප්‍රථම භාග 287 පිට)

මේ හැර මූදලිඳු නාදරණය පිළිබඳව උදානාර්ථ කථාවේද (ත්‍රි. මූ. 69 පිට) ලොකධාතුව පිළිබඳව සුමඞ්ගල විලාසිනියේද (ත්‍රි. මූ 467 පිට) අපායේ ඔනාසඑරණය ගැණ හා ජඤ්ඤරාගය ගැණත් මනොරථ පූරණියේද (ත්‍රි. මූ. 533–866 පිටු) නිවණ ගැණ විභඞ්ග අටුවාවේද (ත්‍රි: මූ: 36 පිට) දුෂ්කරක්‍රියාව ගැණ පපංචසූදනියේද (මුද්‍රිත 465 පිට) ශුක්ලය පිළිබඳව සමන්තපාසාදිකාවේද (මුද්‍රිත 299 පිට) බුද්ධානුබුද්ධකශික්ෂා ගැණ කඞ්ඛාවිතරණියේ ද (මුද්‍රිත 16 පිට) අබ්බුදාදි නිරය ගැණ සුත්තනිපාත අටුවාවේ ද යි (ත්‍රි: මූ: 395 පිට) මෙසේ තවත් සැලකිය යුතු ථෙරවාදයෝ බෙහෙවින් දක්නා ලදහ.

අට්ඨකථාවන්හි දක්නට ලැබෙන මේ ථෙරවාදවලින් වැඩියක් පෙණෙනුයේ විනයාභිධර්ම දෙක්හි ය. ඔවුනතුරෙන් කිසිවක් පූර්වෙහි පටන් පැවත ආ වාදයෝ ය. කිසිවක් නවීන අටුවා කරණ කාලයේ සිටි තෙරවරුන්ගේ වාදයෝ වෙති. ඉනුත් මහාසීව, මහාතිස්ස, මහානාග, මහාපදුමාදි තෙරවරුන්ගේ වාද බහුල ය. මෙ තුමෝ ක්ෂීණාශ්‍රවයෝයි.

ඇතැම් වාද පෙළඅටුවාවන්හි සඳහන් නුවූ දේ ගැණ ම නො වෙති. මහඅටුවාවේ පිරිසුදු ව කියන ලද කරුණු ගැණ ද වාද කර තිබෙන බව පෙණේ. සූකරමද්දවය පිළිබඳ වාදය ඉන් එකකි. සූකරමද්දවය නම් හූරන්ගේ මෘදු සිනිඳු ප්‍රවෘත්ත මාංසයයි මහ අටුවාවේ කියන ලදූයි පැහැදිලි ව ම දක්වති එසේ තිබියදීත් තවත් මත සතරෙක් ඇති වී ය අන් අටුවාවක තබා මහඅටුවාවේ පවා නිර්මල ව ති දූයක් ගැණ නානා මත පහළ කිරීමද ඒ මත එසේ ම අටුවාවන්හි ඇතුළත් කිරීම ද කපලනාවට ගත යුතු ය.

අනුබුද්ධ බුද්ධඝොෂස්වාමිපාදයෝ ද ථෙරවාද දක්වමින් කිසිවක විනිශ්චය දෙති කිසිවක විස්තරය දක්වා නිශ්ශබ්ද වෙති. එයින් හැඟෙනුයේ ධර්මයේ ගම්භීරත්වය සැලකූ එතුමන් විසිනුදු සෙසු ප්‍රාඥ ලොකයාගේ විනිශ්චයට ඉඩ තැබූ බවෙකි. ඒ ථෙර වාදවලින් කිසිවක් මෙහි දක්වූයේ ඒ පිළිබඳ පරීක්ෂණයට දෙර හරිණු සඳහායි.

නවීන අටුවාවන්හි මෙන් ම මහ අටුවාවේ ද මෙබඳු ථෙරවාද විද්‍යමානවූ බව පෙණේ. **''මහාඅට්ඨකථාය ලිඛිත මහාපදුම ථෙරවාදෙ අයන්ති දස්සෙති''** මෙය මහ අටුවාවේ ලියනලද මහාපදුම තෙරුන්ගේ වාදයයි දක්වයි යනු විමති විනොදනියේ (මුද්‍රිත 137 පිට) කියන ලද්දේ එහෙයිනි. ප්‍රතිසම්භිදාප්‍රාප්ත බුද්ධ මතඥ මහරහතන්ගේ කෘතියකත් එබඳු මත භෙද ඇති වීමට හේතුව කුමක් ද? යනු පසු ව ප්‍රකාශ වන්නේය. ඒ මේ සියල්ලම ප්‍රකීර්ණක දෙශනා යයි හෝ පෙළෙහි ආ දේයයි හෝ නො කිය හැකිය. එසේ නම් සාරත්ථදීපනියෙහි ප්‍රකීර්ණක දෙශනාව ම අට්ඨකථා යයි කියන ලද්දේ කුමක් හෙයින් ද? යත්:- විශෙෂයෙන් මහ අටුවාවටත් සාමාන්‍යයෙන් සෙසු අටුවාවන්ටත් පර්‍යායයෙන් එසේ කිය හැකිය. එහෙත් තත්කාතීෘපාදයන් අර්ථවර්ණනා කෙළේ නිෂ්පර්‍යායයෙන් වටහා ගෙණය යනු අපගේ හැඟීමයි.

---

පුස්තකාලය

# අට්ඨකථා පරිපාටිය.

මහඅටුවායයි කියන ලද පළමුවන අට්ඨකථාව තිපදවන ලද්දේ බුදුරදුන් වහන්සේ හා සතතාශ්‍රයෙන් වියූ ප්‍රථම ධර්මසඞ්ග්‍රාහක ක්ෂීණාශ්‍රවයන් වහන්සේ විසිනි. ශුද්ධ මාගධියෙන් කරණලද ජාම්බුද්වීපික ආචාර්‍ය්‍ය පරපුරෙන් පැවත ආ ඒ මහඅටුවා තුන්වන ධර්මසඞ්ගායනාවෙන් පසු මොග්ගලිපුත්ත මහරහතන්වහන්සේගේ මෙහෙයීම පරිදි ලඞ්කා ශාසනය පිහිටුවනු පිණිස හෙළදිවට වැඩි මහාමහින්ද මහරහතන් වහන්සේ විසින් ගෙණ එන ලදූ ව තාම්‍රපර්ණික තෙරුන් විසින් ද්වීපභාෂාවට නගන ලදී. එසේ කිරීමට හේතුව නම් ථෙරියනිකායෙන් වෙන්වූ අන්‍ය නිකායිකයන් විසින් තිපදවන ලද නානා වෛතුල්‍යවාද සමග හා තීර්ථකයන් විසින් ධර්ම විනය බිඳලනු පිණිස තිපදවූ අධර්මවාදයන් සමගත් ශුද්ධ බුද්ධ ධර්මය සංකීර්ණ නොවනු පිණිස යයි ද සංකීර්ණ වුවත් පහසුවෙන් විභජ්ජවාදය තෝරා ගැණීමට හැකි වනු පිණිස යයි ද සාරත්ථදීපනියෙහි කියන ලදී. ශුද්ධ මාගධියෙන් පැවතුන ද, ඒඅර්ථය ගැණීමට බාධාවෙක් නැති. එහෙත් එවකට සියලු ලාංකික භික්ෂුවරයන්ට එක සේ ම තමන්ට ගොචරවූ ද්වීපභාෂායෙන් පමණ ශුද්ධ මාගධියෙන් නිරාකූලාවබොධයක් නො ලැබිය හැකි බව සැලකූ නිසා එතුමන් විසින් එසේ කරණ ලදූයි සිතිය හැකියි. සියලු අටුවාවන්ට පූර්ව තම හෙයින් ද සංගීතිත්‍රයට නැගුන හෙයින් ද මීට මහඅටුවාවයයි කියති.

ක්‍රමයෙන් ඥානශක්තියෙන් පිරිහෙන ලොකයාට කල් යත් යත් පර්‍ය්‍යාප්තියෙහි තව තවත් අවිශදස්ථාන පෙණෙන්නට වි ය. එ නිසා එක ම ථෙරියවංසයෙහි පවා නානාවිධ ථෙරවාදයෝ පහළ වූහ. එසේ ම ථෙරියනිකායෙන් භින්නවූ අන්‍ය නිකායිකයන් ගෙන් හා සමයාන්තරවාදීන්ගෙනුත් විෂම වූ ද වෛතුල්‍ය වූ ද බොහෝ වාදයෝ ගලා එන්නට වූහ. එහෙයින් පසුකාලයෙහි ධර්මධර ආචාර්‍ය්‍යවරයන් විසින් පච්චරිය කුරුන්දි අන්ධක සඞ්ඛෙප ය යි අටුවා සතරක් තිපදවන ලදී.

පච්චරිය ආදී අටුවා තිපදවන ලද්දේ පස්වන සංගායනා වෙනුත් පසු ව ය. එතෙක්ම පැවැත්තේ මහඅටුවාව පමණෙකි. එද හෙළු බසට නගන ලදුව ලක්දිව පැවතුන නිසා සෙසු අටුවාත් එසේම විය යුතු ය යි සලකා පච්චරියාදියද ලක්දිවදී හෙළු බසින්ම තිපදවූහ.

මහඅටුවාව ක්‍ෂීණාශ්‍රවයන්ගේ කෘතියක් බවත් පච්චරියාදි අටුවා සතර නො ඇදහිය හැකි තැන් ඇති බැවින් ක්‍ෂීණාශ්‍රවයන්ගේ කෘති නොවන බවත් විමතිවිනොදනියෙහි (මුද්‍රිත 17 පිට) කියන ලදී. මහඅටුවාවට අනතුරු ව ලියන ලද්දේ පච්චරිය අටුවා වයි. චණ්ඩාලතිස්ස මහා භය උපන් කල්හි ශක්‍රයා විසින් ලාංකික භික්‍ෂූන්ට පරතෙර යනු පිණිස මවා දුන් පසුරෙහි සිට කරණ ලද හෙයින් පච්චරිය නම් වීයයි කියත්. එයට කලකට පසු කුරුන්දි අටුවාව නිපදවන ලදී. කුරුන්දි වෙල්ලි නම් විහාරයේ දී කරණලද හෙයින් එනාම ව්‍යවහාරවූ බව කියති. අනතුරුව දීපාන්තර වාසීන් විසින් කරණලද්දැයි සලකන අන්ධක සඞ්ඛෙප නමින් අටුවා දෙකක්ද විය.

මහාඅට්ඨකථාදි මේ අටුවා පසම හෙළඅටුවාවෝ ය යි ද මින් පෙර අටුවා ප්‍රකරණ වශයෙන් නොපැවැත්තේ යයිද විමති විනොදනියෙහි (මුද්‍රිත 5 පිට) කියන ලද නමුත් මහඅටුවාව පෙළ බස හෙළ බස දෙකින්ම පැවතුන බව සිතිය හැකිසි. **"පරිපුච්ඡා නාම පාළිඅට්ඨකථාදිසු ගණ්ඨිපද විනිච්ඡයකථා"** යන විසුද්ධිමග්ග බන්ධනිද්දෙසයෙහි දක්වන ලද පාඨය ඊට සාධකයෙකි. මෙහි කී අටුවා නම් මහාඅට්ඨකථාදිය මිස අන් කිසිවක් නොවිය හැකිය. ගණ්ඨිපද නම් මහාගණ්ඨිපද මජ්ඣිමගන්ථිපද චූලගන්ථිපදදි නම් වලින් දක්වෙන ගැටපද නොව පැරණි අටුවාවලට කළ අන්‍යතර ග්‍රන්ථිපදවලියකි. මහාගන්ථිපදදිය වනාහි බුද්ධඝොෂාදි අර්ථකථාචාර්යයන් විසින් කළ සමන්තපාසාදිකාදි නවීන අටුවා සඳහා පශ්චාත්කාලිකයන් විසින් නිපදවන ලද ගැටපද බව සාරත්ථදීපනියෙහි (මුද්‍රිත 17 පිට) කියන ලදී.

ඔහු ද පෙළ බස හෙළ බස දෙකින්ම පැවත්තාහ. **"සීහළගණ්ඨිපදෙ වුත්තං–පාළිගණ්ඨිපදෙ පන"** යනුවෙන් සාරත්ථදීපනියෙහි කියන ලද්දේ එහෙයිනි. ටීකා කරණ කාලය තෙක් ඔවුන් පැවතුන නමුදු දැන් ශෙෂ ව පවත්නේ දම්පියාටුවා ගැටපදදි කීපයෙකි.

ත්‍රිපිටකධර පූර්වාචාර්යවරයන් විසින් පර්යාප්තියෙහි අර්ථ වර්ණනා කිරීම් වශයෙන් නිෂ්පාදිත අර්ථකථා පසක් මෙසේ ලඞ්කා ශාසනය හොබවමින් පවත්තා එසමයෙහි අන්‍ය දෙශවාසී භික්‍ෂූන් කෙරෙහි ස්ථවිර වාද සහිත එකද අර්ථ කථාවක් සම්පූර්ණව නො පැවැත්තේය. හෙළ බසින් පවත්තා හෙයින් ලක්දිව පැවති අටුවා

වලිනුදු ඔවුනට වැඩක් නොවීය. මේ දුටු දඹදිව් වැසි ශාසන ධාරී උතුමෝ අනාගත ශාසනාරක්‍ෂාවට පිරිසුදු අර්ථකථා පෙළබසින් තිබිය යුතුයයි සිතූහ.

එහෙයින් උන්වහන්සේලා විසින් මෙහෙයන ලදුව අනුබුද්ධ බුද්ධඝොෂ මහා ස්වාමිපාදයෝ හෙළඅටුවා ආශ්‍රයෙන් පාලි අර්ථ කථා සම්පාදනය පිණිස බුද්ධවර්‍ෂ නවසිය තෙපණස් වන වර්‍ෂයෙහි ලංකාරාජ්‍යාභිෂෙකයට පත් සිරිනිවාස නම් අපර නාමයකින් අර්ථකථාවන්හි දක්වනලද මහානාම රජතුමන් දවස ලක්දිවට සම්ප්‍රාප්ත වූහ.

එසේ පැමිණි උන්වහන්සේ ත්‍රිපිටක පාලියෙහි හා පූර්වාර්ථකථා වන්හි සාරාර්ථයන් කැටි කොට දක්වා ස්වකිය ප්‍රවීණත්වයද විදහා පෙන්වමින් විසුද්ධිමග්ග නම් අටුවාව පළමුවෙන් නිපදවූහ. එය ශීල නිර්දෙශ සමාධිනිර්දෙශ ප්‍රඥාභූමිනිර්දෙශ ය යි ඡෙදත්‍රයකින් යුක්ත වෙයි. ශීලනිර්දෙශයෙන් විනයපිටකයද සමාධිනිර්දෙශ යෙන් සූත්‍රපිටකයද ප්‍රඥාභූමිනිර්දෙශයෙන් අභිධර්මපිටකයද සැකෙවින් වර්‍ණනා කළහ. පෙරදුරන් විසින් ඒ තාක් නිෂ්පාදිත හැම අටුවාවක්ම අවිශෙෂයෙන් ත්‍රිපිටක පාලියටම සාධාරණ හෙයින් එතුමන් විසිනුදු විශුද්ධිමාර්ගයෙන් ඒ ක්‍රමය අනුගමනය කරණ ලදැයි කිය හැකිය.

පර්‍යාප්තිය උද්ග්‍රහණය කරන්නවුන්ට මෙතරම් සරලව ක්‍රමානුකූලව ලියවුන වෙන අටුවාවක් නැති. හෙළඅටුවාවන්හි ශීල සමාධි විදර්ශනාවන්ගේ විස්තරය ත්‍රිපිටකයටම සාධාරණ පරිදි එක් තැනෙක සංග්‍රහ කොට නො දක්වන ලද්දේය යි ද පෙළෙහි ආ පරිදි ඒ ඒ තැන විස්තර කරණ ලද්දේ ය යි ද කියති. එහෙයින් සාරාර්ථකථාපාලියෙහි සාරාර්ථයන් හකුළුවා ලියූ මෙය සඞ්ඝයාගේ අමන්දානන්දයට හේතු වි ය. සඞ්ඝනායක සඞ්ඝපාල ස්ථවිරයන් වහන්සේ හෙළ අටුවා සියල්ල පෙළබසින් අර්ථකථා නිපදවනු පිණිස බුදුගොස් හිමියන්ට භාර කරණ ලද්දේත් එහෙයිනි. උන් වහන්සේ මහා විහාරයට අයත් දූරසඞ්කරවිහාරස්ථ ග්‍රන්ථාකර පිරිවෙන්හි වසමින් මූලාර්ථකථාආශ්‍රයෙන් නවීනාර්ථකථා සම්පා දනය කළෝ ය.

සමන්තපාසාදිකාදි අර්ථකථා තෙළෙසක් එතුමන් විසින් නිපද වන ලද බව පෙනේ. කවරකට පසුව කවරක් නිපදවන ලද දැ යි මොවුන්ගේ පරිපාටිය සෙවීම අතිශයින් දුෂ්කර ය. ලක්දිවට

පැමිණ පළමුවෙන් නිපදවන ලද්දේ විශුද්ධිමාර්ගය බවට නම් සැක යෙක් නැත්තේ ය. එයට පළමු දඹදිව දී ම අත්ථසාලිනී නම් ධම්මසඞ්ගණී අටුවාව කරණ ලද බව මහාවංශයෙහි කියන ල දී. එය එසේ නම් අත්ථසාලිනිය- (මුද්‍රිත 2 පිට) ආදියෙහි ම දක්වන ලද.

> "කම්මට්ඨානානි සබ්බානි චරියාභිඤ්ඤා විපස්සනා
> විසුද්ධිමග්ගෙ පනිදං යස්මා සබ්බං පකාසිතං."

විශුද්ධිමාර්ගයෙහි වනාහි කම්මස්ථානාදිය පිළිබඳ සියලු විස්තරය යම් හෙයකින් ප්‍රකාශ කරණ ලද ද එහෙයින් මේ අත්ථසාලිනියෙහි එය විස්තර නො කරමි යන්නෙන් හා, "**සබ්බකම්මට්ඨානානං ච භාවනාවිධානං සබ්බං අට්ඨකථානයෙන ගහෙත්වා විසුද්ධිමග්ගෙ විත්ථාරිතං.**" සියලු කම්මස්ථානයන්ගේ භාවනාක්‍රම සියල්ල අට්ඨකථා නයින් ගෙණ විශුද්ධිමාර්ගයෙහි විස්තර කරණ ලදී යන චිත්තුප්පාදකාණ්ඩ පදවිභාසිත වර්ණනායෙහි (මුද්‍රිත 171 පිට) එන පාඨයෙනුත් විශුද්ධිමග්ග නාමය එහි සඳහන් විය නො හැකි ය. මේ කරුණ ගැණ පමණක් සලපනා කරණ කෙනෙකුට විශුද්ධිමාර්ගයට පසුව අත්ථසාලිනිය කරණ ලද්දේ ය යි කිය හැකි ය. එහෙත් මහාවංශාදී සැලකිය යුතු ඉතිහාසග්‍රන්ථයන්හි කියන ලද්ද ද බැහැර කළ යුතු නො වේ. ථෙරවාද සහිත අට්ඨකථා ඉගෙණ ගන්නට මත්තෙන් දඹදිව දී අත්ථසාලිනිය කරණ ලද බවද පසුව එහි අසම්පූර්ණත්වය පෙණුන හෙයින් උන්වහන්සේ විසින් ම ලක්දිව දී යලිත් එය සකස් කොට ලියන ලද බව ද මෙහි දී නිශ්චය කළ යුතු ය යි සමහරු කියති.

විශුද්ධිමාර්ගයට අනතුරුව ලියන ලද්දේ සමන්තපාසාදිකා නම් විනය අටුවාව ය යි කිය යුතු නමුත් ඒ සම්බන්ධ ව දක්වෙන කරුණු පළමු කරුණට ත් වඩා ආකුල ය. සුමඞ්ගලවිලාසිනී නම් දික්සඟි අටුවාවේ කස්සපසීහනාද සූත්‍ර වර්ණනාවෙහි (ත්‍රි: මු: 236 පිට) "**විත්ථාරො පනෙතස්ස තිපිටකපරිවාරෙසා සමන්තපාසාදිකාය විනයට්ඨකථාය පබ්බජ්ජාක්ඛන්ධවණ්ණනාය වුත්තනයෙන වෙදිතබ්බො.**" මේ තීර්ථකපරිවාසවිස්තරය වනාහි සමන්තපාසාදිකාවිනයාර්ථකථාවෙහි ප්‍රව්‍රජ්‍යාස්කන්ධවර්ණනායෙහි කියන ක්‍රමයෙන් දත යුතු ය යනු හා සාමඤ්ඤඵල සූත්‍ර වර්ණනායෙහි (ත්‍රි: මු: 94 පිට) "**විත්ථාරකථාපිස්ස සමන්තපාසාදිකාය විනයට්ඨකථාය වුත්තා.**" මොහුගේ විනිශ්චය කථාව සමන්තපාසාදිකා විනයාර්ථකථාවෙහි කියන ලදී යනු ද

දක්වෙයි. පපංචසූදනී නම් මැදුම්සඟිඅටුවාවේ කුක්කුරවතිය සුත්‍රවර්ණනායෙහි (මුද්‍රිත 625 පිට) හා සාමගාමසූත්‍රවර්ණනායෙහි ද (මුද්‍රිත 838 පිට) යථොක්ත පාඨ දෙක පෙණේ. එසේම **"විත්ථාරො පනෙස"** යන පාඨය සංයුත් අටුවාවේ ද (ත්‍රි: මු: ද්විතීයභාග 28 පිට) දක්නා ලදී.

මෙසේ සමන්තපාසාදිකා නාමය සුමඞ්ගලවිලාසිනී පපංචසූදනී සාරත්ථප්පකාසිනී යන ග්‍රන්ථත්‍රයෙහි ම පෙණෙන හෙයින් සමන්තපාසාදිකාව ලියන ලද්දේ ඒ ග්‍රන්ථ තුනට පෙරටුව ය යි කිය හැකි ය. එසේ නමුදු සමන්තපාසාදිකා වේ සුමඞ්ගලවිලාසිනී පපංචසූදනී නමුදු සඳහන් වෙයි. ආකූලත්වයට හේතුව එය යි. **"අත්ථිකෙහි පන පපංචසූදනියං වා මජ්ඣිමට්ඨකථායං භයභෙරව සුත්තවණ්ණනාතො සුමඞ්ගලවිලාසිනියං වා දීඝනිකායට්ඨකථායං සරණවණ්ණනායො ගහෙතබ්බා."** විස්තර කැමැත්තවුන් විසින් පපංචසූදනී නම් මැදුම්සඟි අටුවාවේ භයභෙරව සූත්‍ර වර්ණනාවෙන් හෝ සුමඞ්ගලවිලාසිනී නම් දික්සඟි අටුවාවේ ශරණ වර්ණනාවෙන් ගත යුතු ය (ත්‍රි: මු: ප්‍රථම භාග 115 පිට) යන සමන්තපාසාදිකා පාඨයෙහි යථොක්ත නම් දෙක පැහැදිලිව ම පෙණේ. (යථොක්ත පාඨය යොදන ලද පිළිවෙළින් පපංචසූදනිය ට පසුව සුමඞ්ගලවිලාසිනිය කළ බව හැඟෙ යි. එය ලෙඛනයෙන් වූ ප්‍රමාදයෙකි.) තවත් අරිට්ඨසික්ඛා, පද වර්ණනාවෙහි හා මහාවග්ග බොධිමණ්ඩවර්ණනාවෙහි ත් පපංචසූදනී නාමය දක්ක හැකි ය.

කාරුණු මෙසේ හෙයින් මේ ග්‍රන්ථත්‍රයෙන් පූර්වතම ග්‍රන්ථය කවරක් දැ යි නිශ්චය කිරීම දුෂ්කරතරය. මේ සම්බන්ධව කළ පරීක්ෂණයෙන් පෙණෙනුයේ සමන්තපාසාදිකාව ම පූර්වයෙන් ලියන ලද බවත් සුමඞ්ගල විලාසිනී ආදිය අනතුරු ව ලියන ලද බවත් ය. බොහෝ ග්‍රන්ථනිෂ්පාදකයෝ ආදිම ග්‍රන්ථයේ දී අතිරෙක පරිශ්‍රමයක් ගණිති. සමන්තපාසාදිකාවේ ආරම්භයෙන් පෙණෙන්නේ එබඳු විශෙෂ පරිශ්‍රමයක් ගෙණ තිබෙන බවෙකි. මූල් ගාථාපඞ්ක්තියකින් මහ අටුවාදි පූර්වාචාර්ය කථාවන් පිළිබඳ හැඳින්වීමක් ද ඒ අටුවා ආශ්‍රයෙන් ස්වකීය අර්ථකථාසම්පාදනය කරණ බව ද ඒ සඳහා තමන් වහන්සේ අනුගමනය කරණ ක්‍රම ද කෙටියෙන් දක්වූහ. එයට පසුව ත්‍රිපිටක පර්‍ය්‍යාප්තිය පිළිබඳ සඞ්ගායනා විස්තරය හා ආචාර්‍ය්‍ය පරම්පරාව ද දක්වූහ. එබඳු විස්තරයක් අන් අටුවාවක නොමැති යි,

මේ කරුණු අනුව මැදහත් ව කල්පනා කරන්නෙකුට සිතිය හැක්කේ විශුද්ධිමාර්ගයෙන් පසුව ලියන ලද අර්ථකථාව නම් සමන්තපාසාදිකාව බව යි. එපමණක් නොව ත්‍රිපිටකයෙන් විනය පිටකය මුල් වන නිසා ද සඞ්ගීතිකාරක උතුමන් විසිනුත් එය පළමුවෙන් සඞ්ගායනා කළ නිසාද බුද්ධඝොෂ හිමියන් වහන්සේ විසිනුත් අර්ථකථාකරණයෙහි දී ඒ පිළිවෙළ ම අනුගමනය කරණ ලදැයි සිතීම නුවණට හුරුය.

අත්ථසාලිනියෙහි විසුද්ධිමග්ග නාමය සඳහන් වන බව මුල දී කීවෙමු. එසේම අත්ථසාලිනියෙහි සමන්තපාසාදිකා නාමයද සමන්තපාසාදිකාවේ අත්ථසාලිනී නාමයද සඳහන් වූ බව පෙණේ. **"තාසං විචාරණක්කමො විත්ථාරතො අට්ඨසාලිනියා ධම්මසඞ්ගණිඅට්ඨකථායං වෙදිතබ්බො."** එහි විචාරණ ක්‍රමය විස්තර වශයෙන් අට්ඨසාලිනී නම් ධම්මසඞ්ගනී අටුවාවෙහිදී දත යුතුය යන පාඨය සමන්තපාසාදිකා මහාවග්ග මාතුඝාතකාදි වත්ථු වණ්ණනායෙහි එයි. එහෙත් **"අයමෙත්ථ සඞ්ඛෙපො විත්ථාරො පන සමන්තපාසාදිකායං වුත්තො."** මේ මෙහි සංක්ෂෙපයයි විස්තර වනාහි සමන්තපාසාදිකාවෙහි කියන ලද්දේය යන පාඨය අත්ථසාලිනී චිත්තුප්පාදකාණ්ඩයෙහි අකුසලකම්මපථවණ්ණනායෙහි එයි. පළමු පාඨයෙන් සමන්තපාසාදිකාවට වඩා අත්ථසාලිනිය පෙරටුයැයි කිය හැකිය. දෙවන පාඨයෙන් අත්ථසාලිනියට වඩා සමන්තපාසාදිකාව පෙරටුයයි කිය හැකිය. මේ ආකුලත්වය නිසා ග්‍රන්ථයක නාමය නවත් ග්‍රන්ථයක සඳහන් වීම් මාත්‍රයෙන් අසුවල් ග්‍රන්ථය පළමුවෙන් කරණ ලදය, අසුවල් ග්‍රන්ථය පසුව කරණ ලදයයි නිගමනයකට බැසීම අත්‍යවියෙන් දුෂ්කරය.

විනය පිටකය අවසන් වීමට එහිම අටුවාවක්වූ කංඛාවිතරණී නම් ප්‍රාතිමොක්ෂ අටුවාව මීලඟට නිපදවිය යුතු වුවද සමන්ත පාසාදිකාවෙන් විනයාර්ථවර්ණනාව එකදෙශයකින් සම්පූර්ණ වන නිසා කංඛාවිතරණිය ලියන ලද්දේ අභිධර්ම අටුවාවලටත් පසුවය

සමන්ත පාසාදිකාවට අනතුරුව ලියන ලද්දේ සූත්‍රපිටකයට අයත් ආගමාර්ථකථාවෝයි ඔවුනතුරෙන් පළමු කොට සුමඞ්ගල විලාසිනී නම් දීඝනිකායට්ඨකථාව ලියූ බවට සැකයෙක් නැත්තේය. පපංචසූදනී සාරත්ථප්පකාසිනී මනොරථපූරණී නාම යෝද එහි සඳහන් වන්නාහ. ඉක්බිතිව පපංචසූදනී නම් මැදුම් සඟි අටුවාව ලියන ලදැයි කිය හැකි නමුත් එයටද අවුලෙක්.

**"සබ්බඤ්ඤුණාණං ච විත්ථාරකථාය විනිච්ඡයො සම්මොහ විනොදනියා විභඞ්ගට්ඨකථාය වුත්තො".** සියලු ඥණයන්ගේ විස්තරකථාව පිළිබඳ විනිශ්චය සම්මොහවිනොදනී නම් විභඞ්ගාර්ථ කථාවෙහි කියන ලද්දේය යන පපංචසූදනී (මුද්‍රිත 266 පිට) පාඨයෙන් සම්මොහවිනොදනිය පපංචසූදනියට පළමු කළ බවක් හඟවති. එ .ස්ම පපංචසූදනියෙහි සමන්තපාසාදිකා සුමඞ්ගල විලාසිනී නමුදු වෙයි.

කෙසේ නමුත් සුමඞ්ගල විලාසිනියට අනතුරුව ලියන ලද්දේ පපංචසූදනියයි. පපංචසූදනිය ලඟට ලියන ලද්දේ සාරත්ථප්පකාසිනී නම් සංයුත් අටුවාවයි. එහිද **"අට්ඨකථාපි තෙසං විභඞ්ගට්ඨකථාය චෙව පපංචසූදනියා ච මජ්ඣිමට්ඨකථාය සබ්බාකාරෙන වුත්තා."** ඔවුන්ගේ අර්ථ වර්ණනාව විභඞ්ගාර්ථ කථායෙහිද පපංචසූදනී නම් මැදුම සඟි අටුවාවෙහිද සර්වප්‍රකාරයෙන් කියන ලදී (ත්‍රි: මූ: දෙවන භාග 34 පිට) යන පාඨයෙන් විභඞ්ගාර්ථ කථා නාමය හා පපංචසූදනී නාමයද පෙණේ. එපමණකින් විභඞ්ග අටුවාවට පසුව සාරත්ථප්පකාසිනිය රචිතයයි නොකිය හැකිය. (යථොක්ත පාඨයද යොදන ලද්දේ විභඞ්ග අටුවාවට පසුව පපංචසූදනිය කරණ ලද බව හැඟෙන සේයි).

**"සාවත්ථිපභූතීනං නගරානං වණ්ණනා කතා හෙට්ඨා**
**සඞ්ගීතීනං ද්වින්නං යා මෙ අත්ථං වදන්තෙන**
**විත්ථාරවසෙන සුදං වත්ථූනි ච යානි තත්ථ වුත්තානි**
**තෙසම්පි න පුන ඉධ විත්ථාරකථං කරිස්සාමි"**

යන සාරත්ථප්පකාසිනියෙහි (ත්‍රි: මූ: 2 පිට)ආදියෙහි දැක්වූ ගාථා වලින් සුමඞ්ගලවිලාසිනී පපංචසූදනී අටුවා දෙක පිළිවෙලින්ද ඊලඟට සාරත්ථප්පකාසිනියද කළ බව පැහැදිලිය. දික් සඟි මැදුම් සඟි දෙක පිළිබඳව අර්ථ වර්ණනා කරන්නාවූ මා විසින් සැවත් නුවර ආදි කොට ඇති නගරයන් පිළිබඳ යම් වර්ණනාවක් යට කියන ලදද යම් කථාවස්තු කෙනෙක් විස්තර වශයෙන් එහි කියන ලද්දාහුද ඔවුන්ගේ විස්තර කථාව බොහෝ සෙයින් මෙහිදී නො කරන්නෙමි යනු ඒ ගාථාවන්හි අදහසය.

එපමණක් නොව එහිම දැක්වෙත:-

**"මජ්ඣෙ විසුද්ධිමග්ගො එස චතුන්නම්පි ආගමානං හි**
**ඨත්වා පකාසයිස්සති තත්ථ යථා භාසිතං අත්ථං"**

මේ ගාථාවෙන් හැඟෙනුයේ ආගමාට්ඨකථා සතර පිළිවෙළින් ම නිපදවීමට එතුමන් අදහස් කළ බවෙකි.

සංයුක්ත අටුවාවට ඉක්බිති ව මනෝරථ පූරණී නම් අඞ්ගුත්තර අටුවාව කළ බව:-

**“සබ්බාගමසංවණ්ණනමනොරථො පූරිතො ච මෙ යස්මා,**
**එතාය මනොරථපූරණීති නාමං තතො අස්සා.”**

යන එහි ම දැක්වෙන ගාථාවෙන් පෙණේ. දීඝාගමාදි සියලු ආගම වර්ණනා කිරීමේ මනදොළ මෙයින් පිරුණ හෙයින් මීට මනෝරථපූරණී නාමය වී ය යනු එහි අදහසයි.

මිලඟට ඛුද්දගත් සඟියේ අර්ථකථාකරණය පසුබට කොට එකදේශයකින් සූත්‍ර පිටකයට අර්ථකථා සම්පූර්ණ කළ හෙයින් අභිධර්ම පිටකයේ අර්ථකථා කරණයට ආරම්භ කළ බුද්ධ ඝොස් හිමියෝ මනෝරථපූරණයට අනතුරුව අභිධර්මාර්ථකථා අතුරෙන් පළමු වන අටුවාව වූ අත්ථසාලිනිය කළහයි සිතිය හැකියි. මහාවංශාදි යෙහි කියන පරිදි පළමුවෙන් ම දඹදිව දී කළ අර්ථකථාව යළිත් සකස් කර ලීම ය. නැතහොත් ඒ වෙනුවට අමුතුවෙන් ම අර්ථකථා වක් නිපදවා ලීමය. අමුතුවෙන් ම කරණ ලද්දේ ය යි කීම සකස් කරණ ලද ය යි කීමට වඩා සුදුසු සේ පෙණේ.

මෙය ලක්දිව දී ම ලියන ලද බවට ග්‍රන්ථයෙන්ම සාක්ෂි බෙහෙවින් ලැබිය හැකිය. ලක්දිවම සිදුවූ කථාප්‍රවෘත්ති ථෙරවරුන්ගේ නම් හා වාද මෙහි සුලභය. ඒ මේ කරුණු ලක්දිව නිපන් අටුවා වලින් ගෙණ සංග්‍රහ කළැයි කිය හැකි නමුදු දඹදිව ඒ අටුවා නො පැවැති හෙයින් මෙය දඹදිවදී කළැයි එයිනුදු නොකිය හැකිය. ග්‍රන්ථය කිරීමට ආරාධනා කළෝ ද සම්මෝහ විනෝදනිය කිරීමට ආරාධනා කළ දෙවන බුද්ධ ඝොස් හිමියෝයි.

මීට අනතුරුව ලියන ලද්දේ සම්මෝහවිනෝදනී නම් විභඞ්ග අටුවාවයි. **“සබ්බාකාරෙන පනෙස විභඞ්ගට්ඨකථායං ආවි භවිස්සති.”** මෙය වනාහි සර්වප්‍රකාරයෙන් විභඞ්ගාර්ථකථාවෙහි මතු පහළ වන්නේය යන අත්ථසාලිනී (මුද්‍රිත 323 පිට) පාඨයෙන්ම එය පැහැදිලි වෙයි. පරමත්ථදීපනී නම් පඤ්චප්පකරණට්ඨකථාව ලියන ලද්දේ ඉන් පසුවයි.

මෙසේ අභිධම්ම පිටකයට අයත් අර්‍ථ කථා ලියා අවසන් කොට ප්‍රමාද පතිතස්ථාන ශොධනය කරන්නට පිණිස යළිත් සියලු අටුවාවෝ මුලසිට පරීක්‍ෂා කර බලන ලදහ. ඒ පරීක්‍ෂණයේ දී පසුව ලියවුන ග්‍රන්‍ථයන්ගේ නම් ද පළමුවෙන් ලියවුන ග්‍රන්‍ථයන්හි භාවිත කරන්න වුන්ගේ උද්ග්‍රහණ පහසුව සලකා හෝ විස්තරය නොඅඩුව සම්පූර්ණ කරන්නට පිණිසත් සුදුසු තන්හි යොදන ලදී. පසු කාලයේ දී ලේඛකයන් විසින් යොදන ලදැයි සැලකීමට වඩා බුදුගොස් හිමියන් විසින්ම යොදන ලදැයි සැලකීම යෝග්‍යය.

සියලු අර්‍ථකථාසාරය හකුළුවා කඞ්ඛාවිතරණී නම් ප්‍රාතිමොක්‍ෂ අටුවාව ලියන ලද්දේ පරමත්‍ථ දීපනියට පසුවයි. එය යථොක්ත දෙවන සංස්කරණයට පෙරටුව හෝ පසුව විය හැකියි. කෙසේ නමුත් උන්වහන්සේ විසින් ලියන ලද විනය සූත්‍රාභිධම් අටුවාවලට පසුව බව:-

**''නිස්සාය සා අයං නිට්ඨං ගතා ආදාය සබ්බසො,**
**සබ්බං අට්ඨකථාසාරං පාලිඅත්‍ථං ච කෙවලං.''**

යන අවසාන ගාථාවලින් පෙණේ. සියලු පෙල අටුවාසාරය ගෙණ කඞ්ඛාවිතරණිය නිපදවූ බව එහි අදහසය.

මේ හැර බුදු ගොස් මාහිමියන් විසින් රචිත යයි ප්‍රසිද්ධ කුදු ගත් සඟියට අයත් තවද අර්‍ථකථා සතරෙක් වෙති. එනම් ඛුද්දක පාඨ ධම්මපද සුත්තනිපාත හා ජාතක දෙශනාවන්ට කරණලද අර්‍ථ කථාවෝයි. බුරුම රට තත්‍ථ පඤ්ඤ තෙරුන් විසින් කළ ගන්‍ථ වංශයෙහි අපදාන අටුවාවද බුදුගොස් හිමියන්ගේ යයි කියන ලද්දේය. එසේ කිය හැකි එකද හේතුවක් අප විසින් නො දක්නාලදී. එතුමන්ගේ යයි කීමට වඩා අන්‍ය කර්‍තෘවරයකුගේ යයි කීමට වැද ගත් හේතුහු පැණෙති.

ඛුද්දකපාඨට්ඨකථාදි මේ සතරටම තබන ලද විශෙෂ නාමය නම් පරමත්‍ථජෝතිකා යනුයි. එකම නාමයක් තැබීමෙන් හා ග්‍රන්‍ථාවසානයෙහි පෙණෙන **''පරමවිසුද්ධසද්ධාබුද්ධිවිරියගුණ පතිමණ්ඩිතෙන''** යනාදි පාඨයෙනුත් හැඟෙන්නේ මේ සතරම එකකර්‍තෘක බවෙකි. බුද්ධඝොෂ කෘතියයි වෙන් කොට නිශ්චය කළ හැක්කේ මේ අවසාන පාඨයෙන්මයයි සමහරු කියති. එපමණ කින් නම් පරමත්‍ථ ජොතිකා අටුවා සතරද උන්වහන්සේගේ ම යයි කිය හැකිය. මේ පිළිබඳව එපමණකින්ම නිගමනයකට

බැසීමට දුෂ්කර කරුණුද වෙයි. පළමු කොට යථොක්ත පාඨය ගැණ සෙවිය යුතුය. ඒ පාඨය බුද්ධඝොෂ කෘතිවල යොදන ලද්දේ උන්වහන්සේගේ ශිෂ්‍යවරයකු විසිනැයි කියති. උන්වහන්සේගේ යෙදුමක් නොව ශිෂ්‍යවරයකු හෝ අන් කිසිවකු විසින් යොදන ලද් දක් බව නම් නිසැකය. එහෙයින් ඒ පාඨය යෙදූන පමණින් සත රම බුදුගොස් හිමියන්ගේ කෘතියයි නිගමය කිරීම නොමැනවි. අටුවා තුණක් ගැණ කෙසේ වෙතත් දම්පියාටුවාව නම් අන්‍යතර ආචාර්‍ය්‍යවරයකු විසින් නිපදවන ලද යයි කීමට සෑහෙන කරුණුද විරල නොවේ.

මේ සම්බන්ධව කරුණු සෙවීමේ දී භාෂාස්වරූපය හා සම්බන්ධ, සම්බන්ධාදිය සොයා බැලිය යුතු ය. භාෂාස්වරූපයෙන් නම් බුදු ගොස් හිමියන්ගේ ම ය යි ශඞ්කාරහිත අටුවාවල ස්වරූපයට වඩා දම් පියාටුවාව බෙහෙවින් වෙනස් ය. ආරම්භ ගාථාවල ස්වරූපයෙන් බුදුගොස් හිමියන්ගේ ම කෘතිය යි සිතිය හැකි බව ඇතැම් පඬිවරු කියති. කෙනෙකුගේ භාෂාස්වරූපය නියමයෙන් සෙවිය යුත්තේ පද්‍යයෙන් නොව ගද්‍යයෙනි. ගද්‍ය හෝ පද්‍ය කෙබන්දකින් නමුත් භාෂාස්වරූපය සලකා එයින් ම ග්‍රන්ථකර්තෘ සෙවීම පහසු වූවක් නොවේ. එකකර්තෘක ග්‍රන්ථයන්හි පවා අවස්ථා වශයෙන් බොහෝ වෙනස් කම් පැණේ. ගුරුළුගෝමි හා විද්‍යාචක්‍රවර්තීන් කළ සිංහල ග්‍රන්ථයන් ගෙන් එය මොනවට පැහැදිලියි.

දම්පියාටුවාව කොමල සිපිල භාෂා විලාසයකින් යුතු වුවත් සමන්තපාසාදිකාදියේ භාෂාස්වරූපයට වඩා ලොකු වෙනසක් ඇති බව නම් කිය යුතු ම ය. මනොරථපූරණී එතදග්ගපාලි වණ්ණනා යෙහි එන කථාවස්තු හා දම්පියාටුවා කථාවස්තු පරීක්ෂාවෙන් සම කර බලන කවරෙකුට වුවත් දෙපොතෙහි රචනා විලාසය කෙතරම් විසදෘශ දැයි පහසුවෙන් දක්ක හැකිය. ආරම්භ අවසාන දෙක්හි මඳ මඳ වෙනස් කම් ද පැණෙයි. ග්‍රන්ථ රචනා කාලය දක්වන තැන සිරිකුඩ්ඩ නම් රජකු ගැණ කියති. ඒ මෙසේයි:-

"විහාරෙ අධිරාජෙන කාරිතම්හි කතඤ්ඤුනා,
පාසාදෙ සිරිකුඩ්ඩස්ස රඤ්ඤො විහරතා මයා."

මෙයින් සිරිකුඩ්ඩ නම් රජකු විසින් කරවන ලද පහයක සිට ග්‍රන්ථය රචිත බව හැහෙයි. බුදුගොස් හිමියන් සමන්තපාසා දිකාදි අටුවා කරණලද්දේ මහානිගම ස්වාමීන් විසින් කරවන ලද

පහයක සිට ගෙණ ය. කිප තැනක සිට අටුවා කළ බවක් නො පෙණෙයි. සිරිකුඩඩ රජුත් සිරිනිවාස නම් අපර නාමයකින් යුත් මහානාම රජු ම ය යි සමහරු කියති. එය කෙසේ නිශ්චය කළ හැකි දැ යි අපට නො වැටහෙ යි.

එය එසේ හෝ කෙසේ හෝ වේවා, මේ කරුණුව දම්පියාටුවාව බුදුගොස් හිමියන්ගේ කෘතියක් නොවේ ය යි කීමට එතරම් හේතු නොවූවත් සම්බන්ධාසම්බන්ධය සැලකීමෙහි දී නම් බලවත් සැක යට කරුණු පෙණෙයි. බුදුගොස් හිමියන් විසින් කළ හැම කෘතිය කම එකිනෙකෙහි සම්බන්ධය පවතී. විශුද්ධිමාර්ගය හුදෙක් සවීය ප්‍රවීණත්වය විදහා ආදියෙන් ම කළ විශෙෂ ග්‍රන්ථයක් හෙයින් එහි අන්‍ය නවීනාර්ථ කථාවක නාමය සඳහන් වනු නො හැකිය. එහෙත් එහි නාමය පසුව තමන් කළ හැම ග්‍රන්ථයක ම පාහේ සඳහන් කළහ. සමන්තපාසාදිකාදියත් එසේය. මෙසේ එක් අර්ථකථාවක නාමය තවත් අර්ථකථාවක සඳහන් වීමෙන් එකිනෙකට සම්බන්ධත්වයක් පවතී. ඉන් බෙහෙවින් සඳහන් වන්නේ විසුද්ධිමග්ග සමන්තපාසාදිකා නම් දෙකය. අන්‍ය නාමයන්ද විරලව දක්ක හැකිය. දම්පියාටුවා නාමය අන් අටුවාවක හෝ අන් අටුවා නාමයක් දම්පියාටුවාවේ හෝ සඳහන් නො වේ.

ධම්මපද ගාථාවණ්ණනායන්හි විසුද්ධිමග්ග සමන්තපාසාදිකා නම් දෙකවත් සඳහන් විය යුතු තැන් ඇත්තේය. එබඳු සඳහනක් වත් ආරම්භ අවසාන දෙක්හි සමාන නමක් වත් නො පෙණේ. එපමණක් නොව කථා වස්තූන්හි බොහෝ අවුල්වූ තැනුදු විරල නො වෙයි. ඉන් කිසිවක් ගැණ ඇදුරු පරපුරෙන් එන සැටිය යි කිය හැකි නමුත් පොතෙහි ම එකිනෙකට සම නොවන තැන් ගැණ එසේත් කියනු නො හැකියි. මේ එක් නිදර්ශනයෙකි.

**“දෙවසිකං අනාථපිණ්ඩිකස්ස ගෙහෙ ද්වෙ භික්ඛු සහස්සානි භුඤ්ජන්ති, තථා විසාඛාය මහා උපාසිකාය.”** (ත්‍රි: මූ: 77 පිට.) යනුවෙන් අනේපිඬු සිටුගේ ගෙහි මෙන් විසාඛාවගේ ගෙහිද, දින පතා භික්ෂූන් දෙදහසක් දන් වළඳන බව කියති. තවත් තැනක දී **“චූලඅනාථපිණ්ඩිකස්ස පඤ්චසතානි. තථා විසාඛාය”** (ත්‍රි: මූ: 166 පිට) යනුවෙන් සුළු අනේපිඬු සිටුගේ ගෙහි මෙන් විසාඛාවගේ ගෙහි දින පතා වළඳන්නේ පන්සියයකැයි කියති. එක් තැනෙක දෙදහසෙකි, තව තැනෙක පන්සියයෙකි. මෙයින් කුමක් ඇදහිය හැකි ද? සුළු කරුණු වූවද, මෙබඳු විෂම තැන්

බොහෝ යි. සෙසු අටුවාවන්ට බෙහෙවින් සම නොවන අන් අටුවාවක් මේ හැර වෙන නැත්තේය. මෙසේ සලකන කල මේ සතරම එකකර්තෘක යයි නොකිය හැකිය.

භාෂා ස්වරූපයෙනුත් ආරම්භ අවසාන දෙක්හි පෙණෙන සමාන කමින් හා අන්‍යාර්ථකථාවන් හා පැවති සම්බන්ධයෙනුත් ඛුද්දකපාඨ සුත්තනිපාත අටුවා දෙක හා ජාතක අටුවාවත් සාමාන්‍යයෙන් එකුමන්ගේ කෘතිය යි කිය හැකි සේ පෙණේ. එහෙත් සමන්තපාසාදිකාදියෙහි සමා නව පෙණෙන ඇතැම් ලක්ෂණ මේ එකම අටුවාවකවත් දක්නට නො මැතියි. මොවුනතුරෙන් ඛුද්දකපාඨට්ඨකථාව පළමුවෙන් කරණ ලදී. විශුද්ධිමාර්ගාදියෙන් ගත් වාක්‍යප්‍රදේශයන් ගලපා නිතැතින් කළ ඛුද්දකතම අටුවාවත් ඒකය. සුත්තනිපාත අටුවාව හා ජාතකට්ඨකථාව ඉක්බිතිව නිපදවන ලදී.

අනතුරුව ධම්ම පදට්ඨ කථාව කවුරුන් විසින් නිෂ්පාදිත දැයි සෙවිය යුතුය. බුදුගොස් හිමියන්ට සම කාලිකව බුද්ධඝොෂ නම් අන්‍යතරාචාර්‍ය්‍ය වරයකු සිටිය බව පෙණේ. අභිධර්ම අටුවා කරණු පිණිස මහ බුදුගොස් හිමියන්ට ආරාධනය කරණ ලද්දේ උන් වහන්සේ විසිනි.

**"අත්ථප්පකාසනත්ථං තස්සාහං යාචිතො ඨිතගුණෙන,**
**යතිනා අදන්ධගතිනා සුබුද්ධිනා බුද්ධඝොසෙන."**

මම ඒ සම්මොහවිනොදනියෙහි අර්ථ ප්‍රකාශ කරණු පිණිස ස්ථිර ගුණ ඇති අදන්ධ ගතියෙන් යුත් මනා බුද්ධියක් ඇති බුද්ධඝොෂ නම් යතිවරයන් විසින් යාචඤා කරණ ලද්දෙක් වෙමි යන සම්මොහවිනොදනී ගාථාවෙන් හා–

**"විසුද්ධාචාරසීලෙන නිපුණාමලබුද්ධිනා**
**භික්ඛුනා බුද්ධඝොසෙන සක්කච්චං අභියාචිතො."**

පිරිසුදු ආචාර සීලයෙන් යුත් නිපුණවූ නිර්මල බුද්ධියක් ඇති බුද්ධඝොෂ නම් භික්ෂු විසින් යාචඤා කරණ ලද්දා වූ මම මේ අත්ථසාලිනිය ලියමි යන අත්ථසාලිනී ගාථාවෙනුත් මහාර්ථ කථාචාර්‍ය්‍ය අනුබුද්ධ බුද්ධඝොෂ යතිශ්‍රෙෂ්ඨයන් විසින් දෙවන බුද්ධඝොෂාචාර්‍ය්‍යයෝ මෙසේ වර්ණිතයහ. අන් කිසිවක් නැතත් මේ වර්ණනාවලින්ම දෙවන බුදුගොස් හිමියනුදු සාරභාර ගුණ ඇති විශාරද

පඬිවරයකු බව නිශ්චිතයි. මහා බුද්ධඝොෂාචාර්‍ය්‍යයන් හා සම්පාශ්‍රයෙන් යුතුව සිටි බව පැහැදිලි හෙයින් මෙතුමන් විසිනුදු කිසියම් අර්ථකථාවක් නොතිපදවන ලද්දැ යි නොසිතිය හැකියි. කුද්‍රගත් සඟියට අයත් අටුවා එකම විශෙෂ නාමයකින් තිබිය යුතු යයි සලකා හැකි තාක් මහ බුදුගොස් හිමියන්ට අනුකූල වන පරිදි මේ දෙවන බුදුගොස් හිමියන් විසින් දම්පියාටුවාව රචිත ය යි ද එහි බුද්ධඝොෂ නාමය දුටු පමණින් වරදවා වටහා ගත් පශ්චාත් කාලිකයන් මහ බුදුගොස් හිමියන්ගේ කෘතිය හැයි සිතා අවසාන පාඨය යොජිත යයි ද අපගේ හැඟිමයි.

කවරකු විසින් නමුත් දම්පියාටුවාව නිපදවන ලද්දේ ජාතක අටුවාවට පසුව යයි අනුමානයෙන් කිය හැකිය. ඒ හැර අන් කවරකට ඉදිරි පසු විද්‍යයි නිශචය වශයෙන් කිමට සඞෙකතයක්ද නැත්තේය. ගණතින් තෙළෙසක් වූ මෙකී අටුවාවෝ බුද්ධඝොෂ කෘතීහුයයි සලකන ලදහ.

බුදුගොස් හිමියන් වහන්සේට අනතුරුව අර්ථකථාකරණය ආරම්භ කෙළේ බදරතීර්ථවාසී ධම්මපාල හිමිවරයන් විසිනි. අවසානයෙහි කළ බුද්ධඝොෂකෘතියයි සැලකෙන ජාතක අටුවාවේ නාමය මෙතුමන් විසින් ආදියෙන් ම කළ උදන අටුවාවෙහි සඳහන් වීමෙන් එය පැහැදිලිය. උදනට්ඨකථාදි අටුවා සතක් මූන්වහන්සේ විසින් නිෂ්පාදිත යයි නිසැකව කිය හැකියි. ඔවුනතුරෙන් උදනට්ඨකථාව ආදියෙන් ම කළ බවට සැකයෙක් නැත්තේය. කිසිවකු ඉතිවුත්තක අටුවාවයයි කියන නමුත් ඊට හේතුවක් අපවිසින් නො දක්නාලදී. උදන අටුවාව ලඟට කරණ ලද්දේ ඉතිවුත්තක අටුවාවයි. උදන ඉතිවුත්තක අටුවා දෙක පිළිවෙළින් නිපදවනලද බව **"විත්‍ථාරො පන පරමත්‍ථදීපනියා උදානට්ඨකථාය ඉතිවුත්තකට්ඨකථාය ච වුත්තනයෙනෙව වෙදිතබ්බො."** විස්තරය වනාහි පරමත්‍ථදීපනී නම් උදනාර්ථකථාවේ හා ඉතිවුත්තකාර්ථකථාවේ කී ක්‍රමයෙන් දතයුතුය- යන ථෙර ගාථා අටුවා (ත්‍රි: මූ: 36 පිට) පාඨයෙන් පෙණේ.

ඉක්බිතිව විමානවත්‍ථු අටුවාවද එයට පසුව පෙතවත්‍ථු අටුවාවද රචිත බව කිය යුතුය. විමාන වත්‍ථුනාමය-

**"පරමත්‍ථදීපනියං විමානවත්‍ථුඅට්ඨකථායං."** පරමත්‍ථදීපනී නම් විමානවස්තු අර්ථකථාවෙහි යන පාඨය පෙතවත්‍ථුඅටුවායෙහි (ත්‍රි: මූ: 54–174 පිටු) දක්වනලදී. මීලඟට ථෙරගාථා ථෙරීගාථා

අටුවා නිෂ්පාදිත යයි ද ඉන් පසු ව චරියාපිටක අටුවාව කරණ ලද්ද යිද කිය යුතුය. ථෙරගාථා අටුවාවේ (ත්‍රි: මූ: 8 පිට) "චරියාපිටක වණ්ණනායං" යන පාඨය පෙණෙතත් එය මත්තෙන් කළ බව එපමණකින් සිතිය නො හැකියි. එසේ නම් එය කිය යුත්තේ "චරියාපිටකට්ඨකථායං" යනාදී ක්‍රමයකිනි. එබඳු සඳහනක් නැතිබැවින් ථෙරගාථා අටුවාවට පසුව චරියාපිටක අටුවාව කළ බව සිතිය යුතුයි. නෙත්තිප්පකරණ අටුවාව සම්පාදිත වූයේ අවසාන යේදී ය.

බුද්ධවංශ, පටිසම්භිදා, නිද්දෙස අටුවා තුණ ආචාර්‍ය්‍යවරයන් තිදෙනෙකු විසින් නිෂ්පාදිතය. එයින් බුද්ධවංස අටුවාව කරණ ලද්දේ බුද්ධදත්ත හිමියන් විසිනි. එහි අත්‍යර්ථකථාවක නාමය හෝ අත්‍යර්ථ කථාවන්හි එහි නාමය හෝ සඳහන් නොවන හෙයින්ද ආරම්භ අවසාන දෙක්හි විශෙෂ සංඛෙතයක් නැති බැවින්ද අසුවල් ග්‍රන්ථයට පෙරටුව හෝ පසුව කරණ ලදැයි නිශ්චය කළ නොහැකිය.

කතීඃපාදයන් බුදුගොස් හිමියන්ට සම කාලිකව සිටි හෙයින් ධම්මපාල හිමියන් අර්ථකථා කරණ කාලයේදීම මේ අටුවාවද කරණ ලදැයි සිතිය හැකියි. මෙයට දී තිබෙන විශෙෂ නාමය මධුරත්ථප්ප කාසිනී යනුයි. සමහරු මධුරත්ථවිලාසිනී යයිද කියති. මේ නම් දෙකම ග්‍රන්ථාවසානයෙහි පෙණෙති.

"පපඤ්චසූදනං විවජ්ජන්තා, මධුරත්ථස්ස සබ්බසො,
සම්පත්තාසනතො තස්මා, මධුරත්ථප්පකාසිනි."

යන්නෙන් කතීඃන් විසින් ම මෙයට යොදන ලද නාමය මධුරත්ථප්පකාසිනී බව පැහැදිලියි. පසුකල ලේඛකයන් විසින්:-

"ගරූහි ගිත නාමෙන බුද්ධදත්තෙනාති විස්සුතො,
ථෙරෙන කතො අට්ඨකථං මධුරත්ථවිලාසිනි."

යනුවෙන් කියනලද ගාථාව ග්‍රන්ථයේ නාමය මධුරත්ථවිලාසිනී යයි සිතා ගැණීමට හේතුයි.

මහානාම හිමියන් විසින් පටිසම්භිදා අටුවාව කරණ ලද්දේ ඉන් පසුවයි. එය පළමුවන මුගලන් රජුගේ මරණයෙන් නොහොත් කුමාරදාස රජුගේ රාජ්‍යාදයෙන් තුන්වන වර්‍ෂයෙහිදී කරණලද බව ග්‍රන්ථාවසානයෙහි කියති. අනතුරුව නිද්දෙස අටුවාව කරණ

ලද්දේ උපසේන හිමියන් විසිනි. එය සිරිනිවාස සිරි සඞ්ඝබොධි නාමයෙන් යුත් රජකුගේ රාජ්‍යයෙන් සවිසි වසේදී කළබව ග්‍රන්ථාවසානයෙන් පෙණෙයි. මෙයට දී තිබෙන විශෙෂ නාමය සද්ධම්මපජ්ජෝතිකා යනුයි "සමයං අනුලොමෙන්තො." යනාදි ගාථා පෙළක් පටිසම්භිදා නිද්දෙස අටුවා දෙක්හිම පෙණෙයි. එය පටිසම්භිදා අටුවාවෙන් ගෙණ නිද්දෙස අටුවාවෙහි යොදන ලද්දකි.

අපදාන අටුවාවට දී තිබෙන විශෙෂ නාමය විසුද්ධජනවිලාසිනී යනුයි. එය කරණ ලද්දේ ධම්මපාල හිමියන් විසිනැයිද බුදු ගොස් හිමියන් විසිනැයි ද කියති. ඒ එකක් වත් නිශ්චය කිරීමට කිසිද සාක්ෂියක් අපට හමු නොවීය. දම්පියාටුවා කතුවරයන් විසින්ම හෝ අන්‍යතරාචාර්‍යයකු විසින් කරණ ලදැයි කිය යුතුය.

බුද්ධඝොෂ මහාසවාමිපාදයන් විසින් නිපදවනලද අට්ඨකථාවන්ගේ පටිපාටිය මෙසේයි:- සඞ්ඝරාජ සඞ්ඝපාල හිමියන්ගේ ආරාධනයෙන් කළ විසුද්ධිමග්ග ය, බුද්ධසිරිතෙරුන් වහන්සේගේ ආරාධනයෙන් කළ සමන්තපාසාදිකාව, සුමඞ්ගල පිරිවෙන් වැසි දාඨානාග තෙරුන්ගේ ආරාධනයෙන් කළ සුමඞ්ගලවිලාසිනිය, බුද්ධමිත්ත තෙරුන්ගේ ආරාධනයෙන් කළ පපංචසූදනිය, ජෝතිපාල තෙරුන්ගේ ආරාධනයෙන් කළ සාරත්ථප්පකාසිනිය, ජෝතිපාල තෙරුන්ගේ හා ජීවක උපාසකයන්ගේ ආරාධනයෙන් කළ මනොරථපූරණිය, බුද්ධඝොෂ නම් තෙරුන්ගේ ආරාධනයෙන් කළ අත්ථසාලිනී-සම්මොහවිනොදනී-පරමත්ථප්පකාසිනී අටුවා තුණ, සොණ තෙරුන්ගේ ආරාධනයෙන් කළ කඞ්ඛාවිතරණිය යන මේ ග්‍රන්ථ දශය හා ඛුද්දපාඨට්ඨකථා සුත්තනිපාතට්ඨකථා දෙකද අත්ථදස්සි බුද්ධමිත්ත බුද්ධදෙව තෙරවරුන්ගේ ආරාධනයෙන් කළ ජාතකඅටුවාවද යන මොහුයි. කුදුගත් සඟියට අයත් මේ අටුවා තුණෙන් ආදි දෙක කිරීමට ආරාධනය කළවුන්ගේ නම් සඳහන් නොවෙයි. මෙසේ බුදුගොස් හිමියන් පිළිවෙළින් කළ අට්ඨකථා තෙළෙසකි.

ධම්පාල හිමියන් කළ අට්ඨකථාවන්ගේ පටිපාටිය මෙසේය:- උදාන, ඉතිවුත්තක, විමානවත්ථු, පෙතවත්ථු, ථෙරගාථා, ථෙරීගාථා, චරියාපිටක අටුවා සහ ධම්මරක්ඛිත තෙරුන්ගේ ආරාධනයෙන් කළ නෙත්තිප්පකරණ අටුවාවද යන මොහුයි. විශෙෂ නාමයෙන් පරමත්ථදීපනී නම්වූ සංඛ්‍යා වශයෙන් සතක්වූ මොවුනතුරෙන් ආදි

ග්‍රන්ථ සය කිරීමට ආරාධනය කළවුන්ගේ නාමයෝ සඳහන් නො වෙති. බුද්ධදත්තාචාර්යයන් විසින් බුද්ධසිහ තෙරුන්ගේ ආරාධනයෙන් පරමත්ථප්පකාසනිය ද මහානාම ආචාර්යවරයන් විසින් සද්ධම්මප්පකාසිනිය ද උපසේනාචාර්යයන් විසින් දෙව නම් තෙරුන්ගේ ආරාධනයෙන් සද්ධම්මපජ්ජෝතිකාව ද පිළිවෙළින් නිෂ්පාදිත වූ සේ සිතිය හැකි ය. සද්ධම්මප්පකාසිනිය කිරීමට ආරාධනය කළවුන්ගේ නම් හමු නො වී ය.

යථොක්ත අටුවා කරණයට අතර කාලයක දී හෝ පසු ව හෝ අවිනිශ්චිත කර්තෘවරයන් විසින් කුමාරකස්සප තෙරුන්ගේ ආරාධනයෙන් දම්පියාටුවාව ද අප්‍රකට කෙනෙකුන්ගේ ආරාධනයෙන් අපදාන අටුවාව ද නිෂ්පාදිත ය. ථෙර ථෙරී ගාථා අටුවාව කර්තෘවරයන් විසින් එක ම ග්‍රන්ථයක් වශයෙන් කරණ ලද නමුදු ථෙර ගාථා අටුවා ය, ථෙරීගාථා අටුවා ය යි දෙකක් වශයෙන් ව්‍යවහාර ප්‍රාප්ත ය. නිද්දෙස අටුවාව ද එසේ යි. භාවිත වන්නේ මහානිද්දෙස අටුවා ය, චූලනිද්දෙස අටුවා ය යි දෙකක් වශයෙනි.

---

## අට්ඨකථා සමානාසමානත්වය.

---

පූර්වාර්ථකථා ය, නවීනාර්ථකථා ය යි අර්ථ කථා දෙකොටසෙක් වෙයි. පූර්වාර්ථකථා නම් මහාඅට්ඨකථාව හා පච්චරිය කුරුන්දි අන්ධක සඞ්ඛෙප යන අටුවා පසයි. නවීනාර්ථකථා නම් බුද්ධඝොෂාදි ආචාර්යවරයන් විසින් සම්පාදිත වර්තමාන අර්ථකථාවෝ යි. නවීනාර්ථකථාවන්ගේ පහළ වීමෙන් පූර්වාර්ථකථාවෝ අභාවයට ගියහ. කවර කලෙක කෙසේ අභාවයට ගියාහු දැ යි නිසැක ව කීමට තරම් සාක්ෂ්‍යයකුදු නැත්තේ ය. බුදුගොස් මාහිමියන් සමයෙහි ම ගින් තෙන් දවන ලද්දාහුය යි ද, සෑයෙක නිදන් කරණ ලද්දාහුය යි ද ඒ පිළිබඳ නානාවිධ මතාන්තරයෝ වෙති. ඒ එකකුදු පිළිගැණීමට සෑහෙන කිසි ම හේතුවක් නැත්තේය. දම්පියාටුවා ගැටපදය ආදි නවීන ගැටපද කරණ කාලය තෙක් පැවති බව ඒ ගැටපදවලින් පෙණේ. කෙසේ නමුදු ඒ පැරණි අර්ථකථාවන්ගේ හා පැරණිවූ ද නවීන වූ ද ග්‍රන්ථිපදාදියේ අභාවය හෙළ බසට මෙන් ම වර්තමානයෙහි පැන නගින යම් යම් කරුණු නිරාකරණයට ද බලවත් බාධාවකි. පූර්වාර්ථකථාවන්හි ඇතුළත් වූ සියල්ල නවීනාර්ථකථාවන්හි

සඞ්ගෘහීත වුව ද අන් අටුවා කෙසේ වෙතත් මහා සඞ්ගීති කාරක උතුමන් විසින් නිපදවූ ද මහා සඞ්ගායනාවන්ට නැගුනාවූ ද මහා අට්ඨකථාව තුබූ සේ ම පෙලබසින් මේ තාක් ආරක්ෂා කළ යුතු ව තුබුනේ ය.

තදට්ඨකථාග්‍රන්ථපදයන් දැනට අප හමුවෙහි අවිද්‍යමාන වුව ද ඔවුන්ගේ තත්ත්වය නවීනාට්ඨකථාටීකානුසාරයෙන් සාමාන්‍යයෙන් සිතා ගත හැකි ය. ඔවුනතුරෙන් මූල් මහඅටුවාව සඞ්ගීතිකාරකයන් පෙල බසින් කළ කෘතියක් බවත් පසු ව ලක්දිව දී හෙළ බසට නගන ලද බවත් මුල දී කිවෙමු. එය ත්‍රිපිටකයට ම සාධාරණ ව නිපදවන ලද්දකි. සම්පූර්ණ පාලි ධම්මයෙහි වැණිය යුතු තැන් හා ග්‍රන්ථස්ථාන කොටියෙන් විසඳන ලද්දේ මෙහි ය. ත්‍රිපිටක ධම්මයෙහි ඒ ඒ ධම්ම කොට්ඨාසයන් වෙන් වෙන් ඡේද වශයෙන් නිෂ්පාදිත බව පෙණේ. “විනයට්ඨකථායං වුත්තං–දීඝට්ඨකථායං යුත්ත” යනාදීන් විසුද්ධිමග්ගාදි නවීනාට්ඨකථාවන්හි දක්වන ලද්දේ එහෙයිනි. මහාඅට්ඨකථාදීහු ද එය ම අනුකරණය කිරීමෙන් තව තවත් අවණ්ණිත ස්ථාන හා ග්‍රන්ථස්ථානත් විසඳූ ත්‍රිපිටකයට ඡේද වසයෙන් ලියන ලද්දාහු වෙති. කිසිවෙක් මහ අටුවාව සූත්‍ර පිටකයට ද පච්චරිය කුරුන්දි අටුවා දෙක පිළිවෙළින් අභිධම්ම විනය පිටක දෙකට ද ලියන ලදැයි කියති. ඒ මෙසේ යි.

**“ආයස්මා බුද්ධඝොසො කුරුන්දට්ඨකථා සීහලභාසං පරිවත්තෙත්වා මූලභාසාය මාගධිකාය නිරුත්තියා සමන්තපාසාදිකා නාම විනයපිටකට්ඨකථං අකාසි. තදනන්තරං සුත්තන්තපිටකෙ මහාඅට්ඨකථං සීහලභාසං පරිවත්තෙත්වා සුමඞ්ගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථඤ්ච ඨපෙසි. තථා පපඤ්චසූදනී නාම මජ්ඣිමට්ඨකථඤ්ච ඨපෙසි. තථා මනොරථපූරණිං නාම අඞ්ගුත්තරනිකායට්ඨකථඤ්ච ඨපෙසි. තදනන්තරං අභිධම්මපිටකෙ මහාපච්චරියට්ඨකථං සීහලභාසං පරිවත්තෙත්වා මූලභාසාය මාගධිකාය නිරුත්තියා අට්ඨසාලිනී නාම ධම්මසඞ්ගණ්‍යට්ඨකථඤ්ච ඨපෙසි. තථා සම්මොහවිනොදනී නාම විභඞ්ගප්පකරණට්ඨකථඤ්ච ඨපෙසි. කථා පරමත්ථදීපනී නාම පඤ්චප්පකරණට්ඨකථඤ්ච ඨපෙසි.”**
**(සද්ධම්ම සඞ්ගහ පුස්කොළ පොත)**

ආයුෂ්මත්වූ බුද්ධඝෝෂ ස්ථවිරතෙමේ කුරුන්දි අටුවාව හෙළ බසින් පෙරළා මාගධී නම් වූ මූලභාෂානිරුක්තියෙන් සමන්තපාසාදිකා නම් විනය අටුවාව කෙළේ ය. අනතුරු ව සූත්‍ර පිටකයෙහි

මහ අටුවාව හෙළු බසින් පෙරළා සුමඞ්ගලවිලාසිනී නම් දික්සඟි අටුවාව ද පපංචසූදනී නම් මැදුම්සඟි අටුවාව ද සාරත්ථප්පකාසිනී නම් සංයුත් අටුවාව ද මනොරථපූරණී නම් අඞ්ගුත්තර අටුවාව ද තැබී ය. අනතුරු ව අභිධම්මපිටකයෙහි මහාපච්චරිය අටුවාව හෙළු බසින් පෙරළා මාගධී නම් වූ මූලභාෂානිරුක්තියෙන් අත්සාලිනී නම් ධම්මසඞ්ගණී අටුවාව ද එසේ ම සම්මොහවිනොදනී නම් විභඞ්ග අටුවාව ද පරමත්ථදීපනී නම් පඤ්චප්පකරණ අටුවාව ද කෙළේ ය යනු එහි අදහසයි.

මෙය මිථ්‍යාමාත්‍රයක් බව නවීනාර්ථකථා ටීකා වලින් පෙණෙන නමුදු සද්ධම්මසඞ්ගහාදි සැලකිය යුතු ග්‍රන්ථයන්හි ද දක්වෙන පැරණි මතයක් හෙයින් ඉන් එක් කරුණක් සිතා ගත හැකි ය. එනම්:- ඒ ඒ අටුවාවන්හි බෙහෙවින් වර්ණිතය යි සැලකිය හැක්කේ ඒ ඒ පිටකධම්ම බවයි. අභිධර්මපිටකය ධර්මස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් විශාල වුව ද, විනය අභිධර්ම පිටකද්වයට ම වඩා ග්‍රන්ථ සඞ්ඛ්‍යාවෙන් සූත්‍රපිටකය විශාල ය. එහෙයින් මහ අටුවා වර්ණනයෙහි සූත්‍රාන්තධර්ම බහුල විය හැකි ය. අප මුලින් කී පරිදි ජාතකාදි කථාවස්තු සංග්‍රහ විය යුතු හෙයිනි. ඒ දුටු පච්චරිය කුරුන්දි අර්ථකථාචාර්ය වරයෝ ද මහ අටුවාවේ අඩුවෙන් වර්ණිතවූ පිටක දෙකෙහි ධර්ම බහා වැඩියෙන් වර්ණනා කළහයි සිතිය හැකි ය. යථොක්ත මතයෙහි කිසියම් සත්‍යයෙක් වේ නම් මෙය එයට හේතු ය.

මෙසේ පූර්වාර්ථකථාවෝ එක් මගකට ගමන් කළාහු ය. එනම්:- හැම අටුවාවක් ම ත්‍රිපිටකයට සාධාරණ පරිදි ඡේද වශයෙන් නිපදවීමෙනි. නවීනාර්ථකථාචාර්යවරයෝ එයට වඩා පහසු මඟෙක ගමන් කළාහු ය. එය එසේ විය යුතු ය. ලොකයාගේ පරිශුද්ධ පරමාර්ථධර්මාවබොධය ක්‍රමයෙන් පිරිහෙන ඥානශක්තියෙන් ද ස්මෘතිශක්තියෙන් හා ධාරණශක්තියෙන් ද හීන වන ලොකවාසීන්ට බුදු රදුන් වහන්සේගේ අනුශාසනය වටහා ගැණීමට පහසු වූත් සරල වූත් මාර්ගයක් ඇති විය යුතු ය. එහෙයින් බුද්ධඝොෂාදි නවීනාර්ථකථාචාර්යවරයෝ පෙල බසෙහි එක් ග්‍රන්ථයකට වෙන වෙන ම අටුවා සපයාලීමට කල්පනා කළහ. අර්ථවර්ණනය ද පෙල ගසා අවබෝධයට පහසු පරිදි පිළියෙල කළහ. බුදුගොස් හිමියන් වහන්සේ නවීන අටුවා කර්තෘවරයන් අතුරෙන් විවාදයක් නැති ව ම ප්‍රමුඛස්ථානය ගණිති. උන්වහන්සේගේ අර්ථකථා අනුගමනය කිරීමෙන් ශ්‍රෙෂ්ඨස්ථානයෙහි තබා සැලකීමෙන් ධර්මපාලාදි

සෙසු ආචාර්‍යපාදයෝ අටුවා කළහ. එහෙත් බුදුගොස් මාහිමියන්ගේ අටුවාවන්හි විශෙෂ ලක්‍ෂණයෝ ද වෙති. ආචාර්‍යවාද නිරාකරණයේ දී මිලිඳු පඤ්හයෙන් කරුණු උපුටා සාධක කොට දැක්වීම එක් විශෙෂ ලක්‍ෂණයෙකි. එතුමන් නාගසේන හිමියන්ගේ කියුම් ඉතා ගෞරවයෙන් සැලකූ බව එයින් පෙණෙයි. "ආයස්මා නාගසෙනත්ථෙරො" "නාගසෙනත්ථෙරො" යනුවෙන් විශෙෂ නාමයෙන් ද "මහාථෙරො ආහ," "ථෙරො ආහ" යනුවෙන් සාමාන්‍යනාමයෙන් ද ආගමාර්ථකථාවන්හි බොහෝ සෙයින් දක්වන ලද්දේ එහෙයිනි. මේ ලක්‍ෂණය සෙසු ආචාර්‍යවරයන් එතරම් දුරට අනුගමනය කළ බවක් නො පෙණේ. එසේ ම එක් අටුවාවක නාමය තවෙකක සඳහන් කිරීමෙන් උන්වහන්සේගේ හැම අටුවාවක් ම එකිනෙකට සම්බන්ධ ව පැවතීම තවත් ලක්‍ෂණයෙකි. ධම්මපද අපදාන අටුවාචාර්‍යයන් හා බුද්ධදත්තහිමියන් හැර සෙසු ආචාර්‍යවරයෝ ද මේ ලක්‍ෂණය අනුගමනය කළහ. විශෙෂයෙන් අනුගමනය කරණ ලද්දේ ධම්පාල හිමියන් විසිනි.

නවීනාර්ථකථාකරණයෙහි ද්විතීය ස්ථානය ගන්නා ධම්මපාල හිමියන් ගේ කෘතිවල ද විශෙෂ ලක්‍ෂණ දෙකෙකි. එනම් තදීය හැම කෘතියකට ම එක ම සාධාරණ නාමයක් තැබීම හා ග්‍රන්ථයන් ගේ ආරම්භ අවසාන දෙක්හි සමානත්වයක් තැබීමයි. සාධාරණ ව තැබූ විශෙෂ නාමය නම් පරමත්ථදීපනී යනුයි. හැම ග්‍රන්ථයක් ම "මහාකාරුණිකං නාථං" යනාදි ගාථා සතරකින් ආරම්භය හා "ඉති තං සඞ්ඛරොන්තෙන" යනාදි ගාථා සතරකින් අවසානයත් කෙරෙති. චරියාපිටක නෙත්තිප්පකරණ අටුවාදෙක්හි පමණක් ඒ ලක්‍ෂණය මඳක් වෙනස් වි ය. චරියාපිටක අටුවාවේ ආදිම ගාථාව අන්‍ය වූවකි. නෙත්තිප්පකරණ අටුවාවට විශෙෂ නාමයක් නොමැතියි. එය කාලයෙන් වූ වෙනසකැයි සිතීමට නො හැකි නො වේ.

බුද්ධදත්ත ස්වාමිපාදයන්ගේ කෘතියෙහි ද විශෙෂ ලක්‍ෂණ දෙකෙකි. නවීන අටුවා නාමයක් සඳහන් නො කිරීම එකෙකි. නිරුක්තිය අනු ව පාලිය සකස් කිරීම නො ව පාලිය අනු ව නිරුක්තිය සකස් කොට දැක්වීම අන්‍ය ලක්‍ෂණයයි. මහානාම-උපසේන කතුවරයන්ගේ කෘතීන්හි විශෙෂ ලක්‍ෂණයෙක් නො පෙණේ. මෑත කාලයෙහි මහතෙරවරුන් විසින් පාලියෙන්

උපුටාගත් සූත්‍ර සංග්‍රහ කිරීමෙන් කළ සුත්තසංගහ චතුභාණවාරාදි ධර්මසංග්‍රහයන්ට තදර්ථකථාපාලියෙන් ම උපුටා කළ සුත්තසංගහට්ඨ කථා- චතුභාණ වාරට්ඨකථාදිය ද නවිනාර්ථකථා පඞ්ක්තියට ම ඇතුළත් වෙයි.

---

## නවීන අටුවා කෙසේ සම්පාදිත ද?

---

මෙය ද වෙන් වසයෙන් විමසිය යුතු ප්‍රශ්නයෙකි. වාර්තාමාතික බොහෝ දෙනෙකුන්ගේ ආකුලත්වයට හේතු වූවක් හෙයිනි. මේ පිළිබඳ ප්‍රසිද්ධ මත දෙකෙක් වෙති. නවීන අටුවා පූර්වාර්ථකථාවන්ගේ පරිවර්තන ය යි ද තත්කර්තෘවරු පරිවර්තකයෝ ය යි ද එක් මත යෙකි. ඒ එසේ නො වේ. නවීන අටුවා පූර්වාර්ථකථානුසාරයෙන් නිපදවූ සංස්කරණයෝ ය; තත් කර්තෘවරු සංස්කාරකයෝ ය යනු දෙවන මතයයි.

අපේ හැඟීම පරිදි මේ දෙමතයෙහි ම සත්‍යයක් පවත්නා හෙයින් බැහැර ලිය නො හැකි ය. ජම්බුද්වීපික සඞ්ඝයා බුද්ධඝොස් හිමියන් ලක්දිවට එවන ලද්දේ පූර්වාර්ථකථාවන් පෙළ බසින් තබනු පිණිස බව මුලින් කීවෙමු. ඒ නියමය පරිදි උන්වහන්සේ විසින් හෙළු බසින් තුබූදෑ තුබූ සේ ම පෙළ බසට නැඟීම මිස අන් කිසිවක් නො කරණලදැයි කෙනෙකුට කෙටියෙන් සිතා ගත හැකි ය. එහෙත් එතුමෝ එසේ නො කොළෝ ය. නියම අර්ථකථා කර්තෘත්වයක සිට ගෙණ තුබූදෑ සකසා පෙළ ගසා ඌනස්ථාන පූරවා අධික වර්ණන යන් බහා පරිවර්තනය කොළෝ ය. පරිවර්තනයෙහි භෙදයෝ වෙති. පදානුපදික පරිවර්තනය එකෙකි. පද ගැණ ම නො සලකා අර්ථය (භාවය) පමණක් ගෙණ අන් බසකට නැඟීම එකෙකි. බුද්ධ ඝොෂාදි ආචාර්‍ය්‍යවරයන් කළ පරිවර්තනය දෙවන ක්‍රමයට ගිණිය හැකියි. එපමණක් නො ව පෙර අටුවාවන්හි නො ආ දෙය ද ථෙර වාදයෙන් ගෙණ සංග්‍රහ කළහ. ඒ මෙසේයි:-

මූල් මහ අටුවාව ක්ෂීණාශ්‍රවයන් විසින් කළ හෙයින් හා සඞ්ගායනා තුණට නැගුනු හෙයිනුත් සුපරිසුද්ධ එකක් බව පිළිගත යුතු ය. ඒ අනුසාරයෙන් එහි ඇතුළත් නොවූ බොහෝ වර්ණනයන් ඇතුළත් කොට පච්චරිය ආදි අටුවා. සිවුවන ශතවර්‍ෂයෙන් පසු තත්

කාලික පය්‍යාප්තිධරයන් විසින් නිපදවන ලදී. ඒ අටුවාවන්හි විරොධස්ථාන ඇති බැවින් එතුමන් රහතුන් නො වෙතියි කියති. ත්‍රිපිටකයට සාධාරණ ව ලියවුනු අටුවා පසක් මෙසේ ඇති කල එකිනෙකට නො ගැළපෙන විරොධ මත ද ඇති කල බුද්ධඝොෂාදී උතුමන් වැනියන් කෙසේ පදනුපදික පරිවර්තනයක් කළ හැකි ද? එහෙයින් එතුමෝ සූත්‍රාදියට සම කර බලා බැහැර කළ යුතු දෙය බැහැර කොට සූත්‍රාදියට අනුකූල කිසිවකුත් බැහැර නො කොට අතිරෙක වර්ණනාවන්ගෙන් හැඩ ගසා නවීන අට්ඨකථා සම්පාදනය කළහ.

"මහාඅට්ඨකථායං පන සච්චම්පි අලිකම්පි දුක්කටමෙව වුත්තං. තං පමාදලිඛිතන්ති වෙදිතබ්බං." මහ අටුවාවෙහි වනාහි සත්‍යයෙහි ද අසත්‍යයෙහි ද දුකුළාව ම කියන ලදී. එය ප්‍රමාදයෙන් ලියන ලද්දකැයි දතයුතු ය යනුවෙන් මහ අටුවාවේ ද ප්‍රමාද පතිස්ථාන ඇතිවූ බව සමන්තපාසාදිකාවෙහි (ත්‍රි:මු: ප්‍රථමභාග 224 පිට) දක්වන ලදී. එසේ ම කාරුණාව දැක්විය යුතු ආකාරය විස්තර කරණ තැනː-

"අංගුත්තරට්ඨකථායං පන පඨමං වෙරිපුග්ගලො කරුණායිතබ්බො. තස්මිං චිත්තං මුදුං කත්වා දුග්ගතො තතො පිය පුග්ගලො තතො අත්තාති අයං කමො වුත්තො. සො දුග්ගතං දුරුපෙතන්ති පාළියා න සමෙති." අංගුත්තර අටුවාවෙහි වනාහි පළමු කොට වෛරී පුද්ගලයා කෙරෙහි කාරුණාව වැඩිය යුතුය. ඔහු කෙරෙහි කාරුණාව වැඩීමෙන් සිත මෘදු කොට දුඃඛිතයා කෙරෙහිත් ඉන් පසු ප්‍රිය පුද්ගලයා කෙරෙහිත් අනතුරු ව තමා කෙරෙහි ද වැඩිය යුතුයයි කියනලද බව හා එය නපුරු කොට ගැණී මෙක, දුරු කට යුත්තෙක,පෙළ හා සම නොවන්නකැයි විසුද්ධිමග්ග බ්‍රහ්මවිහාර නිර්දෙසයෙහි (මුද්‍රිත 240 පිට) කියන ලදී. මෙහි අංගුත්තර අටුවා යයි කියන ලද්දේ නවීන අටුවාව නො ව මහ අටුවාවේ ම ආගමාර්ථකථාඡෙදයෙහි අංගුත්තර නිකාය පිළිබඳ ව කළ අර්ථවර්ණනා කොටස ය.

මෙසේ මහ අටුවාවේද තවත් ප්‍රමාද පතිතස්ථාන කීපයක් කියන ලදී. මොනු කෙසේ අ තිවූවාහුද? ක්ෂීණාශ්‍රවයන්ගේ කෘතීන් හිත් මෙබඳු විෂමස්ථාන ඇති විය හැකි ද? යනු විමසිය යුතුය. මේ විෂමස්ථානයෝ මහඅටුවාව නිපදවූ ක්ෂීණාශ්‍රවයන් අතින් සිදුවූවාහු නො වෙත්. එතුමෝ බොහෝ සෙයින් එතදග්‍රපාලියෙන් තත

තුරු ලැබුවාවූද බුදුරදුන් වහන්සේ ඇසුරු කළාවූද ප්‍රතිසම්භිදා ප්‍රාප්ත මහාක්ෂීණාශ්‍රවයෝයි. පසු කාලයෙහි ලේඛකයන්ගේ ප්‍රමාදයෙන් පතිත වූවාහුය. එසේනම් තත් තත් කාලික රහතන් ඒ දෙස් බැහැර නොකොළේ කුමක් හෙයින්දැයි තර්කණය කළ හැකිය. හැම රහතන් වහන්සේ ම එක සේ නො වෙති. කිසි කෙනෙකුන් වහන්සේ ශුෂ්කවිදර්ශකය, එසේම ත්‍රිවිද්‍යාප්‍රාප්තය, පඤ්චාභිඥාප්‍රාප්තය, ෂඩභිඥාප්‍රාප්තය, ප්‍රතිසම්භිදාප්‍රාප්තය යනාදි ප්‍රභේද ඇත්තාහු වෙති. ප්‍රතිසම්භිදා ප්‍රාප්තවූද සියලුදෙනාවහන්සේම එකසේ නොවෙති. ප්‍රතිසම්භිදාව ලෞකික ලොකොත්තර වශයෙන් දෙපරිදි වන්නාක් මෙන්ම විසද අවිසද වසයෙන්ද දෙපරිදිය. කිසි කෙනෙකුන් වහන්සේගේ ප්‍රතිසම්භිදාව විසදය, කිසි කෙනෙකුන් වහන්සේගේ අවිසදය සාරිපුත්ත නාගසේනාදි උතුමෝ විසද ප්‍රතිසම්භිදා ප්‍රාප්තයෝයයි කියන ලදී.

ප්‍රතිසම්භිදාප්‍රාප්තයනට වුවද යථොක්ත අපපාඨ සදෙස් සේ පෙණුනත් පර්‍යාප්තියෙහි අභියෝගයක් නැතිකල හේතු යුක්ති දක්වා බැහැර කළ හැකි නොවෙත්. මිලිඳු රජුගේ ප්‍රශ්නයන්ට නාගසේන හිමියන් වහන්සේට මුත් සෙසු රහතන් වහන්සේට පිළිතුරු දෙනු නොහැකි වීම මෙයට නිදර්ශනයෙකි. ප්‍රතිසම්භිදාප්‍රාප්තිය අනෙකෙකි. නානා න්‍යායධර්ම ශාස්ත්‍රයන්හි විශාරදත්වය අනෙකෙකි. පිළිසිඹියාපත් පමණෙකින්ම සියල්ල කළ හැකිය, දත හැකියයි කියනු නොහැකියි. මිහිඳුහිමියන් වහන්සේ පර්‍යාප්තිය හදාළේ සිවුපිළිසිඹියා රහත්බවට පැමිණීමෙන් පසුවයි. ප්‍රතිසම්භිදාප්‍රාප්තයන් විසින්ම රහත් නොවූ අනඳ හිමියන් වහන්සේ ප්‍රථම ධර්ම සඞ්ගායනාවට තෝරා ගැණීමත් අට්ඨකථා කිරීමට විශාරදයකු සේ පුහුදුන් බුදුගොස් හිමියන්වහන්සේ තෝරා ගැණීමත් මේ පිළිබඳව කල්පනාවට ගතයුතුවේ.

කාරුණු මෙසේ හෙයින් යථොක්ත අපපාඨයෝ එසේම බුදුගොස් හිමියන්ගේ කාලය තෙක් පැවත ආවාහුය. නානා න්‍යාය-ධර්මශාස්ත්‍රයන්හි කොටිප්‍රාප්ත උන්වහන්සේ සූත්‍රාදියට සම කර බලා මේ මේ හේතුවෙන් මොහු ප්‍රමාදපතිතයෝ යයි කිසිවක් බැහැර කළහ. කිසිවක් එසේම වෙසෙසා සඳහන් කොට තුබූහ.

තවද උන්වහන්සේ පෙර අටුවාවන්හි නො ආ දෙයද ආචාර්‍ය්‍යවාදයෙන් ගෙණ ස්වීය ග්‍රන්ථයන්හි යෙදූහ. රාගාදිචර්‍ය්‍යාවන් පිළිබඳ විභාගය ඉන් එකෙකි. "යස්මා පන ඉදං චරියාවිභාවනා

**විධානං සබ්බාකාරෙන නෙව පාළියං න අට්ඨකථායං ආගතං. කෙවලං ආචරියමතානුසාරෙන වුත්තං. තස්මා න සාරතො පච්චෙතබ්බං.**" යනුවෙන් චර්‍යා විභාගය පෙළක හෝ අටුවාවක සර්ව්ප්‍රකාරයෙන් නො ආ බවත් ආචාර්‍ය්‍යමතානුසාරයෙන් කියන ලද හෙයින් සාරවශයෙන් ගණන් නොගතයුතු බවත් **විසුද්ධිමග්ග** කර්‍මස්ථානනිර්දේශයෙහි (මුද්‍රිත 79 පිට) කියන ලදී. "**අවිචාරිතමෙතං පොරාණෙහි.**" මෙය පැරණියන් විසින් විචාරණය නොකරණ ලදී යනුවෙන් **පපංචසූදනී** (මුද්‍රිත 24 පිට) ආදියෙහි කී දූයද කල්පනා කළ යුතුයි.

පූර්වාචාර්‍ය්‍යකථාවන්හි ආ ඇතැම් වර්‍ණනයන්ට වෙනස් මත දක්වමින් "**අම්හාකං පනෙතං නක්ඛමති. අඤ්ඤමඤ්ඤාකං ඛමති**" මෙය වනාහි අපට රුචි නොවෙයි. මේ අපගේ අදහස්ය යනුවෙන් තත්කාලික තෙරවරුන් හා තමනුත් පිළිගත් දූය වෙන් කොට දක්වූහ. කිසි තැනෙක තමන්ට නිර්‍ණය කළ නොහැකි කරුණු පිළිබඳව හෙදය පමණක් දක්වා නිශ්ශබ්ද වෙති. පෙළෙහි ආ ඇතැම් පාඨයන් පිළිබඳව "**ඉතිපි පාඨො - අයමෙව වා පාඨො - අයම්පි පොරාණපාඨො**" මෙසේ හෝ පාඨය වෙයි, මෙයම හෝ පාඨය වෙයි, මේද පැරණි පාඨයයි යනුවෙන් කියන ලද්දේ එහෙයිනි.

පැරණි අටුවාවල ආ දෙයම මිස නවීන අටුවාවන්හි අමුතුවෙන් කිසිවක් ඇතුළත් නොවෙතියි කියන කථාව එක් ක්‍රමයකින් සත්‍ය යෙකි. කුමක් හෙයින් ද? යත්:- සාරය එය ම බැවිනි. වර්‍ණනය කිරීමේදී හා සකසා පිළියෙල කිරීමේදී අමුතු බෙහෝ හේතූදාහරණ ඇතුළත් කිරීමෙන් පැරණි අටුවාමත ම පුළුල්ද සපිරද කළහ. ඔවුනුදු පූර්වාචාර්‍ය්‍යකථාවලින් ගෙණ සංග්‍රහ කළහ යි සමහරුන් කියත තමුත් ඔහු කුමක් නිසා එසේ කියත්දැයි අපට නොවැටහෙයි. ප්‍රථම සඞ්ගායනාවෙන් පෙළට ඇතුළත් නොවූදෙය දෙවන තුන්වන සඞ්ගායනාවලින් ඇතුළත් කළහැකි නම්, මහ අටුවාවේ නොආ බොහෝ දේ පච්චරියාදියට ඇතුළත් කළ හැකි නම්, නවීන අටුවාවන්ට අමුතුවෙන් කිසිවක් කුමක් නිසා ඇතුළත් නො කළ හැකි ද ?

මහඅටුවාවේ නො ආ දේයයි නිසැකවම කිය හැකි කරුණු වලින් මේ ස්වල්පයෙකි.

**චූලසිව-ඉසිදත්ත-මහාසොණ තෙරහු:-** බ්‍රාහ්මණතිස්සභය සන්හිඳුනු පසු භික්ෂුසඞ්ඝයා සක්දෙව්රජු හා එක්ව ධාතූන් රැස් කොට ගෙණ චෛත්‍යයක් කළාහු ය. එවකට බ්‍රාහ්මණතිස්ස සොරු ද ජනපද විනාශ කෙළේ ය. සඞ්ඝයා රැස් ව කථා කොට සොරුන් ප්‍රතිබාධනය කරවයි දන්වා සක්දෙව්ඳු ළඟට තෙරුන් අට නමක් යැවූහ සක්දෙව්රජ "ස්වාමීනි, උපන් සොරු ප්‍රතිබාධනය කරන්නට නො හැක්කෙමි. සඞ්ඝ තෙමේ මුහුදින් එතෙරට යෙත්වා. මම මුහුදෙහි ආරක්ෂාව සලසන්නෙමි"යි කීකල සඞ්ඝයා සියලු දිශාවලින් නාගදිපයට ගොස් දඹකොළපටුනෙහි ත්‍රිභූමක මහපසුරක් බැඳවූහ. එහි එක තට්ටුවක් ජලයෙහි ගැලුනේ ය. එක තට්ටුවක සඞ්ඝයා හුන්හ. එහාක පාසිවුරු තැබූහ. සංයුත්තභාණක චූලසිව ඉසිදත්ත මහාසොණ තෙරහු තිදෙන සෙසු සඞ්ඝයාට ප්‍රධානයෝ ය. චූලසිව ඉසිදත්ත දෙනම මහාසොණ තෙරුන් අමතා "ඇවත, මහාසොණය, මහපසුරට නැඟෙව"යි කීහ. "ස්වාමීනි, ඔබවහන්සේලා කොහි වඩනහු ද"යි විචාළේ ය. "ඇවත! දියෙහි මරණයත් ගොඩ මරණයත් දෙක ම සම ය. අපි නො යමු. තා නිසා අනාගත ශාසනය පවත්නේ ය. ඇවත, එහෙයින් යව"යි කීහ. "ස්වාමීනි, ඔබතුමන් නොවඩන කල මම ද නො යමි"යි කී. තුන්යල දක්වා ද කියා ගිවිස්වා ගත නො හී තිදෙන ම නැවැත්තාහ.

ඉක්බිති චූලසිව තෙරුන්වහන්සේ ඉසිදත්ත තෙරුන් අමතා "ඇවත, ඉසිදත්තය! අනාගතයෙහි මහාසොණ තෙරුන් නිසා ශාසනය පවත්නේ ය. උන් බැහැර නො කරව. අතින් නුමුදව" යි කීසේක. "ස්වාමීනි, ඔබ වහන්සේ කොහි වඩනහු ද?. මම මහසෑය වඳින්නෙමි" යි සෙසු තෙරුන් දෙනමට අවවාද කොට පිළිවෙළින් වඩින්නාහු මහා විහාරයට පැමිණියෝ ය. එසමයෙහි මහා විහාරය සඞ්ඝයාගෙන් හිස් විය. සෑ මළුවෙහි එරඬු ගස් හට ගත්තාහ මහ සෑය ගස කොළින් වට වූයේ ද සෙවෙලින් වැසුනේ ද විය. ස්ථවිර තෙමේ ජීවමාන බුදුන්ට සැලකිලි දක්වන්නාක් මෙන් මහ සෑය වැඳ පශ්චිම දිශාවෙහි වූ ශාලාවකට පිවිස බලන්නේ මෙබඳු ලාභයෙන් යශසින් අග්‍රප්‍රාප්ත ශාරීරික ධාතු චෛත්‍යස්ථානයත් අනාථ වූයේ යයි සිතමින් සිටියේ ය.

තුඩුරු ගසෙක අධිගෘහීත දෙවතාවෙක් මගියකුගේ ස්වරූපයෙන් සහල් නැළියක් හා උක් සකුරු පිඩක් ද ගෙණ තෙරුන් සමීපයට වුත් "ස්වාමීනි කොහි වඩන හුදූ"යි? විචාළේ ය. "උපාසකය,

මම දකුණුදිශාවට යෙමි"යි කී. "ස්වාමීනි, මමත් එදිසාවට යෙමි. එහෙයින් එක් ව යමු." ඇරාධනය කෙළේ ය. "මම දුර්වලයෙක්මි. තොපගේ ගමනින් යන්නට නො හැක්කෙමි. උපාසකය තෙපි පෙරටුව යව"යි කීය. "ස්වාමීනි, මමත් ඔබවහන්සේගේ ගමනින් යෙමි"යි කියා තෙරුන්ගේ පාසිවුරු ගත්තේ ය. ක්‍රමයෙන් තිසා වැව ඉවුරට නැගි කල්හි තෙරුන්ගේ පාත්‍රය ගෙණ පැනක් පිළියෙල කොට දුන්නේ ය. එය පූ කෙණෙහි ම තෙරුන් වහන්සේට ස්වල්ප ශක්තියක් ඇති වූයේ ය. දෙවතාවා පෘපිවිය හකුළුවමින් ගොස් වෙණුගහබඩ එක් පාළු විහාරයකට පැමිණ තෙරුන්ට විසීමට තැනක් පිළියෙල කර දුන්නේය. දෙවතාද තෙරුන් මුව සේදූ කෙණෙහි කැඳ පිස දුන්නේය. කැඳ මැළඳුවහුට බත් පිස දුන්නේ ය. ස්ථවිර තෙමේ කොටසක් පිළිගෙණ "උපාසකය! සෙස්සෙන් තෙපි යැපෙව"යි අතින් පාත්‍රය වැසී ය. 'ස්වාමීනි, මම දුරකට නො යන්නෙමි' යි තෙරුන්ගේ පාත්‍රයට ම සියල්ල බහා කරණ ලද බත් කිස ඇති තෙරුන්ගේ පාත්‍රය ගෙණ ගමට පිළිපන්නේ පෘපිවිය හකුළුවා ජජ්ජර නදිය ළඟට පමුණුවා "මේ පෙණෙනුයේ කොළු කන මිනිසුන් වසන තැන දුම ය. මම පෙරටුව යෙමි" යි තෙරුන් වැඳ තමන් වසන තැනට ම ගියේ ය. ස්ථවිර තෙමේ කොළු කන මිනිසුන් ඇසුරු කොට සියලු භයකාලය ගෙවී ය.

ඉසිදත්ත තෙර ද සොණ තෙරුන් සමග පිළිවෙළින් සැරිසරන්නේ අළ ජනපදයට පිවිසියේ ය. එහි මිනිස්සු ඉතා තරුණ මී ගෙඩි බිඳ ඇට හැර ගෙණ ලෙලි ඉවත දමා ගියාහු ය. ස්ථවිර තෙමේ "ඇවත මහාසොණය, භික්ෂාහාරයක් පැණෙ"යි කියා පාසිවුරු ගෙන්වා සිවුරු පොරොවා පාත්‍රය බැහැර කොට ගෙණ සිටියේය. වැඩුනු දරුවෝ තෙරුන් සිටියවුන් දැක "මෙයින් කිසිවකින් ප්‍රයෝජන ඇත්තේ වනැ"යි වැලි පිඟු මීගෙඩිපොතු පාත්‍රයෙහි බහාලූහ. තෙරහුද එය හැරගෙණ වැළඳූහ. සත්දිනකට ආහාරය එතෙක් ම වූයේ ය. මෙසේ පිළිවෙළින් වැඩ සොරවැව වෙතට එළඹියාහු මිනිසුන් ඕලු ගෙණ හැර දමා ගිය ඕලුදඬු දුටුවාහුය. එහි දී ද ස්ථවිර තෙමේ "ඇවත මහාසොණය, භික්ෂාහාරයක් පැණේ"යයි පාසිවුරු ගෙන්වා සිවුරු පොරොවා පාත්‍රය බැහැර කොට සිටියේ ය. ගම්දරුවෝ ඕලුදඬු සුද්ධ කොට පාත්‍රයෙහි බහා දුන්නාහු ය. එද තෙරුන් වහන්සේලාට සත් දිනකට ම ආහාරය වූයේ ය. නැවතද පිළිවෙළින් වඩනාහු කොළු කන මිනිසුන් වසන එක් ගම්දොරකට පැමිණියහ. එහි එක් දැරියකගේ මාපියෝ වනයට යන්නාහු "දැරිය, ඉදින් කිසියම් ආර්‍ය්‍යයන් වහන්සේ නමක්

වැඩි සේක් නම් බැහැරකට යා නො දෙව, විසීමට තැනක් පිළියෙල කොට දෙව"යි අවවාද කොට ගියාහුය. ඕතොමෝ තෙරුන් දුක පාත්‍රය ගෙණ වැඩ හිඳුවා ගෙයි කිසි ධාන්‍ය ජාතියක් නැත්තෙන් වැය ගෙණ හුනිද හා සිවිය පොතු සැස හුනිද වැලේ කොළ සමග එකට කොටා පිඩු තුණක් කොට එකක් ඉසිදත්ත තෙරුන්ගේ ද එකක් මහාසොණ තෙරුන්ගේද පාත්‍රයෙහි බහා ඉතිරි පිණ්ඩය ද ඉසිදත්ත තෙරුන්ගේ පාත්‍රයෙහි බහන්නෙමියි අත දිගු කළාය අත පෙරළී ඒ පිණ්ඩය ද මහාසොණ තෙරුන්ගේ පාත්‍රයෙහි ම වැටුනේය. ඉසිදත්ත ස්ථවිර තෙමේ "බ්‍රාහ්මණතිස්සභයෙහි දුන් හුනිද පිණ්ඩයෙහි විපාකදායක කර්මය දෙශ කාල සම්පත් වශයෙන් කොපමණ විපාකයෙක් දෙන්නේ දැ'යි කීයේ ය. මෙසේ කියා ඔහු එය වළඳා වාසස්ථානයට ම වැඩියාහුය. ඕතොමෝ ද කැලයෙන් ආ මාපියන්ට තෙරුන් දෙනමක් වැඩි බව හා උන්වහන්සේට වාසස්ථාන පිළියෙල කොට දුන් බවද කීවාය. ඔහු දෙදෙන තෙරුන් ලඟට ගොස් වැඳ "ස්වාමීනි, අපි යමක් ලබමු ද, එයින් ඔබවහන්සේලාද සතපන්නෙමු, මෙහි ම වැඩ වසන සේක්වා" යි තෙරුන්ගෙන් ප්‍රතිඥා ගත්තාහුය. තෙරනුද ඔවුන් නිසා, සියලු භයකාලය එහිම ගෙවූහ.

බ්‍රාහ්මණතිස්ස සොරු මළ කල පිය මහරජතෙම සේ සත් නැඟී. "භය සංහිඳුනේය. ජනපදය නිරාකුල ය" යි අසා පරවුහුදින් සඞ්ඝයා අවුත් මාතොට පටුනෙහි බැස මහාසොණ තෙරනු කොහි වෙසෙද්දැ"යි අසමින් තෙරුන් සමීපයට ගියහ. ස්ථවිර තෙමේ පන්සියයක් භික්ෂූන් පිරිවර කොට ඇත්තේ මණ්ඩලාරාම විහාරයට පැමිණියේය. එකල කාලගම කුල සත්සියයක් පමණ වෙසෙති රාත්‍රිභාග යෙහි දෙවතාවෝ ගමෙහි ඇවිද "මහාසොණ ස්ථවිර තෙම පන්සියයක් භික්ෂූන් පිරිවර කොට ඇත්තේ මණ්ඩලාරාම විහාරයට පැමිණියේය, එක් එක් කෙනෙක් නවරියන් වස්ත්‍රයක් සමග එක් එක් පිණ්ඩපාතයක් දෙත්වා" යි මිනිසුන්ට කියාලූහ. දෙවතාද තෙරුන් කාලගමට පිඩු පිණිස පිවිසි කල මිනිස්සු වඩා හිඳුවා කැඳ දුන්හ. එහි මණ්ඩලාරාම වැසි තිස්සභූති තෙරුන් වහන්සේ සඞ්ඝ ස්ථවිර ව සිටියෝය. එක් මහා උපාසකයෙක් උන් වහන්සේ වැඳ "ස්වාමීනි; මහාසොණ නම් තෙර කවරෙක් දැ"යි ඇසීය. ඒ කාල යෙහි ඒ ස්ථවිරතෙමේ නවකයෙකි. සිටියේ පිරිස් කෙළවරය. සඞ්ඝ ස්ථවිර තෙමේ අත දිගුකොට "උපාසකය, තෙලෙ පෙණෙන්නේ මහාසොණ නම ය" යි කීසේක උපාසකයා උන්වහන්සේ වැඳ පාත්‍රය ගන්නට සූදානම් වූ නමුදු ස්ථවිර තෙමේ නුදුන්නේය. ඒ

දුටු තිස්සභූති ස්ථවිරයෝ "ඇවැත්නි සෝණය, යම් සේ තෙපි නොදන්නාහුද, එසේම අපිත් නොදනිමු, පින්වතුන්හට දෙවියෝ උපකාර කෙරෙති, එහෙයින් පාත්‍රය දෙව. සබ්‍රම්සරුන්ට සංග්‍රහ කරව"යි කීහ. සෝණ තෙරුන් පාත්‍රය දුන් පසු උපාසකයා පාත්‍රය ගෙණගොස් කහවණුවක් අගනා පිණ්ඩපාතය පුරා තවරියන් වස්ත්‍රයක් දරණුවක් කොට තබා ගෙණවුත් සෝණ තෙරුන් අත තැබීය. තවත් උපාසකයෙක් ද එසේම දුන්නේ ය. මෙපරිද්දෙන් වස්ත්‍ර සත්සියයක් හා පිණ්ඩපාත සත්සියයක්ද එක දවසින්ම තෙරහු ලදහ. හේ එය සඞ්ඝයාට බෙදා පිළිවෙළින් මහාවිහාරයට විත් මුව සෝදා මහාබොධිය හා මහසෑය වැඳ ථූපාරාමයෙහි සිටියේ සිවුරු පොරොවා සඞ්ඝයා විසින් පිරිවරණ ලද්දේ දකුණු දොරින් නුවරට පිවිස දෙරටුවේ සිට වළඳන ශාලාව තෙක් මේ අතර දී සැට කහවණුවක් අගනා පිණ්ඩපාත ලැබීය. ඉන් පසු ලත් සත්කාරයෙහි ප්‍රමාණයෙක් නැත්තේය. (සම්මෝහ විනොදනී ත්‍රි: මූ: 314 පිට)

---

**නිග්‍රොධ ස්ථවිර:**— තවද එක් නිග්‍රොධ නම් ස්ථවිර කෙනෙක් වෙසෙති. ඒ හිමියන් සාමණේර කාලයෙහිම බ්‍රාහමණතිස්ස භය උපන්නේය. සාමණේරයන් හා ඔවුන් උපාධ්‍යාය තෙරුන් වහන්සේත් විදෙශයට නොවැඩියාහු "කොළ කන මිනිසුන් ඇසුරු කොට වසන්නෙමු"යි පිටිසර බඳ පළාත් බලා වැඩියහ. සාමණේරයෝ සත් දවසක් ආහාරයක් නැතිව සිටියාහු එක් ගම් කෙතක වූ තල් ගසෙක ගෙඩි දැක "ස්වාමීනි, මදක් ඉවසුව මැනව. තල්ගෙඩි බිම හෙලන්නෙමි"යි කීහ. 'සාමණේරය, තෙපි දුර්වල වූවහුය. ගසට නොනැගෙව"යි කිව ද "ගසට නගිමි"යි කුඩා වෑය ගෙණ ගසට නැගී තල්කැනක් කැපීමට සූදානම් විය. එවිට වෑයෙහි තලය ගැලවී බිමට වැටුනෙන් මහා ස්ථවිර තෙම "මොහු කලාන්ත වූයේම ගසට නැංගේය. දැන් කුමක් කරන්නේදැයි" සිතීය. සාමණේරයෝ ද තල් කොළ පල පලා ගැට ගසමින් වෑ මිටෙහි බැඳ බිමට හෙලා "ස්වාමීනි, වෑතලය මෙහි ගසා එවන්නේ මැනව"යි කීවාහු ය. ස්ථවිරයෝද සාමණේර තෙම උපායඥතයෙන් යුක්තයයි සිතා වෑතලය ගසා දුන්නෝය. ඔවුන් වෑය ගෙණ තල්ගෙඩි කපා බිම හෙළුවෙන් මහ තෙරණුවෝ වෑය බාවා වැටුන තල් ගෙඩියක් කපා සාමණේරයන් බට කල "තෙපි දුර්වල වූ වහුය. එබැවින් මෙය පළමු කොට වළඳව"යි කියා තෙරණුන්ට දුන්නාහුය. "ස්වාමීනි, ඔබවහන්සේ නොවළඳන කල

මම කෙසේ වළඳන්නෙම්ද? නොවළඳමි"යි කියා වෑය ගෙණ තල් ගෙඩි සාපා පොතු හැර තල් මද ගෙණ තෙරණුවන් වළඳවා තුමූද වැළඳූය. තල්ගෙඩි තිබෙන තෙක් එහිම වැස එය අවසන් වූ කල්හි පිළිවෙළින් ගොස් කොළ කන මිනිසුන් වසන ගමෙක භික්ෂූන්ගෙන් ශූන්‍ය විහාරයකට පිවිසියාහුය.

සාමණේරයෝ තෙරුන් වහන්සේට වාසස්ථානයක් පිළියෙල කළහ. තෙරණුවෝ හෙරණුන්ට අවවාද දී සෙනස්නට පිවිසියෝය. හෙරණහුද "අස්ථානයෙහි මළවුන්ගේ පමණෙක් නැත. එහෙයින් බුදුනට උපස්ථානයක් කෙරෙමියි සැමලුවට ගොස් තණ පදුරු බැහැර කරණ සේක් සත් දිනකින් ආහාර නැති බැවින් සැලෙන ගතින් යුතුව වැදහොත්තේම තණගස් උදුරණ සේක. කිසියම් මිනිස් කෙනෙක් කැළයෙහි හැසිරෙන්නාහු මී හා දර හා පලාකොළත් ගෙණ තෘණ සෙලවෙන සංඥවෙන් "මේ මුවෙක් දෝ හෝ"යි සිතා සාමණේරයන් ලඟට ගොස් "ස්වාමීනි කුමක් කරන්න හුද"යි විචාළහ. "උපාසකවරුනි, තණපදුරු හරවමු. "ස්වාමීනි, තවත් කිසිවෙක් ඇත්තේද" "එසේය උපාසකයෙනි, මාගේ උපාධ්‍යායයන් වහන්සේ ඇතුළුගබඩාවෙහි ය." "එසේ නම් ස්වාමීනි, මහතෙරුන්ටත් දී වළඳන්නේ මැනවැ"යි හෙරණුන්ට මීහුක් දී තමන් වසන තැනද කියා "හිමියෙනි, අපි කොළ අතු කඩා යෙමු. එසලකුණෙන් උපාධ්‍යායයන් හා වඩනේ මැනවැ"යි දන්වා ගියෝය. හෙරණෝද මී සුහ ගෙණ තෙරුන් වහන්සේ ලඟට ගොස් පිටතින් සිට "ස්වාමීනි ඔබ වහන්සේගේ පා වදිමි"යි කීසේක. තෙරණුවෝ "මේ හෙරණු බඩ සයින් ආයේ වනැ"යි සිතා නිශ්ශබ්ද වූවෝය. හෙරණුන්වහන්සේ නැවතද "ස්වාමීනි, ඔබවහන්සේගේ පා වදිමි' යි කීසේක. කිමෙක්ද සාමණේරය, මේ මහලු උන්නාන්සේට සුවසේ නිදන්නට නොදෙන්නෙහිද"යි අසා 'ස්වාමීනි, දොර හරණට වටනේය"යි කියෙන් තෙරණුවෝ නැගිට දොර හැර "සාමණේරය, තෙපි කුමක් ලද්දහුද" යි කීසේක. "මිනිසුන් මී සුහක් දෙන ලදී. "ස්වාමීනි, එය වළඳන්නට වටනේය." "සාමණේරය, එසේ වළඳන්නට නො හැක්කෙමු. පැනක් කොට වළඳන්නෙමු"යි කියෙන් හෙරණනු පැනක් කොට දුන්හ ඉක්බිති තෙරණුවෝ "සාමණේරය, මිනිසුන් වසනතැන් විචාළේ ඇද්ද" යි විචාළහ. "ස්වාමීනි, ඔහුම තමන් වසන තැන් කීවාහුය." "සාමණේරය, උදේ කාලයෙහි යන්නෙමු නම් කලානත වෙමු. දැන් ම යමු" යි පාසිවුරු ගෙණ නික්මුනාහුය.

ක්‍රමයෙන් ගොස් මිනිසුන් වසන තෙනට නුදුරෙහි හොත්තාහුය. හෙරණුවෝ රාත්‍රි කාලයෙහි "මා පැවිදි කල පටන් ග්‍රාමාන්තයෙහි අරුණක් නොනැගු විරූය"යි සිතා පාත්‍රය ගෙණ අරුණ නගනු පිණිස කැළයටම ගියෝය. මහ තෙරුන් වහන්සේ නැගිට බලන සේක් හෙරණුන් හුන් තැන නොදැක, 'මිනීමස් කන්නවුන් විසින් ගැරගත්තේ වනැ'යි සිතූසේක. හෙරණුවෝද කැළයෙහිදී අරුණ නගා පාත්‍රයෙන් පැන් හා දූවටුත් ගෙණ ආවෝය. "සාමණේරය, තෙපි රාත්‍රිභාගයෙහි කොහි ගියහුද? මහලු තෙරුන්ට තෙපි විමතියක් ඇති කළහුය. එයට දඬුවම් විඳුව"යි කීකල "එසේය ස්වාමීනි, විඳිමි"යි කීසේක. දෙදෙනම මූව සෝදා සිවුරු පොරෙවා මිනිසුන් වසන තෙනට ගියාහුය. මිනිසුන් තමන්ගේ පරිභොගවූ අලමුල් ගෙඩි හා කොළ ඔවුන්ටත් දුන්පසු මහ තෙරුන්වහන්සේ වළඳා විහාරයට වැඩිසේක. හෙරණුවෝද උපාධ්‍යායන් වහන්සේ විහාරයට වැඩි පසු දිය ගෙණවුත් "ස්වාමීනි, පා සෝදන්නෙමි"යි කීහ. එවිට මහ තෙරණුවෝ 'සාමණේරය තෙපි රාත්‍රියෙහි කොහි ගියහුද? අපට විතර්කයක් ඇති කළහුය'යි කීහ. "ස්වාමීනි, මා ග්‍රාමාන්තයෙහි අරුණක් නොනගන ලද විරූය. එහෙයින් අරුණ නගනු පිණිස කැළයට ගියෙමි'යි කී පසු 'සාමණේරය, එසේ නම් දඬුවම සුදුසු වන්නේ තොපට නොව අපට ම ය" යි කියා හෙරණුන්ට අවවාද කරන්නාහු "අපි දැන් මහල්ලෝ වෙමු, මෙනම් දෙයක් වෙති"යි දත නොහැක්කම්හ. තෙපි වූ කලී තම ආරක්ෂාව අපෙක්ෂා කරව් ය" යි කීවාහුය මහතෙරුන් වහන්සේ අනාගාමි සේක. පසු කල සොරුන් විසින් උන්වහන්සේ අල්වා මරා ගෙණ කන ලදහ. හෙරණුවෝ තුමූ රැකී හය සත්හුන් පසු සුදුසු තැනකින් උපාධ්‍යාය කෙනෙකුන් ලබාගෙණ උපසපන් වී බුදුවදන් ඉගෙණ ත්‍රිපිටකධාරී ව වත්තබබක නිග්‍රොධ ස්ථවිර නමින් ප්‍රසිද්ධ වූහ.

හය සත්හිදී පියමහරජ රාජ්‍යය කරණ කල පරමුහුදින් වැඩි භික්ෂූහු "වත්තබබක නිග්‍රොධස්ථවිරයෝ කොහිදැ"යි විචාරා දැන උන්වහන්සේ ලඟට එළඹියහ. මෙසේ පැමිණි මහසඟපිරිසක් විසින් පිරිවරණ ලද තෙරණුවෝ පිළිවෙළින් මහ වෙහෙරට පැමිණ මහබෝ මහසෑය හා ථූපාරාමයද වැඳ නුවරට පිවිස දකුණු දොරටුවෙන් නික්ම අතර ස්ථාන නවයකදී දෙනලද තුන් සිවුරු ලැබූහ. නුවරට පිවිසි කාලයේ පටන් මහත් සත්කාර ලැබූහ. (සම්මොහ විනොදනී ත්‍රි: මූ: 317 පිට)

**චූලසුධම්ම ස්ථවිර:-** තවද කුටිකණ්ණ රජ වනාහි ගිරිගම් කොත් වැසි චූලසුධම්ම තෙරුන් මමායනය කරන්නේ උපුල්වැව වසන උන්වහන්සේ කැඳවා යැවූයේය. තෙරුන් වහන්සේ පැමිණ මල්අරම් වෙහෙර විසූහ රජතෙමේ "තෙරුන් වහන්සේ කුමකට ප්‍රිය දැ"යි තෙරුන්ගේ මවගෙන් විචාරා "මහරජ! අලවලට ය" යි කීකල අල ගෙන්වා ගෙණ විහාරයට ගොස් තෙරුන්ට දෙන්නේ මුහුණ බලන්නට නො හැකිව පිරිවෙණින් නික්ම පිටතදී 'තෙරුන් වහන්සේ කොබදු දැ' යි බිසවගෙන් ඇසිය. 'ඔබවහන්සේ පුරුෂයෙකු බලන්නට නො හැකි වූ නම් මම කෙසේ දනිම් ද? නො දනිම්"යි ඕතොමෝ කීවාය. රජතෙමේ "මගේ රටෙහි එක් බිලිකරු ගැහැවි පුත්‍රයකු බලන්නට මට නො හැකි විය. අහෝ! බුද්ධ ශාසනය ඉතා මහත් එකෙකැ"යි කියා අත් පොළසන් දුන්නේය (සම්මෝහ විනෝදනී ත්‍රි: මු: 319 පිට)

---

**ත්‍රිපිටක චූලනාගස්ථවිර:-** තවද ත්‍රිපිටක චූලනාග තෙරුන් කෙරෙහි කුටිකණ්ණ රජ මමායනය කරන්නේ ඒ හිමියන්ගේ ඇඟිල්ලෙහි ගඩක් නැගිකල "තෙරුන් බලන්නෙමි"යි විහාරයට වැද උන්වහන්සේ කෙරේ බලවත් ප්‍රේමයෙන් ඇඟිල්ල මුඛයෙන් ගත්තේය. මුඛය තුළ දී ගඩය බිදී ලේ සැරව ගලන්නට වන. රජු වනාහි තෙරුන් කෙරේ කළ ප්‍රේමයෙන් එය නොදමා ගිල දැමීය. ඒ තෙරණුවන් මරණ මඤ්චකයෙහි හොත්කල රජු ඇවිත උන්වහන්සේගේ අසුචි භාජනය හිසින් ගෙණ "ධම්මචක්‍රයාගේ කරඇණය බිඳෙන්නේය"යි වැලපෙමින් ඇවිද්දේය. ප්‍රතිවිශ්වරයකු අසුචි භාජනයක් හිසින් ගෙණ හැසිරීම නම් සන්මාගීයාගේ බල යෙන් ම වූවකි. (සම්මෝහ විනෝදනී ත්‍රි: මු: 319 පිට)

---

**එක්තරා තෙර කෙනෙක්:-** තවද එක් තෙර කෙනෙකුන් "බුදුරදුන් වහන්සේ වදාළ පාලි උගන්නට ය' යි රුහුණු වඩනා සේක. තෙරුන් වහන්සේ හා එක කුසෙහි ඔත් උපාසිකාවෝ ද තම පුතනුවන්ගේ පවත් තෙරුන්ගෙන් විචාරන්නාහ. තෙරුන් වහන්සේ එක් දවසක් තමන් වහන්සේගේ බෑනනුවන් ගෙණ එම් යි රුහුණ බලා වැඩි සේක. උපාසිකාවන්ගේ පුතනුවන් වහන්සේද "බොහෝ කලක් මම මෙහි විසූයෙමි. උපාධ්‍යායයන්

වහන්සේ බලා පියා උපාසිකාවන්ගේද පවත් දැන එම්"යි රුහුණින් නික්මුනු සේක. දෙදෙනා වහන්සේ හුවුනොවුන් දැක තෙරුන් වහන්සේ විසින් "කොයි යවුද?"යි විචාරණ ලදින් එපවත් සැලකළ සේක.

තෙරුන් වහන්සේද "තොප විසින් කරණ ලද්ද ඉතා යහපති. උපාසිකාවෝ තොප නිරන්තරයෙන් විචාරන්නාය. මම තොප කැඳවාම ආමි. තෙපි යව. මම මෙහිම වස් වෙසෙමි"යි කියා උන් වහන්සේ නගා යැවූ සේක. ඔවුන් වහන්සේද වස් වසන දවස්ම පියානන් කරවූ සෙනස්නටම වැඩිසේක. ඉක්බිති ඔවුන් වහන්සේගේ පියානෝ දෙවන දවස් අවුත් "ස්වාමීයි, අපගේ සෙනසුන කවුරුන් වහන්සේ පිළිගත් සේක්දැ?"යි විචාරා "ආගන්තුක ලදරු භික්ෂු කෙනෙකුන්දැ ය"යි අසා උන්වහන්සේ කරා එළඹ පසඟ පිහිටුවා වැඳ "ස්වාමීනි, අපගේ සෙනස්නේ වස් විසීමට පැමිණියාවුන් කළ මනා වතෙක් ඇතැ"යි කීහ. ඔවුන් වහන්සේ "කිමෙක් ද? උපාසකයෙනි"යි විචාළ සේක.

උපාසකයෝ ද "ස්වාමීනි, තුන් මස මුළුල්ලෙහි අපගේ ගෙහිදීම වළඳා වඩනා කල අපට කියා වැඩිය මැනවැ"යි සැළ කළහ. ඔවුන් වහන්සේද එබස් අසා මුවෙන් නොබිණීමෙන් ඉවසූ සේක. උපාසකයෝ ද තමන්ගේ ගෙට ගොස් "අපගේ සෙනස්නට එක් ආගන්තුක වහන්සේ නමක් වැඩිසේක; සකස් කොට උපස්ථාන කට යුතුය"යි කීහ. උපාසිකාවෝද යහපතැයි මුදුනෙන් පිළිගෙණ ඉතා මධුරවූ කන බොන දෑ සපයා ලූහ. භික්ෂූන් වහන්සේද බත් වේලෙහි නෑදෑයන්ගේ ගෙදරට වැඩි සේක. කිසි නෑදෑ කෙනෙක් ඔවුන් වහන්සේ නො හඳුනන්නාහ. ඒ ආයුෂ්යන් වහන්සේද තුන් මසක් මුළුල්ලෙහි වළඳා "අපි යම්හ"යි වදාළ සේක. ඉක්බිති උන්වහන්සේගේ නෑදෑයෝ "ස්වාමීනි, සෙට වැඩිය මැනවැ"යි දෙවන දවස් තමන්ගේ ගෙහි දී ම වළඳවා තෙල් නැළියක් හකුරු පිඩක් හා නවරියන් කඩක් ද දී වැඩිය මැනව"යි කීහ.

ඔවුන් වහන්සේද අනුමෙවෙතිබණ වදාරා "රුණට යම්හ"යි වැඩි සේක. උපාධ්‍යායයන් වහන්සේද වස් වැස වඩනාසේක් ඔවුන් දැක එක්තරා රුක් මුලෙක්හි වඩා හිඳුවා කරණ ලද වතාවත් ඇතිසේක් "ඇවැත්නි, උපාසිකාවන් දුටුදැ?"යි විචාළ සේක. "එසේය ස්වාමීනි"යි සියලු පුවත් දන්වා තෙලින් තෙරුන් පතුල් මැඩ සකුරු පැන් වළඳවා ඒ පිළිය තෙරුන් වහන්සේට පිළිගන්වා පසඟ පිහිටුවා වැඳ "ස්වාමීනි, මට රුහුණ ම සැපය"යි කියා වැඩි සේක.

තෙරුන් වහන්සේ ද විහාරයට අවුත් දෙවන දවස් කොරණ්ක නම් ගමට වැඩිසේක. උපාසිකාවෝ ද 'මාගේ බෑනන් වහන්සේ මාගේ පුතනුවන් කැඳවා ගෙණ දූන් වඩනා සේක; දූන් වඩනා සේකැ''යි එක්වන් පෙරමග බල බලා හිඳිනාහු හුදකලා ව වඩනා තෙරුන් දූහ මහාශොකයෙන් උන්වහන්සේගේ පාමුල්හි හෙව මහ හඬින් හැඬූහ. තෙරුන් වහන්සේ ද 'තොපගේ පුතනුවෝ තමන් ඉතා අපිස් බැවින් නො හඳුන්වා ගියහ''යි උපාසිකාවන් අස්වසා සියලු පවත් දන්වා පාත්‍ර පසුම්බියෙහි තුබූ පිළිය ද දක්වූසේක. (විසුද්ධිමග්ග මුද්‍රිත 67 පිට)

---

මහාසිව ස්ථවිර:- තවද මහාසීව නම් තෙර කෙනෙකුන් වහන්සේ මාගම තිස්සමහ වෙහෙර වසන සේක් තෙවළා බණ අර්ථ වශයෙන් ද පාළි වශයෙන් ද අටළොස් මහගණයකට උගන්වන සේක. තෙරුන් වහන්සේගේ අවවාදයෙහි සිට තිස් දහසක් භික්ෂූන් වහන්සේ රහත්වූ සේක. ඔවුන් වහන්සේ අතුරෙන් එක් කෙනෙකුන් වහන්සේ තමන් ලද්දාවූ ධර්මය අරහයා උපන්නාවූ ප්‍රීති හා සොම්නස් ඇති සේක් ''මෙ වැනි අමාමහ නිවන් සුවයක් අපගේ ආචාර්‍ය්‍යයන් වහන්සේටත් ඇද්දෙහෝ''යි සලකන සේක් තෙරුන් වහන්සේ රහත් නොවූ බව දැන ''එක් උපායකින් තෙරුන් වහන් සේට කලකිරීම් උපදවම්''යි සිතා තමන් වහන්සේ වසන තැනින් නික්ම තෙරුන් වහන්සේ සමීපයට ගොස් වැඳ වතාවත් දක්වා වැඩහුන් සේක.

ඉක්බිති තෙරුන් වහන්සේ ''ඇවැත්නි, කුමක් පිණිස අවු දැ?''යි විචාළ සේක. ඔවුන් වහන්සේ ද ''ස්වාමීනි, ඉදින් අවකාශයක් ලැබේ නම්, එක් ධම්මපදයක් උගන්නට ආමි''යි කීසේක. තෙරුන් වහන්සේ ද ''ඇවැත්නි, බොහෝ දෙන උගන්නාහ. එහෙයින් තොපට අවසරයක් නැතැ''යි වදාළ සේක. භික්ෂූන් වහන්සේ සියලු රෑ දවල් අවකාශයක් නොලබන සේක් ''ස්වාමීනි, මෙසේ අවකාශයක් නැති කල නුඹවහන්සේ කාරුණික මරුට කෙසේ අවසරයක් ලැබේ දැ?''යි විචාළ සේක.

එකල්හි තෙරුන් වහන්සේ ''මොහු මා සමීපයෙන් උගන්නට ආවාහු නො වෙති. මට ම කලකිරීම් උපදවනු පිණිස ආවනැ''යි සිතා වදාළ සේක. ඔවුන් වහන්සේ ද ''ස්වාමීනි, භික්ෂූන් නම මා

බඳු වුව මනා නො වේ දැ?"යි කියා තෙරුන් වහන්සේගේ ශ්‍රීපාදය වැඳ ඉන්ද්‍රනීලමාණික්‍යයක් සේ නිල් වූ අහසට නැගී තමන් වහන්සේ වසන තැනට ම එළඹි සේක. තෙරුන් වහන්සේ ඔවුන් වහන්සේ වැඩි වේලෙහි පටන් කොට උපන්නාවූ මහ කලකිරීම් ඇති සේක් දහවල් දවස් ද ගණ හදුරවා පිරිවහා පාසිවුරු අත පෙහෙවන තන්හි තබා උදුසන පාලිවචන ඉගෙණ බස්නාවූ භික්ෂූන් වහන්සේ හා සමග පාසිවුරු ඇරගෙණ බැස තෙළෙස් ධුතාඞ්ගයන් පුරා සමාදන් වූ සේක. ගම් සොළොස්ර ගලෙක්හි විහාරයට ගොසින් එය සකසා එහි ඇඳ පුටු තගා "නොරහත් ව මාගේ පිට හැඳෙකා නො තබමි"යි දැඩි කොට ඉටා ගෙණ සක්මණට බට සේක. "අද රහත් වෙමි, අද රහත් වෙමි"යි උත්සාහ කරන්නවුන්ට පවාරණය ආසන්න වි ය. එකල්හි ඔවුන් වහන්සේ පුහුදුන්බව හැර විසුද්ධි පවුරුණෙන් පවරම් 'යි සිතා වීර්‍ය්‍ය කොට ඉතා විඩාවට පත් වූ සේක.

එ පැවරුමට මාර්ගයක් වත් ඵලයක් වත් උපදවා ගන්නට නො පොහොසත් වූ සේක. "පටන් ගන්නා ලද විදර්ශනා ඇති මබන්දෙක් පවා රහත්බව නො ලබයි: ඒ ඉතා උගහට දෙයක් වනැ"යි සිතා එ ම ලෙස ම සිටීම් සක්මන් කිරීම් යන මෙහි ම තත් පර ව තිස් හවුරුද්දක් පමණ මහණදම් පුරා මහාපවාරණ දැස් ආකාශ මධ්‍යයෙහි සිටියාවූ පිරුණු සඳ බලා "කිම් දේ හෝ, සඳමඩල පිරිසුදු දේ හෝ නොහොත් මාගේ ශීලය පිරිසුදු දේ හෝ'යි පරීක්‍ෂා කරණ සේක් "සඳමඩලෙහි සසලකුණු පෙණෙයි මාගේ ශීලයෙහි වූ කලි උපසපන්වූ දවස් පටන් අද දක්වා කැලලෙක් නැතැ"යි බලා උපන්නාවූ ප්‍රීති හා සොම්නස් ඇති සේක් මුහු සාලාවූ ඥාන ඇති බැවින් උපන්නාවූ ප්‍රීතිය ඔබා සිවුපිළිසිඹියා පත් රහත්වූ සේක. (මනොරථ පූරණී ත්‍රි: මු: 24 පිට)

---

**මලියදෙව ස්ථවිර:-** තවද, මලියදෙව නම් ස්ථවිරයන් වහන්සේ කාලලග්‍රාමයට වැඩ වදුරා මණ්ඩලාරාම නම් මහා විහාර යෙහි බුදුන් වදළ පාලි උගන්නා සේක. ග්‍රන්ථධුර පූරණ සේක. එක් දවසක් කාලලග්‍රාමයෙහි පිඬු සිඟා වඩනාවූ ඔවුන් වහන්සේට එක් උපාසිකාවක් කැඳ සරළුවක් දී පුත්‍රස්නෙහය උපදවා තෙරුන් වහන්සේ ඇතුළුගෙයි වඩා හිඳුවා ප්‍රණීතවූ ආහාර වළඳවා"ස්වාමීනි,

කවර ගමක වසනසේක් ද?"යි ක්යා විචාළාය. ඔවුන් වහන්සේ "උපාසිකාව, මණ්ඩලාරාම මහා විහාරයෙහි ගුළුබුර පුරමි"යි වදාළ සේක. උපාසිකාවෝ ද "ස්වාමීනි, යම් තාක් ගුළුබුර පුරණ සේක් ද, ඒතාක් මාගේ ගෙහි දී ම වළඳා වදාළ මැනවැ"යි කිව. ඔවුන් වහන්සේ ද එහි දී නිබඳ ව ආහාර වළඳා අනන්‍තයෙහි අනුමෙවෙති බණ වදාරණ සේක් "දුකින් මිදී සුවපත් ව"යි යන මේ දෙපදය ම කියා වඩනා සේක

මෙසේ ක්‍රමයෙන් ඇතුළුවස් තුන්මස්හි උපාසිකාවන්ට අනුග්‍රහ කරණ සේක් තමන් වහන්සේ වැළඳූ අහරට පූජා කොට වස් පවරණ දවස් සිවුපිළිසිඹියාපත් රහත් බවට පැමිණිසේක. ඉක්බිති මහාස්ථවිර කෙනෙකුන් වහන්සේ "ඇවැත්නි, අද විහාරයෙහි මහාජනයා රැස් වූහ. ඔවුන්ට ධර්ම දෙශනා කරව"යි වදාළ සේක. තෙරුන් වහන්සේ ද ඉවසූ සේක. එකෙණෙහි ළදරු සාමණේරයන් වහන්සේ කෙනෙකුන්දූ ගොසින් උපාසිකාවන්ට 'අද තොපගේ පුතනුවන් වහන්සේ බණ වදාරණ සේක, විහාරයට ගොස් බණ අසව"යි කීසේක.

උපාසිකාවෝ ද "ස්වාමීනි, හැමදෙන බණ දන්නාහු නො වෙති. මාගේ පුතනුවන් වහන්සේ මට මෙතෙක් කල් අනුමෙවෙති බණ වදාරණ සේක් "සුවපත් ව, දුකින් මිදෙ ව" යන මේ දෙපදය ම වදාරණ සේක එහෙයින් කවටකම් නො කළ මැනවැ"යි කීහ. සාමණේරයන් වහන්සේ ද 'උපාසිකාවෙනි, දනුතුදූ නො දනුතුදූ තෙපි විහාරයට ගොස් බණ අසව"යි කී සේක. උපාසිකාවෝ ද ගඳමල් ගත් අත් ඇති ව විහාරයට ගොස් ගන්‍ධමාලාදීන් පූජා කොට පිරිස් කෙළවර බණ අස අසා හුන්හ

දහවල් ධර්මකථික වහන්සේ ද පාඨය කියවන්නාහු තමන් පමණක් කියවා හුනස්නෙන් නැගී සිටියාහු ය. ඉක්බිති මලියදෙව ස්ථවිරයන් වහන්සේ ද ධර්මාසනයේ වැඩහිඳ විජිනිපත අල්ලා ගෙණ "මහාඋපාසිකාවන්ට තුන්මසක් මුළුල්ලෙහි දෙපදයකින් ම අනුමෙවෙති බණ කීමි; අද සියලු රාත්‍රියෙහි තුන් පිටකය ම සම්මර්ශනය කොට එම දෙපදයෙහි ම අර්ථව්‍යාඛ්‍යාන කෙරෙමි"යි සිතා ධර්මදෙශනාවට පටන් ගෙණ දසන්තවුන් කන්හි අමා වතුරක් තමන්නා සේ සියලු රෑ බණ වදාළ සේක අරුණෝදයෙහි බණ දෙසා කෙළවර මහා උපාසිකාවෝ සෝවාන් පෙලෙහි පිහිටියාහු ය. (මනොරථපූරණී ත්‍රි: මූ: 22 පිට)

**තිස්සභූති ස්ථවිර;**- තවද මහා විහාරයෙහි තිස්සභූති නම් එක් තෙර කෙනෙකුන් වහන්සේ විනය හදුරා පිරිවහන සේක. සිඟා වඩනා වේලෙහි ඇතුළුගමට පිඬු සිඟා වඩනාදු ය. එක් දවසෙක ගැණු අරමුණක් දැක එහි ලොභ ඉපිදවූ සේක. ඔවුන් වහන්සේ ඔබාගත් පියවර නො සොල්වා ම තමන්වහන්සේගේ පාත්‍රයෙහි වූ කැඳිත්ත උපස්ථාන කරණ ලදරු භික්ෂූන් වහන්සේගේ පාත්‍රයෙහි බහා "මේ විතර්කී වඩනේ මා සතර අපායෙහි හෙළා මහදුක් දෙන්නේ ය"යි සිතා එසින් නැවත ආචාර්‍ය්‍යයන් වහන්සේ සමීපයට ගොස් වැඳ එකත්පස්හි සිටිසේක් "ස්වාමීනි, මට ව්‍යාධියක් උපන. මම එයට පිළියම් කරන්නට නො පොහොසත් වීමි. ඔබ වහන්සේ ද දවල් කියවන පාළිවචනය ද සවස්වේලෙහි කියවන පාළිවචනය ද මා බලා, තබා වදාළ මැනවැ"යි කීහ.

මෙසේ ඔවුන් වහන්සේ ආචාර්‍ය්‍යයන් වහන්සේට එපවත් සැළ කොට ගල් වල වසන සඞ්ඝරක්ඛිත තෙරුන් වහන්සේ සමීපයට වැඩි සේක. ඔවුන් වහන්සේ තමන් වහන්සේගේ පන්සල පිරිබඩ ගන්නා සේක් වැඩි වහන්සේ නො බලා ම "ඇවැත්නි, තොපගේ පාංසුකූලවුරු නගා තබව"යි වදාළසේක. ඔවුන් වහන්සේ ද "ස්වාමිනි, මාගේ එක් ව්‍යාධියක් ඇත. ඉදින් නුඹවහන්සේ එයට පිළියම් කරන්නට පොහොසත් සේක් නම් පාංසුවුරු නගා තබමි"යි වදාළසේක. ඔවුන් වහන්සේ ද "ඇවැත්නි, උපන්නාවූ රෝගයට පිළියම් කරන්නට පොහොසතුන් සමීපයට ම අව. පාංසිවුරු නගා තබව"යි වදාළසේක. "අපගේ ආචාර්‍ය්‍යයන් වහන්සේ නො දැන මෙසේ නොවදාරණ සේකැ"යි පාංසිවුරු නගා තබා තෙරුන් වහන්සේට වතාවත් දක්වා වැඳ එකත්පස් ව හුන්සේක. තෙරුන් වහන්සේ "මොහු රාගචරිතයෝ ය"යි දැන ඔවුන් වහන්සේට සුදුසු කොට කමටහන් දුන් සේක. ඔවුන් වහන්සේ ද හුනස්නෙන් නැගිට පාංසිවුරු උරෙහි ලා තෙරුන් වහන්සේ නැවත නැවත වැඳිසේක් "ස්වාමීනි, ඉදින් මම මාගේ කටයුතු කරන්නට පොහොසත් වීම් නම්, ඉතා යහපත. නො එසේ වී නම් මේ මාගේ අන්ත දුක්ම ය"යි වදාළසේක.

ඔවුන් වහන්සේ ද "යව ඇවැත්නි, මහාතිස්සභූතීනි! තොප බඳු වූ වීර්‍ය්‍යවත්වූ කුලපුත්‍රයන්හට ධ්‍යානය වත් විදර්ශනාව වත් මාර්ගය වත් ඵලය වත් දුර්ලභ නො වේ"යි වදාළසේක. ඔවුන් වහන්සේ තෙරුන් වහන්සේගේ බස් අසා ඔබට ආදර දක්වා එසින් නික්ම එන වේලෙහි ම සලකුණු කාරණ ලද, සැඟවී තුබූ දෙමට ගසක් මුලට වැද පලක් බැඳ වැඩහිඳ අසුබ කමටහන් පාදක කොට

විදශීනාවට පටන් ගෙණ රහත් බැව්හි පිහිටා අලුයම් වේලෙහි පාළි වචනය උගන්නට ආචාර්‍ය්‍යයන් වහන්සේ සමීපයට ම වැඩිසේක. (මනොරථපූරණී ත්‍රි: මු: 23 පිට)

---

**අභ්‍යන්තර සාමණේර නමක්:—** තවද එක් රහත් තෙර කෙනෙකුන් වහන්සේ "මහ සෑය හා බෝධිය ද වඳින්නෙමි"යි සමාපත්තිලාභී භණ්ඩගාහක හෙරණ කෙනෙකුන් සමග දනව්වෙන් නික්ම මහාවිහාරයට අවුත් එක් පිරිවෙණකට පිවිසිසේක. සවස් කාලයෙහි මහා සඞ්ඝයා සෑය වඳනා කල්හි වඳිනු පිණිස නික්ම නොවැඩි සේක. කුමක් හෙයින් ද? යත්:- ක්ෂීණාශ්‍රවයන්ට වනාහි රත්නත්‍රය කෙරෙහි ගෞරවය මහත් වන්නේ ය. එහෙයින් භික්ෂුසඞ්ඝයා වැඳ පෙරළා වැඩි කල්හි මිනිසුන් සවස බත් කන වේලෙහි හෙරණුන්දෑට ද නො දන්වා "සෑය වඳිමි"යි හුදකලා ව ම නික්මුනු සේක. හෙරණුන් වහන්සේ ද "අවේලාවෙහි තෙරුන් වහන්සේ හුදකලා ව කුමක් හෙයින් නික්මුනු දැයි දැන ගන්නෙමි"යි තෙරුන් පිය අනු ව ගිය සේක. තෙරුන් වහන්සේ ද ආවර්ජනාවක් නැති බැවින් සාමණේරයන්ගේ ගමන නො දන්නේ දකුණුදෙරින් මහසෑ මලුවට නැගිසේක. හෙරණුන් වහන්සේ ද පිය අනු ව ගොස් සෑමලුවට නැගී මහතෙරුන් මහසෑය බලා බුද්ධාලම්බන ප්‍රීතිය ලැබගෙණ සියල්ල සිතින් සමන්වා තුටුපහටු ව මහ සෑය වඳින ආකාරය බලා "මාගේ උපාධ්‍යායයන් වහන්සේ අතිශයින් පහන් සිත් ඇති සේක් මහසෑය වඳනා සේක. කිමෙක් ද, මල් ලැබුනොත් පූජා කරණ සේක් දෝ?"යි සිතූහ. මහ තෙරුන් වහන්සේ වැඳ නැගිට හිසෙහි ඇඳිලි බැඳගෙණ මහසෑය බල බලා සිටිනු දැක හෙරණුන්දෑ කාරු තමන් ආ බව හැඟවූහ. මහ තෙරුන් පෙරළී බලා "කවර වේලක අවු ද? සාමණේර යෙහි"යි ඇසූ කල "ස්වාමීනි, ඔබවහන්සේ සෑය වඳනා කාලයෙහි ය. අතිශයින් ප්‍රසන්න ව සෑය වඳනා සේක. කිමෙක් ද, මල් ලදෙත් පූජාකරණ සේක් දෑ?"යි ඇසූහ. "එසේය; සාමණේරය, මේ සෑයෙහි පමණ අන් තැනෙක මෙතරම් ධාතුනිධානයක් නැත. මෙබඳු අසදෘශ සෑයක් මල් ලැබ කවරෙක් නු පුදන්නේ දෑ?"යි කීකල 'එසේ නම්, ස්වාමීනි, මඳක් ඉවසාවදාළ මැනව. මල් ගෙණ එමි'යි කියා එකෙණෙහි ම ධ්‍යානයට සමවැද ඍද්ධියෙන් හිමවතට ගොස් වර්ණගන්ධසම්පන්න මල් ගෙණ පෙරහන්කඩෙක පුරවා මහ තෙරුන් වහන්සේ දක්ෂිණපාර්ශ්වයෙහි සිට පශ්චිමපාර්ශ්වයට නො එන තෙක් මල් පෙරහන ගෙණ අවුත් අතෑ තබා "ස්වාමීනි, පූජා කළ මැනවෑ"යි කීහ.

මහ තෙරුන් වහන්සේ "සාමණේරය, මල් ඉතා ටික නො වේ දැ"යි කිසේක. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ගුණය සලකා පූජා කරන්නැ"යි කී පසු තෙරුන් වහන්සේ පශ්චිමපාර්ශ්වයෙහිවූ පියගැටයෙන් නැග සැකුස වේදිකා බිමෙහි මල් පුදන්නට පටන් ගත් සේක. වේදිකාභූමිය පිරී දෙවන වේදිකාභූමියෙහි ද දනක් පමණ මල් පුරා සිටියේ ය. එයින් බැස පියගැට පන්තියෙහි පුද එද පිරුණු පසු යට තලයෙහි විසුරුවමින් වැඩි සේක. සියලු සෑ මලු මල් වලින් පිරුණු පසු "සාමණේරය, මල් ක්‍ෂය නො වන්නේ වේ දැ"යි කී සේක. "ස්වාමීනි, පෙරහත යටිකුරු කරණු මැනවැ"යි කී පසු අධොමුඛ කොට සැලූසේක. එවිට මල් ක්‍ෂය වූයේ ය.

තෙරුන් වහන්සේ පෙරහත සාමණේරයන්ට දී ඇත්පවුරන් සමග මහසෑය තෙවිටක් පැදකුණු කොට සිවුහැනෙක සිට වැඳ පිරිවෙණට වඩනේ "මේ සාමණේර තෙමේ මහත් සෘද්ධි ඇත්තේ ය. මේ සෘද්ධ්‍යනුභාවය රක්නට හැක්කේ ද? නො හැක්කේ දැ?"යි බලා නො හැකි බව දැන "සාමණේරය, තෙපි දැන් මහර්ධි ඇත්තහු ය. මෙබඳු සෘද්ධියන් නසා පසු කල කණ්පෙහෙරදුවකගේ අතින් මැඩපු කැඳ බොන්නහු වේදැ"යි වදාළසේක. මේ කථාව අසා හෙතෙම සංවේගයට නො පැමිණියේ ය. "ස්වාමීනි, මට කමටහන් වදරන්නේ මැනවැ"යි යාචඤා නො කෙළේ ය. ඒ වනාහි තරුණකමේ දොෂයෙක් ම ය. "අපගේ උපාධ්‍යායයන් වහන්සේ කුමක් කියන සේක් දැ"යි නො ඇසූ කන් ඇත්තෙක් ව ගියේ ය.

තෙරුන් වහන්සේ මහසෑයත් බොධියත් වැඳ හෙරණුන් ලවා පාසිවුරු ගෙන්වා ගෙණ පිළිවෙළින් කුටෙලිතිස්ස මහාවිහාරයට වැඩිසේක. හෙරණ තෙමේ ද තෙරුන්වහන්සේගේ පදනුපදික ව පිඬු පිණිස නො හැසිර "ස්වාමීනි, කවර ගමකට වඩනහු දැ?"යි අසා "දැන් මාගේ උපාධ්‍යායයන් වහන්සේ ගම්දොරට පැමිණි සේක් වනැ,'යි දැන තමන්ගේ හා උපාධ්‍යායයන්ගේත් පාසිවුරු ගෙණ අහසින් ගොස් තෙරුන්වහන්සේට පාසිවුරු දී පිඬු පිණිස හැසිරෙයි. මහතෙරුන් වහන්සේ "සාමණේරය, මෙසේ නො කරව. පුහුදුන් සෘද්ධිය නම් සැලෙන සුලුය. අස්ථිර ය. නොසැප රූපාදි අරමුණු ලැබ ස්වල්පයකින් බිඳෙන්නේ ය. ඇත්තාවූ සමාපත්තියෙන් පිරිහුනේ ද බඹසරවසැ සිටින්නට නො හැකි වෙ"යි හැම විටම අවවාද වදරණ සේක. හෙරණුන්දු ද "මාගේ උපාධ්‍යායයන් වහන්සේ කුමක් කියන සේක් දැ"?යි නො අසනු කැමැත්තේ එසේ ම කරණුදු ය,

මහතෙරුන් වහන්සේ පිළිවෙළින් සැවදහේ කාම්පුපෙළන් ද නම් විහාරයට වැඩිසේක. තෙරුන් වහන්සේ එහි වසන කල්හි ද හෙරණ තෙමේ එසේ ම කෙරෙයි. එක් දවසෙක තරුණවියෙහි සිටි රූපත් පෙසකාරදුවක් පියුම්විලකට බැස ගී කියමින් මල් කඩන්නී ය. එසමයෙහි හෙරණ තෙමේ ඒ විල මතුයෙන් යන්නාහු ලහටුවක බැඳෙන කණමැසියක මෙන් ඇගේ ගීයෙහි බැඳී එකෙණෙහි ම සෘද්ධියෙනුදු පිරිහී සිදිනලද පියාපත් ඇති කවුඩකු මෙන් වී ය. ලබනලද සමාපත්තිබලයෙන් වනාහි විල දියමතුයෙහි නො වැටී ඉඹුල්පුළුනක් මෙන් හෙන්නේ පියුම්විල තීරයෙහි පිහිටියේ ය. ඉක්බිති හෙතෙම වෙලෙවී වැ ගොස් උපාධ්‍යායයන්වහන්සේගේ පාංසිවුරු උන්වහන්සේට දී නැවතුනේ ය.

මහතෙරුන් වහන්සේ "මෙය මා විසින් දක්නා ලද්දේ ය"යි කියා "වැළකුව ද නො නවතින්නේ වනැ"යි දැන කිසිවක් නො වදරා පිඩු පිණිස වැඩිසේක. හෙරණු ද පියුම් විල ඉවුරෙහි ඇයගේ එතෙරෙ වීම බලමින් සිටියේ ය. පෙහෙරදුවතියෝ පියුම්විල මතුයෙන් යන්නා වූද පෙරළා අවුත් සිටින්නාවූ ද හෙරණුන් දැක "ඒකාන්තයෙන් මේ මා නිසා කල කිරුණේ වනැ"යි දැන "සාමණෙරයෙනි, ඉවත් ව"යි කිව. උන් ඉවත්වූ පසු තරුණිය ද ගොඩ නැගී වස්ත්‍රය හැඳ උන් කරා එළඹ "ස්වාමීනි, කිමෙක් ද?"යි ඇසුවා ය. උන් තමන් අදහස කී කල ඕ තොමෝ නොයෙක් ලෙසින් ගිහිගෙයි විසීමෙහි දොස් ද බ්‍රහමචරියවාසයෙහි අනුසස් ද කියා අවවාද කොට උන්ගේ කලකිරුම් බව හරණට නොහැකි වූවා "මෙතෙම මා නිසා මෙබඳු සෘද්ධියකිනුදු පිරිහී ගියේ ය. දැන් අත් හරින්නට නුසුදුසු ය"යි සිතා "තෙපි මෙහි ම සිටුව"යි ගෙට ගොස් මවුපියන්ට එපුවත කිවා ය.

ඔහු ද අවුත් නොයෙක් අයුරෙන් අවවාද කියා ගිවිස්සන්නට නො හැක්කාහු "තෙපි අප උසස් කුලිකයනැයි නො සිතව. අපි පෙසකාරයෝ වෙමු. පෙහෙරකම් කරන්නට හැක්කාහු දැ?"යි ඇසූහ. "උපාසකයෙනි, ගිහි වූයේ පෙහෙර කම් හෝ කෙරෙයි. නළකාරකම් හෝ කෙරෙයි. එයින් කිම් ද? වස්ත්‍රයක් දිම් පමණකට ලොභ නො කරව"යි කී පසු පෙහෙර තෙමේ ද බඩෙහි බඳනා ලද වස්ත්‍රය මූදා දී ගෙට ගෙණ ගොස් දුවට දුන්නේ ය. හෙතෙම පෙහෙරකම් ඉගෙණ පෙහෙරුන් සමග කම්හලෙහි වැඩ කරන්නට වන. සෙසු ගැහැණු උදෑසන බත් පිස ගෙණ ආහ. උන්ගේ ඇඹේතියෝ එතෙක් නො ආහ. සෙස්සන් වැඩ තබා බත් කන කල ද හෙතෙම හූ කටිමින් හුන්නේ ය.

ඉක්බිති බොහෝ කල් ගෙවා බත් ගෙණා අඹුවට හෙතෙම තර්ජනය කළේ ය. ගෘහිණිය නම් සක්විතිරජ වුවත් තම වශයට පත් බව දන්නී දුසයකු කොටත් නො සලකන්නී ය. එහෙයින් ඕ තොමෝ ද "අනුන්ගේ ගෙවල දර කොළ ලුණු ආදිය රැස් කොට ඇත. බැහැරින් ගෙණ දෙන පෙසකාරයෝ ද ඇත. මම හුදකලා එකකිමි. තෙපි මගේ ගෙයි මේදෙය ඇත මේ දෙය නැතැ'යි නො දන්නහු ය ඉදින් කැමැත්තෙහි නම් කව, නො කැමැත්තෙහි නම් නො කව"යි බැණ වැදුනා ය. හෙතෙමේ ද "උදෑසනින් මට බත නො ගෙණායෙහි ය. දූන් බසිනුත් මට වෙහෙස දෙන්නෙහි ය"යි කිපී අන් ගැසිය යුතු දෙයක් නො දුටු හුදඹුනාඩෙන් ම දමා ගැසී ය. එය තම කරු එනු දුටු ඈය මදක් ඈල ව ගිය නමුදු තියුණු හුදඹු කෙළවර ඈගේ ඇස වැද ගත්තේ ය. ඕ තොමෝ වහා දෙඅතින් ඇස වසා ගත්තී ය. ඇසින් ලේ වැගිරෙණු දුටු හෙතෙමේ ද උපාධ්‍යායයන් වහන්සේ "අනාගතයෙහි කණපෙහෙරදුවක අතින් මැඩපු කැඳ බොන්නේ වේ දූ'යි වදාළේ මේ නිසා ය. මෙය තෙරුන් විසින් දක්නා ලද්දේ ය. අනේ! ආයුෂ්‍යන් වහන්සේ දීර්ඝදර්ශී ය"යි කියා මහ හඬින් හඬන්නට පටන් ගත. සෙස්සන් විසින් "යහළුව, දූන් හැඬීමෙන් කිම් ද? නො හඬව, ඇස නම් බිඳී ගියේය. හැඬීමෙන් එය ප්‍රකෘතිමත් කරන්නට නො පිළිවනැ"යි ඔහුට කී කල "මම මේ නිසා හඬන්නෙම් නො වෙමි. වැලිත් මා හඬන්නේ මේ නිසා ය"යි හෙතෙම සියලු පුවත පිළිවෙළින් ඔවුන්ට කීයේ ය. (සම්මෝහ විනෝදනී 204 පිට)

---

**මහාතිස්ස ස්ථවිර:-** තවද මහාතිස්ස නම් තෙර කෙනෙකුන් වහන්සේ වස් නොවැසූ කල්හි පටන් අෂ්ටසමාපත්ති ලාභීසේක. තමන් වහන්සේ සමාපත්තීන් ඔබන ලද කෙලශයන් නැවත නූප දනා මෙන් සැටවයස් වැඩුනු කල්හි ද තමන් වහන්සේ පුහුදුන් බව නො දන්නා සේක.

එසමයෙහි එක් දවසක් මාගම්හි තිස්සමහවෙහෙර භික්ෂුසඞ්ඝයා වහන්සේ තලඞගර වාසී ධම්මදින්න නම් තෙරුන් වහන්සේට "ස්වාමීනි මෙයට වැඩ බණ වදාරණ සේක් ව"යි කියා හසුන් යැවූ සේක. තෙරුන් වහන්සේ "යහපතැ"යි ඉවසා මා සමීපයෙහි වැඩ

මහලු වහන්සේ කෙනෙකුන්ද නැත. මහාතිස්ස නම් තෙරුන් වහන්සේ වනාහි මට ආචාර්‍යයෝ සේක. ඔවුන් වහන්සේ සඞ්ඝස්ථවිර කොට යෙමි"යි භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණ ලද සේක් තෙරුන් වහන්සේගේ විහාරයට ගොස් දිවාස්ථානයෙහි සිටි තෙරුන්ට වත් දක්වා එකත් පසෙක හුන්හ. තෙරහු "කිම, ධම්මදින්නය, බොහෝ කලකින් ආයෙහිදැ?"යි විචාළහ. 'එසේය; වහන්ස! තිස්ස මහවෙහෙරින් භික්ෂුසඞ්ඝයා මට හස්නක් එවූහ. මම හුදකලා ව එහි නො යමි. නුඹවහන්සේ සැටු ව යනු කැමැත්තෙන් මෙහි ආමි"යි සිහි කටයුතු කථා කියමින් කල් යවා "වහන්ස, ඔබ මේ ලොවුතුරු දහම් කවර දවසෙක ලැබූසේක්දැ"යි විචාළහ. "සැටවසෙක් වී යැ"යි කීහ. "වහන්ස, සමවත්සුව වළඳව් දැ"යි විචාරණ ලද සේක් "එසේය ඇවැත්නි"යි කීහ. "වහන්ස, එක් පොකුණක් මැවිය හැකිදැ? යි ඇසූහ. "ඇවැත්නි, මෙය නොබර ය"යි ඉදිරියෙහි පොකුණක් මැවූහ. "වහන්ස, මෙහි එක් පියුම්පඳුරක් මවව"යි කියන ලදු ව එය ද මැවූහ "මෙහි දූන් මහතෙලුම්මලක් දක්ව"යි කීහ. තෙරණුවෝ එය ද දක්වූහ.

මෙහි සොළොසැවිරිදි පමණ වයසැති ස්ත්‍රී රූපයක් දක්ව"යි කියන ලදසේක් එය ද මවා දක්වූහ. "මේ රූව ශුභ වශයෙන් මෙනෙහි කරව"යි කීහ. තෙරනු තමා මැවූ ගැහැණු රූව බලන්නෝ ලොභ ඉපිදවූහ. එවිට තමා පුහුදුන් බව දැන "සත්පුරුෂය, මට පිහිට වෙව'යි අතැවැසිනු වෙත උක්කුටුකයෙන් හුන්හ. "වහන්ස, මේ සඳහා ම ආමි"යි සැගැල්ලු අසුභ කමටහනක් කියා තෙරුන්ගේ විවේකය සඳහා පිටතට නික්මුනුසේක. ඔහු දිවා ස්ථානයෙන් නික්මෙත් ම තෙරනු සංස්කාරයන් මෙනෙහි කොට සිවු පිළිසිඹියා රහත් බවට පැමිණිසේක. ඉක්බිති ඔවුන් වහන්සේ සඟතෙර කොට ධම්මදින්න තෙරණුවෝ තිස්සමහාවිහාරයට ගොස් ධර්ම දෙශනා කොට වදාළ හ (මනොරථ පූරණී ත්‍රි. මූ. 25 පිට).

---

**මහානාග තෙරහු:—** තවද සිතුල්පව්වෙහි තිවුන්දරු වූ තෙරුන් වහන්සේ දෙනමක් විසූසේක. දෙදෙනා වහන්සේ අතුරෙන් බාල වහන්සේ තමන් වහන්සේට උපස්ථාන කරණ උපාසකයකු විසින් දෙන ලද උක්දණ්ඩක් හැරගෙණ බෑයන් වහන්සේ සමීපයට ගොස්' ස්වාමීනි, වළඳ වදාළ මැනවැ"යි කීසේක. එවේලෙහි තෙරුන්වහන්සේ ද බත් වළඳ මුව සෝදන්නට වැඩහුන් සේක් "ඇවැත්නි, නො කැමැත්තෙමි"යි වදාළසේක. නැවත භික්ෂූන්

වහන්සේ "ස්වාමීනි, එකාසනිකයෙක් දැ?"යි විචාළසේක. ඉක්බිති තෙරුන් වහන්සේ "ඇවැත්නි, උක්දණ්ඩ මෙහි ගෙණෙව"යි වදරා පණස් හවුරුද්දක් මුළුල්ලෙහි තමන් වහන්සේ රක්‍ෂා කළ එකාසනික ධුතාඞ්ග ගුණය සහවා උක්දණ්ඩ අනුභව කොට නැවත ධුතාඞ්ගය සමාදන්වූ සේක. (මනොරථ පූරණී ත්‍රි. මූ. 44 පිට)

---

**අන්‍යතර ස්ථවිරයෙක්:**—තවද, රුහුණු නාගමහා විහාරයෙහි වසනහි එක්තරා මහතෙර කෙනෙකුන් වහන්සේ භික්‍ෂු සංඝයා නොවිචාරා නා ගසක් සිඳවූසේක. ගසට අරක් ගත් දෙවතාවාතෝ තෙරුන් වහන්සේට කිපී පළමු ව ඔවුන් වහන්සේ පොළඹවා පසු ව "මෙයින් සත්දවසකින් ඔබවහන්සේගේ උපස්ථායක රජතෙම මැරෙන්නේ ය"යි සිහිනෙන් කියාලූහ. ස්ථවිර තෙමේ ඒ කථාව අසා රජුගේ අන්තඃපුරස්ත්‍රීන්ට කීය. ඔහු තුමූ එක පහරින් ම මහහඬින් හැඬූහ. රජ තෙමේ "මේ කිමෙක් දැ?"යි විචාරා 'තෙරුන් විසින් මෙබන්දක් කියන ලදැ"යි කීකල දවස් ගණන් කොට බලා සත්දවස ඉක්ම ගිය පසු තෙරුන් කෙරේ කිපී අත්පා සිඳවූයේයි. (සම්මෝහ විනොදනී ත්‍රි. මූ. 286 පිට)

---

**තිස්ස ස්ථවිර:**· තවද, තිස්ස නම් එක් තෙරණ කෙනෙකුන් වහන්සේ තම උපාධ්‍යායයන් වහන්සේ තිස්ස මහ වෙහෙර වසන කල 'ස්වාමීනි, මම නාල කිරුණේ වෙමි"යි එක් දිනෙක උන්වහන්සේට කීසේක. තෙරුන් වහන්සේ "සාමණෙරය, මේ විහාරයෙහි නහන දිය දුලීන ය. මා ගෙණ සිතුල්පව්වට යව"යි කීකල සාමණෙරයන්දෑ උන්වහන්සේත් කැටි ව සිතුල් පව්වට ගියදෑ ය.

ඉක්බිති තෙරුන්වහන්සේ මේ විහාරය "අතිශයින් සඞ්ඝිකය; එක් පෞද්ගලික විහාරයක් කරව"යි කීසේක. සාමණෙරයෝ ද "ස්වාමීනි, යහපතැ"යි කියා සංයුත්සඟිය වන පොත්කිරීම, පබ්භාරය සුද්ධ කිරීම තෙජෝකසින පරිකර්මය යන කරුණු තුණ එකවිට පටන් ගෙණ කර්මස්ථානය අභිඥාවට පැමිණවීමත් සංයුත්සඟිය වනපොත් කිරීම හා ලෙණෙහි වැඩ අවසන් කිරීමත් එකවිට ම කොළෝ ය. සියල්ල කොට උපාධ්‍යායයන් වහන්සේට දන්වූ පසු උපාධ්‍යායයන් වහන්සේ "සාමණෙරය, තා මහත් උත්සාහයෙන් කළ විහාරයෙහි පළමු කොට අද තෙපි ම වසව"යි වදාළසේක.

හෙතෙමේ ද ඒ රැය ලෙනෙහි වසන්නේ ඍතුසප්‍රාය ලැබ විවසුන් වඩා රහත් ව එහි ම පිරිනිවියේ ය. උන්වහන්සේගේ ධාතු රැගෙණ සෑයක් කළාහු ය. පපංච සූදනී ශ්‍රී ධ. සංස්කරණ 312 පිට).

---

**අන්‍යතර දහර භික්‍ෂුවක්:—** තවද එක් තරුණ භික්‍ෂූන් වහන්සේ නමක් කළුදිය වැව දෙර විහාරයකට ඉගෙණීම පිණිස ගියේ ය. ආචාර්‍ය්‍යයන් වහන්සේ ඔහුට එන අනතුරක් දැක අවකාශ නො කෙරෙති. ඔවුන් නැවත නැවතත් ලුහු බඳතා කල ආචාර්‍ය්‍යයන් වහන්සේ "ඉදින් ඇතුළුගම නො හැසිරෙන්නෙහි නම්, තට ඉගෙණීම දෙමි"යි කීහ. හෙතෙමේ "යහපතැ"යි පිළිගෙණ උදෙසීම නිමි කල්හි ගුරුන් වහන්සේ වැද යන්නේ 'මාගේ ගුරුන් වහන්සේ මෙගම හැසිරෙන්නට නො අනුදනිති, කාරණ කිමෙක් දෝ හෝයි බලමි"යි සිවුරු පොරොවා එගමට පිවිසියේ ය.

එක් කුලදූවක් කසාවතක් හැඳ ගෙයි සිටියා තරුණ භික්‍ෂූහු දැක හටගත් ඇලුම් ඇත්තී හැන්දෙන් කැඳ ගෙණවුත් පාත්‍රයෙහි බහා පෙරළා ගොස් හැඳකට නැඟී වැතිර ගත්තා ය. දෙමාපියෝ "දූරිය, කිමෙක්දැ?"යි ඇගෙන් විචාළෝ ය. 'දූන් ගෙදරින් ගිය තරුණයා ලබන්නෙම් නම් ජීවත් වෙමි. ඉදින් නො ලබන්නෙම් නම් මැරෙමි"යි තර ව කීවා ය. දෙමාපියෝ ඉක්මනින් ගොස් ගම් දෙර දී තරුණ භික්‍ෂුව හමු ව "ස්වාමීනි, නැවතී භික්‍ෂාව පිළිගණු මැනවැ"යි කීකල තරුණයා "නුවූව මනා ය, යන්නෙමි"යි කීයෙන් "ස්වාමිනි, මෙනම් කාරුණෙණකැ"යි යාච්ඤා කරන්නාහු "ස්වාමීනි, අපගේ ගෙයි මෙතෙක් ධනය ඇත්තේ ය. අපට සිටින්නේ එක ම දුවක. ඕ ව අපගේ වැඩිමාලු පුත්තනතුරේ තබමු. සැප සේ ජීවත් වන්නට හැක්කේ ය"යි ඇවිටිලි කළාහු ය. තරුණ තෙමේ ද "මට මේ පලිබෝධයෙන් වැඩෙක් නැතැ'යි ඔවුන්ගේ බස් නො පිළිගෙණ ගියේ ය. දෙමාපියෝ ගෙට ගොස් "මැනියෙනි, තරුණයා නවතන්නට නොහැකි වී ය. වෙන යම් හිමියකු කැමැත්තෙහි නම් කියව. නැගිටුව, කව, බොව"යි පැරැත්ත කළාහුය. ඕ ද නො කැමැත්තී සත්දිනක් නිරාහාර ව සිට මළා ය. දෙමාපියෝ ඇගේ සිරුර පිළිබඳ කටයුතු නිමවා ඒ කසාවත ලඟ විහාරයෙහි සඞ්ඝයාට දුන්නාහු ය.

එක් මහලු නමක් තමන් ලත් කොටස ගෙණ කැලණි වෙහෙරට ආයේ ය. පෙරකී තරුණයා ද "සෑය වඳින්නෙමි"යි එහි ගොස් දිවාස්ථානයෙහි හුන්නේ ය. මහලු වහන්සේ ඒ වස්ත්‍රඛණ්ඩය

ගෙණ "සවාමීනි, මෙයින් මට පෙරහනක් කර දුන මැනවැ"යි තරුණ උන්නාන්සේට කීහ. තරුණයා ද මහලු උන්නාන්සේ ගෙන් "මෙය කොයින් ලබන ලද දැ"?යි විචාරා සියලු පුවත දැන ගෙණ "මෙබඳු තැනැත්තියක සමග වසන්නට නො ලැබුමෙන් වනැ"යි හටගත්රාග ගින් තෙන් දැවී එතැන ම කාලුරිය කොළේ ය. (පපංචසූදනී ශ්‍රී. ධ. සංසකරණය 353 පිට.)

---

**තරඞගල වාසි ධම්මදින්න සඵවිර:—** හාවද තරඞගල වාසී ධම්මදින්න නම් සිවුපිළිසිඹියාපත් රහතන් වහන්සේ කෙනෙකුන්දූ බොහෝ භික්‍ෂූන් වහන්සේට අවවාද දෙන සේක. ධම්මදින්න තෙරුන් වහන්සේ එක් දවසක් "අපගේ ආචාර්‍ය්‍ය වූ මහානාග තෙරුන් වහන්සේගේ මහණ දම් මුදුන් පත් වී දෝ හෝ"යි පරීක්‍ෂාකරණ සේක් ඔවුන් වහන්සේ පුහුදුන් බව දැන "මා ඔබ සමීපයට නො ගිය හොත් පුහුදුන් ව ම මියනසේකැ"යි දැන සෘද්ධියෙන් අහසින් ගොස් දවල් සිටි තැන්හි වැඩ සිටි මහානාග තෙරුන් වහන්සේ සමීපයෙහි බැස ඔවුන් වහන්සේ වැඳ වතාවත් දක්වා එකත් පස්හි වැඩහුන් ඉක්බිති මහානාග තෙරුන් වහන්සේ "ඇයි, ඇවැත, ධම්මදින්නය, නොකල්හි අවු දැ?"යි වදාළසේක. ධම්මදින්න තෙරුන් වහන්සේ "සවාමීනි, පැනයක් විචාරන්නට ආමි"යි කීසේක.

ඉක්බිති මහානාග තෙරුන් වහන්සේ "ඇවැත්නි, විචාරව. දනුමෝ නම් කියන්නමෝ වේ දැ"යි වදාළසේක. ධම්මදින්න තෙරුන් වහන්සේ පැන දහසක් විචාළසේක. මහානාග තෙරුන් වහන්සේ විචාළ විචාළ පැන පැකිළීමක් නැති ව විසඳ වදාළසේක. ඉක්බිති ධම්මදින්න තෙරුන් වහන්සේ "සවාමීනි, ඔබවහන්සේගේ ඥනය ඉතා තීක්‍ෂණය. කවර කාලෙක්හි ඔබවහන්සේ විසින් මේ ධර්මය දන්නා ලද දැ"යි විචාළකල්හි මහානාග තෙරුන් වහන්සේ මෙයට "සැට හවුරුද්දකට පෙර ය"යි වදාළසේක. ධම්මදින්න තෙරුන් වහන්සේ "සවාමීනි, සමාධි පුවය ලදසේක් දැ"යි විචාළසේක. මහානාග තෙරුන් වහන්සේ "ඇවැත්නි, ඒ බැරිදෙයෙක් නො වෙ"යි වදළසේක.

ධම්මදින්න තෙරුන් වහන්සේ "සවාමිනි, එබැවින් එක් ඇතකු මවා වදළ මැනවැ"යි වදළසේක. මහානාග තෙරුන් වහන්සේ ඍද්ධියෙන් ධවලවූ ඇතකු මවා වදළසේක. ධම්මදින්න තෙරුන්

වහන්සේ "ස්වාමීනි, දැන් මේ ඇතු සිටුවනලද කන් ඇති ව දික් කරණලද නඟුටු ඇති ව සොඬ මුවෙහි තබා ගෙණ භයානකවූ කුඤ්චනාද කෙරෙමින් ඔබ වහන්සේ ඉදිරියට එන පරිද්දෙන් මවා වදාල මැනවැ"යි කී සේක. මහානාග තෙරුන් වහන්සේ ද ඒ ලෙසින් ඇතු ඉදිරියට එන පරිද්දෙන් මවා යුහු ව එන්නාවූ ඇතුගේ භයානකවූ ආකාර දැක නැඟී සිට පලායන්නට වන්සේක.

ඉක්බිති ක්ෂීණාශ්‍රව ධම්මදින්න තෙරුන් වහන්සේ අත දික් කොට මහානාග තෙරුන් වහන්සේගේ සිවුරුකණ ගෙණ "වහන්ස; ක්ෂීණාශ්‍රව කෙනෙකුහට භයෙක් නම් ඇත් දැ?"යි විචාළසේක. මහානාග තෙරුන්වහන්සේ එකල්හි තමා පුහුදුන් බව දැන "ඇවැත්නි; ධම්මදින්නයෙනි, මට පිහිට වේව'යි කියා ඔවුන් වහන්සේගේ පාමුල්හි උක්කුටුකයෙන් හුන් සේක. ධම්මදින්න නම් තෙරුන් වහන්සේ "ස්වාමීනි, මම ඔබ වහන්සේට වහල් වන පිණිස ම ආමි. කිසිවක් නො සිතා වදාල මැනවැ" යි කියා කමටහන් දුන් සේක. මහානාග තෙරුන් වහන්සේ කමටහන් ගෙණ සක්මණට බැස තුන්වන පියවරෙහි රහත් වූසේක. (මනොරථපූරණී ත්‍රි: මු: 25 පිට.)

---

**පූසදෙව ස්ථවිර:—** තවද, කාලදර වාසී පූසදෙව නම් තෙරුන් වහන්සේ දාගැබ්මලුව හැමද සිවුර එක්පස්හි බහාලා අතුරණලද තිකමල් රැසක් වැනිවූ සම ව පතළාවූ වැලි ඇති දාගැබ් මලුව බලා බුද්ධාලම්බනප්‍රීති උපදවා සිටිසේක. එකෙණෙහි මාර තෙම පර්වතසමීපයෙහි උපන් කළුවඳුරක්හු සැටියෙන් දාගැබ්මලුවෙහි ගොම විසුරුවා ගෙණ ගියේ ය. තෙරුන් වහන්සේ චිත්තෛකාග්‍රතාවක් නො ලදින් රහත් වන්නට නො පොහොසත් වූ සේක. ඔවුන් වහන්සේ නැවත මලුව හැමද වැඩසිටි කල්හි මරු දෙවන දවස් මාලුගොණෙකු සැටියෙන් එසේ ම ගොම ලා ගෙණ ගියේ ය.

තෙරුන් වහන්සේ එදවස් ද රහත්වන්නට නො පොහොසත් වූ සේක. මාරතෙම තුන්වන දවස් පය සොර එකෙක්හුගේ සැටියෙන් පා බිම් ගා ගෙණ ගියේ ය. තෙරුන් වහන්සේ "මෙ වැනි පිළිකුල් පුරුෂයෙක් භාත්පසින් යොදනක් පමණ තැන නැත. මේ මාරයා දැ?"යි විචාරා වදාළසේක.

ඉක්බිති මාරතෙම "දූන් වූ කලි වඤ්චාවක් නො කට හැක් කැ"යි සිතා "මම මාරයෙමි"යි කී ය. තෙරුන් වහන්සේ "සර්‍වඥයන් වහන්සේ දුටු විරූ දැ?"යි විචාළසේක. "එසේ ය; වහන්ස, දිටිමි"යි කී ය. තෙරුන් වහන්සේ "මාරයා නම් මහානුභාව ඇත්තේය. එබැවින් සර්‍වඥයන් වහන්සේ වැනි රූපයක් මවව"යි වදාළසේක. "වහන්ස, එවැනි රූපයක් මවන්නට නො පිළිවන. එතෙකුදු වුවත් එවැනි සටහනක් මවමි"යි කියා තමාගේ සැටිය හැර සර්‍වඥයන් වහන්සේගේ රූපය හා සම වූ ආත්මභාවයෙන් සිටියේ ය. ඉක්බිති තෙරුන් වහන්සේ මරහු බලා "මේ සරාග සද්‍වෙස සමොහ එකෙක් පවා මෙසේ සොබී. රාගාදි කිසි දෙෂයක් නැති සර්‍වඥයන් වහන්සේ කෙසේ හොබනා සේක් දැ හෝ"යි සිතා වදුරු බුද්ධාලම්බන ප්‍රීතිය මෙතෙහි කොට විදර්‍ශනා වඩා රහත්වූසේක. (විසුද්ධිමග්ග මුද්‍රිත 171 පිට.)

---

**අන්‍යතර මහණෙක්:**-තවද, එක් අග්‍රශ්‍රාවකයන් වහන්සේ කෙනෙක් එක් අතකින් සුණු භාජනය හා අනෙක් අතින් කොස්ස ද ගෙණ, මහසෑයෙහි සුණුපිරියම් කරණ අවදියෙහි. 'මම ද, සුණුපිරියම් කරමි"යි සෑමලුවට පැමිණිසේක. එවිට එක් දඩබ්බර භික්‍ෂුවක් ගොස් තෙරුන් වහන්සේ ළඟට වූයේ ය. තෙරුන් වහන්සේ "අනෙකකු වත්කල පමා වන්නේ වේදැ"යි එතැනින් අන් තැනකට ගියසේක. ඒ මහණු එතැනට ද පැමිණි කල තෙරුන් වහන්සේ අන් තැනකට වැඩි සේක. මෙසේ තුන්වන තැනටත් ආවහුට "සත්පුරුෂය, සෑමලුව මහත් වන්නේ ය. කිමෙක් ද, අන්තැනක් අනවකාශ දැ?"යි කීහ. එතෙකින් අන්‍යයා බැහැර ගියේ ය. (පපංචසූදනී ශ්‍රී: ධ: මුද්‍රිත 549 පිට.)

---

**චූලනාග හා මහානාග:**—තවද, වසාල නම් නගරග්‍රාමයෙන් නික්ම සොහොයුරෝ දෙදෙනෙක් පැවිදි ව චූලනාග මහානාග නමින් ප්‍රසිද්ධ වූහ. ඔවුන් වහන්සේ දෙනම සිතුල්පව්වෙහි තිස් වසක් වැස රහත් බවට පැමිණ "මෑනියන්දෑ දකින්නෙමු"යි වසාල නගර වෙහෙරට වැඩ දෙවනදා මෑනියන්දෑගේ ගමට පිඩු පිණිස වැඩියාහු ය. මෑනියෝ සැන්දෙත් කැඳ ගෙණ එක් කෙනෙකුන් වහන්සේගේ පාත්‍රයෙහි බහාපියා මුහුණ බැලූහ. එකෙණෙහි ම ඇයට පුත්‍රසෙනහය ඉපදී "දරුවෙනි, නෙපි මාගේ පුත්වූ මහානාග

දූ?"යි ඇසූහ. තෙරුන් වහන්සේ "උපාසිකාවෙනි, පසු ව වඩනා තෙරුන්ගෙන් අසව"යි කියා වැඩි සේක. පසු ව වැඩි තෙරුන් වහන්සේට කැඳ දී "දරුවෙනි, තෙපි මාගේ පුත්‍ර චූලනාග දූ?"යි ඇසූහ. තෙරුන් වහන්සේ ද "උපාසිකාවෙනි, කිමෙක් ද, පෙරටුව වැඩි තෙරුන් වහන්සේගෙන් නො විචාළහුදූ?"යි කියා වැඩි සේක. (සාරත්ථප්පකාසිනී ද්වුතිය භාග ත්‍රි: මු: 125 පිට )

---

**කුජ්ජතිස්ස ස්ථවිර:**— තවද, සැදැහැතිස් රජ්ජුරුවෝ "ස්වාමිනි, මා වැන්ද යුතු එක් ආයුෂ්මතුන් වහන්සේ නමක් වදාළ මැනවැ"යි භික්ෂූන් වහන්සේ විචාළහ. වහන්සේවරුන්දූ ද "මහරජ, මඟුණු වැසිවූ මහාකුජ්ජතිස්ස නම් තෙරුන් වහන්සේ වැන්ද යුතු ය"යි වදාළසේක. ඉක්බිති රජ්ජුරුවෝ මහපෙරහරින් පස්යොදුනක් පමණ මග ගෙවා තෙරුන් වහන්සේ සමීපයට ගියහ. තෙරුන් වහන්සේ "ඇවැත්නි, මේ කවර අරගලයෙක් දූ?"යි භික්ෂූන් වහන්සේ විචාළසේක.

වහන්සේවරුන්දූ ද "ස්වාමීනි, රජ්ජුරුවෝ ඔබවහන්සේ දක්නට එන්නෝ ය"යි වදාළසේක කුජ්ජතිස්ස නම් තෙරුන් වහන් සේද "දූන් මා මාලු ව ගිය කල්හි රජගෙයි කම්මාන්තයෙන් සැහෙනු කිම් දූ?"යි සිතා වදාරා දහවල් හිඳිනා තන්හි වැඩහිඳ බිම හිරි අඳනට වන් සේක. රජ්ජුරුවෝ "කුජ්ජතිස්ස තෙරුන් වහන්සේ කොයි දූ?"යි විචාරා "දහවල් වැඩ සිටිනා තැන ය"යි අසා එතෙනට ගොස් තෙරුන් වහන්සේ බිම හිරි ඇඳ ඇඳ වැඩ හුන්නවුන් දැක "ක්ෂීණාශ්‍රවයන්ගේ නම් හස්තවිකාරයෙක් නැත මොවුන් වහන්සේ ක්ෂීණාශ්‍රව නො වන සේකැ"යි නො වැඳ ම නික්මුනාහ.

ඉක්බිති භික්ෂු සඞ්ඝයා වහන්සේ "ස්වාමීනි, මෙවැනි සැදැහැ ඇති රජ්ජුරු කෙනෙකුන් කවර හෙයකින් කලකිරවූ සේක් දූ?"යි විචාළහ. කුජ්ජතිස්ස තෙරුන් වහන්සේ "ඇවැත්නි, රජ්ජුරුවන්ට ප්‍රසාද එළවීම් අපට බැරි නො වේ ය"යි වදාරා පසු ව නිරුපධිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පානා සේක් "ඇවැත්නි, මාගේ කූටාගාරයේ අනෙක් පලඟකුත් පණවව"යි භික්ෂුසඞ්ඝයා වහන්සේට වදාළ සේක.

තෙරුන් වහන්සේ වදාළ පරිද්දෙන් අනෙක් පලඟක් පැණවූ කල්හි තෙරුන් වහන්සේ "මේ කූටාගාරය අන් තැනෙක්හි නො පිහිටා රජ්ජුරුවන් දුටු විට ම බිම පිහිටාව"යි කියා අධිෂ්ඨාන කොට පිරිනිවන් පෑ වදාළසේක. ඉක්බිති කූටාගාරය පස්යොදුන් මඟ

ගෙවා අහස්හි ම ගියේ ය. පස් යොදුන් මහ දද උපුලන්නට පොහොසත් වෘක්ෂයෝ දද ඉසුලූහ. ඒ සා මහ වනකොළලැහැබි මුළුල්ල කූටාගාරය තුබූ දිශාවට නැමී ගියේ ය.

ඉක්බිති වහන්සේ වරුන්දූ "තෙරුන් වහන්සේ පිරිනිවි සේක. කූටාගාරය අහසින් ම ඔබ එ"යි කියා සැදෑහැකිස් රජ්ජුරුවන්ට පතක් යැවූසේක. රජ්ජුරුවෝ නො ඇදහූහ. කූටාගාරය අහසින් ම ගොස් ධූපාරාමය දකුණත් පස් කොට ගෙණ ගල්දාගැබ් පිහිටි තන්හි සිටියේ දාගැබ් ද තලච්ච හා එක් වැ අහසට පැන නැඟී කූටාගාර මත්තෙහි පිහිටියේය. රැස්වූ මහා ජනයා සාධු කාර දගස්ගණන් පැවැත් වූහ.

එකෙණෙහි මහාව්‍යග්‍ඝතම් තෙරුන් වහන්සේ ලෝවාමහ පායේ එක් කන්කුළෙක්හි වැඩ හිඳ භික්ෂූන් වහන්සේට විනය කම්ම කරණ සේක් ඒ මහත් කෝලාහලය "අසා මේ කුමන් අරගල යෙක් දැ?"යි විචාළසේක. භික්ෂූන් වහන්සේ "ස්වාමීනි මගුණු වැසි කුජ්ජතිස්ස නම් තෙරුන් වහන්සේ පිරිනිවන් පෑසේක. කූටාගාරය පස්යොදුන් මහ ගෙවා අහසින් ම ආ ය එතන්හි මේ සාධු කාර දෙන හඩ ය"යි කී සේක.

මහාව්‍යග්‍ඝ නම් තෙරුන්වහන්සේ 'ඇවැත්නි, පින්වතුන් නිසා මෙ වැනි පූජාවක් ලබම්හ"යි කියා අතැවැස්සන් ක්ෂමා කරවා අහසින් අවුත් කූටාගාරයට වැද දෙවන පලඟ වැද හෙව නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන් පෑසේක ඉක්බිති රජ්ජුරුවෝ ද නොයෙක් සුවඳමල් සුවඳසුණු ආදිවූ පූජා උපකරණ ගෙණ ගොස් අහස බම බමා සිටි කූටාගාරය දැක මහසොම්නසින් පිණා ගියාහු කූටාගාරයට පූජා කළාහ. එකෙණෙහි කූටාගාරය අහසින් බැස පොළොව පිහිටියේ ය. රජ්ජුරුවෝ මහපෙරහරින් ආදාහන කෘත්‍යය කරවා ධාතූන් වහන්සේ ගෙණ මහදාගබක් බැඳවූහ. මෙසේ තමන් වහන්සේ අධිෂ්ඨාන බලයෙන් පිරිනිවන් පෑ කල්හි පවා පස්යොදුන් මග මුළුල්ලෙහි ඒ සා මහවල කූටාගාරය දිසාවට නමා එක හෙළා මහාජනයා මුදුනෙහි දෙහොත් තබවා මහපෙළහරදක්වා වදාළහ. (මනොරථපූරණී ත්‍රි. මු. 384 පිට.)

---

**එක් ලදරු භික්ෂු නාමක්:—** මහගම මහ වෙහෙර වසන එක් ලදරු භික්ෂූන් වහන්සේ නමක් "දීඝවාපියෙහි මහාජාතක භාණක නම් තෙරුන් වහන්සේ ගාථා දහසකින් හෙබි මහාවෙස්

සතාතර ජාතකය වදාරණ සේක"යි අසා තිස්මහවෙහෙරින් නික්ම එක දවසින් තවයොදුන් මඟ ගෙවා වැඩිසේක. ලදරු භික්‍ෂූන් වහන්සේ දුරු සතර ගෙවා අවුත් මං පිඩා ව ඉදුරු බණ ඇසිය නො හි තෙරුන් වහන්සේ බණ වදාරා වඩනා වේලෙහි "මා අා ගමන් සිස් ව ගියේ ය"යි කිය කියා හඬ හඬා සිටිසේක.

එක් මිනිසෙක් ඔවුන් වහන්සේගේ බස් අසා ගොසින් 'ස්වාමීනි, ඔබවහන්සේගේ බණ අසමි"යි කියා එක් ලදරු භික්‍ෂූන් වහන්සේ නමක් තිස්මහවෙහෙර සිට අවුත් ගමන්පිඩා බැවින් බණ ඉදුරා ඇසිය නො හී මා අා ගමන් සිස් වැ ගියේ යයි කිය කියා හඬ හඬා සිටිසේකැ"යි තෙරුන් වහන්සේට දැන්වි ය. තෙරුන් වහන්සේ "යව සෙට බණ කියන බව කියා ඔවුන් සන්සිඳුවව"යි වදාළ සේක. හෙ ද එපවත් භික්‍ෂූන් වහන්සේට සැළ කෙළේ. ඔවුන් වහන්සේ නැවත දෙවන දවස් තෙරුන් වහන්සේ වදාරණ බණ අසා සෝවාන් වූ සේක. (මනොරථ පූරණී ත්‍රි: මු: 38ර.)

---

**මහාතිස්සභූති ස්ථවිර:-** තවද මණ්ඩලාරාම විහාරයෙහි වසන මහාතිස්සභූති නම් තෙරුන් වහන්සේ ගමට පිඩු සිඟා වන්සේක් ගැණු අරමුණක් දැක ඒ පිළිබඳ සිත් ඇති කළ සේක. ඉක්බිති ඔවුන් වහන්සේ විදර්ශනායෙන් කෙලෙසුන් ඔබා නැවත විහාරයට වැඩි සේක. ඔවුන් වහන්සේට ස්වප්නයෙහි ද ගැණු අරමුණක් වැටහෙයි. ඉක්බිති ඔවුන් වහන්සේ මේ කෙලෙස්හු වැඩි මා අපායෙහි හෙළන්නාහු යයි සලකිරි විහාරයෙන් නික්මැ මහාසඞ්ඝරක්‍ෂිත නම් තෙරුන් වහන්සේ වෙතට පැමිණ ඔවුන් වහන්සේ ගෙන් කමටහන් රුගෙණ එක්තරා ලැහැබකට වැද පංසුකූල චිවරය අතුට වැඩහිඳ අනාගාමි මාර්ගයෙන් පඤ්චකාමයෙහි ඇලුම් සිඳ හුනස්නෙන් නැඟී ආචාර්යයන් වහන්සේ වැඳ දෙවන දවස් පාළි වචනය උගන්නට වැඩිසේක. (පපංචසූදනී ශ්‍රී: ධ: මුද්‍රිත 55 පිට.)

---

**දීඝභාණකඅභය ස්ථවිර:—** තවද දීඝභාණකඅභය නම් මහ තෙරුන්වහන්සේ චතුර්විධ ප්‍රත්‍යය සන්තොෂ භාවනාවෙහි ඇලුනු බැවින් මහාආර්‍යවංශප්‍රතිපත්ති වදාරණ සේක. බොහෝදෙන ගඳ දුම් මල් ගත් අත් ඇති ව මහා සත්කාර කරන්නාහ ඉක්බිති එක් තෙර කෙනෙකුන් වහන්සේ ඒ ලාභ සත්කාරය ඉවසන්නට නොපොහොසත් සේක් "දීඝභාණකඅභය මහතෙරහු මහාආර්‍යවංශ

ප්‍රතිපත්තිය දෙසම්යි කියා සියලු රැ කෝලාහල කෙරෙති" යනාදීන් ඔවුන් වහන්සේට නින්ද කරණ සේක් ගව්වක් පමණ මග කැටිව වැඩි සේක. ඒ තෙරුන් වහන්සේ ද මහ මුළුල්ලෙහි දීඝභාණකඅභය තෙරුන් වහන්සේට නින්ද ම කළ සේක.

ඉක්බිති දෙදෙනා වහන්සේගේ විහාරයට මඟ වෙන් වී ය. දීඝභාණකඅභය මහ තෙරුන් වහන්සේ එතැන්හි සිට තෙරුන් වහන්සේ වැද 'ස්වාමීනි, මේ ඔබ වහන්සේ වඩනා මඟ දැ?"යි විචාළ සේක. ඔවුන් වහන්සේ කිබස නො ඇසූ කෙනෙකුන්දැ මෙන් වැඩි සේක. දීඝභාණකඅභය මහ තෙරුන් වහන්සේ ද විහාරයට ගොස් පතුල් සෝධා වැඩ හුන් සේක. ඉක්බිති එක් අතැවැසි භික්ෂු කෙනෙකුන් වහන්සේ ද "ස්වාමීනි, සමීපයෙහි සිට ගව්වක් පමණ මහ මුළුල්ලෙහි නුඹවහන්සේට නින්ද කළ තෙරුන් වහන්සේට කිසිවක් නොවදාළ සේක් දැ?"යි විචාළ සේක. දීඝභාණකඅභය මහ තෙරුන් වහන්සේ "ඇවැත්නි, මා ක්ෂාන්තිය බරි බව මූත් සෙස්සන්ට බැරි නො වෙයි. කමටහන නැති ව එක පියවරක් තබන කල්ද නො දත්මියි වදාළ සේක. (පපංචසූදනී ශ්‍රී: බෘ: මුද්‍රිත 63 පිං.)

---

**තිස්ස ස්ථවිර:—** තවද ලෙනගිරි වාසී තිස්ස නම් තෙරුන් වහන්සේ කෙනෙක් මහගිරි ගම ඇසුරු කොට වසන සේක. පණසක් පමණ මහතෙරවරු නාගදීප චෛත්‍යය වදිනු පිණිස යන්නාහු ගිරිගමෙහි පිඩු පිණිස හැසිර කිසිවක් නො ලැබ නික්මුනාහ. ඉක්බිති තිස්ස තෙරුන් වහන්සේ පිවිසෙනසේක් උන්වහන්සේලා දැක "ස්වාමීනි, පිඩු නො ලැබුවනු දැ?"යි අසා "ඇවත, අපි හැසුරුණෙමු"යි තෙරුන් වහන්සේලා කී පසු පිඩු නොලත් බව දැන "ස්වාමීනි, මා එන තෙක් මඳක් වැඩ සිටිය මැනවැ"යි කී සේක. "ඇවත, අපි පණස්දෙන ම හැසිරු පාත්‍රය තෙමන පමණ වත් නො ලැබුවෙමු'යි තෙරුන් වහන්සේලා කී පසු "ස්වාමීනි, නෙවාසිකයෝ ප්‍රබල වෙති. නො ලැබුනත් ලැබෙන මඟ දනිති"යි කී පසු උන්වහන්සේලා නතර වූහ. තිස්ස තෙරුන් ගමට පිවිසි කෙණෙහි සමීපගෙහි උපාසිකාව කිරිබත් සපයා තෙරුන් එන මඟ බල බලා සිටියා, ගෙදොරට පැමිණි තෙරුන් වහන්සේගේ පාත්‍රය පුරා කිරිබත් දුන්නී ය. ඔවුන් වහන්සේ එය ගෙණ තෙරුන් වහන්සේලා සමීපයට ගොස් "ස්වාමීනි, පිළිගණු මැනවැ"යි සඞ්ඝ ස්ථවිරයන් වහන්සේට කී සේක.

සඞ්ඝ ස්ථවිරයෝ ද "අප මෙතෙක් දෙන හැසිර කිසිවකුත් නො ලද කල මොවුන් මෙය වහා ගෙනෙන ලද්දේ කෙසේ දූ?"යි සෙස්සන් ගේ මුහුණු බැලූහ. තිස්ස තෙරුන් වහන්සේ ද බැලීම් ආකාරයෙන් ම දූත "සවාමීනි, දූහැම් පිණ්ඩපාතයෙක. සැක නැති ව වළඳන්නේ මැනවැ"යි පිළිවෙළින් සියලුදෙනා වහන්සේට සෑහෙන පමණ පිළිගන්වා තමන් වහන්සේ ද සෑහෙන පමණ වැළඳූසේක.

වැළඳූ ඉක්බිති "ඇවත, මේ ලොකොත්තර ධර්මය ලබන ලද්දේ කවරද දූ"යි තෙරුන් වහන්සේලා ඇසූහ. "සවාමීනි. මට ලොකොත්තර ධර්මයෙක් නැති." "එසේ නම් ඇවත, තෙපි ධ්‍යාන ලාභී වහු ද?" "සවාමීනි, මට එබන්දකුදු නැති." "ඇවත, ශෛය ප්‍රාතිහාර්යයෙක්හු?"යි කීකල "සවාමීනි, මා සාරණීයධර්ම පුරණ ලද කල පටන් භික්ෂූන් ලක්ෂයකට දෙන්නේ නමුදු පාත්‍රගත දෙය සිස් නො වන්නේ ය"යි කීසේක. "තෙරුන් වහන්සේලා 'යහපත, යහපත, ඇවත්නි මෙය තොපට ම සුදුස්සෙකැ"යි කියා පැසසූහ.

තවද මේ හිමියන් වහන්සේ ම සැපව්වෙහි ගිරිභණ්ඩ මහා පූජාවේ දන් දෙන ස්ථානයට වැඩ "මේ දනයෙහි වරභණ්ඩය කිමෙක් දූ?"යි විචාරු "සවාමීනි, සාටක යුග්මයකැ"යි කීකල එසේ නම් "එය ලැබෙන්නේ මට ය"යි කීසේක. ඒ අසා ඇමතියෝ "තරුණ උන්නාන්සේ නමක් මෙසේ කියන්නේ වේදූ"යි රජහට කීහ. තරුණ උන්නාන්සේ නමක් එසේ කිව ද, සියුම් වස්ත්‍ර මහ තෙරුන්ට ම වටනේ ය"යි තෙරුන් වහන්සේලාට දෙනු පිණිස බහා තබා භික්ෂු සඞ්ඝයා වහන්සේ පිළිවෙළින් වැඩහුන් කල රජ්ජුරුවෝ පිරිකර බෙදන්නට සූදානම් වූහ.

මුලින් වැඩ සිටි වහන්සේට දෙන කල පිරිකර මතුයෙහි තුබූ ද ඒ වස්ත්‍ර යුග්මය අතට |නො නැගෙයි. අතික්කම අතට එයි. පළමු කී තරුණ වහන්සේට දෙන කල අතට නැගී ගත. රජ්ජුරුවෝ එය තිස්ස හිමියන් වහන්සේ අතැ තබා ඇමතියන් මුහුණ බලා උන්වහන්සේ වඩා හිඳුවා දතුත් දී සඞ්ඝයා වහන්සේ පිටත් කර හැර සමීප ව හිඳගෙණ "සවාමීනි, මේ ධර්මය අවබෝධ කෙළේ කවරද දූ?"යි ඇසූහ. උන්වහන්සේ ද "මහරජ මට එබන්දෙක් නැතැ"යි කීසේක. "හැයි, සවාමීනි, ඔබවහන්සේ මුල දී ම ලැබෙන බව කීසේක් වේ දූ?"යි කී කල "මහරජ, එසේ ය. මා සාරණීයධර්ම පූරණ ලද කල් පටන් පිරිකර බෙදන තැන දී මට අග්‍රභාණ්ඩ ම

ලැබෙති''යි කීසේක. රජ්ජුරුවෝ ද "ස්වාමීනි, යහපති, යහපති. මෙය ඔබවහන්සේට ම සුදුස්සේකැ"යි කියා වැඳ ගියහ. (සුමඞ්ගල විලාසිනී ත්‍රි: මු: 368 පිට.)

---

**නාග ස්ථවිරාව:-** තවද බැමිණිටියා සායෙහි දී භාරත ග්‍රාම වාසීහු නාග නම් මෙහෙණින්නට නො දන්වා ගමින් නික්ම ගියාහු ය. භික්ෂුණීන් වහන්සේ උදෑසන නැගිට "ගම අතිශයින් නිශ්ශබ්ද ය බලව"යි තරුණ භික්ෂුණීන්ට කිවා. භික්ෂුණීහු ගොස් බලා ගම්වැස්සන් ගිය බව දැන අවුත් තෙරණියන්ට කීහ. ඕ ඒ අසා "ඔවුන්ගේ ගමන ගැණ නෙපි තගම්ක් සිතව්. උද්දෙස පරිපුච්ඡා යොනිසොමනසිකාරාදියෙහි යෙදෙව් ය''යි කියා භික්ෂා වාර වේලායෙහි හැඳ පොරොවා තමන් දොළොස් වැනි කොට ඇති ව හෙවත් එකොළොස් දෙනෙකුන් පිරිවර කොට ඇති ව ගම්දොර නුගරුක් මූලෙහි ගොස් සිටියා ය. ගසෙහි අරක් ගත් දෙවිකෙනෙක් භික්ෂුණීන් දොළොස්නමට පිණ්ඩපාතය දී "ආයසීා වෙති, අන්තැනකට නොවඩිනු මැනව. නිතර ම මෙහි වඩිනු මැනවැ''යි කීහ.

ඒ ස්ථවිරාවන්ගේ කනිටු බෑ නාගසේන නම් තෙරුන් වහන්සේ කෙනෙක් ඇත. උන්වහන්සේ "දැන් මෙහි බිය මහත. යැපෙන්නට නො හැක්ක. පරතීරයට යන්නෙමු"යි භික්ෂූන් දොළොස් දෙනෙකුන් වහන්සේ පිරිවර කොට ඇතිසේක් තමන් වසන තැනින් නික්ම තෙරණියන් දැක යමු"යි බෑගමට ගියසේක. තෙරණියෝ තෙරුන් වහන්සේ වැඩිබව අසා ඔවුන් සමීපයට ගොස් "ස්වාමීනි, කිමෙක්?"යි ඇසූහ. තෙරුන් වහන්සේ තමන් වැඩි පවත් කීකල ඕ තොමෝ "අද එක දවසක් විහාරයෙහි වැස පියා සෙට වඩනේ මැනවැ"යි කියා වෙහෙරට පිවිසි කල දෙවතද රුක්මුල පිඩු පිණිස හැසිර තෙරුන්වහන්සේ කරා එළඹ "මේ පිණ්ඩපාතය වළඳන සේක්ව"යි කිවා ය

ඉක්බිති නාගසේන ස්ථවිරයන් වහන්සේ "තුවුවමමනාය"යි නිශ්ශබ්ද වූසේක. 'ස්වාමීනි, පිණ්ඩපාතය ධාර්මික ය; කුකුස් නො කොට වළඳනුමැනවැ'යි කිව ද තෙරුන් වහන්සේ "තුවූවමමනා ය"යි කීසේක් ම ය. භික්ෂුණීන් වහන්සේ පාත්‍රය ගෙණ අහසට දමූවා පාත්‍රය අහස නැග සිටියේ ය. නාගසේනස්ථවිරයන් වහන්සේ "තෙරණියන් සත්තලෙක්හි සිටියද භික්ෂුණියකට අයත් බුතු ය, භය නම් ඇදහටු මු වන්නේ නොවේ. බිය සන්හුන් කල

ආයුෂ්මංශය කියනු ලබන්නේ පිණ්ඩපාත තෙරණි කෙනෙකුන්ගේ බත වළඳ, සාල්ගෙවුයේ වනැයි සිතින් චෝදනා කරණු ලබන්නේ ඉවසනු නො හැකි වෙමි. එබැවින් තෙරණියෙනි, නෙපි අප්‍රමත්ත ව වියෑ''යි කියා මගට පිළිපන්සේක.

රුක්දෙවියානෝද "ඉදින් තෙරුන් වහන්සේ තෙරණියන් අතින් පිණ්ඩපාතය වළඳනසේක් නම්, නො නවතමි. නො වළ දන්නේ නම්, නවතන්නෙමි''යි සිතමින් සිටියේ තෙරුන් වහන්සේ පිටත්වනු දුක ගසින් බැස ඇවිත් "සවාමීනි, පාත්‍රය දෙනු මැනවැ''යි පාත්‍රය ගෙණ තෙරුන් වහන්සේලා රුක්මුලට වඩා ගෙණැවිත් අසුන් පණවා පිණ්ඩපාතය දී බත්කිස නිමිකල ප්‍රතිඥ ගෙණ දෙළොසක් භික්‍ෂුණීන් වහන්සේට හා දෙළොසක් භික්‍ෂූන් වහන්සේටත් සත්වසක් මුළුල්ලෙහි උවැටන් කළහ. (සුමඞ්ගල විලාසිනී ත්‍රි: මු: 369 පිට.)

---

**පධානිය සථවිර**:—තවද සිතුල්පව්වේ පධානිය නම් තෙරුන් වහන්සේ රාත්‍රිය මුළුල්ලෙහි භාවනා කොට වැඩ සිටිසේක. ඉක්බිති ඔවුන් වහන්සේට බඩරුජාවෙක් ඇති වි ය. තෙරුන් වහන්සේ රුජාව ඉවසන්නට නො පොහොසත් වැ ඇත් මැත් බලා පෙර ළෙන්නට වන්සේක. ඉක්බිති සිහා වළඳන එක් තෙර කෙනෙකුන් වහන්සේ "ඇවැත්නි භික්‍ෂූනු නම් ඉවසන්නාහු වෙද්ද''යි වදළසේක.

පධානිය තෙරුන්වහන්සේ "යහපත; සවාමීනි"යි වදරා ඒ සා මහත් වේදනාව ඉවසා නිශචලව වැ වැඩහොත් සේක. රුජාව පැතිර නාභිය පටන් ලය දක්වා පැළී ය. ඉක්බිති තෙරුන් වහන්සේ ඒ සා මහත් වේදනාව ඉවසා විදර්ශනා වඩා ඒ ක්‍ෂණයෙහිම අනාගාමී ව ජීවිතක්‍ෂයට පත් වූ සේක. (පපංචසූදනී ශ්‍රී:බ:මුද්‍රිත 66 පිට.)

---

**අන්‍යතර සාමණේර කෙනෙක්**:— තවද ධම්මික තිස්ස මහරජ කාලයෙහි සත් හවුරුදු සාමණේරයන් වහන්සේ කෙනෙක් වූහ. එක් දිනෙක රජහට පන්සියයක් ගැල්වලින් ගෙණෙන ලද උක් සකුරු ලැබුනේ ය. රජ්ජුරුවෝ "මේ වනාහි ප්‍රිය පඬුරෙකි. ආයුෂ්‍යන් වහන්සේගෙන් වෙන් ව නො කමි''යි ගැල් දෙසිය පණසක් මහාවිහාරයට යවා කරණ ලද පාතරාසය ඇත්තාහු එහි ගියහ. ගෙඩිය ගැසූ කළ දෙළොස් දහසක් භික්‍ෂූන් වහන්සේ

රැස් වූසේක. අනතුරු ව රජ්ජුරුවෝ එකත්පස් ව සිටියාහු ආරාමිකයන් කැඳවා "රජ කෙනෙකුන් දෙන දානයෙහි පාත්‍ර පුරවා දිය යුත්තේ ය. ඉදින් එසේ නො පිළිගෙණ පමණ දන පිළිගන්නා කෙනෙක් වෙත් නම් මට කියව"යි කීහ.

ඉක්බිති එක් මහ තෙර කෙනෙකුන් වහන්සේ "මහාබොධිය හා මහසෑය ද වඳින්නෙමි"යි සැපවිවෙන් අවුත් විහාරයට පිවිසෙන්නේ මහාවණ්ණපාසාදයෙහි උක්සකුරු පිළිගන්නා භික්ෂූන් වහන්සේ දක පසු ව එන හෙරණුන්ගෙන් "සාමණේරය, තොපට උක්සකුරෙන් ප්‍රයෝජන නැත් දැ?"යි අසා "එසේ ය; ස්වාමීනි, නැතැ"යි කී කල "සාමණේරය, අපි මාර්ගයෙන් ක්ලාන්ත වූවෝ වෙමු. ගිවුල් එලයක තරම් පිඩකින් අපට ප්‍රයෝජනය"යි කී සේක.

හෙරණුන් වහන්සේ පාත්‍රයක් හැර ගෙණ ගොස් වස් පිළිවෙළින් සිටි සේක. ආරාමිකයා පාත්‍රයට වැටෙන පමණ පුරවා එසවූ කල හෙරණුන් වහන්සේ ඇඟිල්ල සෙලවූ සේක. "ස්වාමීනි, රජ්ජුරුවන්ගේ දානයෙහි භාජනයට වැටෙන පමණ- තලිය පිරෙණ පමණ- ගතයුතු ය"යි කී කල "උපාසකයෙනි, ඒ එසේ ය; රජදරුවෝ නම් මහත් අදහස් ඇත්තෝ ය. මාගේ උපාධ්‍යායයන් වහන්සේට මෙපමණකින් ප්‍රයෝජන ය"යි කී සේක.

රජ්ජුරුවෝ ඔවුන්ගේ කථාව අසා "පින්වත, සාමණේරයන් වහන්සේ කුමක් කියනසේක් දැ?"යි අසමින් ඔහු ළඟට ආහ. ආරාමිකයා "සාමණේරයන්ගේ භාජනය කුඩා ය; වැඩියක් නොගණිතැ"යි කීය. රජු විසින් "ස්වාමීනි, ගෙණා භාජනය පුරා ගණු මැනවැ"යි කී කල "මහරජ, රජදරුවෝ නම් මහත් අදහස් ඇත්තෝ ය. එළවනලද භාජනය පුරා ම දෙනු කැමැත්තෝ ය. එහෙත් අපගේ උපාධ්‍යායයන් වහන්සේට මෙපමණකින් ප්‍රයෝජන ඇත්තේ ය"යි සාමණේරයන් වහන්සේ කී සේක.

ඉක්බිති රජ්ජුරුවෝ "මේ වනාහි සත් හවුරුදු දරුවෙකි. අද දක්වාත් ඔවුන්ගේ කටින් කිරි සුවඳ නො හැරෙයි. හැරගෙණ කළයෙක හෝ සැළියක පුරවා සෙට දවසත් වළඳන්නෙමි"යි නො කීහ. අහෝ! බුද්ධ ශාසනය ප්‍රමාණ කට නො හැක්කේ ය"යි සිතා "පින්වත්නි, හෙරණුන් වහන්සේට පැහැදුනෙමි. තවත් වස්ත්‍ර දෙසිය පණසක් ගෙණවුත් සඞ්ඝයාට දෙවවු" යයි මිනිසුන්ට කීහ.

ඒ මේ රජතෙමේ ම එක් දිනෙක වටුමස් කනු කැමැත්තේ ඉදින් "මම අඟුරෙහි පළහන ලද වටුමස් කනු කැමැත්තෙමි"යි අනෙකකුට කීව් නම්, අවට යොදුනක් මානයෙහි වටුවන්ගේ විනාශය වන්නේ ය"යි සිතා උපන් ආශාව ඉවසන්නේ තුන් වර්ෂයක් ඉක්ම වූයේ ය. එයින් ඔවුන්ගේ කන්වල සැරව හට ගත්තේ ය. හේ ඉවසන්නට නො හැක්කේ "අපගේ, සිල් රක්නා, කිසියම් උපස්ථායක උපාසකයෙක් ඇත්තේ දැ?"යි විචාරු "දෙවයන් වහන්ස, එසේ ය. තිස්ස නම් උපස්ථායකයෙක් ඇත. හේ සීලය අඛණ්ඩ කොට රකී"යයි අසන ලදින් විමසනු කැමැත්තේ උපාසකයන් කැඳවී ය.

ඔහු පැමිණ රජු වැඳ සිටිකල "දරුව, තෙපි තිස්ස නම්හුදැයි ඇසී ය.?" "එසේ ය, දෙවයන් වහන්ස!" "එසේ නම් යව"යි ඔවුන් යවා පියා එක් කුකුළකු ගෙන්වා "යව, මේ කුකුළා කුමව තුණකට පිස අපට එවන ලෙස තිස්සයාට කියව"යි මිනිසකු ඇණවී. හේ ගොස් එසේ කී ය. "පින්වත, ඉදින් මූ මළ එකෙක් වී නම්, මා දත් පමණින් පිස එවිය හැකි ය. මම ප්‍රාණ වධ නො කරමි"යි උපාසකයා කීයේ ය. ගිය මිනිසා අවුත් රජහට එපවත් කියන ලදින් රජ යළිත් එසේ ම කියා යැවී. එවිට ද හේ ගොස් "රාජෝපස්ථානය නම් ඉතා බැරි දෙයෙක. එසේ නො කරව. සිල් සමාදන් වන්නට පසු ව ද හැක්කේ ය. මෙය පිස යවනු මැනවැ"යි උපාසකයන්ට කී ය. තිස්ස උපාසකයන් ද "පින්වත, ආත්මභාවයක මරණය එකක් ම වන්නේ ය. මම ප්‍රාණවධ නො කරමි'යි කියෙන් නැවත ද රජහට දැන්වී. රජ තෙමේ තුන් වන වර ද යවා නො පිළිගත් ඔහු කැඳවා තෙමේ ම විචාළේ ය. උපාසක රජහට ද එසේ ම පිළිවදන් දුන්නේ ය.

ඉක්බිති රජතෙමේ මේ රජ අණ ඉක්මවයි. යව් "දම්ගෙඩියෙහි තබා මොහුගේ හිස සිඳිව්"යයි රාජපුරුෂයන්ට නියම කොට රහසින් ඔවුනට සංඥා කරන්නේ "මොවුන් තැති ගන්වා ගෙණ ගොස් හිස දම්ගෙඩියෙහි තබා අවුත් ක්යව"යි කී ය. රාජපුරුෂයෝ උපාසකයන් දම්ගෙඩියෙහි හොවා කුකුළා ඔහුගේ අතැ තැබූහ උපාසකයෝ ද කුකුළා ලෙහි හොවා "දරුව, මම මාගේ ජීවිතය තට දෙමි. තාගේ ජීවිතය මම ගණිමි. තෝ බිය නො වී යව"යි අත් හළහ. කුකුළා පියා පත් පොළා අහසින් ගොස් තුරු ගසෙක සැඟවුනේ ය. කුකුළාට අභය දුන් තැන කුක්කුට ගිරි නම් වි ය.

රජතෙමේ එපුවත අසා ඇමති පුත්‍ර උපාසකයන් කැඳවා සියලු අබරණින් සරසා "දරුව, තෝ මා විසින් විමසන ලද්දේ මෙ කරුණ සඳහා ය. වටු මස් කනු කැමැති මට තුන් අවුරුද්දක් ඉක්ම ගියේ ය. එහි ත්‍රිකොටිපරිශුද්ධ මාංසයක් කොට මට එළවිය හැක්කේ දැ?"යි ඇසී ය. "දෙවයන් වහන්ස, එය ඉටු කිරීම මගේ වැඩෙකැ"යි නික්ම දෙරටුව සමීපයෙහි සිටියේ උදයෙන් ම වටුවන් තිදෙනෙකුන් ගෙණ නුවරට එන එක් මිනිසකු දැක කහවණු දෙකක් දී වටුවන් ගෙණ ශුද්ධ කොට දුරු ආදිය යොදා අඟුරෙහි මිනා කොට පළඟා රජහට එළවූයේ ය.

රජ්ජුරුවෝ මහල්තලයේ පයඹිඩකයෙහි හුන්නාහු එකකු ගෙණ මඳක් සිඳ මුවෙහි තැබූහ. එකෙණෙහි සත් දහසක් රස නහර පැතිර ගියේ ය. එවිට ම භික්ෂු සඞ්ඝයා සිහි කොට මා වැනි පෘථිවීශ්වර රජ කෙනෙකු වටුමස් කනු කැමැති ව තුන්හවුරුද්ද කින් නො ලද්දේ ය. පිසීමක් නැති භික්ෂුසඞ්ඝයා වහන්සේ කොයින් ලබනසේක් දැ?"යි සිතා මුවෙහි තුබූ කැබෙල්ල ද බිම හෙලූහ. ඒ දුටු ඇමති පුත්‍ර උපාසකයෝ දතින් වැටී එය මුවෙන් ගත්හ. රජ තෙමේ "දරුව, ඉවත් වෙව, තාගේ නිදෙස් බව මම දනිමි. මේ කරුණෙන් මම එය ඉවත් කෙළෙමි"යි කරුණ කියා "සෙස්ස එසේ ම පරිස්සම් කොට තබව"යි නියම කෙළේ.

දෙවනදා රාජකුලූපග තෙරුන් වහන්සේ පිඩු පිණිස රජ ගේ බලා පිවිසිසේක. උපාසකයෝ උන්වහන්සේ රජගෙට වඩා ලූහ. තවද එක් මහලු පැවිද්දෙක් තෙරුන් වහන්සේට පසු ව එන් නේ රජගෙට පිවිසියේ ය. තෙරුන් වහන්සේ "රජ්ජුරුවන්ගේ මහණෙකැ"යි සිතූසේක. උපාසකයෝ "තෙරුන් වහන්සේගේ උපස්ථායකයෙකැ"යි සිතා නො විමසූහ. දෙදෙන ම වඩා හිඳුවා කැඳ වළඳවා රජ්ජුරුවෝ වටුමස එළවූහ. ස්ථවිරයන් වහන්සේ එකකු ගත් සේක. අන්‍යයා ද එකකු ගත්තේ ය. රජ්ජුරුවෝ ඉතිරි කොටස "නො විචාර කන්නට නො වටනේ ය"යි මහ තෙරුන් වහන්සේට එළවූහ. තෙරුන් වහන්සේ අතින් පාත්‍රය වැසූසේක. මහලු පැවිදි තෙමේ එය ද පිළිගත්තේ ය.

රජතෙමේ නො සතුටු වූයේ කරණ ලද බත් කිස ඇති තෙරුන් වහන්සේ ගේ පාත්‍රය ගෙණ අනු ව යන්නේ "ස්වාමීනි, කුලගෙට එන්නවුන් විසින් උගත් වත් ඇති මහණුන් ගෙණ එන්නට වටනේ ය"යි කී ය. තෙරුන් වහන්සේ "මෙතෙමේ රජු විසින් නො කැඳවන ලද්දෙකැ"යි එකෙණෙහි දත්සේක. දෙවනදා උපස්ථා

යක හෙරණ කෙනෙකුන් සමග වැඩිසේක. රජතෙමේ එදිනද කෑ දින් පසු වටුවස් එළවී. තෙරුන් වහන්සේ එකකු ගත්සේක. හෙරණුන් වහන්සේ ඇඟිල්ල සොලවා මැදින් සිඳවා අඩක් ම ගත්සේක. රජතෙමේ ඉතිරි කොටස යළිත් එළවී. තෙරුන් වහන්සේ හා අතැවැසි හෙරණුන් වහන්සේ ද අත වැසූහ.

ඉක්බිති රජ්ජුරුවෝ නුදුරෙහි හිඳ වටුමස් කඩ කඩ කොට සිඳ කන්නාහු "උගත් වත් ඇත්තවුන් නිසා අඩක් සහිත වටුවකුගේ මස් කන්නට ලදිමි"යි කීහ. මස් කෑ කල රජහුගේ කණෙහි සැරව බැහැර ගියේය. අනතුරුව කට සෝද හෙරණුන් වහන්සේ කරා එළඹ "දරුවෙනි, ඔබට පැහැදුනෙමි. නුඹවහන්සේට තිති බත් අටක් දෙමි"යි කීහ. 'මහරජ, මම එය උපාධ්‍යායයන් වහන්සේට දෙමි.'' "තව අටක් දෙමි." "එය මාගේ ආචාර්‍යයන් වහන්සේට දෙමි." "තව අටක් දෙමි." "එය සමානඋපාධ්‍යායයන්ට දෙමි." "නැවතද අටක් දෙමි." "එය භික්ෂුසඞ්ඝයාට දෙමි." 'දරුවෙනි, අතිකුදු අටක් දෙමි"යි කී කල ඉවසූසේක. (සාරත්ථප්පකාසිනි ත්‍රි: මු: තෘතීයභාග 48 පිට.)

---

**මහා ඵුස්ස ස්ථවිර:—** තවද ආළින්දකවාසී වූ මහා ඵුස්ස නම් තෙරුන් වහන්සේ එකුන් විසි හවුරුද්දක් ගතපච්චාගතික වත් පුරා විසූසේක. එහෙයින් කෙලෙසුන් ඔබා කමටහන් මෙනෙහි කොට වසනාසේක. අතර මග නොයෙක් කර්මාන්ත කරණ මිනිස්සු නැවත නැවත අවුත් වැඩ සිට කමටහන් මෙනෙහි කොට වඩනා තෙරුන් වහන්සේ දැක "කිම්දේ! ඉතාම මූළා තිසාදේ හෝ! නො හොත් කිසිවක් සඳහන් නැතිව තබා පියා යන එන තියාදේයෝ"යි කියන්නාහ.

මහතෙරුන් වහන්සේ කියන බස්හි ආදරයක් නො කොට කමටහන් මෙනෙහි කොට වඩනා සේක. මෙසේ ඔවුන් වහන්සේ රෑ දවල් නො පමාව ගතපච්චාගතිකවත් පුරා විසිහවුරුද්දක් ඇතුළත රහත් බවට පැමිණිසේක. ඔවුන් වහන්සේ රහත්වූ දවස සක්මන් කෙළවර වසන දෙවිදු තමා ඇඟිල්ලෙන් පහන් දල්වා සිටියාය. සතරවරම් මහරජ්ජුරුවෝය, ශක්‍රදෙව රජය, මහාබ්‍රහ්මයාය යනාදී මහානුභාව ඇති දෙවියෝද අත් පා මෙහෙ කොට ගියහ. (පපංචසූදනී ශ්‍රී: ධ: මුද්‍රිත 203 පිට.)

---

**මහානාගස්ථවිර:—** තවද මහානාග තෙරුන් වහන්සේ මවු උපාසිකාවන්ගේ ගමට ගොස් සෙසු භික්ෂූන් වහන්සේ සමග පිඬු සිඟා වත් සේක. උපාසිකාවෝ ද වහන්සේ වරුන්ද කැඳ වලදවා ආසනසාලායෙහි වඩා හිඳවූහ. වැඩහුන් වහන්සේ වරුන්ද අතුරෙන් මහානාග තෙරුන් වහන්සේ නිරොධ සමාපත්තියට සමවැද වැඩහුන් සේක.

එකල්හි ආසන ශාලාව ගිනි ගෙණ දිලෙන්නට පටන් ගත. සෙසු වහන්සේ වරුන්ද තමන් වහන්සේ හිඳිනා දූ ගෙණ වැඩි සේක. මහානාග තෙරුන් වහන්සේ වූ කලි ඔප් නගාලූ රන් පිළිමයක්සේ බබල බබලා වැඩහුන් සේක. ඉක්බිති ගිනි රුස තණ හා හුණදඬු ආදිය දවා තෙරුන් වහන්සේ සිසාරවා සිටගත. ගම් වැස්සෝ ඇතුළෙහි වැඩහුන් තෙරුන් වහන්සේ දූක මහා කළ කිරීමට පැමිණ පැන් ගෙණ ඇර ගිනි නිවා හළු පහ|කොට පිරිබඩ ගෙණ සුවඳ මල් පුදා මහසොම්නසින් පිණා වැඳ වැඳ සිටියාහ. මහානාග තෙරුන් වහන්සේ ද ආදි කොට නියම කළ කල්හි නැවත නැගීසිට වැඳ වැඳ මහා සොම්නසින් පිණ පිණා සිසාරු සිටි මහා ජනයා දූක "මම ප්‍රකට වීමි"යි සිතා ආකාශයට පැන නැගී පියඞ්ගුවිපයට වැඩිසේක. (විසුද්ධිමග්ග මුද්‍රිත 5?4 පිට.)

---

**අන්‍යතර භික්ෂූන් වහන්සේ කෙනෙ ක්:-** තවද භාතිය රජ කාලයෙහි මහසෑය පුදනු පිණිස දකුණුදෙසින් එක් භික්ෂු කෙනෙක් සත්රියන් කසාවතක් අංශයෙහි කොට ගෙණ සෑමලුවට පිවිසිසේක. එකෙණෙහිම රජ්ජුරුවෝත් සෑය වඳිනු පිණිස ආහ. එහෙයින් සෙනග රැස්වී මහා ජනකායක් වූහ. ඒ භික්ෂූන් වහන් සේ ද මහා ජනයාගෙන් පෙළුනේ අංශයෙන් ගිලිහෙන කසාවත නොදූකම නික්ම ගියසේක. මදක් දුර ගිය පසු කසාවත නොදූක "මෙපමණ ජනකායෙක කසාවත සොයන්නේ කවරෙක් ද? එය දූන් මට අහිමිය"යි ධුරනික්ෂෙප කොට වැඩිසේක.

අනික් භික්ෂූන් වහන්සේ නමක් පසුව එන්නේ ඒ කසාවත දූක සොර සිතින් හැර ගත්තේය. පසුව විපිළිසරව "මම අශ්‍රමණ යෙක් වීමි, සිවුරු හරිමි"යි සිතී. එවකට සියලු පය්‍යාපත්ධර විනයා චාය්‍යයනට ප්‍රමුඛ චූලසුමන නම් තෙරකෙනෙකුන් වහන් සේ මහ වෙහෙර වසන සේක. ඒ මහතෙරුන් වහන්සේ කරා එළඹ වැඳ අවසර ඉල්වාගෙණ තම කුකුස විචාළේය. තෙරුන් වහන්සේ ඒ

අසා ජනකායය ගිය පසු පැමිණ ගත් බව දැන "දැන් මෙහි ඉඩෙක් ඇද්ද"යි සිතා "ඉදින් කසාවත හිමි මහණහු ගෙණ එන්නෙහි නම් තට පිහිටක් කරන්නට හැක්කේ ය"යි වදාළසේක "ස්වාමීනි, මම ඔහු කෙසේ සොයම්ද? "ඒ ඒ තැන ඇවිද සොයව." හේ පස්මහ වෙහෙර ඇවිද බලාත් සොයා ගත නො හැකිවිය.

ඉක්බිති මහතෙරුන් වහන්සේ "කවර දිශාවකින් බොහෝ භික්ෂූහු එන්නාහුද?" "ස්වාමීනි, දකුණුදිශාවෙන් එති." "එසේ නම් කසාවත දිග පලල මැන තබා දකුණු දිග විහාර පිළිවෙළින් සොයා ඒ මහණ ගෙණ එව"යි වදාළසේක. භික්ෂූන් වහන්සේ ද එසේ කොට සොයා ඒ මහණ දැක මහතෙරුන් වහන්සේ ළඟට ගෙණා යේය. ස්ථවිරයන් වහන්සේ "මේ කසාවත කාගේද?"යි විචාළසේක. "ස්වාමීනි, මගේය." "තෙපි මෙය කොහි හෙළූහුද?" ඔහු සියලු පුවත කී කල තෙරුන් වහන්සේ ඔහු කළ ධුරනික්ෂෙපය අසා "තොප මේය කොහිදී දැක ගන්නා ලදද"යි අන්‍යයාගෙන් ඇසූ සේක. ඔහු විසිනුදු සියල්ල දැන්වූ කල මහතෙරුන් වහන්සේ "ඉදින් තොප සුදධ සිතින් ගන්නා ලද නම් ඇවැත් නැත්තේය. සොර සිතින් ගත් බැවින් දුකුළා ඇවතට පැමිණියේය. එය දෙශනා කොට නිරාපත්තිකවෙව. මේ වස්ත්‍රය තමන් සතුවූවක් කොට ඒ මහණහටම දෙව"යි වස්ත්‍රය ගත් භික්ෂූන් වහන්සේට කී සේක. උන්වහන්සේද අමාවෙන් අභිෂෙක කරණ ලද්දෙකු මෙන් පරම ප්‍රතිෂ්ඨාවට පැමිණියෙක් විය. (සමන්තපාසාදිකා ත්‍රිඃ මූඃ 219.)

---

**අන්‍යතර තෙර කෙනෙක්:—** තවද එක් භික්ෂූන් වහන්සේ නමක් අන්තර සමුද්‍රයේදී මොනවට වැඩුන පොල්ගෙඩියක් ලැබ වක්‍රයකට නංවා සක් තලියක් මෙන් සිත්කළු තලියක් කොට එහිම තබා සෑගිරියට ගියේය. අනික් භික්ෂූන් වහන්සේ නමක් අන්තර සමුද්‍රයට ගොස් එවෙහෙර වසන කල තලිය දැක සොර සිතින් ගෙණ සෑගිරියටම ආයේය. එහිදී ඔවුන් තලියෙන් කැඳ බොනු දැක තලිය හිමි භික්ෂූන් වහන්සේ "ඔබ මෙය කොයින් ලබන ලදද"යි අසා අන්තර සමුද්‍රයෙන් ගෙණා බව කීකල "මෙය ඔබ සතුවූවක් නොවෙයි. ඔබ මෙය සොර සිතින් ගන්නා ලදය"යි තලියත් සමග මහණහු සඟ මැදට ගෙණායේය.

එහිදී විනිශ්චයක් නො ලැබ මහාවිහාරයට ගියහ. ගෙඩිය ගසා මහ සෑය ළඟට සඞ්ඝයා රැස්කරවා විනිශ්චය ආරම්භ කළහ. විනයධර තෙරුන් වහන්සේලා සොර බව පැණවූහ. ඒ පිරිසෙහි

ආභිධම්මික ගොදත්ත නම් තෙරුන් වහන්සේ විනිශ්චය කරණ සේක් "මෙතෙම මේ තලිය කොහිදී හැර ගත්තේ ද?" "ස්වාමීනි, අන්තර සමුද්‍රයේදීය." "එහිදී මෙය කොතෙක් අගීද?" "කිසිත් නො අගනේය. මිනිසුන් මිදනා බැහැර දැමූ කටු දර පිණිස වත් නේය." "මෙහි තිබෙන හස්තකර්මාන්තය කොතෙක් අගනේද?" "මාසකයක් හෝ ඌනමාසකයක් හෝ වටී." "බුදුරදුන් වහන්සේ මාසකයකට හෝ ඌනමාසකයකට පණවන ලද ඇවතෙක් කිසි තැනක ඇත්තේ දැ?"යි අසා වදාළසේක.

"යහපති, යහපති" විනිශ්චය මොනවට කරණලද ය"යි එකවිට සාධුනාද නැංගේය. එසමයෙහි වසාභ භාතිය රජ්ජුරුවෝ සෑය වඳිනු පිණිස නුවරින් නික්මුනාහු ඒ ශබ්දය අසා "මේ කිමෙක්දැ"යි විචාරා සියලු ප්‍රවෘත්තිය දැන "මා සිටින තුරු භික්ෂු භික්ෂුණීන්ගේ හා ගිහියන්ගේ අධිකරණ විනිශ්චය ආභිධම්මික ගොදත්ත තෙරුන් වහන්සේ විසින්ම කරණු ලැබේවා. එතුමන්ගේ විනිශ්චයෙහි නො පිහිටන්නෙක් වේ නම් රාජාඥාවෙන් පිහිටුවමි"යි බෙර පියවී කරවූහ.

---

**මෙහාතික ස්ථවිරයෝ:**—තවද දෙකුල පුත්‍ර කෙනෙක් අනුරාධපුරයෙන් නික්ම ථූපාරාමයෙහි පැවිදිවූහ. එක් කෙනෙකුන් වහන්සේ උභය මාතෘකා පාලිය ප්‍රගුණ කොට පස්වස් ඇතිසේක් පවර පාචීනඛණ්ඩරාජියට වැඩි සේක. එක්කෙනෙකුන් වහන්සේ එහිම වෙසෙති පාචීනඛණ්ඩරාජියට ගිය වහන්සේ කලක් එහි වැස ස්ථවිර වූසේක් "මේ ස්ථානය සිත එකඟ කර ගැණීමට යොග්‍යය. එහෙයින් මගේ යහළුවාටත් කියමි"යි සිතා එයින් නික්ම අනුරාධපුරයට පිවිසි සේක.

ඉක්බිති උන්වහන්සේ දැක සමානවස් ඇති තෙරුන් වහන්සේ ඉදිරියට ගොස් පාසිවුරු හැරගෙණ කළයුතු වත් කළසේක. ආගන්තුක තෙරුන් වහන්සේ සෙනසුනට පිවිස 'මගේ යහළුවා නන් වහන්සේ මෙහි චිරනිවාසී කෙනෙක. දැන් මට ගිතෙලක් හෝ පැනියක් හෝ පියයුතු දෙයක් එවති"යි සිතූසේක. රාත්‍රියෙහි එබන්දක් නො ලැබ දැන් දායකයන් විසින් එවන ලද කැඳ බත් එවති''යි සිතා ඒත් නො දැක "එවන කෙනෙකුන් නැති නමුත් ගමට පිවිසියහුට දෙන්නේවනැ'යි උදේ අතික් තෙරුන්නුත් හැටුව ගමට පිවිසි සේක.

දෙදෙනා වහන්සේ එක් වීථියක හැසිර සැන්දක් පමණ කැඳ ලැබ ශෙණවුත් අසුන්හලෙහි හිඳ වැලඳූහ. ආගන්තුක තෙරුන් වහන්සේ "තිබඳ දෙන කැඳක් නැති නමුත් බත් වේලෙහි මිනිස්සු ප්‍රණීත බත් දෙන්නාහු යයි සිතූසේක. බත් වේලාවෙහිද පිඩු පිණිස හැසිර ලබන ලද්දක් ම වළඳා "කිමෙක් ද ස්වාමීනි, හැමවිටම යැපෙන්නේ මෙසේ ම දැ?"යි ඇසූසේක. 'ඇවත එසේය"යි කීකල "ස්වාමීනි, පාචීනඛණ්ඩරාජිය පාසුය. එහි වඩිමුදැ"යි ඇසූසේක. අනික් තෙරුන් වහන්සේ ද නුවර දකුණුදෙරින් නික්ම කුම්භකාර ගමට යන මගට පිළිපන්සේක.

ආගන්තුක තෙරුන් වහන්සේ "කිමෙක් ද ස්වාමීනි, යන්නට සුදුනම් වනුදැ?"යි ඇසූසේක ඇයි ඇවත, තෙපි පාචීනඛණ්ඩරාජිය වණ්ණනා කොට කිවහු නොවේද කිමෙක්ද? ස්වාමීනි මෙතෙක් කල් මෙහි සිටි ඔබ වහන්සේගේ කිසියම් අතිරේක පිරිකරක් නැත් තේද?" "ඇවත හැඳ පුටු සඬසිකය. එය තැන්පත් කොට තැබීමි. අන්කිසිත් නැත. "ස්වාමීනි මගේ සැරයටිය තෙල් ගුලාව හා පාව හත් පසුම්බියත් එහිය." "ඇවත, එක් දිනක්ම මෙහි සිටි තෙපි මෙතෙක් පිරිකර එහි තුබූහුද?" "ස්වාමීනි එසේය"යි කියා තෙරුන් කෙරේ පහන් සිත් ඇතිසේක් වැඳ "ස්වාමීනි, ඔබ වැනියන්ට හැම තැනම අරණ්‍යවාසය වෙයි ථූපාරාමය සිවු බුදුවරුන්ගේ ධාතු නිදන් කළ තැනෙකි. ලෝහප්‍රාසාදය ධර්මශ්‍රවණයට යෝග්‍යය. මහසෑය හා තෙරුන්ගේ දර්ශනයත් නිතර ලැබෙන්නේය. බුඩ කාලය මෙන් වෙයි. නුඹවහන්සේ මෙහිම වසන සේක්වා"යි කියා දෙවනදා, තෙමෙම පාසිවුරු ගෙණ නික්ම ගියේය. (විසුද්ධිමග්ග මුද්‍රිත 66 පිට.)

---

චූලසමුද්‍ද ස්ථවිර:— තවද දුර්භික්‍ෂ කාලයෙහි පන් සියයක් තෙරුන් වහන්සේ චූලසමුද්‍ද තෙරුන් ලඟට පැමිණියහ. තෙරුන් වහන්සේ "මහාසඞ්ඝයා පිඩු පිණිස කොහි හැසිරෙණසේක්දැ' යි සිතනසේක් සියලු ලක්දිව ඉඩක් නොදක මුහුදින් එතර පැළලුප් නුවර වනතේය' යි පාසිවුරු ගන්වා 'ඇවැත්නි, එව්. භික්‍ෂාචාරය පිණිස යමු"යි කියා පොළොව හකුළුවා පැළලුප් නුවරට වැඩිසේක.

භික්‍ෂූන් වහන්සේ "ස්වාමීනි, මේ කවර නුවරෙක්දෝ"යි විචාළහ. "ඇවැත්නි පැළලුප් නුවරය" "ස්වාමීනි පැළළුප් නුවර දුර නොවේද?" "එසේය ඇවැත්නි, මහලු තෙරවරු දුරදෙයද සමීපයෙහි

කොරෙති." "ස්වාමීනි මහාසමුද්‍රය කොහිද?" "ඇවැත්නි, මග එක් තිල් දිය වැලක් ඉක්මවා නො ආවහුද?" "ස්වාමීනි, එසේය." "මහාසමුද්‍රය මහත් එකක් නොවේද?" 'ඇවැත්නි මහලු තෙරවරු මහත් දෙය ද කුඩාකොරෙති"යි කීසේක. (විසුද්ධිමග්ග මුද්‍රිත 311 පිට.)

---

**දීඝභාණක මහාඅභය ස්ථවිර:—** තවද දූලුලහකොල කණ්ණිකා වැසි එක් ගැහැණියක් තම පුත්‍රයාට කිරි පොවන්නී "දීඝභාණක මහාඅභයනම් තෙර කෙනෙකුන් වහන්සේ ආර්‍ය්‍යවංශප්‍රතිපදාව කියනසේකැ"යි අසා පස් යොදුන් මග ගෙවා ගොස් දිවාකපික තෙරුන් වහන්සේ හුන් කල්හිම විහාරයට පිවිස පුත්‍රයා බිම හොවා සිටගෙණ බණ ඇසුවාය. එසේම පද භාණයද අසා දීඝභාණක මහාඅභය තෙරුන් වහන්සේ විසින් සිවු පසය පිළිබඳ මහාආර්‍ය්‍යවංශය දෙසන්නට වන් කලද සිට ගෙණම ඇසූවාය. තෙරුන් වහන්සේ ප්‍රත්‍යය තුනක් දෙසා නැගිට යන ආකාර යක් කළ කල උපාසිකාවද "ආර්‍ය්‍යයන් වහන්සේ 'ආර්‍ය්‍යවංශය කියන්නෙමු'යි සිතිඳු බොජුනක් වලඳ මීකිරි පැනක් බී මීතෙල් ආදියකින් බෙහෙත් කියන්නට වටනා කල්හිම නැගිටිනසේකැ"යි කීවා. තෙරුන් වහන්සේද "සොහොයුරිය, යහපත යහපතැ"යි කියා මතුකොටසද දෙසන්නට පටන් ගත්සේක. අරුණ නැගීම තෙරුන් වහන්සේගේ බණ සමහර කිරීම හා උපාසිකාවන්ගේ සෝවාන් පෙළෙහි පිහිටීමද එකාවිටම සිදුවූහ. (මනොරථපූරණී ත්‍රි: මු: 386 පිට.)

---

**එක්තරා රහත් තෙර කෙනෙකුන් වහන්සේ:—** තවද සිතුල්පව් වැසි එක් රහත් තෙර කෙනෙකුන් වහන්සේගේ මහලු කල පැවිදිවූ එක් උපස්ථායකයෙක් දිනෙක තෙරුන් වහන්සේ සමග පිඩුපිණිස හැසිරෙන්නේ "ස්වාමීනි, ආර්‍ය්‍යයෝ නම් කෙබන්දෙ දැ?"යි ඇසී. "ඇවත, මෙලොව ඇතම් මහලු කෙනෙක් පා සිවුරු ගෙණ වත් පිළිවෙත්කොට සමග හැසිරෙණ නමුදු ආර්‍ය්‍යයන් නො දනිති. ආර්‍ය්‍යයෝ නම් මෙසේ දත නොහැක්කෝ ය"යි තෙරුන් වහන්සේ වදාළසේක මෙසේ කියාද ඔහුට දැනගත නො හැකිවිය. (සාරත්ථප්පකාසිනී ත්‍රි: මු: ද්‍රිතිය භාග 183 පිට.)

---

තවද තිසක් පමණ භික්‍ෂූන් වහන්සේ කැලණි මහ සෑය වැඳ කැලෑ මගින් මහ මගට බසින්නාහු අතර මග දවන ලද කෙතක කර්මාන්ත කොට එන එක් මිනිසකු දුටුවාහ. දූලි කුණු වැකුනු සිරුරින් යුතුව දූලි කුණු වැකුනාවූ ම එක් කහකඩක් කැස ගන්වා ගැන්දවූ හේ පෙණීමෙන් දැවුන කණුවක් මෙන් විය. දිවාභාගයෙහි කර්මාන්ත කොට මදක් දැවුන දරමිටියකුත් ඔසවා ගෙණ පිටට විසුරුනු කෙසින් යුතුව කැලෑ මගින් අවුත් භික්‍ෂූන් හමුවෙහි සිටිය උන්දෑ දැක හෙරණුන් වහන්සේ උහුන් මුහුණු බලා "ඇවැත්නි, මේ තොපගේ පියාය, මහපියාය, මයිල්ය" යනාදී සිනා මුසු බස් කියා "උපාසකය තෙපි කවරක්හු දැ?"යි ඇසූහ.

හේ තෙමේ ද නමී විචාරණ ලද්දෙන් විපිළිසරව දරමිටිය වහා බිම දමා ගිහ කඩ සකසා හැඳ මහ තෙරුන්ගේ පා වැඳ "ස්වාමීනි, මදක් ඉවසුව මැනවැ"යි කිය. මහ තෙරුන් වහන්සේ නැවතුන පසු තරුණ හෙරණුන් වහන්සේ අවුත් මහතෙරුන් හමුවෙහිද පරිහාස කරණසේක් මය. උපාසකයානෝද "ස්වාමිනි, ඔබවහන්සේ මා දැක පරිහාස කරන්නාහුය. මෙතෙකින් ඔබවහන්සේ මස්තක ප්‍රාප්ත වූවෝ වමු"යි සිතන්නාහුද? මමද පෙර ඔබවහන්සේ වැනි මහණෙක්මි. ඔබවහන්සේට සිතේ එකග බව පමණකුත් නැත. මම මේ ශාසනයෙහි මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති කෙනෙක් වීමි. අහස ගෙණ පොළොව කෙළෙමි. පොළොව අහස කෙළෙමි. දුර සමීපය කෙළෙමි. සමීපය දුර කෙළෙමි. දහසක් සක්වළ ක්‍ෂණයකින් පසු කෙළෙමි. මගේ මේ අත් බලනුමැනවි. දැන් මකුළුවකුගේ අත් හා සමානය. මම මේ අත්වලින් මෙහිම සිට ගෙණ සඳ හිරු දෙදෙන පිරිමැදීමි. මේ පාවලින් ම සඳ හිරු දෙදෙන පා තබන පුවරු කෙළෙමි. මෙබඳු මගේ ඍද්ධිය ප්‍රමාදයකින් අතුරුදන් විය. විහන්ස තෙපි පමා නොවව්. ප්‍රමාදයෙන් මෙබදු විපත් පැමිණෙති අප්‍රමත්තව වසන්නාහු ජාති ජරා මරණ කෙළවර කෙරෙති. එහෙයින් ස්වාමීනි, නුඹවහන්සේ මා අරමුණු කොටම අප්‍රමත්තවව්"යයි නැතිගන්වා අවවාද දුන්නෝය. භික්‍ෂූන් වහන් සේ උන්ගේ කථාව අතරදී සංවේගයට පැමිණ විවසුන් වඩන්නාහු තිස්දෙනම රහත් වූ සේක. (සම්මොහ විනො දනී ත්‍රි: මූ: 207 පිට.)

---

තවද දකුණු දෙස හත්ථිභොග ජනපදයෙහි පඬුර නම් විහාර යෙක් ඇත. එහි බොජුන්හල දොරටුවෙහි පහුරු රුකෙක වැසි දෙවියෙක් භික්‍ෂුවක් මිහිරි හඬින් කියන මහාධම්ම සමාදාන සූත්‍රය අසා සාධුනාද දිති. තරුණ භික්‍ෂූන් වහන්සේ "මේ කවරෙක්දැ?"යි ඇසූහ. "ස්වාමීනි, මම මේ රුකෙහි සිටින එක් දෙවිකෙනෙකැ"යි

කීය. "දෙවියෙනි, කුමකට පැහැදුනුද හඬටද නො එසේනම් සුත්‍රයට දැ?"යි ඇසූකල "ස්වාමීනි, හඬ නම් යම් කිසි කෙනෙකුට ලැබෙන්නේය මා ප්‍රසන්න වූයේ සුත්‍රයටය. ශාස්තෘන් වහන්සේ ජේතවනයෙහි වැඩ සිට දෙශනා කළ දවස හා අද්‍ය එක් අකුර කුදු වෙනස් නුවූයේය." "දෙවියෙනි, තෙපි ශාස්තෘන් වහන්සේ විසින් කරණ දෙශනාව ඇසූවහුද?" එසේය ස්වාමීනි, "කොහිසිට ඇසූවහුද"? "ස්වාමීනි, දෙව්රමට ගියකල මහෙශාක්‍ය දෙවියන් එන්නට වන්පසු එහි අවසරයක් නොමැතිව මෙහිම සිට ඇසීමි". "මෙහි සිටංගෙණ අසන්නට හැකිවූවහුද?" "ස්වාමීනි, ඔබවහන්සේ මගේ ශබ්දය යම්සේ අසන සේක්ද? එමෙන් දකුණු කණ ලඟ සිට දෙසන බණක් මෙන් ඇසිය හැකිවිමි." "දෙවියනි, කිමෙක්ද බුදුරදුන් වහන්සේගේ රූපයත් දුටුවහුද?" "ස්වාමීනි, කුමක් කියන සේක්ද? බුදුරදුන් වහන්සේ මා දෙස බලම්න්ම බණ දෙසති"යි හඟිමින් ලජ්ජාවෙන් සිටිනු නො හැකිවීමි." "දෙවියනි තෙපි ආයුෂ්ඵලයකුත් ලැබූවහුද?" එකෙණෙහි දෙවිතෙම අතුරුදන්විය. ඕහු එදවස සොවාන් පෙලෙහි පිහිටියේය. (පපංචසූදනී ශ්‍රී: බෟ: මුද්‍රිත 530 පිට)

---

තවද පාටලී පුත්‍ර නම් නුවරු බමුණෝ දෙදෙනෙක් කාලවල්ලි නම් මණ්ඩපයෙහි වසන්නාවූ මහානාග තෙරුන් වහන්සේගේ ගුණ කථා අසා "අප ඔවුන් වහන්සේ අවශ්‍යයෙන් දක්ක මැනවැ"යි සිතා දෙන්නාම නික්මුනාහ. එක්කෙනෙක් අතර මගම මළේය. අනිකා මුහුදු තෙරට පැමිණ නැව් නැගී මාවටු තොට බැස නුවරට අවුත් "කාලවල්ලි නම් මණ්ඩපය කොහිදැ"යි විචාරු "රුහුණෙහිය" යනු අසා අනුක්‍රමයෙන් තෙරුන් වහන්සේ වසන තැනට පැමිණ සුළුගම් නුවර එක් ගෙයෙක්හි ලැග්ගේය.

දෙවනදා උදසන තෙරුන් වහන්සේට අහර සපයා තෙරුන් වහන්සේ වසන තැන් විචාරු ගොස් නාගතෙරුන් වහන්සේ දක සිටි තන්හිම සිට වැඳ නැවත ඔවුන් වහන්සේ සමීපයට එළඹ ගොප් මස දැඩිකොට අල්වා ගෙණ "ස්වාමීනි, නුබවහන්සේ ඉතා උස් සේක. නුබවහන්සේගේ ගුණ වූ කාලි මහා සාගරය මතුමත් තෙනි සියලු දඹදිවිතලෙහි පැතිර ගියේය. මමද පාටලීපුත්‍රනම් නුවර සුන්නෙම නුඹවහන්සේගේ ගුණකථාව අසා ආමි"ය. කියා තෙරුන් වහන්සේට ආහාර පිළිගන්වා තමන්ට තුන් සිවුරු සපයා තෙරුන් වහන්සේ සමීපයෙහි පැවිදි විය. ඔවුන් වහන්සේ මහානාග තෙරුන් වහන්සේගේ අවවාදයෙහි සිට කීප දවසකින් විදශීනා වඩා රහත් වූ සේක. (මනොරථපූරණී ත්‍රි:මු: 384 පිට.)

---

තවද මිරිසවැටි නම් මහාවිහාරපූජෝත්සවයේදී දුටුගැමුණු අබා මහරජතෙමේ මහදන් පිළියෙල කොට උභතොසඞ්ඝයා වැලඳවී. එහි භික්ෂූන්ගෙන් ලක්ෂයක් හා භික්ෂුණීන්ගෙන් නව දහසෙක් වූහ. එක් හෙරණ නමක් පාත්‍රයෙන් හුණු කැඳ ගෙණ යන්නේ වරෙක සිවුරු කණෙහිද වරෙක බිමද තබයි. එක් හෙරණීන්දෑ කෙනෙක් එය දැක 'මෙහි පාත්‍රය තබා යව''යි ඇත්දතින් කළ තලියක් දුන්නීය. ඔහුතුමූ පසු කාලයෙහි කිසියම් භයක් උපන් කල මුහුදින් එතර ගියාහුය.

භික්ෂුණිය පළමු කොට ගියාය. "එක් සිංහල භික්ෂුවක්ද ආයේය''යි අසා තෙරුන් ලඟට ගොස් පිළිසඳර කථා කොට හුන්නී "ස්වාමීනි, මිරිසවැටි විහාර පූජා අවදියෙහි ඔබවහන්සේට වස් කොතෙක්ද?''යි විචාළා. භික්ෂූන් වහන්සේ "එකල මම සත් හවුරුදු හෙරණෙක්මි. තොපට වස් කොතෙක්ද?''යි අසා "එකල මමත් සත් හවුරුදු හෙරණියක්මි. හුණුකැඳ ගෙණ යන හෙරණ කෙනෙකුන්ට පාත්‍රය තබනු පිණිස තලියක් දුනිමි''යි කී කල "ඒ මම වෙමි''යි තලිය ගෙන හැර දැක්වූහ. ඔහුතුමූ මෙපමණකින් හටගත් ප්‍රේමයෙන් බඹසර රක්නු නොහැකිව දෙදෙනම සැට හවුරුදු වස් ඇත්තාහු සිවුරු හැර ගිහි වූහ. (සුත්තනිපාතට්ඨකථා ත්‍රි: මූ: 47 පිට.)

---

තවද භාතික රජතෙමේ වනාහි එක් භාණකයෙකුට පූජාවක් කොට "ත්‍රිවිධ රත්නයෙන් අමුක්තවූ එක් ජය මඞ්ගලයක් කියව''යි කීය. හේ ත්‍රිපිටක බුද්ධ වචනය අලලා බලා ගාථාවක් කියන්නේ **"දිවා තපති ආදිච්චො''** යන පදය කියා බැස යන සූර්යයාටද **"රත්තිං ආභාති චන්දිමා''** යන පදය කියා නැග එන චන්ද්‍රයාටද **"සන්නද්ධො ඛත්තියො තපති''** යන පදය කියා රජහටද **"ඣායී තපති බ්‍රාහ්මණො''** යන පදය කියා භික්ෂුසඞ්ඝයාටද **"බුද්ධො තපති තෙජසා''** යන පදය කියා මහසෑයටද ඇඳිලි බැන්දේයි. එකෙණෙහිම රජ්ජුරුවෝ "අත නොබන්ව''යි ඔසවන ලද අත්හි දහසක් තැබූහ. එවක් පටන් මෙය සබ්බමඞ්ගලගාථා නම් විය.

**"දිවා තපති ආදිච්චො රත්තිං ආභාති චන්දිමා**
**සන්නද්ධො ඛත්තියො තපති බුද්ධො තපති තෙජසා''**

(සාරත්ථප්පකාසිනී ත්‍රි: මූ: දුතියභාග 180 පිට.)

---

තවද එක් තරුණ භික්ෂූන් වහන්සේ නමක් දීඝවාපි චෛත්‍යයෙහි පුණ්ණුපිරියම් කරණ කල මුල්වේදිකාපාදයෙන් ගිලිහී සැකුසින් බස්නේ යට සිටි සඞ්ඝයා ' ඇවත, බජගඟ පිරිත සිඟිකර ච"යි කියෙන් මරණභයින් බිය පත්ව "බජගඟ පිරිත මා රකිවා"යි කීයේය. එකෙණෙහිම සැකුසින් ගඩොල් කැට දෙකක් නැගී වේදිකාවක් මෙන් සිට ගත එහි රුඳුන උන්වහන්සේට මත්තෙහ සිටි අය වැලින් කළ හිණක් හෙලූහ. හිණට නැගුනපසු ගඩොල් තුබූ තැනම පිහිටා සිටියහ. (සාරත්ථප්පකාසිනී ත්‍රි: මු: 262 පිට.)

---

තවද මහාදාඨික නාගනම් රජතෙමේ සෑගිරියෙහිවූ අම්බස්ථල යෙහි මහ සෑයක් කරවා ගිරිභණ්ඩවාහනනම් පූජාවක් කොට කලින් කල අන්තඃපුරස්ත්‍රීන් විසින් පිරිවරණ ලදුව සෑගිරියට ගොස් භික්ෂු සඞ්ඝයාට මහදන් දෙයි. බොහෝ දෙන රැස්වූ තන්හිදී නම් සියල්ලන්ටම එක සේ සිහිය මනාව පිහිටන්නේ නොවෙයි. රජ්ජුරුවන්ගේ දූකුමාරිකාව ප්‍රථම වයසෙහි සිටි දමිළ නම් බිසොවක් වූවා. එක් චිත්ත නම් තෙර නමක් වයස්ගත කල මහණ වූයේ අසංවර ලීලාවෙන් බලන්නේ ඇගේ රූපය අරමුණු කොට ගෙණ උමතුව හුන් සිටි තැනදී "දමිළ දෙවිය යහපති, දමිළ දෙවිය යහපති"යි කියමින් හැසිරෙයි. එවක් පටන් ඔහුට ලදරු සාමණේරයෝ උමතු චිත්ත තෙර ය යි බැවහර කළහ.

ඕතොමෝ ද ටිකදිනකින් කළුරිය කළා. භික්ෂූන් වහන්සේ සොහොනට ගොස් ආපසු වැඩිය කල තෙරුන්නාන්සේලා ඒ චිත්ත තෙරුන් ලඟට "ගොස් හිමියෙනි චිත්ත තෙරුනි, යම් එකියක් නිසා ඔබ වැලපෙන්නෙහිද, අපි ඒ දෙවියගේ සොහොනට ගොස් ආමි"යි කීහ. එවිට චිත්ත තෙර තෙමේ "යම් හෙයකින් තෙපි සිවුපික දශීනයට ගියහු ද එහෙයින් තොපගේ මුහුණු දුම් පැහැය ය"යි මෙබදු උමතු බසක්ම කිය. (මනොරථපූරණී ත්‍රි: මු: 13 පිට.)

---

තවද වසභ රජතෙමේ ලෝවාමහපායට නැගෙන පෙදෙසෙහිවූ අම්බඅටයිගානි දී දීඝභාණක තෙරුන්වහන්සේ විසින් සජ්ඣායනා කරණ සුදශීන සූත්‍රාන්තය අසා "කිමෙක්ද මාගේ ආයුෂ්යන් වහන්සේ විසින් මෙහි කුමක් කියන ලද ද තමන් කෑපූ තැන සම්පත්තියම

වදාළේ වනැ"යි සිතන්නේ "ආනන්දය සංස්කාරයෝ මෙසේ අනිත්‍යයහ" යනු ද අසා චක්ෂුසම්පූන් වහන්සේ විසින් පසැසින් මෙයම දක්නා ලදැයි අපොලා මහත් සොම්නසින් සාධුනාදකෙළේ ය. (සුමඞ්ගල විලාසිනී ත්‍රි: මු: 44[illegible] පිට.)

---

තවද දුෂ්ඨගාමිණී අභය මහරජතෙමේ දෙතිස් දෙමළ රජුන් ජයගෙණ අනුරාධපුරයෙහි පැමිණි අභිෂෙක ඇත්තේ ලබන ලද සොම්නසින් මසක් නිදි නොලැබ "ස්වාමීනි, නිදි නොලබමි"යි දිනෙක සඞ්ඝයාට දැන්වීය. "මහරජ, එසේ නම් අද උදසනින් පෙහෙ වෙව"යි කියෙන් පෙහෙවස් සමාදන්වී. සඞ්ඝයා වහන්සේ "යව, රජහට චිත්තයමකය කියව"යි සහ අටදෙනෙකුන් යැවූ සේක. ඔවුන් වහන්සේ වැඩ "මහරජ, නිදා ගණුව"යි කියා සඞ්ඝායනාය කරණ කල ඒ අසමින්ම රජතෙමේ නිද්‍රෝපගතවී. සඞ්ඝයා වහන්සේ "රජු නොපුබුදුවව"යි කියා නික්ම වැඩිසේක.

දෙවනදා සූර්යොදයෙහි පිබිදුන රජතෙමේ තෙරුන් වහන්සේ නොදැක "ආයුෂ්මතුන් වහන්සේ කොහිදැ?"යි ඇසීය. "දේවයෙනි, ඔබ වහන්සේ නිදියෙන බව දත් උන්වහන්සේ වැඩි සේකැ"යි කී කල 'පින්වත්නි, යම්සේ නිදියෙන බෙහෙතුන් දනිද එසෙයින් මාගේ ආයුෂ්මතුන් වහන්සේ විසින් නොදන්නා බෙහෙදක් නම් නැතැ"යි රජතෙමේ අතිශයින් ප්‍රසන්නවී. (සුමඞ්ගල විලාසිනී ත්‍රි: මු: 452 පිට.)

---

තවද භාතිය නම් රජතෙමේ "සුවඳින් සමන්මල් අග්‍රය"යි දෙසූ සූත්‍රාන්තයක් අසා එය විමසනු පිණිස එක් ගබඩාවක් සිවුදිගින් පිරිබඩගන්වා සුවඳ මල්වගී ගෙන්වා සුමුගක් මැද සමන් මල් කලඹ තබා සෙසු මල් වගී ඒ හාත්පස මිටි බැඳ තබා දොරවසා පිටත සිටියේ ස්වල්පවේලාවකින් දොර හැර ගබඩාවට පිවිසියේය. එකෙණෙහිම සියල්ලට පළමු සමන්මල්සුවඳ ආඝ්‍රාණය වී. රජතෙමේ මහල්තලයෙහි මහසෑයට අභිමුඛව හොත්තේ "සුවඳ මල් අතුරෙන් සමන්මල් අග්‍රයයි දෙශනා කළ භාග්‍යවතුන් වහන්සේ විසින් සත්‍ය වචනයක්ම දෙසන ලද්දේය"යි කියා මහසෑය වැන්දේය. (මනොරථපූරණී ත්‍රි: මු: 8.9 පිට.)

---

තවද මහා පදුම නම් තෙරුන් වහන්සේ වසභ රජ බිසොවට රෝගයක් උපන් කල එක් ගැහැණියක් පැමිණ පිළියම් විචාරණ ලද්දේ "නොදනිමි"යි නොකියා "මෙබඳු රෝගයට මෙබඳු පිළියමක් කළ යුතුය"යි තවත් භික්ෂූන් වහන්සේ කෙනෙකුන් සමග කථා කළ සේක. ඒ අසා සිටියෝ එයින් බිසොවට පිළියම් කළහ. රෝගය සන්හුන් පසු තුන් සිවුරක් කහවණු තුන්සියයක් හා බෙහෙත් පැසක්ද පුරා ගෙණවුත් තෙරුන් වහන්සේගේ පාමුලතබා "ස්වාමීනි, මෙයින් මල් පූජා කළමැනවැ"යි කීහ. තෙරුන් වහන්සේද "මේ ආචාර්යභාගය"යි කැපවසයෙන් ගෙණ ඒ කහවණු වලින් මල් පිදූසේක. (සමන්තපාසාදිකා ත්‍රි: මු: 337 පිට.)

---

තවද සිතුල්පව් වැසි එක් භික්ෂූන් වහන්සේ තමක් චතුස් සාලා දොරටුව ඉදිරිපිට "සෙට සඞ්ඝයා වහන්සේට මෙපමණ කැවුම් පිසන්නේ නම් මැනවැ"යි ආරාමිකයන්ට හඟවනු පිණිස බිම මඬුල් ලක් ඇන්දේය. ඒ දුටු දක්ෂ ආරාමිකයෙක් එපමණ කැවුම් පිස දෙවනදා ගෙඩිය ගැසීමෙන් සඞ්ඝයා රැස්වූ පසු ඇරගෙණ විත් "ස්වාමීනි, එක් ආර්‍ය්‍යයන් වහන්සේ කෙනෙකුන් විසින් චතුස්සාලාව ඉදිරිපිට කැවුම් පිණිස සංඥවක් කරණලදී. එබන්දක් මින් පෙර පියන්ගෙන් පියමුතුන්ගෙන් නො අසන ලද විරූය. මෙවක් පටන් ආර්‍ය්‍යයන් වහන්සේ තම තමන්ට රුචිදෙයක් කියන සේක්වා. එය අපට පහසුවන්නේය"යි සඞ්ඝස්ථවිරයන්ට කීය. සඞ්ඝස්ථවිරයන් වහන්සේ කැවුම් ප්‍රතික්ෂෙප කළසේක. සඞ්ඝයා වහන්සේද නො පිළිගත්හ. (සමන්තපාසාදිකා මුද්‍රිත 401 පිට.)

---

තවද භාතිය රජ කල රජපුරුෂයෝ ගෙරිමස් කන බොහෝ මිනිසුන් රජහට දක්වූහ. රජ්ජුරුවෝ ඔවුන්ගෙන් "දඬුවම් විඳින්නට හැක්කාහුදැ"යි අසා "නොහැක්කෙමු"යි කී පසු රාජාඞ්ගණය සුද්ධකිරී මෙහි යොදා ලූහ. ඔවුන්ගේ එක් දුවක් විශිෂ්ටරූ ඇත්තීය. රජ්ජුරුවෝ ඇය අන්තඃපුරයට පමුණුවා වල්ලභ ස්ථානයෙහි තැබූහ. ඇය නිසා සෙසු නෑයෝ ද සුවසේ විසූහ. (සම්මෝහ විනෝදනී ත්‍රි: මු: 310 පිට.)

---

තවද එක් රජෙක් තමහට පුත්‍රයකු උපන් කල බිසොවට පැහැදී වරයක් දුනි. ඈතොමෝ වරය පසුවට ගණු කොට තැබූ. කුමාරයෝ සත් හැවිරිදි කල රජාඞගණයෙහි කුකුළන් පොර ඇණ ලූහ. එක් කුකුළෙක් පැන කුමාරයන්ගේ ඇස සිදුරු කොළේය. ඔහුගේ මවුතොමෝ 'පුත්‍රයාට පසළොස් සොළොස් හවුරුදු කල රජ්‍යය පවරන්නෙමි"යි රජු කරා එළඹ "දෙවයෙනි, ඔබවහන්සේ විසින් මපුතුන් උපන් කල වරයක් දෙනලදී. මම එය පසුවට ගණු කොට තැබීමි. දැන් ගණිමි"යි කීවා.

"දෙවිය, යහපති ගණුව." "දෙවයන් වහන්ස, මා ඔබවහන් සේ ගෙන් නො ලැබූ දෙයෙක් නම් නැත. දැන් මම මගේ පුත්‍රයාට රජ්‍යය කැමැත්තෙමි." "දෙවිය, තොපගේ පුත්‍රයා අඞගවිකලයෙකි. රජ්‍යය දෙන්නට නො හැක්කෙමි." "දෙවයන්වහන්ස, මා රුචිවන වරයක් දෙන්නට නොහැකි කල කුමක්හෙයින් වර ගණුවයි කීව හුද?" රජතෙමේ මෙයින් අතිශයින් පෙළුනේ "තොපගේ පුත්‍රයාට සියලු ලක්දිව රජ්‍යය දෙන්නට නොහැක්කෙමි. නාගදිපයෙහි ඔටුණු පැලඳ රජ්‍යය කෙරේවා"යි කියා නාගදීපයට යැවී. හේ තෙමේ දීපක රජ නම් විය. ඉදින් ඔහු ඇස් විකලවූවෙක් නොවී නම් තුන් සියයක් යොදුනැති සියලු ලක්දිව සියලු සම්පත්තියෙන් යුතුව රජ්‍යය ලබන්නේය. (සම්මෝහවිනෝදනී ත්‍රි: මූ: 313 පිට.)

---

මේ දක්වන ලද්දේ ලක්දිවම සිදුවූ දේයයි නිශ්චය කල හැකි කරුණුවලින් ස්වල්පයෙකි. ග්‍රන්ථකීපයකට ප්‍රමාණවත තරම් තවත් මෙබඳු කරුණු අටුවාවලින් එක්කළ හැකිය. මේ ටිකද දක්වන ලද්දේ අප්‍රකට වැදගත් ඉතිහාස කරුණු රැසක් හෙළිකරණු පිණිසය. මේ දැක්වූ කරුණුවලින් එකක් වත් මහඅටුවාවේ ආදෙයකැයි කිසිවකුටත් නො කිය හැකියි. මින් කිසිවක් මහා පච්චරියාදියෙහි ආදෙයයි කිව හැකි වුවද බුදු ගොස් මාහිමියන් වහන්සේ වැඩවිසූ කාලයට ඉතාමත් ආසන්නයෙහි සිදුවූ ප්‍රවෘත්තීන් දක්නට ලැබෙන හෙයින් පූර්වී කථාවන්හි ඇතුළත්වූ දෙයම නොව අමුතු බොහෝ දෑ එක් කොට නවීන අට්ඨකථාවන් සම්පාදනය කළ බවට කිසිම සැකයෙක් නැත්තේය.

---

# අට්ඨකථාසම්පාදකයෝ.

—:—

මූල් මහඅටුවාව ප්‍රථම සඞ්ගීති කාරක මහාකාශ්‍යපාදි ක්ෂිණාශ්‍රයන් විසින් නිෂ්පාදිතය. පච්චරියාදි අටුවා සතර කවුරුන් විසින් සම්පාදිත දැ යි වෙන් වශයෙන් නො කිය හැකිය. පස්වන සඞ්ගායනාවට හා බුදුගොස් මාහිමියන්ටත් අතර කාලයේ සිටි කිසියම් ආචාර්‍ය්‍යවරයන් විසින් සපයන ලදහයි කිය යුතුයි.

නවීනාට්ඨකථාසම්පාදකයන් වශයෙන් බුද්ධඝොෂාදි ආචාර්‍ය්‍යවරයෝ පස්නමක් පැහැදිලිව පෙණෙති. ධම්මපද අපදාන අටුවා බුදුගොස් මාහිමියන් හා ධර්‍මපාල ස්වාමිපාදයන් විසිනුත් කරණලදැයි කියන නමුත් එය අප විසින් නො හැදහිය හැකි කරුණෙකි. කවුරුන් විසින් කරණ ලදදැයි නිශ්චය වශයෙන් අපටද නොකිය හැකිය

බුද්ධඝොෂාදි ආචාර්‍ය්‍යවරයන් පිළිබඳ අනාකූලවූත් සම්පූර්ණවූත් විස්තරයක් සැලකිය යුතු කිසිම ග්‍රන්ථයකින් හමු නොවිය. මෙහි දක්වන ලද්දේ අපට හමුවූ කෙටි සටහන් අනුව කැටි කළ දේයි. එද නො හැදහිය හැකි කරුණුවලින් අමිශ්‍ර යයි නො කිය හැකිය.

1. **බුද්ධඝොෂ මහා ස්වාමිපාදයෝ** වර්‍තමාන අටුවා කළ උතුමන් අතුරෙන් ප්‍රථමාඞ්කයෙන් ගැණෙන මේ ස්වාමිපාදයන් ගැණ නිරවුල් සම්පූර්ණ චරිත වර්‍ණනාවක් අවශ්‍යයෙන් තිබිය යුතුය. ලක්දිව තබා දඹදිවවත් කෙබඳු භාෂාවකින් නමුත් ලියවුන එබන්දක් ගැණ මෙතාක් අසන්නට නොමැතිසි. මහාවංශ 37 වන පරිච්ඡෙදයේ එන විස්තරය හා මෑතදී ලියවුන බුද්ධඝොසුප්පත්ති කථාදි තවත් ලෙඛන කීපයක් ඇතිවුවද ඔහුත් ජනශ්‍රැතියෙන් එක්කර ගත් කරුණු අනුව ගැළපුනාහු වෙති. පිරිසුදු සඳහනෙ කැයි මදක් දුරටවත් කිය යුක්කේ මහාවංශයෙහි එන විස්තරය පමණෙකි. අට්ඨකථාවලිනුත් විසූ ස්ථානය, කාලය හා ආරාධකයන් ගැණ මිසක් එයට වැඩි යමක් දැනගන්නට නො මැතිසි.

භාරතවාර්ෂික (Bimala Charan Law. M. A. B. L.) බිමලා චරන් ලෝ නමැති පඬිතුමන් විසින් ලියන ලද (The Life and work of Buddhaghosa) බුද්ධඝොෂයන්ගේ චරිතය හා කෘත්‍යය නම් ඉංග්ලීෂි ග්‍රන්ථාශ්‍රයෙන් මේ විස්තරයද අප විසින් සපයන ලදී.

එතුමන් විසින්ද එය ලියන ලද්දේ මහාවංශ, සාසනවංශ, ගන්ධවංශ සද්ධම්මසඞ්ගහ යන පොත්වලින්ද මහාමඞ්ගලනම් තෙරකෙනෙකුන් විසින් කළ බුද්ධ ඝෝසුප්පත්ති කථා නම් පොතකින් හා "ජේම්ස් ග්‍රේ" නම් පඬිවරයකුගේ ලේඛනවලිනුත් කරුණු උපුටා ගැණීමෙනි.

**උත්පත්තිය:-** උතුරු දඹදිව මගධ ජනපදයට අයත් බෝ මැඩට නුදුරෙහි ඝොෂනම් එක්ගමෙක් විය. එහි වැස්සෝ සාමාන්‍ය යෙන් ගොපල්ලෝය. පස්වන ශතවර්ෂයේදී එහි රාජ්‍යය කළ සංග්‍රාම නම් රජුගේ අග්‍රපුරෝහිතයා ඒ ගොපලු ගමෙහි උපන් කෙසී නමින් යුත් ශ්‍රෙෂ්ඨ බ්‍රාහමණවංශිකයෙකි. ඔහුගේ බිරිඳ කෙසිනී නම් වූවාය. බමුණාගේ නම "කෙස" යයිද බැමිණියගේ නම කෙසී යයි ද ඇතැම් ලේඛනයන්හි පෙණේ.

ඒ කාලයෙහි රේවත නම් එක් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ නමක් "අටුවා හෙළබසින් පවත්නා හෙයින් අනාගතයෙහි බුදුරදුන් වහන්සේගේ ඉගැන්වීම අවබෝධ කර ගැණීමට අපහසු වන්නේය. එහෙයින් ලක්දිව පවත්නා හෙළ අටුවා පෙළ බසට නගන්නට සමර්ථ කවරෙක්ද?"යි දිවැසින් බලා තව්තිසා දෙව්ලොව වසන ඝොෂ නම් දිව්‍ය පුත්‍රයා ඒ කාර්‍ය්‍යයෙහි සමර්ථයයි දැන එකෙණෙහිම තව්තිසාවට වැඩි සේක.

සක්දෙව් රජ උන්වහන්සේට පෙර ගමන් කොට වැඩි පවත් විචාරා දැන "මඳක් ඉවසනු මැනව"යි කියා දිව්‍යපුත්‍රයා සමීපයට එළඹ කාරුණු කියා "නිදුකානෙනි, ඔබ මිනිස්ලොව යනු කැමැත් තෙහිද?"යි ඇසීය. "මම දුක් ඇති මිනිස්ලොවට නොව මීට වඩා සැප ඇති ඉහල දෙව්ලොවට යනු කැමැත්තෙමි. එහෙත් මිනිසුන්ට බුද්ධ දෙශිතය අවබෝධ කර ගැණීමට අපහසු නම් මම එහි යන්නට සූදානම්"යි දිව්‍යපුත්‍රයා කීය. ශක්‍රයා ඔහුගේ සතුට දැන කෙසී බ්‍රාහමණයාගේ මිත්‍ර ඒ රහතන් වහන්සේට කීය. උන්වහන්සේ ආපසු වැඩ "යුෂමතා අද සිට සත්දිනක් ගතවනතුරු ලෞකික දෙයෙහි ඇලුම් නො කරව. බොහෝ ඥානවන්තවූද භාග්‍යවන්තවූද පුතෙක් තොපට උපදින්නේය" යි බ්‍රාහමණයාට වදාළසේක.

සත්වන දවස දිව්‍ය පුත්‍රයා එයින් චුතව කෙසිනී බැමිණියගේ කුස පිළිසිඳ ගත්තේය. දසමසක් ඇවෑමෙන් උපන් ඔහුට දසයෝ ගෙවැස්සෝ හා බ්‍රාහමණයෝ "කව, බොව" යනාද මිහිරි බස්ම කීවාහුය. ඒ නිමිති කොට කුමාරයාට ඝොෂ නාමය කරණ ලද්දේ යයි කියති.

**ඉගෙනීම**:-සත්වසකින් වේදය ඉගෙණගත් ඝෝෂයෝ උත්පත්තියෙන් සත්වන වර්‍ෂයේදී ත්‍රිවේදයෙහි ස්වාමිත්වයට පැමිණියහ. දිනෙක ඔහු විෂ්ණුහුගේ අංශය මතුපිට වාඩිවී මාශ හෙවත් මෑ ඇට අනුභව කෙළේය. එසේ කරණු දුටු සෙසු බමුණෝ කොපයට පැමිණ "අපගේ ස්වාමිවූ විෂ්ණුහුගේ අංශය මතුයෙහි වාඩිවී මෑඇට අනුභව කරන්නේ හැයිද? තෙපි තොපගේ පමණ නොදන්නහුය. කිමෙක්ද, තෙපි ත්‍රිවේදය දන්නහුදැ?"යි ඇසූහ.

"මාශ යන්නෙන් විෂ්ණුද කියති එයට කුමක් හෙයින් එසේ කියද්ද? මාශත් විෂ්ණුත් යන මේ දෙකින් කවරක් විෂ්ණුයයි මම දැන ගන්නෙම්දැ?"යි ඝෝෂයෝ ඇසූහ. බමුණෝ කිසි පිළිතුරක් දෙනු නොහැකිව ගොළුවන් මෙන් ඔවුනොවුන්ගේ මුහුණු බලා සිට කොසී බ්‍රාහ්මණයා වෙතට ගොස් සියලු ප්‍රවෘත්තිය කීහ. "තා විසින් මෙබන්දක් කරණ ලදදැ"යි පුත්‍රයාගෙන් අසා "එසේ ය?"යි කී කල්හි "තෙපි කෝප නොවව්. ඔහු තරුණයෙකි"යි බමුණන්ට කියා ඔවුන් සැනසීය. එතෙකින් සැනසුන බමුණෝ ඉවත ගියහ.

කොසී බමුණා රජුට වේදය උගන්වන්නේ දිනෙක ස්වකීය පුත්‍රයාත් කැටුව රජු වෙතට ගියේය. හෙතෙමේ රාජශිෂ්‍යයාට උගන්වන අතර එක් ග්‍රන්ථිස්ථානයකට පැමිණියේය. එහි අදහස ඉදිරිපත් කරණු නොහැකිව රජුගේ අවසරය පරිදි පෙරළා ගෙට පැමිණියේය. ඒ බව දත් ඝෝෂයෝ ග්‍රන්ථිස්ථානයේ අදහස පියාගේ අත්පොතෙහි රහසිගතව ලියා තැබූහ.

බ්‍රාහ්මණයා ඒ දැක බලවත් සතුටට පැමිණියේ "මෙය කවුරුන් විසින් ලියන ලදදැ?"යි පිරිවර ජනයාගෙන් විචාරු "ස්වකීය පුත්‍රයා විසිනැ"යි දැන විස්මයට හා අතිශය ප්‍රීතියට පැමිණ "දයාබර දරුව, මෙය ලියන ලද්දේ තොප විසින් දැ?"යි පුත්‍රයාගෙන් ඇසීය. කුමාරයා "එසේ ය"යි කී කල බ්‍රාහ්මණයා වහාම රජුට ඒ බව දැන්වීය. රජ තෙමේද අමන්‍දානන්‍දයට පැමිණියේ කුමාරයා වැළඳ හිස සිඹ "තෙපි මාගේ පුත්‍රයෝය. මම තොපගේ පියා වෙමි"යි කියා වටිනා ගමක්ද තෑගි කෙළේය.

**බෞද්ධයෙකු වීම හා මහණවීම**:-වේදය උගත් ඝොෂ කුමාරයෝ දිනපතා පාද හදුහ බැගින් පාඩම් කියති. දිනෙක කොසී බ්‍රාහ්මණයාගේ මිත්‍ර මහතෙරුන් වහන්සේ දන් වළඳනු පිණිස ඔහුගේ ගෙට වැඩියෝය. "ඝොෂයන්ගේ ආසනය හැර සෙසු අසුන් නොපැණේවා"යි ඉටූ තෙරුන් වහන්සේට ගෙවැස්සෝ ශෂව තුබුන එයම වැඩ හිඳින ලෙස එළවූහ. උන්වහන්සේ එහි වැඩ හිඳිනු දුටු ඝොෂයෝ "මේ මුඩුමහණ ලජ්ජානැති කෙනෙකි. ඔහු

ඔහුගේ පමණ නොදනී. කුමක් හෙයින් මාගේ පියා මොහුට ආරාධනය කෙළේද? හෙතෙමේ වේදය හෝ වෙන යම් මන්ත්‍රයක් නො දනී"යයි අවමන් කොට වලඳා අවසානයෙහි වේදාන්විත ප්‍රශ්න අසමියි සිතූය.

වලඳා අවසන් කළ ඉක්බිතිව උන්වහන්සේකරා එළඹ "නුඹ වහන්සේ වේදය හෝ වෙන යම් මන්ත්‍රයක් දන්නාසේක්ද?"යි ඇසීය. තෙරුන් වහන්සේ සතුටට පැමිණ "එසේය ඝොෂයෙනි! මම වේදයන් දනිමි. සෙසු මන්ත්‍රත් දනිමි" යි වදාළසේක. "ඔබ වේදය දන්නෙහි නම් ග්‍රන්ථිස්ථාන කියව"යි කී කල්හි තෙරුන් වහන්සේ ඒ සියල්ල විසඳා වදාළෙන් විස්මයට පැමිණි ඝෝෂයෝ මම ඔබගේ මන්ත්‍ර දැනගනු කැමැත්තෙමි. කරුණා කර මට කියනු මැනව"යි කීහ. තෙරුන් වහන්සේ ධම්මසඞ්ගණිප්පකරණයට අයත් "කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යාකතා ධම්මා" යනාදිය වදාළසේක. අතිශය විස්මයට පත් ඝොෂයෝ "ඔබවහන්සේගේ මේ මන්ත්‍රය කුමක්ද? ගිහියකු විසින් එය උගතහැකිද?"යි අසා "පැවිදිවූවකු විසින් උගතයුතුය"යි කී කල්හි "බුදුන්වහන්සේගේ ධර්මය ඉතා අගනේය. එය මට ප්‍රියවිය. යමෙක් එය ඉගෙණගන්නේ නම් හෙතෙම දුකින් නිදහස් වන්නේය"යි කියා මවුපියන්කරා එළඹ "මම මහතෙරුන් අනුවයමි. උන්වහන්සේ දන්නා බුද්ධමන්ත්‍ර ඉගෙණ සිවුරු හැර ආපසු එමි" යි කීය. ඔහු නැයෝද ඒ අදහසට එකඟව මහතෙරුන් ලඟට පැමිණ "ඔබ අනුව යන්නට කැමතිවන මෙතෙමේ ඔබගේ මුණුබුරෙකි, මොහුට මහණකම දුනමැනව"යි කීහ.

තෙරුන් වහන්සේ ඝොෂයන්ට මහණකමදී තචපඤ්චක කම්වහනද දුන්සේක. "තචපඤ්චක කර්මස්ථානය නම් කිමෙක්ද"යි ඇසූ ඝොෂයන්ට "කෙසා, ලොමා, නඛා, දන්තා, තචො" යනුවෙන් භාවනාකිරීමයයිද එය වනාහි සියලු ශාසනික ඵලය ගැබ්වී ඇති කර්මස්ථානයකැයිද වදාළසේක. හෙතෙමේ එය භාවනා කරන්නේ "ත්‍රිවිධ ශික්ෂාව නම් මේය, බුදුන්වහන්සේ ඉගැන්වූ මධ්‍යම ප්‍රතිපදා නම්වූ ආර්‍ය්‍ය මාර්ගයනම් මේය"යි සියලු ත්‍රිපිටක ධර්මය දැනගත්තේ "ස්වාමීනි බුදුරදුන්ගේ ඉගැන්වීම සියලුදුක් කෙළවරකිරීමේ මාර්ගයයි, මාගේ ත්‍රිවේදය වනාහි අසාරදෙයකැ"යිද කීය. මෙසේ ඝොෂයෝ රේවතමහතෙරුන්ගෙන් මහණකම හා ඉගෙණීම ලබා බුද්ධඝොෂ නමින් ප්‍රසිද්ධ වූහ.

මේ ප්‍රවෘත්තිය මහාවංශයෙහි හා සද්ධම්මසංගහයෙහි එනුයේ මෙසේයි:-

දඹදිව බෝමැඩට නුදුරු ඝොෂග්‍රාමයෙහි උපන් එක් බ්‍රාහ්මණ මාණවකයෙක් ත්‍රිවේද පාරගතවූයේ මහාවාදීව දඹදිව නගරග්‍රාම ජනපදයන්හි වාද කෙරෙමින් අවුත් එක් මහාවිහාරයකට එළඹියේය. සියගණන් භික්ෂූන් වාසය කරණ ඒ මහාවිහාරයෙහි අධිපති රේවත නම් එක් රහත්මහතෙර නමක් විය. විහාරයට එළඹි බ්‍රාහ්මණ මාණවකයා රාත්‍රියෙහි පාතඤ්ජලි සූත්‍ර පාඩම් කියමින් සිටියේය. ඒ ඇසූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ “මෙතෙමේ දමනය කළ යුතු නුවණැති භාග්‍ය සම්පන්න පුද්ගලයෙකැ”යි සිතා “මෙහි කොටළුවෙකු මෙන් කෑගසන්නේ කවරෙක්ද”යි ඇසූහ.

ඉක්බිති මාණවකයා “ශ්‍රමණයෙනි, ඔබ කොටළුහඬෙහි අදහස කියන්නට දන්නෙහිද?”යි අසා “මම දනිමි”යි තෙරුන් වහන්සේ කී කල්හි වේද වේදාඞ්ගයන්හි ග්‍රන්ථිස්ථාන ඇසීය. තෙරුන් වහන්සේ ඒ සියල්ල විසඳූ අවසානයෙහි “බ්‍රාහ්මණය! තෙපි මගෙන් බොහෝ ප්‍රශ්න ඇසුවහුය. මම තොපගෙන් එක්ප්‍රශ්නයක් අසමි, එය විසඳව”යි වදුරා “මගෙන් ප්‍රශ්න අසව, මම පිළිතුරු දීමට සූදානමි”යි කී කල්හි යමකප්‍රකරණයෙහි චිත්තයමකය ඇසූසේක. බ්‍රාහ්මණයාට එය විසඳනු නොහැකිව “මෙය කාගේ මන්ත්‍රයක්ද?”යි අසා “බුද්ධමන්ත්‍රය”යි කී කල මන්ත්‍ර ගණු පිණිස තෙරුන් ලඟ මහණව ත්‍රිපිටකය උගත්තේය” යනුයි

**ලඞ්කාගමනට පොරොන්දුවීම**:-දිනෙක බුඩඝොෂභික්ෂුතෙමේ “පිටකත්‍රයෙහි මාගේ ඥානය විශාලද? නැතහොත් මගේ ගුරුවරයාගේ ඥානයද?”යි සිතීය. තෙරුන් වහන්සේ පරසිත් දන්නා නුවණින් ඔහුගේ අදහස දැන “තෙපි මෙබඳු සිතක් සිතුවහුය. එය වරදය”යි වදුරා “ස්වාමීනි! එය මාගේ වරදෙකි. ඊට මට සමාවුවමැනවැ”යි යාචඤාකළ කල්හි “ඉදින් තෙපි ලක්දිවට ගොස් හෙළබසින් පවත්නා අටුවා පෙළබසට නගන්නනු නම් මම සමාවෙමි”යි වදාළසේක. “ස්වාමීනි! ඔබවහන්සේ කැමැති වන සේක් නම් මම ලක්දිවට යනු කැමැත්තෙමි. එහෙත් මගේ පියා මිසදිටුබැවින් මුදන තෙක් මට ඉඩදුන මැනවැ”යි බුද්ධඝොෂයෝ කීහ.

**කෙසි බ්‍රාහ්මණයා**:-ඉක්බිති ඔහු කෙසි බ්‍රාහ්මණයාගේ හෙවත් පියාගේ ගෙට ගියේය. “මගේ පුත්‍රයා සිවුරු හරණට ආයේවනැ”යි සිතා “ඝොෂයෙනි, තෙපි ගිහිවන්නහුද?”යි බ්‍රාහ්මණයා ඇසීය. බුද්ධ ඝොෂයෝ පියාගේ ප්‍රශ්නයට පිළිතුරු නොදී “කෙසේනම්

පියා මිසදිටුබැවින් මූද සම්දිටුවකු කරම්දැ?"යි සිතමින් සිටියහ. ඔහු සිතාගත් ක්‍රමය මෙසේ ක්‍රියාවෙහි යෙදූහ. එනම්:-ස්වකීය වාසස්ථානයට ගොස් ගඩොල් පුවරු ආදියෙන් එකට යාබද බිම්ගෙවල් දෙකක් තනා එහි ඇතුළෙන් හා පිටතින් වැසියහැකි අගුල් දෙකක් යොදා එහි- කළ, ගිනි, සහල්, වතුර, කිරි, මෝරු, ගිතෙල් ආදිය පිළියෙල කොට ස්වකීය පියා ඇතුල්කාමරයෙහි බහා යන්ත්‍රමාගීයෙන් දොර වැසීය එවිට බ්‍රාහමණයා "දයාබර දරුවෙනි, මම තොපගේ පියාය. මට මෙසේ කරන්නේ හැයිදැ?"යි ඇසීය. "පියාණෙනි, ඔබ මාගේ පියාබව සැබව. නමුත් ඔබ බුදුරදුන් වහන්සේගේ ඉගැන්වීම නොඅදහන්නෙහිය. ඒ නිසා මම මේ දඬුවම ඔබට කරන්නෙමි"යි බුද්ධඝොෂයන් කීකල "මම මිථ්‍යාලබ්ධිය නොඅදහන්නෙමි, දොර හරුව"යි කීහ.

"පියාණෙනි, ඔබ සම්‍යක්දෘෂ්ටිය වැලඳගන්නෙහි නම් **ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"** යනුවෙන් බුදුරදුන්ගේ වචනයෙන්ම කියව"යි කී යා බ්‍රාහමණයාගේ සිත සැදැහැයෙන් පුරවන්නේ "පියාණෙනි, ඔබ මිථ්‍යාලබ්ධිය ඉවත් නොකරන්නෙහි නම් මරණින් මතු අපායට වැටෙන්නෙහිය"යි මෙසේද කියේය.

බ්‍රාහමණයා තුන් දිනක් එහි ගතකළේ සිවුවන දින සෝවාන් ඵලයට පැමිණ සද්ධර්මයෙහි ශ්‍රෙෂ්ඨත්වය අවබොධකොළේ ස්වකීය පුත්‍රයාට "ඉතිපි සො භගවා අරහං......' යනාදිය කියමින් ත්‍රිවිධ ශික්ෂා ශාසනය වැලඳගත් බව හා ශාස්තෲන් වහන්සේ ස්වකීය ගුරුවරයාලෙස පිළිගත් බවද කියේය. ඉන්පසු බුද්ධඝොෂයෝ කාමරයෙහි දොර හැර පියා සුවඳපැනින් නහවා සමාව ඉල්වූහ. බ්‍රාහමණයා බුදුගුණ ගයමින් කියන ගිනිකාද ශ්‍රවණය කොට බලවත් සතුටට පැමිණියේය. මෙසේ කෙසිබ්‍රාහමණයා ඥනාන්විත පුත්‍ර රත්නය නිසා බොහෝ කාලක් වැලඳ ගෙණ සිටි මිථ්‍යාලබ්ධියෙන් මිදී ආයර්‍ය පුද්ගලයෙක් වූයේය.

**ලක්දිවට පැමිණීම:-** බුදුගොස් හිමියෝ පියා බෞද්ධයකුව සෝවාන්පෙලෙහි පිහිටියායින් පසු සමාව ලබනු පිණිස ගුරුන්වෙත ගියහ. ගුරුවරයන්ගෙන් සමාව ලැබූ ඉක්මනින් ලක්දිවට වඩනා පිණිස යාත්‍රාවට සූදානම්ව තුබූ මෙළඳ නැවකට නැංගෝය. ලක්දිවට වඩනා අතර මගදී ලක්දිවින් දඹදිව බලා වඩනා බුද්ධදත්ත

තෙරුන්වහන්සේ හමුවූහ. නිරුපද්‍රැතව ලක්දිවට පැමිණි බුද්ධඝොෂ ස්වාමිපාදයෝ මහාවිහාරයෙහි සඞ්ඝරාජ මහතෙරුන් වහන්සේ කරා එළඹ ධම්මවිනය උගන්නා භික්ෂූන්ට පිටිපසින් එක් තැනක සිටියහ.

මහතෙරුන් වහන්සේ අදහස විස්තර කරණු නොහැකි එක් ග්‍රන්ථස්ථානයකට පැමිණ දුර්මුඛව එයින් නැගිට ස්වකීය ලෙණට වැඩ අදහස සිතමින් සිටියහ. බුද්ධඝොෂහිමියෝ ග්‍රන්ථස්ථානයෙහි අදහස මැනවින් විස්තර කොට කළුලෑල්ලක ලියා තුබූහ. ලෙණින් ආපසු වැඩි මහතෙරුන් වහන්සේ ඒ දැක "මෙය විසමයජනකය. කවුරුන් විසින් ලියන ලද්දේද? හෙතෙමේ කොහි ගියේදැ?"යි විමසූසේක. භික්ෂූන් වහන්සේ බුදුගොස් හිමියන් මහතෙරුන් වහන්සේට දැක්වූහ. සඞ්ඝරාජ තෙමේ සියලු තොරතුරු විචාර දැන "මෙතැන් සිට භික්ෂු පිරිසට ත්‍රිපිටකය තොප විසින් ඉගැන්විය යුතුය"යි කී සේක.

බුද්ධඝොෂ ස්වාමිපාදයෝ එය ප්‍රතික්ෂෙප කොට "මා මෙහි පැමිණියේ සිංහලාට්ඨකථා මාගධියට පෙරළනු පිණිසය"යි කීහ. ඒ අසා සොම්නසට පැමිණි තෙරුන් වහන්සේ "ඔබ මෙහි පැමිණියේ එබඳු කාර්‍ය්‍යයකට නම් ත්‍රිපිටක වර්ණනාවෙහි තොපගේ දක්ෂකම බුද්ධදෙශිත මේ ගාථාවෙන් අපට පැහැදිලි කරව"යි.

**"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං,**
**ආතාපී නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටං."**

යන ගාථාව දුන්සේක.

**ඥානශක්තිය පරීක්ෂාකිරීම**:–බුද්ධඝොෂ ස්වාමිපාදයෝ "එසේය මම එය කරමි"යි කියා සතුටුව ස්වකීය වාසස්ථානයට ගියේ එදිනම සවස යථොක්ත ගාථායෙන් පටන්ගෙණ විශුද්ධිමාර්ගය ලියා අවසන් කොට සැතපෙන්නට ගියහ. උන්වහන්සේගේ ග්‍රන්ථකරණයෙහි කෞශල්‍යය ප්‍රකට කරණු පිණිස ශක්‍රදෙවේන්ද්‍රයා එය සොරා ගත්තේය. රාත්‍රියෙහි පිබිදී බලා පොත නොදැක යළිත් පහන් එළියෙන් ඉක්මනින් පොතක් ලියා හිසට තබාගෙණ සැතපුනාහ. එයද දෙව්රජ සොරාගත්කල තෙරුන් වහන්සේ පිබිදී පොත නොදැක නැවතද ලියා සිවුරුකොණින් ගැටගසා තබා සැතපුනේය. එවිට සක්දෙවිඳු තමාගත් පොත් දෙකද උන්වහන්සේගේ හිස ළඟ තබා ගියේය. උදැසන පිබිදුන තෙරුන්වහන්සේ නැතිවූ පොත්දෙකත් අමුඟු පොත් තුණම එකතැන තිබෙනු දැක ප්‍රීතියට පැමිණියෝ සඟ

රජ මහතෙරුන් වහන්සේට භාර කළහ. "කුමක්හෙයින් පොත් තුණක් ලියූහුද"යි විචාළකල සිදුවූ සියලුප්‍රවෘත්තිය නොවළහා කීහ. තෙරුන් වහන්සේ පොත් තුණ සමකර බලා එකඅකුරකිනුදු වෙනසක් නැතිබව දැක විස්මයට පැමිණ පෙළ හා සියලු හෙළඅටුවා භාර කළහ. එපමණක් නොව බුද්ධඝොෂ හිමියන්ගේ ගුණයද බෙහෙවින් වර්ණනා කළහ. එවක් පටන් බුදුගොස් මාහිමියෝ ලක්වැසියන් අතර හිරු සඳු මෙන් අතිශයින් ප්‍රසිද්ධවූහ. බුදුවරයකු මෙන් මුළු පෙළොවෙහි මනුෂ්‍යදෙහීන්ගේ ස්වාමියාය යි කියනු ලැබූවෙක් ද වූහ

**අටුවා කිරීම**:-ලක්දිවදී උන්වහන්සේ වාසයකළේ සත්මහලින් යුත් පහයක පහතමාලේය. දිනපතා උදේ පිඩුපිණිස හැසිර පස්වරු කාලයෙහි තල්කොළ අවුලා පොත් ලියනුපිණිස ස්වකීය වාසස්ථානයට ගෙණායුතුය. දිනෙක එක් නුවණැති වෙළෙඳෙක් තල්පත් අවුලා උසුලාගෙණ එන උන්වහන්සේ දැක නොකැඩුන තල්කොළ රැසක් උන්වහන්සේ වඩනාමග විසුරුවා හැර සැඟවී බලා සිටියේය. තෙරුන්වහන්සේ පිඩු සිඟා අවසන්වූ ඉක්බිති ඒ තල්පත් අවුලා ගෙණ ගියහ. වෙළඳද අනුවගියේ ඒ පත්වලින් පොත් ලියනු දැක සතුටුව පසුදිනෙහි ආහාර තලියක් ගෙණවුත් පිදීය.

"උඩුමාලෙහි ඉතා උසස් තෙරුන් වැඩසිටිනසේක. කරුණාකර උන්වහන්සේට ගෙණගොස් දෙව"යි තෙරුන්වහන්සේ කීකල වෙළඳා උඩුමාලට ගොස් මහතෙරුන් දැක ආහාරය පිළිගැන්වීය. "පහත මාලෙහි වසන බුද්ධඝොෂ තෙරුන් වහන්සේ අපට වඩා බොහෝ වටිනා කෙනෙකි. දිනපතා උන්වහන්සේ අර්ථකථා පරිවර්තනයෙහි යෙදෙති. උන්වහන්සේට ගෙණගොස් දෙව"යි මහතෙරහු කීහ. නැවතද වෙළෙඳා බුදුගොස් හිමියන් කරා එළඹ ආහාරය පිදූයේය. උන්වහන්සේ එය පිළිගෙණ කොටස් සයක් කොට තෙරුන් සනමකට එක එක කොටස බැගින් දුන්සේක. උන්වහන්සේගේ යැපීම පිණ්ඩපාතයෙන් ලත් දෙයින්ම විය.

කුදුගත් සඟියේ පොත් කීපයකට හැර සෙසු සියලු ත්‍රිපිටකයට තුන්මසකින් අටුවා ලියා අවසන් කොට සඞ්ඝරාජ තෙරුන් වහන්සේට භාර කළහ. සඟරජතෙමේ බුදුගොස් හිමියන්ට බෙහෙවින් පසසා මිහිඳු හිමියන් විසින් ලියනලද සිංහලාර්ථකථා ගිනි ලැවූයේලු. ඉක්බිති බුදුගොස් හිමියෝ ස්වකීය ඥාතීන් දකිනු පිණිස ආපසු වඩින්නට අවසර ලබා සූදානම් වූහ.

**සංස්කෘත ඥානය**–පැවි තැගීමට සූදානම්වූ කල්හි "මේ තෙරුන් වහන්සේ ත්‍රිපිටක පාලිය පිළිබඳ අපට ගුරුකම් දුන්නේ නමුදු සංස්කෘත නොදන්නාහ"යි සිංහල භික්ෂූන් කියනු අසා 'ස්වාමීනි! සෙට පොහෝ දිනෙහි මහසෑ මළුවෙහි සිව් පිරිස රැස්කරවුව මැනව. මම සංස්කෘතයෙන් දෙශනාවක් කරමි"යි සඟරජ තෙරුන් වහන්සේට කීහ. පසුදින උදයෙහි සිවු පිරිස මැද ධර්මාසනාරූඪව ස්වකීය සංස්කෘතඥනය ප්‍රකට කරණු පිණිස සකුබසින් ධර්මදෙශනාවක් කොට ධර්මාසනයෙන් බැස සඞ්ඝයාට නමස්කාර කළහ. එවක් පටන් උන්වහන්සේගේ සංස්කෘත දැනීම පිළිබඳ සැකයෙක් සිංහල භික්ෂූන් වහන්සේට නොවීය.

**ස්ථානොචිත ඥානය:**– බුදුගොස් හිමියන් ලක්දිව සිටියදී සිදුවූ සිද්ධියකින් උන්වහන්සේගේ ස්ථානොචිත ඥනය මැන ගැණීමට හැකිය. ඒ සිද්ධිය මෙසේය:–

දිනෙක බමුණන් දෙදෙනෙකුගේ තරුණ දාසියන් දෙදෙනෙකු අතර කලහයක් විය. එක් දාසියක පිරුණ වතුර කලයක් රැගෙණ පොකුණකින් ගොඩවන විට හිස් කළයක් රැගෙණ පොකුණට බසින දාසියකගේ කළය පළමු තැනැත්තියගේ දිය කළයෙහි ගැටුනේය. එයින් පළමු තැනැත්තියගේ කළය බිඳුනෙන් කෝප යටපත් ඕ දෙවැන්නියට බැණ වැදුනාය. ඕතොමෝද පෙරළා බැන්නාය. මෙසේ ඔවුනොවුන් බැණගන්නා අතර බුද්ධඝොෂ ස්වාමිපාදයෝ මෙය අසමින් "දැන් මෙහි අන් සාක්ෂියෙක් නැත්තේය. මොවුන්ගේ ස්වාමිවරු මේ පුවත අසා විනිශ්චය සභාවට දන්වා මා සාක්ෂ්‍යයට කැඳවන්නාහ. එවිට මා සාක්ෂ්‍ය දියයුතුය"යි සිතූහ.

උන්වහන්සේ සිතූ පරිදිම කළය බිඳුන තැනැත්තිය එපුවත ස්වාමියාට කී කල හෙතෙමේ විනිශ්චය කරුවන්ට කියේය. රජ තෙමේ සාක්ෂ්‍ය නැතිව නඩුව විසඳීමට නොකැමැතිවූයේ "තොපට සාක්ෂ්‍ය දෙන්නේ කවරෙක්දැ?"යි ඇසීය. එක් දාසියක් බුද්ධඝොෂ ස්වාමිපාදයන් ගැන කීවාය. විනිශ්චය සභාවෙන් අණක් ලැබ උන්වහන්සේ එහි ගොස් රජු ඉදිරිපිට පෙණී සිට "කාන්තාවන් දෙදෙනෙකුන් බැණ ගන්න කථාවක් මා විසින් අසන ලදි. මම ශ්‍රමණයෙක්මි. එහෙයින් මම එය අරමුණකට නො ගත්තෙමි"යි කියමින් ඔවුන්ගේ කථාව සටහන් කළ තමාළඟ තුබූ අත්පොතක් රජුට දුන්හ,

රජතෙම එය බලා තඩුව තීන්දු කෙළේය. "මේ නොහොබනා මහණ වෙළඳාමට මෙහි පැමිණියෙක්. ඔබ වහන්සේ ඔහුගේ කථාව නො පිළි ගත යුතුය"යි බුදුගොස් හිමියන්ගේ කථාවෙන් අසතුටු පත් බමුණෝ කීය. එහෙත් රජතෙමේ බුදුගොස් හිමියන්ට බොහෝ සෙයින් ප්‍රශංසාකොට "මෙතරම් උසස් ස්ථානොචිත බුද්ධියකින් හා ඥානශක්තියකින් යුත් ශ්‍රමණයෙක් මින් පෙර මවිසින් නොදක්නා ලද්දේය"යි කීයේය.

**දඹදිවට යාම:-** සඞ්ඝයාගෙන් අවසර ගෙණ ලක්දිවින් වෙළඳුන් සමග පිටත්වූ මුන්වහන්සේ පළමුකොට උපාධ්‍යායයන් වහන්සේ දැක වැඳ තමා විසින් කළ පයඞ්ඝාපති විවරණ ගැණද කියා දෙවනු සවකීය ඥාතීන් දකිනු පිණිස ඔවුන්ගේ ගෙවලට වැඩියහ. "දඹදිවට පැමිණීමට මත්තෙන් ලක්දිවින් බුරුමයට වැඩියහ. උන් වහන්සේගේ පැමිණීමෙන් එහි බලවත් ආගමික උන්නතියක් විය. එහිදී කච්චායන ව්‍යාකරණය බුරුම බසට නැගීමාදි බොහෝ ශාසනික වැඩ කළාහුය"යි දැක්වෙන ආකූල ප්‍රවෘත්තියක්ද ඇත්තේය.

**අපවත්වීම:-** අපවත්වන කාලය නිශ්චය කොට ගත් උන්වහන්සේ "මරණය වනාහි සමුච්ඡේද, ඛණික, සම්මුතියයි ත්‍රිවිධය. සමුච්ඡේදය නම් නැවත උත්පත්තියක් නොගන්නා මරණයයි. ක්ෂණික මරණය නම් විනාශක්ෂණයක් පාසා ඇතිවන රූප කලාපයන්ගේ විනාශයයි. සම්මුති මරණය නම් සියලු සත්වයන්ට සාමාන්‍යයෙන් සිදුවන මරණයයි. මේ තුන් වැදෑරුම් මරණයෙන් මා මැරෙන්නේ සාමාන්‍ය සම්මුති මරණයෙන් නොවේදැ"යි මෙසේ සිතූහ. ජීවිතයේ අන්තිම මොහොතේ මෙසේ සිතූ උන්වහන්සේ අවසාන හුස්ම හෙලා තුෂිත දෙව්ලොව උපන්හ. අපවත්වූයේ කොහිදීද යන්න ගැණ කිසිවක් නොකිය හැකිය.

**ආදාහනය:-** මෘත දෙහය දිව්‍ය, මනුෂ්‍ය, ශ්‍රමණ, බ්‍රාහමණයන් විසින් පිළිවෙළ කළ සඳුන් චිතකයට නංවා ආදාහන කරණ ලදී. උන්වහන්සේගේ ධාතු ගෙණ බමුණන් හා සෙසු මිනිසුන් විසින් මහාබෝධියට ආසන්නයෙහි චෛත්‍යයෝ නංවනලදහ.

මෙහි එක දිනකින් විශුද්ධි මාර්ග තුණක් ලියන ලදය, තුන් මසකින් සියලු අටුවා කරණ ලදය යනාදි නොහැදනිය හැකි බොහෝ කරුණුද ඇත්තාහ. සුපරිශුද්ධ බුද්ධඝොෂ චරිතයක් සැපයීම අතිශයින්ම දුෂ්කරය.

## 2. බදරතිත්ථවාසී ධම්මපාල ස්වාමිපාදයෝ.

විශාල සඞ්ඛ්‍යාවක් අට්ඨකථා සම්පාදනයෙන් විවාදයක් නැතිවම කීර්ත්‍යස්ථානය ගත්තා මූන්වහන්සේ වනාහි දඹදිව තෙලිඟු රට බ්‍රාහ්මණවංශයෙහි උපන්නෙකැයි කියති. ආඥචක්‍රවර්ත්ති ධර්මාශෝක මනුජේන්ද්‍රයන් විසින් දකුණු දඹදිව නාගපට්ටනමෙහි කරවන ලද බදරතිත්ථ නම් විහාරයෙහි විසූ ස්වසමයසමයාන්තරපාරදෘශ්වී මේ ආචාර්ය්‍ය පාදයන්ට සමාන ග්‍රන්ථකර්තෘවරයෙක් නම් මේ ශාසනයෙහි නොවීය යනු කිසිවකුගේ හැඟීමය. ගම්භීර ඥානය, ක්‍රියාකෞශල්‍යය, ප්‍රවීණත්වය හා නෛසර්ගික ප්‍රතිභාන ශක්තිය එතරම් මහත්ය.

බුද්ධඝෝෂ මහාස්වාමිපාදයන්ට සමකාලිකව විසූ නමුදු අට්ඨකථා කරණය ආරම්භකළේ උන්වහන්සේට පසුවයයි සිතිය හැකිය. බුදුගොස් මාහිමියන් අටුවා කිරීමෙහි යෙදී සිටියදී අන්කිසි ආචාර්ය්‍යවරයකු එහි යෙදුන බවක් නොපෙණේ. බුදුගොස් මාහිමියන් විසින් කුදුගත් සඟියේ පොත් කිපයකට හැර සෙසු සියලු ත්‍රිපිටකයට අට්ඨකථාවන් ලියා දඹදිව වඩිද්දී මූන්වහන්සේ හමුවී ඉතිරි අටුවා කරණ ලෙස කී බවක්ද ජනශ්‍රැතියෙන් පැවතෙයි. එය කෙසේ වුවද බුදුගොස් මාහිමියන් කෙරෙහි අන්‍යාචාර්ය්‍යවරයන්ටත් වඩා විශේෂ සැලකීමක් දක්වා තදනුගාමීව අටුවා නිපදවන ලද බව කියහැකියි. එපමණක් නොව උන්වහන්සේ කළ අටුවාවලට ටීකා කිපයක්ද මූන්වහන්සේ විසින් කරණ ලදහ.

ඛුද්දක නිකායාන්තර්ගත උදාන, ඉතිවුත්තක, විමානවත්ථු, පේතවත්ථු, ථෙර-ථෙරීගාථා, චරියාපිටක, නෙත්තිප්පකරණ අටුවා පමණක් නොව පරමත්ථමඤ්ජූසා නම්වූ විසුද්ධිමග්ග මහා ටීකාවද දික්සඟි මැදුම්සඟි සංයුත්සඟි අටුවා තුණට පුරාණ ටීකාද අභිධම්මමූලටීකාවට අනුටීකාවක් හා සච්ච සංඛෙපප්පකරණය ආදී ටීකානුටීකාද මූන්වහන්සේගේ කෘතීහු වෙත්. අටුවාවලින් මුලින්ම කළැයි සැලකිය හැකි උදාන අටුවාවේ "විත්ථාරො පන පටිබිම්බස්ස උදහරණභාවසාධනාදිකො අන්තරාභවකථාවිචාරො කථාවත්ථුප්පකරණස්ස ටීකාය ගහෙතබ්බො." (ත්‍රි: මූ: 65) යන පාඨයෙන් කථාවත්ථුප්පකරණ ටීකාව කළ බව හා අට්ඨකථා කරණයට මත්තෙන් ටීකාකරණයෙහි යෙදී සිටි බවද සිතිය හැකියි. මූන්වහන්සේ විසින් නිපදවන ලද අට්ඨකථා සියල්ලෙහිම

මහාකාරුණිකං නාථං ඤෙය්‍යසාගරපාරගුං,
වන්දෙ නිපුණගම්භීරං විචිත්‍රනය දෙසනං.

විජ්ජාචරණසම්පන්නා යෙන නීයන්ති ලොකතො,
වන්දෙ තමුත්තමං ධම්මං සම්මාසම්බුද්ධපූජිතං.

සීලාදිගුණසම්පන්නො ඨිතො මග්ගඵලෙසු යො,
වන්දෙ අරියසඞ්ඝං තං පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං.

වන්දනාජනිතං පුඤ්ඤං ඉති යං රතනත්තයෙ,
හතන්තරායො සබ්බත්ථ හුත්වාහං තස්ස තෙජසා.

යන ගාථා සතර ආරම්භයෙහි පෙණෙති, චරියා පිටක අටුවාවෙහි පමණක් ආදියෙහි:-

චරියා සබ්බලොකස්ස හිතා යස්ස මහෙසිනො,
අචින්තෙය්‍යානුභාවං තං වන්දෙ ලොකග්ගනායකං.

යන ගාථාව එයි. සෙස්ස එහි ද සමාන ය.

ඉති තං සඞ්ඛරොන්තෙන යං තං අධිගතං මයා,
පුඤ්ඤං තස්සානුභාවෙන ලොකනාථස්ස සාසනං.

ඔගාහෙත්වා විසුද්ධාය සීලාදිපටිපත්තියා,
සබ්බෙපි දෙහිනො හොන්තු විමුත්තිරසභාගිනො.

චිරං තිට්ඨතු ලොකස්මිං සම්මාසම්බුද්ධසාසනං,
තස්මිං සගාරවා නිච්චං හොන්තු සබ්බෙපි පාණිනො.

සම්මා වස්සතු කාලෙන දෙවොපි ජගතීපති,
සද්ධම්මනිරතො ලොකං ධම්මෙනෙව පසාසතු.

යන ගාථා සතර හැම අටුවාවකම අන්තයෙහි එති. මේ හැර බුද්ධඝොෂ මහා ස්වාමිපාදයන් මෙන් ස්වකීය අභිධාන පිළිබඳ කිසිදු සඳහනක් ග්‍රන්ථයන්හි ආරම්භයෙහි හෝ අවසානයෙහි නොදක්වති. බුද්ධදත්ත, මහානාම, උපසේන ස්වාමිපාදයෝ තම තමන් ගැණම ස්වකීය ග්‍රන්ථයන්හි සඳහන් කළහ.

## 3. බුද්ධදත්ත ස්වාමිපාදයෝ

කාවීරජලසම්පාත පරිපූතමහීතලෙ,
කාවීර පට්ටනෙ රම්මෙ නානානාරිනරාකුලෙ.
කාරිතෙ කණ්හදාසෙන සණ්හවාචෙන සාධුනා,
විහාරෙ විවිධාකාර චාරුපාකාරගොපුරෙ.
ගොධාසලිලසම්පාතෙ දස්සනීයෙ මනොරමෙ,
හතදුජ්ජනසම්බාධෙ පවිවෙකසුඛෙ සිවෙ.
තත්‍ථ පාචීනපාසාද තලෙ පරමසීතලෙ,
වසතා බුද්ධවංසස්ස මයා සංවණ්ණනා කතා.

යනුවෙන් මූන්වහන්සේම තමන් ගැණ බුද්ධවංශාර්ථකථාව ඝාතයෙහි සඳහන් කෙරෙති. එයින් කාවේරි පට්ටනෙහි කෘෂ්ණදාස යන් විසින් කරවනලද විහාරයෙහි වසමින් බුද්ධවංශ අටුවාව නිපදවූ බව හඟවති. බුද්ධඝෝෂ ධර්මපාලාදි ආචාර්‍ය්‍යවරයන් ධර්මවිනය විස්තර කිරීම වශයෙන් අටුවා ටීකා කොට සම්බුද්ධශාසනය යම් සේ අලඞ්කාර කළාහුද එමෙන් මේ ආචාර්‍ය්‍ය පාදයෝද අටුවා ටීකා කරණයෙන් ශාසනය ශෝභාවත් කළහ.

දකුණු දඹදිව සොලීරට උරගපුරයෙහි (තිරුණෙල්වෙලි පෙදෙසෙහි වූ නාගපුරයෙහි) කුලගෙයක ඉපිද ක්‍රමයෙන් වැඩිවයසට පැමිණ ත්‍රිවේදයෙහි පරතෙරට ගියෝ සම්බුද්ධශාසනයෙහි පැවිදිව දඹදිවදීම ත්‍රිපිටක බුද්ධ වචනය ඉගෙණ ලක්දිවටද පැමිණ මහාවිහාරවාසීන් හා සමීපාශ්‍රය ඇත්තාහු ඔවුන්ගේ වාඩිමාගීයද දැන බුද්ධවංසට්ඨකථාදි ධර්මප්‍රකරණ කළහ.

අභිධර්මාවතාරය, විනයවිනිශ්චය, උත්තරවිනිශ්චය යන ග්‍රන්ථයෝ ද මෙතුමන්ගේ කෘතීහු වෙත්. රූපාරූපවිභාග නම් අභිධර්මග්‍රන්ථයද මෙතුමන්ගේ කෘතියකැයි ග්‍රන්ථවංසයෙහි කියන ලද්දේය. මේ හැම කෘතියක්ම නිපදවන ලද්දේ දඹදිව දී වුව ද මහා විහාරික තෙරුන්ගේ ආශ්‍රයෙන් කලින් කල ලක්දිවද විසූ බව සලකති. විනයවිනිශ්චය ටීකාචාර්‍ය්‍යයෝ:-

"යො බුද්ධඝොසාචරියාසභෙන
විඤ්ඤූපසංසත්‍ථනප සුප්පසත්‍ථො,
සො බුද්ධදත්තාචරියාභියානො
මහාකවි ථෙරියවංසදීපො."

යනුවෙන් හා "මාදිසාපි කවී හොන්ති බුද්ධදත්ත දිවඞ්ගතෙති ආදිතාපවජ්ජිම්කෙහි ච පසත්ථතරෙහි අභිඤ්ඤාතගුණො භදන්ත බුද්ධදත්තාචරියො" යනාදියෙනුත් පූජාශ්‍රී බුද්ධදත්තාචාර්‍ය්‍යපාදයන් වර්ණනා කෙරෙති. ථෙරවංශයට පහනක් බඳුවූ බුද්ධදත්ත ස්වාමිපාදයන් වනාහි බුද්ධඝොෂාදි පූර්ව කවීන් විසිනුත් "බුද්ධදත්තයන් දිවඞ්ගත කල්හි අපවැන්නෝත් කවීහු වෙති"යි යනාදීන් පශ්චාත්කාලික කවීන් විසිනුත් එකසේ වර්ණිත මහනීය ගුණ ඇති උතුමෙකු බව යථොක්ත විනයවිනිශ්චය ටීකා කථාවෙන් පැහැදිලි වෙයි.

තවද මූන්වහන්සේ ලක්දිව සිට ස්වකීය ජන්මභූමියට වඩනා කල්හි අට්ඨකථාකරණය පිණිස ලක්දිවට වඩනා බුද්ධඝොෂ මහාස්වාමිපාදයන් අතරමගදී හමුවී කරුණු විමසා බලවත් සන්තොෂයට පැමිණ "ඔබවහන්සේ අටුවා ලියා අපවෙත එවන සේක්වා, අපි ඔවුනට ටීකා ග්‍රන්ථ කරන්නෙමු" යි කී බව හා බුදුගොස් මාහිමියන් විසිනුත් 'යහපත එසේ කළ මැනව"යි කී බවද විනයවිනිශ්චය ටීකාවෙහි දක්වෙයි. මූළ විනයපිටකය අල්ලා විනයවිනිශ්චය ටීකාව කිරීමෙනුත් යථොක්ත කථාවෙහි කිසියම් සත්‍යයෙක් ඇතැයි සැලකිය යුතුසේ පෙණේ. එපමණක් නොව බුද්ධවංසඅටුවාවෙන් සූත්‍රාන්තධර්මයන්හි පැවති මනා පටුත්වය දක්වන්නාක්මෙන් මේ ග්‍රන්ථ දෙකින් විනයාභිධර්ම දෙක්හි නිපුණත්වයද මැනවින් විදහා දක්වති.

යම්සේ සංස්කෘත කවීන් අතුරෙන් කාලිදාසයෝද සිංහල කවීන් අතුරෙන් රාහුල මහාස්වාමිපාදයෝත් ප්‍රකට වූහුද මාගධ කවීන් අතුරෙන් මේ බුද්ධදත්තාචාර්‍ය්‍යපාදයෝ ද කවීන් විසින් එලෙසින් වර්ණිතයහ ප්‍රශංසා කරණ ලද්දෝය. මූන් වහන්සේගේ විශද ප්‍රඥාපාටවය එකම බුද්ධවංස අටුවාවෙන්ම වුවත් පැහැදිලි වන්නේය.

---

## 4 මහානාම ස්වාමිපාදයෝ.

—:—

අනුරාධපුර මහාවිහාරයෙහි උත්තර මන්ත්‍රීන් විසින් කරවන ලද පිරිවෙන්හි විසූ පූජ්‍යාචාර්‍ය්‍ය මහානාම යතිවරයන්ගේ අන්වය පිළිබඳව සෑහෙන විස්තරයක් දක්නට නොමැතියි. පළමුවන මූග

ලන් රජතුමන් සමයෙහි විසූ බව හා කුමාරදාස රජුගේ රාජ්‍යාද යෙන් නොහොත් මුගලන් රජතුමන්ගේ මරණයෙන් තුන් වන වර්ෂයේදී පටිසම්භිදා අටුවාව නිපදවන ලද බවද පෙණේ.

> "යං තං උත්තරමන්තී මන්තිගුණයුත්තො ච සද්ධාය
> කාරයි මහාවිහාරෙ පරිවෙණමනෙකසාධුගුණං,
> ථෙරෙනෙත්ථ නිවසතා සමාපිතා යං මහාභිධානෙන
> තතියෙ වස්සෙ චුතිතො මොග්ගල්ලානස්ස භූපතිනො"

යනු පටිසම්භිදා අටුවාවසානයෙහි දක්වෙන ගාථා දෙකය. මහාවංශ මූල භාගය කරණ ලද්දේත් මහානාම හිමියන් විසින් ය යන මතයක් පවතී. එහි ද්විතීයාර්ධයේ කර්තෘ භූත ධර්මකීර්ති පාදයන් ගැණ මෙන්ම පූර්වාර්ධයේ කර්තෘභූත මහානාම යතිපාදයන් පිළිබඳ වත් කවර කාලෙක විසූ කෙනෙක් ද යන්න ගැණ ප්‍රසිද්ධ මත දෙකෙකි. කිසිවෙක් මහසෙන් රජකාලයෙහි සිටි මහානාම කෙනෙකැයි ද කිසිවෙක් ධාතුසේන රජකාලයෙහි සිටි කෙනෙකැයි ද කියති. මේ මත දෙකටම හේතුද දක්වති මහසෙන් කාලයෙහි මහානාම යතිවරයකු සිටි බවක් ප්‍රකට නැති හෙයින් ද ධාතුසේන කාලයෙහි ඒ රජුගේ මයිල්වූ දීඝසඳ පිරිවෙන් වැසි මහානාම නම් යතිවරයකු සිටි බව පෙණෙන හෙයින්ද මහාවංශය ලියන ලද්දේ ධාතුසේන කාලයේදීය යි එක් පක්ෂයක් කියති. ධාතුසේන කාල යෙහිදී ලියනලද නම් ඒ කාලය දක්වා ලිවිය යුතුය. පූර්වාර්ධය අව සන් වන්නේ මහසෙන් රජුගෙන් හෙයින් ඒ කාලයේ දී කර්තෘවර යන්ගේ අභාවය හෝ නතර කිරීමට වෙන යම් කිසි හේතුවක් වූයේ නම් තවෂ්ෂ්‍යයෙකැයි කියන ටීකාචාර්යයන් විසින් හෝ මේ බව කියයුතුය. කවරකුගේ වත් එබඳු කථාවක් නැති බැවින් මහා වංශය ලියන ලද්දේ ධාතුසේන කාලයේදී නොව මහසෙන් කාලයේ සිටි අන්‍යතර මහානාම ස්ථවිර කෙනෙකැයි අනික් පක්ෂය කියති. මහසෙන්-ධාතුසේන යන දෙරජුන් අතර කාලය ශතවර්ෂ දෙකකට ආසන්නය. මහසෙන් කාලයේදී මහාවංශය ලියන ලද නම් අටුවාචාර්යවරයන්ගෙන් ඒ බව හෙළිවන්නේය.

වුත්තම්පි චෙතං දීපවංසෙ:-

> ජාතපබ්බතපාදම්හි වෙණුයට්ඨී තයො අහු,
> සෙතා රජතයට්ඨීව ලතා කඤ්චන සන්නිභා.

(දීපවංස 11 පරිච්ඡේද 16 ගාථා ව.)

යනුවෙන් දීපවංශ නාමය හා එයින් ගත් තැන්ද සමන්තපාසාදිකාවෙහි (මුද්‍රිත 34 පිට) දක්වති. දීපවංශය ලියන ලද්දේ අටුවා කාලයට පෙරය. හෙවත් මහසෙන් රජකාලයේ දීය. එමෙන් මහාවංශයත් අටුවා කාලයට මත්තෙන් ලියන ලදනම් මෙසේ නාමය හෝ ගත්තැන් දක්විය යුතුය. අර්ථවශයෙන් ගත් තැන් ඇතැයි සැක කළහැකි වුව ද පාඨවශයෙන් ගත් තැනක් හෝ නාමය සඳහන් වූ තැනක් අප විසින් නොදක්නා ලදී. එහෙයින් මහාවංශය ලියන ලද්දේ ධාතුසේන කාලයේදීය යන මතය සැලකිය යුතුසේ පෙණේ. ඒ අනුව පටිසම්භිදා අටුවාවද මහාවංශ කර්තෘභූත දික්සඳ සෙනෙවියා පිරිවෙන් වැසි මහානාම ස්වාමිපාදයන් විසින් ජීවිතකාලයේ පශ්චිම කොටඨාසයේදී නිෂ්පාදිතයයි පිළිගත යුතුයි.

---

## 5 උපසේන ස්වාමිපාදයෝ

—0—

අනුරාධපුර මහා චෛත්‍යයට පශ්චිම දිශාවෙහි හත්ථිසේන නම් ඇමතියන් විසින් කරවනලද මහපිරිවෙන්හි අධිපතිවූ මූන්වහන්සේ ස්වකීය නිද්දේසට්ඨකථාවසානයෙහි ගාථාපෙලකින් තමන් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරති.

"යං පුරං පුරුත්තමං පරමනුරාධපුරව්හයං,
යො තස්ස දක්ඛිණෙ භාගෙ මහාවිහාරො පතිට්ඨිතො.

යො තස්ස තිලකො භූතො මහාථූපො සිලුච්චයො,
යං තස්ස පච්ඡිමෙ භාගෙ කොට්ඨා කප්පිතසඞ්ඛිතො.

හත්ථිසෙනොති නාමෙන සචිවො රාජසම්මතො,
සුචිචාරිත්තසම්පන්නො ලෙඛො කුසලකම්මිකො.

සීතච්ඡායතරූපෙතං සලිලාලයසම්පදං,
චාරුපාකාර සඤ්චිතං පරිවෙණමකාරයි.

උපසෙනො මහාථෙරො මහාපරිවෙණවාසියො,
තස්සාදාසි පරිවෙණං ලෙඛො කුසලධම්මිකො.

වසන්තෙනෙත්ථ තෙනෙව පිරසීලෙන තාදිනා,
උපසෙනව්හයෙනස්ස කතා සද්ධම්මජොතිකා.

රඤ්ඤො සිරිනිවාසස්ස සිරිසඞ්ඝස්ස බොධිනො,
ඡබ්බීසතිමහි වස්සම්හි නිට්ඨිතා නිද්දෙස වණ්ණනා."

යනු ඒ ගාථා පඞ්ක්තියයි. මෙයින් ස්වකීයාඛ්‍යානය සම්බන්ධ විස්තරයක් නොදක්වනලද නමුත් මූලින් කී පරිදි විසූ ස්ථානය පැහැදිලි කෙරෙති. සිරිනිවාස සිරිසඞ්ඝබෝධි රජුගේ රාජ්‍යයෙන් සවිසිවන වර්ෂයේ දී නිද්දෙස අටුවාව කරණලදැයි කාලය දක්වති. එහෙත් ඒ නාමයෙන් යුත් එකද රජෙකුගැණ මහාවංශයෙහි සඳහනෙක් නැත්තේය. එහෙයින් මේ සිරිනිවාස සිරිසඞ්ඝබෝධි රජු කවරෙක් දැයි සෙවිය යුතුය.

සෛංහලීය රජ වරුන්ට බොහෝ විරුදු නාමයෝ ඇත්තාහ. රජකෙනෙකුගේ නාමය ග්‍රන්ථාන්තරයන්හි බොහෝ සෙයින් දක්වන ලද්දේ නියම නාමයෙන් නොව විරුදු නාමයෙනි. ධර්මශාස්ත්‍රීය ග්‍රන්ථවල පමණක් නොව ඓතිහාසීය ග්‍රන්ථවල සිරිතද එසේ ම විය. ග්‍රන්ථාන්තරයන්හි එකිනෙකට වෙනස් විරුදුනාම වලින් රජනාම සඳහන් කිරීම නිසා ඇතම් කාරුණු නිර්ණය කර ගැණීමට බලවත් අපහසුවෙකි.

බුද්ධඝෝෂ මහා ස්වාමි පාදයන් විසූ කාලයෙහි සිටි මහානාම රජුද සිරිනිවාස යන අපර නාමයකින් උන්වහන්සේ දැක්වූහ. දම්පියාටුවා කතුවරයෝ සිරිකුඩ්ඩ" නම් රජකුගැණ සඳහන් කෙරෙති. එද මහානාම රජුගේම අපර නාමයෙකැයි සමහරුන් ගේ කල්පනාවයි. මහාවංසයෙහි කියන පරිදි මහානාම රජුගේ පටන් පළමුවන අග්බෝ රජුදක්වා දෙවිසි රජකෙනෙක් එක් සිය පස්විසි වසක් රාජ්‍යය කළහ. ඔවුනතුරෙන් කිසිම රජකු විසි වසකට අධික කාලයක් රජකළ බවක් නොපෙණේ.

පළමුවන අග්බෝ රජතුමා සිවුතිස් වසක් රාජ්‍යය කෙළේය. එතුමන්ගේ කාලයේ පටන් මාණවම්ම රජ කාලය දක්වාත් සොළොස් වසකට අධික කාලයක් රජය කළ රජෙක් නොවීය. නිද්දෙස අටුවාවේ කියනලද්දේ සිරිනිවාස සිරිසඞ්ඝබෝධි රජුගේ සවිසිවන වර්ෂයේ දී ඒ අටුවාව කළ බවෙකි. එහෙයින් ඒ විරුදු නම් වලින් දැක්වූ රජු නම් මේ පළමුවන අග්බෝ රජුයයි නිශ්චය කළ යුතුයි. මහාවංශයෙහි කියන පරිදි මේ රජුට මත්තෙන් රාජ්‍යය කෙළේ මහානාග රජතුමායි. ඒ රජුගේ සහෝදර වූ උපතිස්ස නම් තෙරකෙනෙකුන් විසින් නිද්දෙස– බුද්ධවංස අටුවා නිපදවන ලදහයි කිසිවෙක් කියති. පිළිගැණීමට සැහෙන කිසිද හේතුවක් නොපෑණෙන බැවින් එය මතිමාත්‍රයකැයි කියයුතුයි.

බුද්ධඝොෂ- ධම්මපාලාචාර්‍ය්‍යවරයන්ගෙන් මේ උපසේන ආචාර්‍ය්‍යවරයෝද අතිශයින් තියුණු නොපැකිලෙන ඥාන ශක්තියක් ඇති විශාරද පඬිවරයෙකැයි කියති. මේ එකම නිදෙස අටුවාවෙනුත් එය පැහැදිලිවන්නේයි. මේ අටුවාව හැර මූන්වහන්සේගේ අන්‍ය කෘතියක් ගැණ අපවිසින් නො අසන ලදී.

මේ නවීනාර්ථකථාකර්තෘවරයන් පස් දෙනා වහන්සේ අතුරෙන් බුදුගොස් මාහිමියන් අර්ථකථාකරණයෙහි දක්ෂතාභිෂෙක ඇත් තෙකු බව කාගෙත් පිළිගැණීමයි. මූන්වහන්සේ ද බොහෝ සෙයින් තදනුගාමිවූ දෙවන අඩකයට ගැණෙන ධම්මපාල හිමි යෝද සෙසු අර්ථකථා හා සම්බන්ධ තාවක් ඇතිකෙරෙමින් හේතු සාධක දක්වූහ. සංස්කෘත ග්‍රන්ථාගත අලඞ්කාර ක්‍රමයන්ට අනුකූල බවක් දක්වමින් විස්තර වර්ණනා ප්‍රකාශ කළහ. අනෙක ශාස්ත්‍ර විෂයයන්හි පටුත්වය හඟවමින් බැහැරින් ගත් ඓතිහාසික කරුණු වලින් ද තත්කාලිකසිද්ධි හා විවාද වලින්ද සවකීය අර්ථ කථා පොෂණය කොළෝය. එහෙයින් මෙතුමන්ගේ අර්ථකථාවලින් ධර්ම ඥානය සමග නෙයෙක් කරුණු අතින් වැදගත් උසස් සාමාන්‍ය දැනීමක්ද ඇති වන්නේය.

බුද්ධදත්ත-මහානාම-උපසේන ආචාර්‍ය්‍ය වරයන් විසින් එබඳු වර්ණනා ක්‍රම එතරම් දුරට ගරුකළබවක් නොපෙණේ. බුද්ධ දත්ත හිමියෝ අතිරේක කරුණු වලින් තොරව -බැහැරට අත දිගු නොකොට තමන්ගේ අර්ථ කථා වර්ණනය සම්පාදනය කළෝය. සෙසු දෙනමත් එසේය. මහානාම හිමියන් විසින් සෙසු අර්ථ කථා හා කිසියම් සම්බන්ධයක් ඇතිකරණ ලද නම් එය ඉතාමත් කෙටියෙනි. උපසේන හිමියන් විසින් කිසියම් ආචාර්‍ය්‍යවාදයක් දක්වනලද නම් එය අතියත්නෙන් වැදගත් පැරණිවූ එකෙකි. මෙ කිසිවෙක් තත්කාලික සිද්ධි හෝ ඓතිහාසික සාධක ඇතුලත් නොකළහ.

මේ වෙනස අනුව කල්පනා කරණ කල බුද්ධඝොෂ ධම්මපාල ස්වාමි පාදයන්ගේ අර්ථකථා එක් අයුරකිනුත් බුද්ධදත්ත-මහානාම-උපසේන ස්වාමිපාදයන්ගේ අර්ථකථා අන් අයුරකිනුත් සම්පාදිත බව සිතිය හැකිය. පසුව කී තුන් දෙනා වහන්සේ විසින් සම්පාදනය කරණ ලද්දේ එක් එක් අර්ථකථාවක් වූවද එතුමන් අනුගමනය

කල ක්‍රමය වටහා ගැණීමට එයින් බාධාවක් නොමැතියි. මේ විශේෂයෙනුත් පෙණීයන්නේ පූර්වාර්ථකථාවල නො ආ බොහෝ දේ බුද්ධඝොෂ-ධම්මපාල හිමිවරයන් ස්වකීයාර්ථකථාවලට වැඩි වශයෙන් එක්කල බවෙකි.

මේ පස් දෙනා වහන්සේ හැර අන් කිසි අර්ථකථාචාර්‍යවරයකු එවකට සිටි බවක් ප්‍රකට නොවන නමුත් ඇතැම් සාක්ෂ්‍ය අනුව නොසිටියහයි නොකිය හැකිය. ධම්මපදට්ඨකථාව බුදුගොස් හිමියන් විසින්ද අපදානට්ඨකථාව ධම්මපාල හිමියන් විසින්ද කරණ ලදැයි කියන නමුත් මේ පස්දෙනා වහන්සේගේම කෘත්‍යයනට වඩා වෙනසක් හඟවන ඒ මේ ග්‍රන්ථයෝ අන්‍යතරාචාර්‍යවරයකුගේ කෘති බවට සාක්ෂ්‍ය දෙති. ග්‍රන්ථදෙක බොහෝ කරුණු වලින් එකිනෙකට සමාන හෙයින් එකකර්තෘක බවක්ද පහල කෙරෙයි.

උදාන-ථෙරගාථා අටුවාවලින් ධම්මපාල හිමියන් කියන ධම්මපදවර්ණනාය වනාහි වර්තමානයෙහි පවත්නා පාලි අටුවා කථාව නොවේ. සෙසු ආචාර්‍යවරයන් විසින් එය හා අපදාන අටුවාව ගැණ එබඳු සඳහනක් වත් නොකරණ ලද්දේය. එතුමන් මේ අර්ථකථා දෙක ගැණ වැඩි සැලකීමක් නොකල බවක් නොවේ නම් ඒ තාක් පාල්‍යර්ථකථාවශයෙන් සම්පාදනය නොවූ බවක් එයින් හැඟෙන්නේය.

ජාතකාර්ථකථාව බුද්ධඝොෂහිමියන්ගේ කෘතියෙකැයි බොහෝ දෙනෙකුගේ පිළිගැණීම වුවත් එයද එතුමන්ගේ සෙසුග්‍රන්ථවලට වඩා වෙනස් බවක් හඟවන්නෙකි. එක් ආචාර්‍යවරයෙකු පමණක් නොව කීපදෙනෙකුන් විසින් වරින් වර කරණ ලද සම්පාදනයකැයි කීමට ද සාක්ෂ්‍ය එහි සුලභය.

පෙටකොපදෙසට්ඨකථාව ධම්මපාලහිමියන්ගේ කෘතියෙකැයි අසන ලද නමුත් ග්‍රන්ථය අපවිසින් නොදන්නා ලද්දක් හෙයින් කිසිවක් නොකිය හැකිය. මේ කරුණු අනුව හැඟෙන්නේ මුලින් කී උතුමන් හැර ඒ කාලයෙහි හෝ ඊට සමීප කාලයෙහි ප්‍රකට නොවූවත් තවත් අර්ථකථාචාර්‍යවරයන් සිටි බවයි. සුත්තසඞ්ගහට්ඨකථා- චතුභාණවාරට්ඨකථාදිය කල අරියවංස ආනන්ද වනරතනාදී සමීප අතීතයෙහි සිටි ආචාර්‍ය වරයෝ ධම්මසංග්‍රහ සම්පාදකයන් වශයෙන් සලකා මෙහි නොදක්වන ලදහ. ධම්මසඞ්ගහට්ඨකථාවක් ගැණ පඤ්චප්පකරණට්ඨකථාවෙහි (ති: මූ: 36 පිට) කියන නමුත් කුමක්ද යනු අවිනිශ්චිතය.

පාලි අට්ඨකථා හා තත්සම්පාදකයන් පිළිබඳ මේ නිදේශයයි.

## විනය පිටකය.

| පාලි | අට්ඨකථා | සම්පාදකයෝ |
|---|---|---|
| පාරාජික පාළිය<br>පාචිත්තිය ,,<br>චුල්ලවග්ග ,,<br>මහාවග්ග ,,<br>පරිවාර ,, | සමන්තපාසාදිකා<br>( විනය මහාඅට්ඨකථා ) | බුද්ධඝොෂ ස්වාමි. |
| පාතිමොක්ඛ | කඞ්ඛාවිතරණී | ,, |

## සුත්තන්ත පිටකය.

| පාලි | අට්ඨකථා | සම්පාදකයෝ |
|---|---|---|
| දීඝනිකාය | සුමඞ්ගල විලාසිනී | බුද්ධඝොෂස්වාමි |
| මජ්ඣිමනිකාය | පපංචසූදනී | ,, |
| සංයුත්තනිකාය | සාරත්ථප්පකාසිනී | ,, |
| අඞ්ගුත්තරනිකාය | මනොරථපූරණී | ,, |
| ඛුද්දකනිකාය:– | | |
| ඛුද්දකපාඨ | පරමත්ථජොතිකා | ,, |
| සුත්තනිපාත | ,, | ,, |
| ජාතක | ,, | (?) |
| ධම්මපද | ,, | (?) |
| උදාන | පරමත්ථදීපනී | ධම්මපාල ස්වාමි |
| ඉතිවුත්තක | ,, | ,, |
| විමානවත්ථු | ,, | ,, |
| පෙතවත්ථු | ,, | ,, |
| ථෙරගාථා | ,, | ,, |
| ථෙරීගාථා | ,, | ,, |
| චරියාපිටක | ,, | ,, |
| නෙත්තිප්පකරණ | නෙත්තිප්පකරණට්ඨකථා | ,, |
| නිද්දෙස | සද්ධම්මපජ්ජොතිකා | උපසේන ස්වාමි |
| පටිසම්භිදා | සද්ධම්මප්පකාසිනී | මහානාම |
| බුද්ධවංස | මධුරත්ථප්පකාසිනී | බුද්ධදත්ත |
| අපදාන | විසුද්ධජන විලාසිනී | (අවිනිශ්චිතයි) |
| පෙටකොපදෙස | පෙටකොපදෙසට්ඨකථා | ,, |

## අභිධම්ම පිටකය.

| | | |
|---|---|---|
| ධම්මසඞ්ගණී | අත්ථසාලිනී | බුද්ධඝොෂස්වාමි |
| විභඞ්ග | සම්මොහවිනොදනී | ,, |
| කථාවත්ථු<br>පුග්ගලපඤ්ඤත්ති<br>ධාතුකථා<br>යමක<br>පට්ඨාන | පරමත්ථදීපනී<br>(පඤ්චප්පකරණට්ඨකථා) | ,, |

---

## අට්ඨකථා පරීක්ෂණය.

—:—

වර්තමාන අට්ඨකථාවන්හි ඇතැම් කථා ප්‍රවෘත්ති එකිනෙකට සම නොවනසේ පෙණේ. ඉන් කිසිවක් මෙහි දක්වෙන්නේ ධර්මධාරීන්ගේ පරීක්ෂණයට හා ආධුනිකයන්ගේ විශෙෂාවබොධයට හේතු වන පිණිසය.

**දීඝීති කොසල ජාතකය:-** බුදුරදුන් වහන්සේ මේ ජාතක ධර්මය දෙශනා කරණ ලද්දේ කොසැඹෑ නුවර කලහ කාරකයන් තමන්වහන්සේ සමා කරවා ගැණීමට පැමිණි කාලයේදීය යනු ජාතක අටුවාවේ කියන ලදී. “ඒ කලහ කාරකයන් දෙව්රමට අවුත් සමාව යදින කල්හි බුදුන්වහන්සේ ඔවුන් අමතා මෙසේ වදාළසේක. “මහණෙනි! තෙපි මාගේ ඖරස පුත්‍රයෝය, පුත්‍රයන් විසින් පියාගේ අවවාද බිඳින්නට නොවටී. තෙපි මාගේ අවවාද නොපිළි ගත්තාහුය. පෞරාණික පණ්ඩිතයෝ ස්වකීය මවුපියන් මරා රාජ්‍යය පැහැර ගෙණ සිටි සොරහු තැළයේදී අතට පත්වූ කල්හිද මවුපියන්ගේ අවවාදය නොබිඳින්නෙමියි කියා නො මැරුවාහුය” යනු එහි පෙණෙන පරිදිය. (ජාතකට්ඨකථා ත්‍රි: මූ: තෘතීය භාග 147 පිට.)

දම්පියාටුවා කොසම්බක වස්තුවෙහි පෙණෙනුයේ එයට පෙර බවයි. මේ එහි පෙණෙන පරිදිය. “දීඝීති කොසල ජාතකය ආදී ජාතක කථා කීපයක්ම වදරා භික්ෂූන් සමගි කරණු නො හැකිව ඔවුන්ගේ නොසන්හුන්කම බල බලා සිටිනු නොහැකිව පාරිලෙය්‍ය වනයට වැඩ වස්වසා ආපසු වැඩි කල කලහ කරුවෝ පැමිණ සමාව ඉල්වූහ’ යනුයි. (ධම්මපදට්ඨකථා ත්‍රි: මූ: 32 පිට.)

මේ ග්‍රන්‍ථ දෙකින් බුදුරදුන් මේ ජාතකය දෙශනා කරණ ලද්දේ පාරිලෙය්‍ය වනයෙහි වස් විසීමෙන් පසුවයයි ජාතක භාණක යන් විසින්ද ඊට පෙරටුව යයි ධම්මපද භාණකයන් විසින්ද කියන ලද බව හැගේ. කවර අවස්ථාවකදී දෙශනා කළැයි කිවද වරදක් නැති නමුත් උසස් අර්ථකථා දෙකෙක පෙණෙන මේ සුළු වෙනස පවා සාමාන්‍ය ධර්ම ගවේෂකයකුගේ ප්‍රස්ථලනයට හේතුය. මොහු ප්‍රථම සඞ්ගීති කාරක උතුමන්ගේ කෘතීහු නම් මෙබඳු වෙනස් ඇති වනු පුදුමයෙකි. කුමක් නමුත් සත්‍යය මින් එකක්ම විය යුතුය. අර්ථකථා නම් ප්‍රකීර්ණක දෙශනා මිස අන් කිසිවක් නො වේයයි. මෙබඳු කරුණු අනුව කෙසේ නිශ්චය කළ හැකිද?

මෙවැනි විෂමස්ථාන ගැණ මධ්‍යස්ථව කල්පනා කරණ කෙනෙකුට හැඟෙන්නේ මේ කථා වස්තු පශ්චාත්කාලික ආචාර්‍ය්‍යවරයන් විසින් අනුමෙයබුද්ධියෙන් සම්පාදිත වාර්තා බවයි. මේ සඳහා ධම්ම පද භාණකයන්ගේ කථාවට වඩා ජාතක භාණකයන්ගේ කථාව පිළිගැණීම යුක්ති සහගතයයි හැඟෙන නමුත් එකක්වත් නො පිළි ගත යුතුයයි කීමට අවකාශයක් නොමැතියි.

**සාමාවතියගේ කථාව:–** උදේනි රජුගේ අග බිසවුන් අතු රෙන් මාගන්දිය බැමිණි බුදුරදුන් වහන්සේ කෙරෙහි කරණ ලද ආඝාතය නිසා බෞද්ධොපාසිකාවක්වූ සාමාවතිය කෙරෙහිද වෛර බැන්දය. උදේනි රජ තෙමේ ඒ ඒ අග බිසවුන් සිටින තන්හි සත් සත් දවස වෙසෙයි. සාමාවතිය මැරීමට උපක්‍රමයක් යොදන මාගන්දිය බැමිණි රජු තමන් සිටි තැනට අවුත් යන කල රජුගේ හස්ති කාන්ත වීණාවෙහි ඡිද්‍රයෙන් කෘෂ්ණ සර්පයකු බහා ඡිද්‍රය වසා තබා "මහ රජ සාමාවතිය ශ්‍රමණභවත් ගෞතමයන් කෙරෙහි බැඳුන සිතැත්තියකි. ඔබවහන්සේ ගණනකට නො ගණී. ඒ නිසා පරිස්සම් විය යුතුය"යි රජහට අවවාද කළාය.

රජ තෙමේ සාමාවතියගේ පහයෙහි සත්දවසක් ගතකොට යළිත් මාගන්දිය සිටි තැනට පැමිණියේය. මාගන්දිය "කිමෙක්ද? මහරජානෙනි, සාමාවතිය ඔබවහන්සේට අනතුරයක් කරණු පිණිස අවකාශයක් නොලද්දීදැ"යි අසමින් පිළිසඳර කථාවෙන් යුතුව සිටින්නී ප්‍රමාදයක් බලා වීණාඡිද්‍රයෙන් සර්පයා බැහැර කොට සාමාවතියට හා රජුටත් බැණ වැදුනාය." (මනොරථ පූරණී ත්‍රි: මු: 239 පිට.) මෙහි කියන පරිදි සර්පයා මුදන ලද්දේ මාගන්දියගේ ප්‍රාසාදයේදීය.

ධම්මපියාටුවාවෙහි (ත්‍රි: මු: 108 පිට.) පෙණෙනුයේ මාගන්දිය බැමිණි රජුත් සමග සාමාවතියගේ පහයට ගොස් එහිදී සපියා මුදහල බවයි. දෙපොතෙහි මේ කථාව පිළිබඳව තවත් විසදෘශකථානයෝ ඇත්තාහ. මේ කථාවම විසුද්ධිමග්ග ඉද්ධිවිධ නිද්දෙසයෙහි (මුද්‍රිත 294 පිට ) දක්වෙන්නේ මෙසේය.

සාමාවතිය නම් උදේනි රජුගේ අගමෙහෙසියයි මාගන්දිය බමුණු තමාගේ දූවූ මාගන්දියට අගබිසෝ තනතුර ප්‍රාර්ථනා කරන්නේ සාමාවතියගේ වීණායෙහි සපියකු බහා "මහරජ, සාමාවතිය තොප මරණු කැමැත්තී වීණාවෙන් සපියකු ගෙණ හැසිරෙන්නී ය"යි රජුට කීයේය. රජතෙමේ ඒ දක කිපියේ 'සාමාවතිය මරන්නෙමි"යි දුන්නෙහි විස පෙවූ හීයක් යොද විදින්නට සැරසුනේය. පිරිවර සහිත සාමාවතිය රජුට මෛත්‍රිය පැතිරවූවා. රජතෙමේ හීය විදින්නට හෝ බැහැර කරන්නට නොහැක්කේ කම්පිතවෙමින් සිටියේය. එවිට සාමාවතිය "කිමෙක්ද? මහරජතෙනි, කලාන්ත වන්නහුද?"යි අසා "එසේය කලාන්ත වෙමි"යි කීකල "එසේ නම් දුන්න බහා තබව"යි රජුට කීවාය. හීය රජුගේ පාමුල හිති "මහ රජ, නිවැරදි තැනැත්තහුට වරද නො කට යුතුය"යි ඕතොමෝ රජුට අවවාද කලා. යනුයි. ධම්මපියාටුවාවේ පෙණෙන කථාශරීරයට වඩා මෙහි වෙනස් කම් බොහෝය.

මේ ග්‍රන්ථ තුණම බුද්ධඝොෂ හිමියන්ගේ කෘතීහු ය යි කියති. ධම්මපියාටුවාව කෙසේ වෙතත් සෙසු ග්‍රන්ථ දෙක නම් එතුමන්ගේ කෘතීන් බවට සැකයෙක් නො මැතියි. විශුද්ධිමාර්ගය පූර්වාර්ථකථා අලලා බලා සවීය ප්‍රතිභානය අනුව කල ග්‍රන්ථයක් මිස අර්ථකථා පරිවර්තනයෙක් නො වේ. එයට මේ කථාප්‍රවෘත්තිය කොතනින් ගන්නා ලද්දේ දැ යි සෙවූ නමුත් සොයාගණු නො හැකි වි ය. මෙය එතුමන් අමුතුවෙන් කල ග්‍රන්ථයක් නොව කිසියම් තැනෙක දුටු විස්තරයක් අනුව කල සටහනෙකැයි සිතිය හැකියි. නො එසේ නම් මෙය යෙදිය යුත්තේ මනොරථපූරණියට හෝ ධම්මපියාටුවාවට අනුව ය.

ප්‍රථම සඞ්ගීති කාරක උතුමන් මේ සම්බන්ධ කිසියම් විනිශ්චයක් කරණ ලද නම් එයට සමීපකාලයෙහි සිදුවූ මේ සිද්ධිය ගැණ නිරවුල් විස්තරයක් දක්වනු එකාන්ත ය. ප්‍රවෘත්ති තුණෙන් සත්‍යය එකක් ම විය යුතු නමුත් එකක් වත් අසත්‍ය ය යි කීමට අපට ශක්තියක් නො මැති යි. ආචාර්ය වාදයන්ගේ අසම්බන්ධය මිස කරුණුවල කිසි අසම්බන්ධයක් නො පැණෙන හෙයිනි.

**හඬ සතර:-** සංයුත්තකාර් වණ්ණනා සගාථක වර්ගයෙහි (ත්‍රි: මූ: 248 පිට.) මූළු මහත් දඹදිව පතළ හඬ සතර දක්වෙන්නේ මෙසේ ය. පූර්ණ නම් යක්ෂ සෙනාධිපතියා දූකෙළියෙන් ධනඤ්ජය කොරව්‍ය රජු දිනා අපොළා "මම දිනිමි"යි කී හඬද, සක්දෙව් රජ කසුප් බුදුරජුන්ගේ ශාසනය පිරිහෙනු බලා විස්කම් දෙව් පිත් සුනඛ වෙස් ගන්වා ගෙණවුත් "මම ලාමක භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවන් හා සියලු අධර්මවාදීන් කමි"යි ඔවුන් ලවා කරවූ හඬද, කුසජාතකයෙහි පභාවතිය හේතුකොට ගෙණ සත් රජුන් නුවර අවුරා සිටිකල පභාවතියත් සමග ඇතකු පිට නැගී නුවරින් නික්ම "මම කුසරජ වෙමි"යි කී හඬද, කෛලාස මුදුනෙහි සිට අලව්යක් "මම ආලවක යක්ෂයා වෙමි"යි කී හඬද යන සතරය.

ජාතකාර් කථාවේ (ත්‍රි: මූ: චතුර්භාග 179 පිට) ඒ සතර දක් වෙන්නේ විධුර ජාතකයෙහි පූර්ණ නම් යක් රජුගේ හඬ, කුසජාතක යෙහි කුසරජුගේ හඬ, මහාකණ්හ ජාතකයෙහි සුනඛයාගේ හඬ හා භූරිදත්ත ජාතකයෙහි සුදස්සන නා රජුගේ හඬද යන සතරය. එහි අලව් යකුගේ හඬෙක් නැති. ඒ වෙනුවට පෙණෙනුයේ සුදස්සන නා රජුගේ හඬෙකි සංයුත් අටුවාවේ එබන්දක් නැත්තේය.

ජාතක භාණකයෝ මේ සිවුහඬ අතීත ජාතක කථාවලින් ම ගළපාලූහ. සංයුත්ත භාණකයෝ ජාතක භාණකයන් කී හඬ සතරෙන් එකක් වූ සුදස්සන නා රජුගේ හඬ අමතක කිරීමෙන් හෝ නො සලකා හැරීමෙන් ඒ හා සමාන විසමය ජාතක හඬක් වූ වර්ත්තමානික අලව් යකුගේ හඬ ඒ වෙනුවට යොදගත්හ. සංයුත්ත භාණකයන්ගේ කථාවට වඩා ජාතකභාණකයන්ගේ කථාවෙහි යුක්තියක් පෙණෙන නමුත් දෙමතය ම ගරුකළ යුතුය.

**කුමුදුප්පලානීත කථාව:-** පසේ නදි කොසොල් රජු නාග රික කාන්තාවක් කෙරෙහි කාමයෙන් බැඳී ඇයගේ ස්වාමියා මරා ඇය ලබාගණු පිණිස කිසියම් උපායක් යෙදී ය. එදින රෑ නෙරයික යන් සිවුදෙනකු ලොහොකුම්බු නරකයෙහි සිට කරණ ලද හඬ සතරක් සිහිනෙන් අසා බිය පත්ව උදේ පෙරෙවි බමුණාගෙන් එහි විපාක විචාළ කල්හි කිසි විපාකයක් දක්ත ගණු නො හැකිවූ බමුණන් ලාභ පිණිස එකසතයාග යක් කරන්නට කියන ලදැයි ධම්මපදටඨ කථාව (ත්‍රි: මූ: 217 පිට.) කියයි.

සාරත්ථප්පකාසිනියෙහි (ත්‍රි: මූ: 112 පිට) පෙණෙනුයේ සවපන යෙන් විපාකයක් නැති බව දත් බමුණන් ලාභ පිණිස පඤ්චසත යාගයක් කරන්නට කී බවයි එකෙක ඒකසතයාගයෙකි. අනෙ කෙහි පඤ්චසත යාගයෙකි. එකෙක සිහිනෙහි විපාක දත ගණු නො හැකිවූ බව කියති. අනෙකෙහි සිහිනෙහි විපාකයක් නැතැයි කී බව දක්වති.

සිහිනෙහි විපාක දතගණු නො හැකිවියයි කීම හා විපාකයක් නැතැයි කීම ඒකදෙශයකින් සමාන ය. බමුණන් විසින් කරන් නට කියේ ඒකසතයාගයක් ද නැතහොත් පඤ්චසතයාගයක් දැයි නිශ්චය කරණු නො හැකිය. ක්‍රියාවෙහි එකක් වත් නො යෙදුන නමුත් සමහර විට මේ දෙමතයම බමුණන් අතර කථා කෙරෙන්නට ඇත. උසස් ග්‍රන්ථ දෙකෙක දෙපරිද්දකින් දක්වන ලද්දේ එහෙයින් විය යුතුය.

**අනේපිඩු සිටුහුගේ හා විසා උවැසියගේ දානය:-** අනේ පිඩු සිටුහුගේ ගෙහි නිතර පණවන ලද අසුන් පන්සියයක් හා පන්සිය දෙනෙකුන් වහන්සේ දින පතා දන් වලඳන බව සුමඞ්ගල විලාසිනි යෙහි (ත්‍රි: මූ: 214 පිට.) හා ජාතකාර්‍ථ කථාවෙහි ද (ත්‍රි: මූ: චතුර්‍ථභාග 152 පිට.) කියන ලදී. ධම්මපදාර්‍ථකථාවෙහි (ත්‍රි: මූ: 166 පිට.) පෙණෙනුයේ විසාඛාවගේ ගෙහි අනේපිඩු සිටුහුගේ ගෙහි මෙන් භික්ෂූන් දෙදහසක් දිනපතා දන් වලඳන බව ය. එහි ම තවත් තැනෙක මෙසේ ද පෙණෙයි. (ත්‍රි: මූ: 77 පිට.) භික්ෂූහු දෙදහ සෙක් අනේ පිඩු සිටුහුගේ ගෙහි දිනපතා වලඳති විසාඛා– සුළු අනේ පිඩු– සුප්පවාසාවන්ගේ ගෙවල දිනපතා වලඳන්නේ පන් සියක් දෙනා වහන්සේය යනුයි.

අනේපිඩු සිටුගෙහි නිති වලඳන්නෝ දෙදහසෙක යන්න ධම්මපද භාණකයන් මිස සෙස්සෝ නො කියති කුමක් නිසා ඔහු මෙසේ අභිනවම කියද්දැයි නො සිතිය හැකියි. කෙසේ නමුත් විසාඛාවගේ ගෙහිත් වලඳන්නෝ එපමණෙකැයි එක් තැනෙක කියන ලද්දේ ඔවුන්ගේ හෝ ග්‍රන්ථ ලේඛකයන්ගේ ප්‍රමාදයෙන් විය යුතුයි. නො එසේ නම් එක් ඇදුරු පරපුරකට අයත් භික්ෂූන් අතරත් මතභෙද පහළ විය හැකි නමුත් 'කෙචිත් වාදය' යි විශෙෂයක් නො කොට එකම ග්‍රන්ථයක මෙසේ නො දක් වති. ඒ දෙතැන වලඳන සඞ්ඛ්‍යාවෙහි කලින් කල වෙනසක් වූයේ නම් ග්‍රන්ථසම්පාදකයන් විසින් ඒ බව දැක් විය යුතුය. එබඳු විශෙෂයක් කිසි තැනෙක නො කියන ලද්දේය.

**නන්ද කුමාරයන්ගේ පැවිදිවීම:-** බුදුන් වහන්සේ කිඹුල් වතට වැඩි දෙවන දිනයෙහි රාහුල මාතාවන් දර්ශනය කළ බවද එදිනම නන්ද කුමාරයන් පැවිදි කළ බව ද සමන්තපාසාදිකා විනයාර්ථ වර්ණනාවෙහි (මුද්‍රිත 187 පිට.) කියන ලදී. ධම්මපදාර්ථකථාවෙහි (ත්‍රි: මු: 59 පිට) එනුයේ **"සත්ථා කපිලපුරං ගන්ත්වා තතිය දිවසෙ නන්දං පබ්බාජෙසි."** ශාස්තෘන් වහන්සේ කිඹුල්වතට වැඩ තුන්වන දිනයෙහි නන්දයන් පැවිදි කළ සේක. යනුවෙනි.

නන්ද කුමාරයන් පැවිදි කරණ ලද්දේ මේ දෙදිනෙන් එක් දිනෙක ම ය. විනිශ්චය කළ යුත්තේ කිඹුල්වතට වැඩි දෙවනදාද නැතහොත් තුන්වනදා ද යන්නයි. ටීකාචාර්යයෝ ද මේ වෙනස දක්වන ලද නමුත් විනිශ්චයක් නො කළහ. විනය අටුවාවට වැඩි සැලකීමක් දක්වා දම්පියාටුවා පාඨය වෙනස් කරන්නට හෝ **"දුතිය දිවසෙ"** යන්න ප්‍රමාදයෙන් **"තතිය දිවසෙ"**යි ලියන ලද යයි කියන්නට හෝ නො හැකිය. පෙර සිට පැවතෙන්නක් හෙයිනි. දෙවන දිනෙහි කැටුව ගොස් තුන්වන දිනෙහි පැවිදි කරණ ලද නම් මෙහි වෙනසක් නැත්තේය.

**කුමාර කාශ්‍යපයන්ගේ රහත්වීම හා තනතුරු ලාභය:-** මනෝරථපූරණී එතදග්ග පාලි වර්ණනයෙහි හා අපදාන පාලි යෙහිත් පෙණෙනුයේ මූන්වහන්සේ රහත්වූවාට පසුව පායාසි රජු දමනය කිරීම නිසා චිත්‍රකපිකයන්ට අගතනතුරු ලත් බවයි. ජාතකාර්ථ කථාවෙහි (ත්‍රි: මු: 135 පිට.) **"ථෙරො පච්ඡා වම්මිකසුත්තෙන අරහත්තං පාපුණි"** යනුවෙන් උන්වහන්සේ තනතුරු ලැබූවාට පසුව වම්මික සූත්‍ර දේශනාවෙන් රහත්වූ බව කියන ලදී.

එසේම පායාසි රජු දමනය කිරීම සම්බන්ධවද මත භේදයක් පෙණේ. මනෝරථපූරණීයෙහි (ත්‍රි: මු: 159 පිට) පෙණෙන්නේ තනතුරු ලැබීමට පෙර පායාසි රජු දමනය කළ බවයි. විමානවත්ථු අට්ඨකථාවෙහි (ත්‍රි: මු: 266 පිට) **"සත්ථරි පරිනිබ්බුතෙ ආයස්මා කුමාරකස්සපො පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං සෙතව්‍යනගරං සම්පත්තො. තත්ථ පායාසි රාජඤ්ඤං අත්තනො සන්තිකං උපගතං විපරීගාහතො විවෙචෙත්වා සම්මාදස්සනෙ ඨපෙසි."** ශාස්තෘන් වහන්සේ පිරිනිවි පසු ආයුෂ්මත් කුමාර කාශ්‍යප ස්ථවිර යන් වහන්සේ පන්සියයක් භික්ෂූන් හා සමග සෙතව්‍ය නුවරට පැමිණියේ තමන් වහන්සේ ලඟට එළැඹි පායාසි රජ මිසදිටු බැවින් මුදා සම්‍යක් දර්ශනයෙහි තුබූසේක. යනුවෙන් මූන්වහන්සේ පායාසි සූත්‍රය දෙසුවේ බුද්ධ පරිනිර්වාණයට පසුව බව කියන ලදී.

මෙහි විසඳිය යුත්තේ මුන්වහන්සේ චිත්‍ර කපිකයන්ගේ අග්‍ර ස්ථානයට පත් කරණ ලද්දේ රහත්වීමට හා පායාසි රජ දමනයට පෙරටුවද නැතහොත් පසුවද යන්නයි. ජාතක භාණකයන්ගේ පසුවය යන මතයට වඩා අඞ්ගුත්තර භාණක යන්ගේ තිගමනය පරිදි තනතුරු ලාභයට පෙර රහත්වී පායාසි රජු දමනය කරණ ලදයි කීම යුක්තිසහගත සේ පෙණේ. අපදාන පාලියෙහි කියන ලද හෙයිනි. සෙසු අර්ථකථාවල එන විස්තර අනුවද කියයුත්තේ එසේය. සම්බුද්ධපරිනිර්වාණයෙන් පසුව පායාසි රජු දමනයකල බවක් විමානවත්ථු අට්ඨකථාවෙන් ස්ඵුටව කියන නමුත් අන්කිසිවක එබන්දක් නොකියති: එහෙයින් එය අන්කරුණක් සඳහා කියන ලද්දක් නොවේ නම් ප්‍රමාද පතිතයෙකැයි සිතිය යුතුයි.

**කුණ්ඩල කෙසි වස්තුව :–** මනොරථ පූරණී (ත්‍රි: මූ: 203 පිට.) කුණ්ඩල කෙසී වස්තුවෙහිදී දෙශනා කළසේකැයි දක්වෙන

**සහස්සමපි චෙ ගාථා අනත්ථපදසංහිතා,**
**එකං ගාථාපදං සෙය්‍යො යංසුත්වා උපසම්මති.**

යන ගාථාධර්මය දම්පියාටුවාවේ පෙණෙන්නේ දරුචිරිය වස්තුවෙහිදී දෙශනා කළ බවය. අඞ්ගුත්තරට්ඨ කථාවෙහි දරුචිරිය වස්තුවේ දෙශනා කෙළේයයි දක්වන්නේද ඒ මය. ධම්මපදට්ඨ කථාවෙහි.

**යො ච ගාථාසතං භාසෙ අනත්ථපද සංහිතා,**
**එකං ගාථාපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති.**

යන ගාථාව කුණ්ඩලකෙසී වස්තුවෙහිදී දෙශනා කළ බව කියන ලදී. මනොරථපූරණියෙහි එබන්දක් නැති.

සමෘතිවිප්‍රවාසයෙන් කිසි යම් ප්‍රමාදයක් වියහැකි නම් පුහුදුන් කවරෙකුට නමුත් එසේ වීමට මෙය පහසු තැනෙකි. ගාථාදෙක බොහෝ සෙයින් එකිනෙකට සමානය. ටීකාචාය්‍ර්‍යයෝද මේ භේදය කල්පනා කළ නමුත් විනිශ්චයක් දීමට මැලිවූහ. අඞ්ගුත්තර භාණක යන් මෙසේ කියනලද්දේ විශෙෂ කාරණයක් සලකා ගෙණ නොවේ නම් ඊට වඩා ධම්මපදභාණකයන්ගේ මතය ගරුකල යුතුය.

**ඥානනායුෂ්‍ය :–** ප්‍රතිවේධ ඥානය පවත්නා කාලපරිච්ඡේදය පිළිබඳව පෙණෙන මතභෙදය මෙසේය. ප්‍රතිසම්භිදා ප්‍රාප්තයන්ගේ වශයෙන් දහසක්ද අනාගාමීන්ගේ වශයෙන් දහසක්ද සකෘදාගාමීන්ගේ වශයෙන් දහසක්ද ශ්‍රොතාපන්නයන්ගේ වශයෙන් දහසක් දැයි ප්‍රතිවෙධ ඥානය වශී පන්දහසක් පවත්නා බව සමන්තපාසාදිකාවෙහි (මුද්‍රිත 750 පිට.) කියන ලදී.

දීඝනිකායාඨකථාවෙහි දක්වෙන්නේ මෙසේ ය. ප්‍රතිසම්භිදා ප්‍රාප්තයන්ගේ වශයෙන් දහසෙකි. ෂඩභිඥාප්‍රාප්තයන්ගේ වශයෙන් දහසෙකි. ත්‍රිවිද්‍යාප්‍රාප්තයන්ගේ වශයෙන් දහසෙකි. ශුෂ්ක විදර්ශකයන්ගේ වශයෙන් දහසෙකි. ප්‍රාතිමොක්‍ෂයාගේ වශයෙන් දහසෙකි. සංයුත්ත-අඞ්ගුත්තර-අටුවාවන්හි ද මෙසේ එකිනෙකට විරුඞ සේ කියනලදී.

බුදුරදුන්වහන්සේ ශාසනය වර්‍ෂපන්දහසක් පවත්නේ ය යි වදාළ නමුත් මෙසේ මෙසේ ඒ පන්දහස ගතවන්නේ ය යි නොවදාළේය. **"අට්ඨකථා හි පාලිමුත්තකා විනිච්ඡයො."** අටුවා නම් පාලි මුත්තක විනිශ්චය යි. නොහොත් පාලියෙහි ආදෙයින් නොආදේ ප්‍රමාණ කර ගැණීම ය යි විමතිවිනොදනියෙහි කිවාක්මෙන් පූර්‍වාචාර්‍ය්‍යවරයන් විසින් අනුමෙයබුද්ධියෙන් ඒ වර්‍ෂපන්දහස බෙදා මේ වෙන් කළ සැටිය. ඔවුනොවුන්ට හැඟුන හේතු යුක්ති අනුව දක්වීම නිසා දෙමතයක් ඇතිවිය.

**සංකිච්චකිච්චයන්ගේ උත්පත්තිය**:- මූත්වහන්සේගේ මව මළායින් පසු සෑයෙහි දවෙද්දී සෙසුමස් ද ගැබ්මස ශෙෂව තිබෙනු දුටු මිනිසුන් ඒ කොටස කිමට ගෙණ හුල්වලින් හැන අඟුරු මත් තෙහි දමා ගිය පසු ඒ ගැබ්මස ද දැගියෙන් කුමාරයා රන්පිළිමයක් මෙන් අඟුරු මත්තෙහි සිටි බවත් ඒ දුටු මිනිසුන් පුදුමයට පැමිණ කුමාරයා ගෙණ ගිය බවත් දම්පියාටුවාවේ (ත්‍රි: මූ: 326 පිට) කියන ලදී. විශුද්ධිමාර්‍ගයෙහි පෙණෙන්නේ සෑයෙහි දවෙන මළ සිරුරට හුලකින් හැන්න කළ හුල කුමාරයාගේ ඇසේ වැදී ශබ්ද කළ බැවින් ජීවත් වන බව දැන මළ සිරුර සෑයෙන් ගෙණ බඩ පළා කුමාරයා රැගෙණ ගොස් මූත්තනියන්ට භාරදුන් බවය.

විශුද්ධිමාර්‍ගයෙහි දක්වෙන මතය කොතැනින් ගන්නා ලදද යනු ප්‍රකට නැති නමුත් ඒ විස්තරය යුක්තිසහගතසේ පෙණේ. දබ්බ මල්ලපුත්ත-සොපාකයන්ගේ චරිතසමරණයෙන් වූ ආකූලත්වයක් මේ මත දෙකින්ම දක්වෙන්නේය.

ලෞකිකවිද්‍යාවන් පුහුණු කළ- න්‍යාය ධර්‍මයේ සියුම් ක්‍රම නොදත් කිසිවෙකුට මව මළායින් පසු කුමාරයා ජීවත්වූයේ කෙසේද? දලබුවෙන් වැසී සිටියදී ශබ්ද කළේ කෙසේ දැ යි මෙහි දී ප්‍රශ්න කළ හැකිය. මේ කුමාරයා පශ්චිම භවික පුද්ගලයෙකි. එහෙයින් කර්‍මබලයෙන් සියලුඋවදුරු මැඩගෙණ ජීවන ශක්තිය

ලබාගත්තේය. එසේම පූර්වයෙහි මලවුන් දවන්නේ මැරී වැඩි කාලයක් ගතවන්නට මත්තෙනි. හුලෙන් හැනීම නිසා වැදූමසද සිදුරු වන්නට ඇත. ඒ නිසා මේ කරුණු නොසිදුවිය හැකිදේ නොවෙත්.

**මහාකස්සපාදීන්ගේ පූර්ව චරිත:–** කසුබ්බුදුන්ගේ ශාසනය පිරිහෙන කල සාමණේරාදීන්ගේ විප්‍රකාර දැක භික්ෂූහු සත්දෙනෙක් සංවේගයට පැමිණ ශාසනාන්තර්ධානය නොවනතාක් තමනට පිහිටක් කරගත යුතුයයි අරණ්‍යයෙහි එක් පර්වතයකට නැග මහණ දම් කළාහුය. එයින් ප්‍රධාන තෙරුන්වහන්සේ එක් දවසින්ම රහත්වූ සේක.

දෙවන තෙරුන් වහන්සේ ද දෙවනදින අනාගාමී වූහ. සෙසු පස්දෙන විශෙෂයක් උපදවනු නො හැකිව වියලී සත්වන දින කලුරිය කොට දෙව්ලොව උපන්හ. එයින් චුත ව ඔවුනතුරෙන් එක් කෙනෙක් පුක්කුසාති රජ විය. එක්කෙනෙක් කුමාරකස්සප විය. එක් කෙනෙක් දරුචීරිය විය. එක්කෙනෙක් දබ්බමල්ලපුත්ත විය. එක් කෙනෙක් සභියපරිව්‍රාජක විය. මෙය දම්පියාටුවාවේ හා (ත්‍රි: මූ: 313 පිට) මනෝරථපූරණී එතදග්‍රවර්ණනාවෙහි එන පරිදියි.

පපඤ්චසූදනී වම්මිකසූත්‍රවර්ණනාවෙහි පෙණෙනුයේ පර්වතයට නැගි භික්ෂූන් සත්දෙනෙකු නොව පස්දෙනෙකු බවය. දබ්බමල්ලපුත්ත- සභිය පරිව්‍රාජකයන් ගැණ එහි සටහනෙක් නැති. පරමත්තජෝතිකා සභියසූත්‍රවර්ණනාවෙහි (ත්‍රි: මූ: 351 පිට) කියන්නේ පර්වතයට නැගි භික්ෂූන් තිදෙනෙකු ගැණ ය. එහි දැක්වෙන පරිදි එක් නමෙක් රහත් විය. එක් නමෙක් අනාගාමී විය. සභිය පරිව්‍රාජක වූයේ එක් කෙනෙකි. දබ්බමල්ලපුත්තයන් ගැණ හෝ අන්කිසිවකු ගැණ කිසිවක් එහි සඳහන් නොවේ.

මෙහි මතභෙදයක් සේ පෙණෙන නමුත් එබන්දක් නොමැතියි. කිසි තැනෙක කිවයුත්තන් ගැණ පමණක් කීහ. කිසි තැනෙක ඊට සම්බන්ධ සෙස්සන්ගේ නමුත් සඳහන් කළහ. හැම තැනම සියල්ලන්ගේ නම් එකසේ සඳහන් නොකළ බව මුත් නොසිටි බවක් කිසිවෙක් නොහඟිති.

**සභිය පරිව්‍රාජකයන් හා බුදුරදුන් හමුවීම:–** මහාවාදී මිස දිටු සභියයන් බුදුරදුන් හමුවට පැමිණවූයේ කසුබ් බුදුරදුන් කල තමන් හා එකට මහණදම් කොට අනාගාමී ව සුද්ධාවාසයෙහි උපන් බ්‍රහ්මයාය යි සුත්තනිපාතඅටුවා සභියසූත්‍රවර්ණනාවෙහි

කියති. ථෙරගාථාඅටුවා සහියථෙරාපදානයෙහි පෙණෙන්නේ සවකීය මිත්‍ය්‍යාචාරය ගැණ පිළිකුල්කොට ධ්‍යාන උපදවා බඹලොව උපන් මාතෘබ්‍රහ්මයාය කියාය.

සූත්‍රනිපාතඅටුවාමතය සෙසුඅටුවා සමග ගැළපෙන්නේය. මාතෘබ්‍රහ්මරාජයා ය යන මතය කුමක් හෙයින් ඇති වී ද යි සිතීමට කරුණු නොමැතියි.

**පෙසකාර දූවගේ කථාව**:- ''නූල් ටිකක් කැටගෙණ එව''යි කියා ඇගේ පියා පෙසකාරශාලාවට ගියේ ය. ඇය නූල් ගෙණ එන්නී අතර මගදී බුදුරදුන්ගෙන් බණ අසා සෝවාන් ඵලයට පැමිණ මඳක් පමාවී එහි ගියා ය. පියා ඇය පමා වනු දුක සිටගෙණ සිටියේ ම නිද්‍රාවට පැමිණියේ ය. නූල්පැස පියා දෙසට දිගු කරණ කල්හි හිදිඅගෙහි වැදී ශබ්ද නගමින් එය බිම වැටුනේ ය. ඔහු තින්දෙන් පිබිදී වේගයෙන් ඉද්ද හදනා කල එහි සියුම් කෙළවර දූරියගේ ලයෙහි වැදී ඇය එතැනම මැරී වැටුනී ය. මෙයින් හට ගත් ශොකයෙන් හඬමින් ''මාගේ ශොකය නිවනු මැනව'' යි කියා හෙතෙමේ ගොස් බුදුරදුන් වහන්සේට දුන්වී ය.

''බුදුහු ශොක නොකරව'' යි ඔහු අස්වසා බණ දෙසූහ. තුනීවූ ශොක ඇති හෙතෙම බුදුරදුන්ට යාචඤා කොට ලබන ලද මහණ උපසපන් ඇත්තේ නොබෝ කලකින් රහත් විය.

මේ වනාහි දම්පියාටුවාවේ (ත්‍රි: මූ: 432 පිට) එන පරිදියි සූත්‍රනිපාත අටුවාවේ (ත්‍රි: මූ: 196 පිට) එන්නේ එයට බොහෝ වෙනස් අයුරෙනි. ඒ මෙසේ ය.

හෙතෙමේ ඇය එනු දුක ''පමාවී එන්නී ය''යි කිපියේ ඉද්ද වේගයෙන් පැත්තකට දමා ගැසී ය එය ගොස් දූරියගේ කුස වැදී සිදුරු ව ඇය මැරී වැටුනී ය. ඒ දුටු හෙතෙමේ ''දූව මැරුයේ ය''යි රජුගෙන් ඇතිවිය හැකි දණ්ඩනභීතියෙන් පලාගොස් අරණ්‍යයෙහි වසන භික්‍ෂූන් ලඟට එළඹ යාචඤා කොට ලබන ලද පැවිදි උපසපන් ඇත්තේ නො බෝකලකින් රහත් විය. මෙහිදී බුදුරදුන් හමුවූ බවක් හා දම් දෙසනු ලැබූ බවක් නොකියන ලදී.

පෙසකාර දූවගේ හදිසි මරණයත් එයින් හටගත් කලකිරීමෙන් පෙසකාරයාගේ පැවිද්දත් සිදුවූබව කවුරුත් පිළිගණිති. විවාද සහිතව පවත්නේ ඇයගේ මරණය පියාගේ අත් වැරැද්දකින් සිදුවූවක් ද නැතහොත් ක්‍ෂණික කොපයෙන් පියා විසින් සිදුකරණ

ලද්දක් ද යන්න හා පෙසකාරයා පැවිදි වූයේ ආරණ්‍යක භික්ෂූන් ලඟද නැතහොත් බුදුරදුන් සමීපයේ ද යන්නත් ගැණ ය. වර්තමානයෙහි ද මෙබඳු හදිසි සිද්ධි සම්බන්ධයෙන් ලොකයා විවිධමත පහළ කෙරෙති. ඔවුනතර සත්‍යයෙන් බොහෝ ඈත් වූ ද මතාන්තරයෝ ප්‍රකට වෙති. එපරිද්දෙන් මෙහි ද සත්‍යය එකක් ම විය හැකි ය. අර්ථකථාචාර්යයෝ ජනශ්‍රැතියෙහි පැවතුන මතයක්ද ග්‍රන්ථගත කළහ යි සැලකිය යුත්තේ ය.

**සිවලි තෙරුන් මවුගැබේ සිටි කාලය:-** දම්පියාටුවා මනොරථපූරණී ආදී ග්‍රන්ථයන්හි මේ සඳහා පවත්නා වෙනස මෙසේය:- මනොරථපූරණියෙහි (ත්‍රි: මු: 138 පිට) මවුගැබේ විසූ කාලය සත් වස් සත්දිනෙකැයි කියති ථෙරගාථා අටුවාවේද (ත්‍රි: මු: 137 පිට) එසේයි. දම්පියාටුවාවෙහි (ත්‍රි: මු: 307 පිට) පෙණෙන්නේ සත්වස් සත්මස් සත්දිනෙකැ යි කියා ය.

ප්‍රමාදයෙන් වැරැද්දක් විය හැකි නම් මෙය ඊට හැම අතින් ම පහසු තැනෙකි. මෙබඳු සුළුවෙනස්කම් දම්පියාටුවාවේ පමණ අන්කිසිම අටුවාවක නැත්තේ ය. සත්‍යය නිර්ණය කර ගැණීම නුවණැතියන්ට අයත් වැඩෙකි.

**තථාගත ශය්‍යාව:-** බුදුහු පශ්චිමයාමය සතර භාගයක් කොට එක්භාගයක් සක්මනින් ගෙවති. දෙවන භාගයෙහි ගඳකිළියට වැද සමෘතිසම්ප්‍රඥනයෙන් යුක්තව දක්ෂිණපාර්ශ්වයෙන් සිංහශය්‍යා කෙරෙති. තුන්වන භාගයෙහි නැඟී වැඩහිඳ ඵල සමාපත්තියෙන් දවස් යවති. සතර වන භාගයෙහි මහාකරුණා සමාපත්තියට සමවැද එයින් නැඟී පූර්වබුද්ධයන් කෙරෙහි කෘතපුණ්‍ය ඇති විනෙය ජනයන් බලමින් අරුණු නගති. සුත්තනිපාතට්ඨකථාවෙහි (ත්‍රි: මු: 92 පිට) හා සෙසු අර්ථකථාවන්හිද ධර්මප්‍රදීපිකා (මුද්‍රිත 47 පිට) ආදි ධර්මග්‍රන්ථයන්හි ද මේ පෙණෙන පරිදි යි.

බොහෝ ආචාර්යවරයන්ගේ පිළිගැන්ම මෙසේ නමුදු "සත්ථා පඨමයාමෙ ධම්මං දෙසෙත්වා මජ්ඣිමයාමෙ දෙවතානං පඤ්හං විස්සජ්ජෙත්වා පච්ඡිමයාමස්ස පඨමකොට්ඨාසෙ සීහසෙය්‍යං කප්පෙත්වා දුතියකොට්ඨාසෙ ඵලසමාපත්තියා වීතිනාමෙත්වා තතියකොට්ඨාසෙ මහා කරුණා සමාපත්තිං සමාපජ්ජිත්වා ..........."ශාස්තෘන් වහන්සේ ප්‍රථමයාමයෙහි බණ දෙසා මධ්‍යම යාමයෙහි දෙවියන්ගේ ප්‍රශ්න විසඳා පශ්චිමයාමයාගේ ප්‍රථම කොටඨාසයෙහි සිංහශය්‍යා කොට දෙවනකොටඨාසයෙහි ඵල

සමාපත්තියෙන් ගතකොට තුන්වන කොට්ඨාසයෙහි මහා කරුණා සමාපත්තියට සමවැදී........" යනුවෙන් දක්වෙන ජාතකාර්ථකථා පාඨයෙන් (ත්‍රි: මු: භොග 186 පිට වෙනසක් පෙණෙන්නේය.

මෙහි පශ්චිම යාමය බෙදන ලද්දේ කොටස් තුණකටය. සෙසු ග්‍රන්ථයන්හි සතරකට බෙදූ ප්‍රථම කොටසෙහි සක්මන් කරණ බව කියන නමුත් මෙහි සක්මන්කිරීමට කාලයක් නොදක්වති. ජාතක භාණකයන් කුමක් නිසා මෙසේ කියනලදද? යනු පැහැදිලි නොවේ.

**"මජ්ඣිමං පන යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි"** යන සුත්තසඞ්ගහට්ඨකථා පාඨයෙන් (ත්‍රි: මු: 184පිට) බුදුරදුන් සයනය කරන්නේ රාත්‍රී මධ්‍යමයාමයෙහි බවත් කියන්නේය. මෙය ජාතකභාණකයන්ගේ කථාවටත් වඩා ඈබහෙවින් වෙනස් වූවකි. මෙසේ එකිනෙකට බොහෝ සෙයින් ආසන්නනොවූ විරොධස්ථාන සම්බන්ධව ආචාර්‍ය්‍යවාද ය යි කීමට වඩා ප්‍රමාද පාඨ ය යි කීම පහසු ය.

**මාතඞ්ග පණ්ඩිතයන්ගේ කථාව :-** ජාතකාර්ථකථාවෙහි හා තවත් ස්ථපයක පෙණෙන මේ කථාවෙහි වෙනස බොහෝය එයින් මේ සැලකිය යුතු ස්ථප තැනෙකි. ජාතක අටුවාවේ (ත්‍රි: මු: 5 භාග 76 පිට) දිට්ඨමඞ්ගලිකාව මාතඞ්ග පණ්ඩිතයන් පිටඋඩ තබාගෙණ මිනිසුන් බලා සිටියදීම නුවරින් නික්ම සැඬොල් ගමට ගිය බව කියනලදී. සුත්‍රනිපාතාර්ථකථාසම්පාදකයන් (ත්‍රි: මු: 128 පිට) ජාතකභාණකයන්ගේ ඒ මතය ප්‍රතික්ෂෙප කොට "පිටඋඩ තබාගෙණ නොව අතින් අල්වා ගෙණ ගියා ය"යි වෙනස් කරණ ලදී. එසේම මණ්ඩව්‍ය කුමාරයන්ගේ පිරිස මාතඞ්ගපණ්ඩිතයන්ට හිංසා පීඩා කළබව සුත්‍රනිපාතාර්ථකථාවෙහි කියන නමුත් ජාතකාර්ථකථාවෙහි එසේ කරන්නට මත්තෙන් එතුමන් අහසින් ගියබව දක්වෙන්නේ ය.

තවද බන්ධුමතී නුවර ඇසුරු කොට එනම් ගංතෙර විසූ ජාතිමත් තවුසෙකු දමා ආයු ඇතිනාක් එහි විසූ බව සුත්තනිපාත අටුවාවෙහි කියන නමුත් ජාතකඅටුවාවේ පෙණෙන්නේ වෙත්තවතී නුවර ඇසුරු කොට එනම් ගංතෙර විසූ තවුසෙකු දමනය කොට මණ්ඩව්‍ය කුමාරයන්ගේ පිරිවර බමුණන් කොහි දූ යි සොයා "මෙධ්‍ය රජුලඟ සිටිති"යි දැන ඔවුන් දමනය කරණු පිණිස එහි ගිය නමුත් ඔවුන්ගේ උපක්‍රමයකින් ජීවිතක්ෂයට පත්වූ බව ය. මේ හැර තවත් විසදෘශස්ථාන කීපයෙකි.

අට්ඨකථා ප්‍රකීර්ණදෙශනාව ම ය යි කියතොත් විශෙෂයෙන් කියයුත්තේ ජාතක කථාවලට ය. ඒ ගැණ විශෙෂ අවබෝධයක් තිබිය යුත්තේද ජාතකභාණකයන්ට ය. එහෙත් ඔවුන්ගේ මත හේතු විරහිත ව බැහැර කිරීම හා ජාතකකථා සෙසු අටුවාවල මෙතරම් වෙනස්ව දක්වීමත් විමසා බැලිය යුත්තෙකි.

**වක්කලි තෙරුන්ගේ රහත්වීම:-** මුන්වහන්සේ රහත් වූයේ ගිජ්ඣකූළපව්වෙන් පතින්නට පා තගන විට ය යි අඞ්ගුත්තර භාණකයන් විසින්ද (මනොරථපූරණී ත්‍රි: මු: 141 පිට) ධම්මපද භාණකයන් විසින්ද (දම්පියාටුවා ත්‍රි: මු: 636 පිට) කියනලදී. ඛුද්දක භාණකයෝ ථෙරගාථා අටුවාවෙන් (ත්‍රි: මු: 420 පිට) ඒ මතය ඉව තට දමා අනෙක් මතයක් දක්වති. එනම්:- ගිජ්ඣකූළපව්වෙහි සිට සාමාන්‍ය භික්ෂුවක් මෙන් විදසුන් වඩා රහත්වූ බව ය. පර්වතයෙන් පැන දිවි නසා ගැණීමට තැත්කළ බවක් හෝ පතින්නට පා තගන විට රහත්වූ බවක් ඔහු තුමූ නො පිළිගණිති උන්වහන්සේගේ රහත්වීම අද්භූත ලීලාවකින් සිදුනොවූවක් බව ඔවුන්ගේ හැඟීම යි. සත්‍යය කුමක් වුව ද බාහුල්‍යව්‍යවහාරයෙහි පවත්නා පූර්වමතය පිළිගැණීම යුක්තිසඞගත නමුත් දෙමතය ම කල්පනාවට ගතයුතුය.

මෙසේ කථාමාර්ගයන් පිළිබඳ ව සුළු සුළු වෙනස් කම් අට්ඨකථා වන්හි බෙහෙවින් පැණෙන්නාහ. මෙහි දක්වන ලද්දේ සවල්ප යෙකි. සුළු වු ව ද මෙබඳු කරුණු අටුවාවල දක්නට ලැබීම බෞද්ධ නොවූවන්ගේ වඩ වඩා අප්‍රසාදයට හා අල්පශ්‍රැත බෞද්ධයන්ගේත් කල කිරීමට හේතුයි. එසේ නමුදු මේ විසමතැන් මග හැරවීමට මගෙක් නැත්තේය. ටීකාචාර්‍ය්‍යවරයෝ ද ඒ සඳහා මෙසේ කියති.

**"තංතංභාණකානං කථාමග්ගානුසාරෙන තත්ථ තත්ථ ඨආවුත්තනන්ති න ඉධ ආචරියස්ස පුබ්බාපරවිරොධො සඞ්කිතබ්බො"** "ඒ ඒ කරුණු දීඝාදී භාණකයන්ගේ කථාමාර්ගානුසාර යෙන් ඒ ඒ තන්හි කියනලද පරිදි ය යි සලකා මෙහි ආචාර්‍ය්‍යවර යාගේ පූර්වාපරවිරෙධයක් ගැණ සැක නොකළ යුතු ය" යනු යි. මේ එක් විරෙධස්ථානයක් පිළිබඳ ව හේතු දක්වන අඞ්ගුත්තරටීකා චාර්‍ය්‍යයන්ගේ නිර්දේශයෙකි. (අඞ්ගුත්තරටීකා මුද්‍රිත 124 පිට)

එසේ ම **"තං සබ්බං අඤ්ඤමඤ්ඤවිරුද්ධම්පි දීඝභාණකානං මතෙන ලිඛිත සීහලට්ඨකථාසු ආගතනයමෙව ගහෙත්වා ආචරියෙන ලිඛිතං ඊදිසෙ කථාවිරොධෙ සාසනපරිහානිශා**

**අභාවතො සොධනූපායාභාවා ච පරමත්ථවිරොධො එවකි. සුත්තාදිනයෙන සොධනීයො. න කථාමග්ගවිරොධො.”** ඒ මේ සියල්ල ඔවුනොවුන්ට විරුද්ධ නමුදු මෙබඳු කථාවිරොධයෙන් ශාසනපරිහාණියක් නැති බැවින් හා ශුද්ධ කිරීමට උපායයක් නැති බැවිනුත් දීඝභාණකයන්ගේ මතයෙන් ලියන ලද සීහළාර්ථකථාවන්හි ආක්‍රමය ගෙණ බුද්ධඝොෂාචාර්‍ය්‍යවරයන් විසින් ලියන ලදී. පරමාර්ථවිරොධයක් ඇතිකල්හි වනාහි එය සූත්‍රාදි නයින් ශුද්ධ කළ යුතු ය. කථාමාර්ගයන්හි පැණෙන විරොධය නො වේ. යනු තවත් විරොධස්ථානයක් පිළිබඳ ව කරුණු දක්වන විමතිවිනොදනී කර්තෘවරයෝ කියති. (විමති විනොදනී මුද්‍රිත 480)

පූර්වකාලික පච්චරියාදි අටුවාචාරීන්ගේ ස්මෘතිවිප්‍රවාසයෙන් හෝ පතිත වූ මෙබඳු අසමානස්ථාන කෙසේ වත් ශුද්ධ කළ නො හැකිනමුත් ඔවුන් පිළිබඳ ව ග්‍රන්ථයන්හි පෙණෙන මතභෙදය දැන ගත යුතු ය. අප විසින් මෙතෙක් කරුණු උපුටා දක්වන ලද්දේත් එහෙයිනි. මින් කුමක් සත්‍යය වුව ද බුදුරදුන්වහන්සේගේ ඉගැන්වීම වටහා ගැණීමට එයින් බාධාවෙක් නැත්තේ ය.

තවද අර්ථ කථාවන්හි අසමාන සේ පෙණෙන- සමහරුන් අසමාන ය යි සලකන තැනුදු ඇත්තාහ මෙහි දක්වෙන්නේ ද ඉන් කිසිවෙකි.

**දෙව්දතුන්ගේ සඞ්ඝභෙද කාර්‍ය්‍යය:- සඞ්ඝං භින්දිත්වා රුහිරුප්පාදකම්මං කත්වා නවිරපක්කන්තො”** යනුවෙන් රුහිරුප්පාද කාර්‍ය්‍යයට පෙර සඞ්ඝභෙදය කළ බව පපංචසූදනීමජ්ඣිමනිකායාර්ථකථාවෙහි කියන ලදී. (ශ්‍රී: ධ: මුද්‍රිත 420 පිට) සමන්තපාසාදිකා සඞ්ඝභෙදක්ඛන්ධකයෙහි පෙණෙන්නේ රුහිරුප්පාදයට පසු ව සඞ්ඝභෙදය කළ බව යි. එහි “රජු මැරවීම හා රුහිරුප්පාදය කළ නිසා කෙසේ නම් දෙවදත්තයා ප්‍රකෘති මහණෙක් වන්නේ දැ”යි ප්‍රශ්න කොට එය විසඳන්නාහු මෙසේ කියති:-

හුදෙක් ඇණවීම වැරදුන හෙයින් රජු මැරවීම පිළිබඳ ඇවතෙක් නැත්තේ ය. “එසේ නම් කුමාරය, නෙපි පියා මරා රජ වව. මම බුදුන් නසා බුදු වෙමි” යනු දෙව්දතුන්ගේ ඇණවීම යි. එහෙත් කුමාරයා රජ වී පියා මැරවූයේය. ඇණවීම වෙනස් විය. එහෙයින් රජු මැරවීමෙක් නො වන්නේ ය.

රුහිරුප්පාදය කළ මාත්‍රයෙන් ඒ සම්බන්ධ ඇවතක් බුදුරදුන් නො වදාරණ ලදී “මහණෙනි, රුහිරුප්පාදකයා අනුපසම්පන්න ය.

උපසපන් නො කළ යුතු ය. උපසපන් වූයේ සිවුරු හැරවිය යුතු ය. යන සික‍පදය වදාළේ රුහිරුප්පාදකර්මය කිරීමෙන් පසු කාලයේ දී ය. එබැවින් ප්‍රකෘති මහණෙකු ව සිටි දෙවදත්තයා සඞ්ඝභෙදය කෙළේ ය'' යනු යි.

මෙය වනාහි බොහෝ දෙන අවුලට පත්වන තැනෙකි. විය තුන් ද මූලා වූ අවස්ථා අප විසින් දක්නා ලදී. සමන්තපාසාදිකා වෙහි විශෙෂ විවරණයක් කිරීමෙන් හැඟෙන්නේ පූර්වයෙහිත් කිසි යම් කෙනෙකුට මේ ගැණ පැහැදිලි අවබොධයක් නොවූ බවෙකි. යථොක්ත පපංචසූදනීපාඨය ද පශ්චාත්කාලිකයකු විසින් විපර්යාස කරණ ලද්දේ එනිසාම විය හැකියි "රුහිරුප්පාද කම්මං කත්වා සඞ්ඝං භින්දිත්වා"යි එය සකස් කර ගන්නේ නම් අවුල මග හැරෙයි. විනයාර්ථවර්ණනාවට ද එකඟ වෙයි.

**කුමාරකාශ්‍යපයන්ගේ ප්‍රතිසන්ධිය:-** මුන්වහන්සේගේ මව සිවුරයකු සමග වාසය කොට ගැබ් ගත් පසු මහණ වී නොබෝ දිනකින් මුන්වහන්සේ ප්‍රසූත කළා ය. යනු සුමඞ්ගලවිලාසිනියෙහි (ත්‍රි: මු: 585 පිට) කියන ලදී. එසේ ම දම්පියාටුවා ථෙරගාථා අටුවා මනොරථපූරණී පපංචසූදනී අපදානපාලි ආදි බොහෝ ග්‍රන්ථයන්හි ද කියන ලදී.

පාරාජිකාපාලි භික්ඛුනිපචිත්තියෙහි (මුද්‍රිත 246 පිට) වනාහි උදායිතෙරුන් තමන්ගේ අඳනෙහි වූ අසූචිය (ශුක්ලය) සෝදනු පිණිස පුරාණදුතියිකා භික්ෂුණියට දුන් පසු ඇය එය ගෙණ අසූචි යෙන් කොටසක් මුඛයෙහි හා කොටසක් අඞ්ගජාතයෙහි බහා ගැණීම නිසා ගැබ් ගත් බව කියන ලදී. එහි දී එය කවරකුගේ ප්‍රතිසන්ධියක් දැ යි නො කියන ලද නමුත් එයින් උපන්නේ කුමාර කාශ්‍යපස්ථවිරයන්වහන්සේ බව "තෙන ඛො පන කුමාරකස්සපො නිබ්බත්තොති එවං වෙතං ජනො ආහ." යන්නෙන් මිලින්ද පඤ්හයෙහි (මුද්‍රිත 98 පිට) කියන ලදී.

මේ වනාහි මහා වරදක් සේ හැඟෙන තැනෙකි. අටුවා කථා පසෙක තිබියදී පෙළ පොත් දෙකක් වන විනය පාලිය හා අපදාන පාලියත් එකිනෙකට විරුද්ධභාවයක් දක්වන හෙයිනි. එහෙත් මෙහි වෙනසක් නැත්තේ ය. විනයපාලියෙහි කී ප්‍රතිසන්ධිය එකෙකි. අපදානපාලි ආදියෙහි කියන ලද්දේ අනෙක් ප්‍රතිසන්ධි යකි. මෙසේ කීමට ඇති එකම බාධාව නම් නැති වෙනසක් ඇති කෙරෙමින් දක්වන ලද මිලින්දපඤ්හ පාඨ ය යි. එයද සපිර කථාවක්

නො වේ. ජනාලාපයක් වශයෙන් කියන ලද්දකි. තවද මිලිඳු පඤ්හයෙහි ජනශ්‍රැතියෙන් ගත් මෙබඳු ධර්මවිරොධස්ථානයෝ නැත්තාහු ම නො වෙත්. සඞ්ගායනාවන්ට ද නො නැගුන ග්‍රන්ථයක් වූ එහි මිස අන් කිසි පෙලක හෝ අටුවාවක විනයපාලියෙහි කී ප්‍රතිසන්ධිය කුමාරකාශ්‍යපයන්ගේ ය යි නො කියති. කෙසේ නමුත් යථොක්තපාඨය මිලිඳුපඤ්හයෙහි නො යෙදුනේ නම් මේ ගැණ විමතියක් කිසිවෙකුටත් පහළ නො වන්නේ ය. සමාන කථා හා සිද්ධිවලින් වියතුන් ද භ්‍රාන්තියට වැටෙන බව පැහැදිලි කිරීමට මෙය ද කදිම සාක්ෂ්‍යයෙකි.

ඒ ප්‍රතිසන්ධිය කුමාරකාශ්‍යපයන්ගේ නො වේ නම් නාගසේන හිමියන් විසින් ඒ බව නො කියන ලද්දේ කුමක් හෙයින් දැ යි කිසිවකුට කල්පනා කළ හැකි යි. මිලිඳු රජුගේ උපමාකථාවන්හි අඩුපාඩු සම්පූර්ණ කිරීම උන්වහන්සේට අයත් වැඩෙක් නො වේ. එය කවුරුන්ගේ වුවත් නාගසේනහිමියන් විසින් කළයුත්තේ එහි සත්‍යාසත්‍යය විනිශ්චය කිරීම නො ව රජු විසින් අසනලද ගර්භාවක්‍රාන්තිය පිළිබඳ ප්‍රශ්න විනිශ්චය කිරීමය. නොහොත් ඉදිරිපත් කළ ධර්මවිරොධ තර්ක හේතු යුක්ති දක්වා බැහැර කිරීම ය. එපමණක් නො ව නිදර්ශන කථාවන්හි නො වුව මනා කොටස් ගැණ විවේචනය කරන්නට ගිය හොත් වර්තමානයෙහි මෙන් කවර කලෙක වුවත් වාදයක අවසාන යක් නො දැක්ක හැකි ය. විනයපාලියෙහි කියවුන ප්‍රතිසන්ධිය කවරකුගේ ද යන්න අවිනිශ්චිත ය. අපදානපාලි ආදියෙහි කියන ලද්දේ කුමාරකාශ්‍යපස්ථවිරයන්ගේ ප්‍රතිසන්ධිය යි.

**මහ කසුප් හිමියෝ:-** රජගහනුවර නැකත්කෙළි දවසෙක පන්සියයක් කුමරියෝ සඳපු ගෙණ නැකත් කෙළි පිණිස යන්නාහු බුදුන් දැක එයින් කිසිවක් නො දුන්හ. පසු ව වඩනා මහකසුප් තෙරුන් දැක "අපගේ තෙරුන් එති, කැවුම් දෙමූ" යි සියලු කැවුම් ගෙණ උන්වහන්සේ කරා එළඹියාහු ය. තෙරුන් වහන්සේ පාත්‍රය බැහැර කොට සියලු කැවුම් එක ම පාත්‍රයෙහි පිරෙණ පමණක් කොළෝ ය. විශුද්ධිමාර්ගයෙහි (මුද්‍රිත 311 පිට) පෙණෙන මේ කථාව දම්පියාටුවාවේ (ත්‍රි: මු: 488 පිට) පංචශතදාරකයන් සම්බන්ධ කථාව ම නම් ග්‍රන්ථදෙකේ වෙනස ඉතා බොහෝ ය. විශුද්ධිමාර්ගයෙහි කියන්නේ ගැහැණු ළමයින් ගැණ ය. දම්පියාටුවාවේ පිරිමි ළමයින් ගැණ ය. විශුද්ධිමාර්ගයෙහි සියලු කැවුම් පාත්‍රයෙහි බහා ගෙණ ගිය බව ද දම්පියාටුවාවෙහි දරුවන් ලවා කැවුම්පෙට්ටි ගෙන්වා ගෙණ ගිය බව ද කියන්නේ ය.

විශුද්ධිමාර්ගයට ඒ පුවත ගත් වෙන තැනක් නො පැණෙන හෙයින්ද දෙතැන ම පෙණෙන්නේ එක ම කථාවෙකැ යි කීමට ද නො හැකි නො වේ. එය එසේ ම නම් ග්‍රන්ථයකින් ග්‍රන්ථයකට සංක්‍රමණය වීමේ දී කථා හා සිද්ධින් පිළිබඳ ව ඇතිවන වෙනස මැන ගැණීමට මෙය වැදගත් කරුණෙකි. ග්‍රන්ථදෙකේ දක්වෙන්නේ එකම කථාව නො ව කථාදෙකක් නම් මෙහි වෙනසක් නැත්තේ ය.

**බේලුවපණ්ඩුවීණාව :-** ගොධිකතෙරුන්වහන්සේ බොටුව කපා ගෙණ රහත් වන්නට සූදානම් වූ අවස්ථාවෙහි මාරයා තමන්ට නො හැකි බැවින් බුදුරදුන් ලවා රහත් ඵලයට බාධා කරවනු පිණිස බේලුවපණ්ඩුවීණාවත් රැගෙණ බුදුන්වහන්සේ ලඟට පැමිණි බව මාරසංයුත්තකයේ තුන්වන වග තුන්වන සූත්‍රයෙන් හා තදර්ථකථාවෙන් කියන්නේ ය.

එහෙත් මාරයුද්ධයේදී සත්වසක් කළ නිෂ්ඵල පරිශ්‍රමයෙන් හටගත් ශොක ඇති මාරයාගේ කිසිල්ලෙන් ගිලිහී බිම වැටුන එය ශක්‍රයා විසින් හැර ගෙණ පඤ්චසිඛ දිව්‍යපුත්‍රයාට දුන් බව සුත්තනිපාත ප්‍රධානසූත්‍ර අටුවාවෙහි (ත්‍රි: මූ: 333 පිට) කියන්නේ ය. මාරයාට යලිත් එය ලැබුන බවක් කොතැනකවත් නො කියන හෙයින් මේ දෙකින් කෝකක් නමුත් අසත්‍ය වියයුතු සේ පෙණේ ය යි කියති.

මෙහි ලා කිය යුත්තේ මේ දෙතැන්හි ම පූර්වාපරවිරොධයක් නැති බව හා කිසියම් හේතුවක් පිට කියන ලද්දක් බව යි. එනම්, මාරයා පැමිණියේ ස්වකීය රූපයෙන් ම නො ව මවා ගත් කුඩා මාණවක වේශයකිනි. මාරයාට අමුතුවෙසක් එසේ මවා ගත හැකි නම් ඔහු සතු ප්‍රසිද්ධ භාණ්ඩයක් වූ වීණාව ද මවා ගෙණ එනු නො හැකි නො වේ. මෙය අපගේ ම මනඃකල්පිතයක් නො වන බව දම්පියාටුවාවේ ගොධිකවස්තුවෙන් හා එහි ම පරිවර්තනයක් සේ සලකන සද්ධර්මරත්නාවලියෙන් ද පැහැදිලි වන්නේ ය.

**දිවැස :-** සුන්දරිකභාරද්වාජ බමුණා බුදුන් වහන්සේට පිළිගැන්වූ එක් භොජනයකට දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති සතර මහදිව් වැසි දෙවියන් "බුදුරදුන් වලඳති"යි දිව ඕජස් බහා ලූ නමුත් එය නො වැලඳූ බව බ්‍රාහ්මණසංයුත්තකාර්ථ වර්ණනාවෙහි ත්‍රි: මූ:(183 පිට) කියන්නේ ය. මෙහි දී දිවැසට කුමක් වී ද යි සමහරුන් නගන ප්‍රශ්නයෙකි. මිනිසුන්ට නො දක්ක හැකි නො කළ හැකි ඇතැම් දෙය දෙවියන්ට දත හැකි කළ හැකි නමුත් භුම්‍යස්ථ-

දෙවියන්ට තබා ආකාශස්ථදෙවිබඹුන්ට වුවත් හැමෙකක්ම දත හැකි කළහැකි නො වේ. විතර්කීණයෙන් තොර වූ මරුන් බඹුන් පවා භ්‍රාන්තියට පත් වූ මෙබඳු අවස්ථා කොතෙකුත් ආගමිකග්‍රන්ථ වලින් දැක්ක හැකි යි.

**අසූ මහාශ්‍රාවකයෝ:-** ප්‍රථම බොධියේ දී අසූ මහ සව්වන් ගෙන් බුදුන් වහන්සේට උපස්ථාන නො කළ කෙනෙක් නැත්තේ යයි බ්‍රාහ්මණසංයුත්තකාර්ථ වර්ණනාවෙහි (ත්‍රි: මු: 200 පිට) කියති. වනවාසිකතිස්සසාමණේරයන් බැලීමට ද අසූමහසව්වන්ම වැඩි බව ධම්මපදට්ඨකථාවෙහි (ත්‍රි: මු: 260 පිට) කියන්නේ ය. තවත් මෙසේ කියන ලද තැන් ඇත්තාහ. මේ කාලය වන විට මහසව්වන් අසූ නම ම සම්පූර්ණව නො සිටියත් බාහුල්‍යය සලකා මෙසේ කිය හැකි ය. "අප්පකං ඌනමධිකං ගණනූපගං න හොති" යනාදීන් ස්වල්ප යක් අඩු වැඩි වීම ගණනකට නො ගෙණ ප්‍රසිද්ධ සංඛ්‍යාවකින් කීම එක් න්‍යායක්‍රමයෙකි. ථෙරගාථා අට්ඨකථාවෙහි (ත්‍රි: මු: ද්‍විතියභාග 217 පිට) පෙණෙන පරිදි අසූ මහාශ්‍රාවකයෝ නම්:-

**"අඤ්ඤාකොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි, නාලක, යස, විමල, සුබාහු, පුණ්ණජි, ගවම්පති, උරුවෙල කස්සප, නදීකස්සප, ගයාකස්සප, සාරිපුත්ත, මහාමොග්ගල්ලාන, මහාකස්සප, මහාකච්චායන, මහාකොට්ඨිත, මහාකප්පින, මහාචුන්ද, අනුරුද්ධ, කඞ්ඛාරෙවත, ආනන්ද, නන්දක, භගු, නන්ද, කිම්බිල, භද්දිය, රාහුල, සීවලී, උපාලි, දබ්බ, උපසෙන, ඛදිරවනිය රෙවත, පුණ්ණ මන්තානිපුත්ත, පුණ්ණ සුනාපරන්තක, සොණ කුටිකණ්ණ, සොණ කොලිවිස, රාධ, සුභූති, අංගුලිමාල, වක්කලි, කාළුදායි, මහාඋදායි, පිළින්දිවච්ඡ, සොභිත, කුමාරකස්සප, රට්ඨපාල, වංගීස, සභිය, සෙල, උපවාණ, මෙඝිය, සාගත, නාගිත, ලකුණ්ටක භද්දිය, පිණ්ඩොලභාරද්වාජ, මහාපන්ථක, චූලපන්ථක, බක්කුල, කොණ්ඩධාන, දාරුචීරිය, යසොජ, අජිත, තිස්ස මෙත්තෙය්‍ය, පුණ්ණක, මෙත්තගූ, ධොතක, උපසීව, නන්ද, හෙමක, තොදෙය්‍ය, කප්ප, ජතුකණ්ණි, භද්‍රාවුධ, උදය, පොසාල, මොඝරාජ, පිංගිය"** යන මොවුන් වහන්සේ යි.

මොවුන් වහන්සේ ගෙන් දාරුචීරියාදි ඇතැම් සව්වන් තත් කාලයන්හි හා තත්ක්‍රියාවන්හි නො සිටි බව මැනවින් පැහැදිලි වන නමුත් යථොක්ත න්‍යායක්‍රමයෙන් ඇති සේ කිය හැකි ය. වෙන්

වශයෙන් ගෙණ වර්ණනාකළ ද නිර්දෙශය යි කිය යුතුය. විද්‍යාචක්‍රවර්තීන් බුත්සරණෙහි (මුද්‍රිත 72 පිට) වර්ණනා කළාක් මෙති. එහි දක්වන ලද්දේ බාහිය නමිති. බාහිය දාරුචීරිය යනු උන්වහන්සේගේ සම්පූර්ණ නාමය යි. ශාස්ත්‍රීය ග්‍රන්ථයන්ට ඇති දේ නැති කොට නැති දේ ඇති කොට කරණ වර්ණනා ක්‍රම සුදුසු වුවත් ධර්මග්‍රන්ථයන්ටත් එය ගැලපේ දැ යි නුවණැතියන් විසින් විමසිය යුතු යි. ඇතැම් ආචාර්යවරයන් විසින් කාව්‍යලොකයට අනුගත වන පරිදි කරණ ලද මෙබදු වර්ණනා අර්ථකථාවන්හි ඇත්තාහ. අලඞ්කාරශාස්ත්‍රය කුමක් වුව ද සාමාන්‍ය මහාජනයාට විරොධ හැඟීම් පහළ විය හැකි එබඳු වැණුම් විශෙෂයක් නො කොට ධර්මග්‍රන්ථයන්හි ඇතුළත් කිරීම නම් අප සිත් නො ගන්නකි.

**සියපණ නසා ගැණීම:-** ගොධික හිමියන් සියපණ නසා ගැණීමත් සමග ම රහත් වූ බව සංයුත්සඟියෙහි හා දම්පියාටුවාවේ (ත්‍රි: මූ: 208 පිට) පෙණේ. එසේ ම සප්පදාස තෙරුන් ද දිවි නසා ගැණීමට සූදානම් වී රහත් වූ බව ථෙරගාථා අටුවාවේ (ත්‍රි: මූ: 449 පිට) කියති. ඡන්නතෙරුන්ද පිරිනිවියේ සියපණ නසා ගෙණ බව පපංචසූදනියෙන් (මුද්‍රිත 1012 පිට) පෙණේ.

සියපණ නසා ගැණීම පරිජී ඇවතට හේතුය යි සමහරුන් කියන නමුත් පූර්වභාගාපත්තියක් වශයෙන් ඉන් සිදු වන්නේ දුක්කටයෙකි. දුක්කටයකින් නමුත් සාපත්තික ව සිටිය දී රහත් විය හැකි ද යනු කිසිවකුගේ විමතියට කරුණෙකි. චෛතසික ධර්මයන්ගේ සියුම් ක්‍රම අතිශයින් විචිත්‍ර ය, වේදනාපරිග්‍රහණය ඒ මේ සියල්ල යටපත් කොට රහත් වීමට හේතු විය. මෙසේ ම පස්පව් කොට ඒ ගැණ පසු තැවීමෙන් ඒ ජීවිතයේ දී ම පසේබුදුබවට පත් උතුමන් ගැණ ජාතක අටුවාවෙන් (ත්‍රි: මූ: චතුර්භාග 130 පිට) දක්ක හැකි යි.

**සත්හවුරුදු කල උපසපන් වීම:- "දෙවයෙව කිර සාමණෙරා සත්තවස්සිකා උපසම්පදං ලභිංසු. අයං ච සුමනො සොපාකො ච."** සාමණේරයන් දෙදෙනෙක් පමණක් ම සත්වස් ඇත්තාහු උපසපන් වූව හු ය. මේ සුමනත් සොපාකත් යන දෙනම යි. මේ වනාහි දම්පියාටුවාවේ සුමනසාමණේරවස්තුවෙහි (ත්‍රි: මූ: 645 පිට) එන පාඨයෙකි. මෙයින් පෙණෙනුයේ සත්වස් ඇති කල උපසපන් වූ දෙදෙනෙකු ම මිස ඉන් වැඩියක් නො වන බව යි. එහෙත් සත් හවුරුදු කල උපසපන් වූවෝ ඒ කාලයෙහි ම තවත් සිටියහ.

දබ්බමල්ලපුත්ත හිමියෝ ඉන් කෙනෙකි. උන්වහන්සේ සත් හවුරුදු කල ම උපසපන් වූවා පමණක් නො ව රහත්බව හා තන්තුරු ද ලැබූ බව ථෙරගාථා අටුවාවෙහි (ත්‍රි:මු: 42 පිට) හා මනොරථපූරණී එතදග්ගවණ්ණනාදියෙහි ද පෙණේ. තවත් භද්දහිමියෝ ද සත් හවුරුදු කල ම මහණකම, රහත්බව හා උපසම්පත්තිය ද ලැබූහ. (ථෙරගාථා අටුවා ත්‍රි: මු: 476 පිට) ධම්මපදටීකාථා තිඝපාද කයෝ මොවුන් තුදටුවන්ව යථොක්ත පාඨය ප්‍රකාශ කළහ සාව ශෙෂයෙන් මෙසේ කියහැකි වුව ද තවත් මෙබඳු බොහෝ කරුණු අනුව කිය යුත්තේ දම්පියාටුවාව ප්‍රථමසඞ්ගීතිකාරක මාහිමියන් විසින් නො තිපදවන ලද්දක් නො වේ නම් පසු කල ලේඛක යන්ගේ මහත් විකාරයන්ට බෙහෙවින් භාජන වූවක් බව යි.

**මාරාවේශය:-** විසාඛාවගේ පරිවාරිකාවෝ හොරෙන් රා බී බුදුරදුන් වහන්සේ ඉදිරිපිට දී ගී කියා නැටූහ. එය මාරාවේශයෙන් කළ බව හා බුදුන්වහන්සේ ඒ ආවේශය දුරු කළ බව ද දම්පියාටුවාවෙහි (ත්‍රි: මු: 394 පිට) කියන්නේ ය. එහෙත් මෙබඳු ඇතැම් අවස්ථාවන්හි දී මාරාවේශය දුරු නො කළ බව පෙණේ. බුදුහු ආමිසාදි හේතුවක් නිසා නම් ආවේශය දුරු නො කරති. වේඛෙජාවෙහි දී එගම් වැසියන්ට වූ මාරාවේශය දුරු නො කරණ ලද්දේ එහෙයිනි.

**බුද්ධ හසිතය:-** සුප්පබුද්ධරජ පොළොව පළා ගෙණ අපායට යන බව දුන බුදුහු සිනා පහළ කළහ. (දම්පියාටුවා ත්‍රි: මු: 365 පිට) එසේම මහාධන වෙළෙඳකුට වන අනතුරක් දුක ද (550) තවත් එබඳු සංවේගයට සුදුසු අවස්ථාවන්හි ද (598) සිනා පහළ කොළෝය. කුමක් හෙයින් ද? මම මෙබඳු කටුක විපාකදායක කර්මයෙන් මිදුනෙමි යි සැලකිමෙනි. මෙය සද්ධර්මරත්නාවලියෙන් ද දන්නේ ය.

**බක්කුලහිමියන්ගේ පරිනිර්වාණය:-** අහස සිට තෙජෝධාතුවට සමවැද පිරිනිවීම නිසා දබ්බමල්ලපුත්තහිමියන්ගේ ධාතු ශෙෂ නුවූ බව උදාන අටුවාවේ (ත්‍රි: මු: 301 පිට) කියන්නේ ය. එහෙත් එසේ ම පිරිනිවී බක්කුලහිමියන්ගේ ධාතු ශෙෂ වූ බව පපංචසූදනියෙහි (ශ්‍රී: ධ: මුද්‍රිත 932 පිට) කියනලදී. මෙහි වෙනසක් හැටියට පෙණෙනුයේ විශෙෂය නො කියන ලද බැවිනි. අධිෂ්ඨාන බලයෙන් බක්කුල හිමියන්ගේ ධාතු ශෙෂ වූ බව සිතිය හැකි යි. නො එසේ නම් තෙජෝධාතුවට සමවැද පිරිනිවි උතුමන්ගේ ධාතු ශෙෂ වන බවක් නො පෙණේ.

**සත්තක්ඛත්තුපරම සොතාපන්නයා** :- සෝවාන් පුද්ගලයන්ගේ භෙද තුනෙකි. එකබීජ, කොලංකොල, සත්තක්ඛත්තුපරම යනු වෙති. මෙයින් සත්තක්ඛත්තුපරම සෝවාන් පුද්ගලයා අටවැනි භවයක උත්පත්තිය නො ගන්නා බව **"තීසු සොතාපන්නෙසු සබ්බමුදු සත්තක්ඛත්තුපරමො සො අට්ඨමං භවං න නිබ්බත්තෙති"** තුන් වැදෑරුම් සෝවාන් පුද්ගලයන් අතුරෙන් සත්තක්ඛත්තුපරම පුද්ගලයා සර්ව මෘදු ය. ඔහු අටවැනි භවයක නූපදී යනු ඉතිවුත්තකාර්ථකථාවෙහි ද (ත්‍රි: මූ: 236 පිට) උදානාර්ථකථා ආදි තවත් අටුවාවන්හි ද කියති.

මෙය සාමාන්‍ය විවරණයක් බව නො දත මූලාවට පත් වන්නෝ බොහෝ දෙනෙකි. භව අටකට වඩා උත්පත්තිය ලැබූ සෝවාන් පුද්ගලයන් ගැණ සටහන් වන කථාප්‍රවෘත්ති සුලභ ව තිබිය දීත් ප්‍රසිද්ධ ධර්මධරයන් පවා මෙය වරදවා වටහා ගෙණ කරණ ලද දෙශනා අප විසින් අසනලදී. ග්‍රන්ථාන්තරයන්හි දක්වෙන විස්තර සුදුසු පරිදි ගලපා අවබෝධ කර නො ගැණීමේ වරදින් මෙබඳු කරුණු අතින් මූලාවටපත්වීම පුදුමයක් නොවේ.

**"ඉමෙ තයොපි සොතාපන්නා කාමභවවසෙන වුත්තා. රූපාරූපභවෙ පන බහුකාපි පටිසන්ධියො ගණ්හන්ති."** මේ සෝවාන් පුද්ගලයෝ තිදෙන කාමභවයාගේ වසයෙන් කියන ලද්දාහු ය. රූපාරූපභවයන්හි වනාහි බොහෝ ප්‍රතිසන්ධිහු ගණිත්. යනුවෙන් යථොක්ත කරුණ ගැණ මූලා විය හැකි බව සැලකූ ප්‍රතිසම්භිදා අර්ථකථාචාර්යයෝ කියති. (ත්‍රි: මූ: 318 පිට)

සත්තක්ඛත්තුපරම පුද්ගලයාට පමණක් නො ව සෙස්සන්ටත් කාමභවයෙහි නියමිත උත්පත්තිසංඛ්‍යාවට වඩා වැඩිගණනක් රූප අරූප භවයන්හි දී ලැබිය හැකිබව මින් පැහැදිලි ය. මෙවැනි විශෙෂ විස්තරවලින් පෙණෙන්නේ සෙසු ආචාර්යවරයන්ට වඩා ප්‍රතිසම්භිදාර්ථකථා කර්තෘපාදයන්ට පරමාර්ථධර්මවිෂයෙහි ගැඹුරු අවබෝධයක් පැවති බව ගි. බොහෝ අටුවාවලින් නො දක්ක හැකි තියුණු ග්‍රන්ථස්ථාන පිළිබඳ ව කදිම විස්තර එහි දක්ක හැකි ය. ඇතම් ආචාර්යවරයන්ට ගැටලු සේ හැඟුන තැන් උන්වහන්සේ වැඩිවසයෙන් ඉදිරිපත් කොට ඔවුනට බොහෝ පරීක්ෂාවකින් යුතු ව විවරණ දක්වූහ.

**මාරයෝ කෙනෙක් ද** :- මෘත්‍යුමාර ස්කන්ධමාර, අභිසංස්කාර මාර, ක්ලෙශමාර, දෙවපුත්‍රමාර ය යි මාරයෝ පස් දෙනෙකි. මෙය ද අර්ථකථාවන්හි නානාවිධ ව දක්වෙන්නකි. එයින් පෙණෙන්නේ

මාරවාදය පූර්වයෙහි පටන් පැවතෙන බවෙකි. කිසි අර්ථකථාවක දක්වන ලද්දේ තිදෙනෙකි. කිසිවක සිවුදෙනෙකි. කිසිවක පස්දෙනෙකි. සාරත්‍ථප්පකාසිනියෙහි (ත්‍රි: මු: 151 පිට) **"මරණමාර කිලෙසමාර දෙවපුත්තමාරානං."** යනුවෙන් **මරණ කිලෙස දෙවපුත්ත** ය යි මාරයින් තිදෙනෙකුන් ම කියති. අතික් දෙදෙනා ගැණ සටහනෙක් එහි නැත්තේ ය. සුත්තනිපාත අටුවාවේ (ත්‍රි: මු: 367 පිට) **"මාරසෙනාති චතුමාරාභිභවෙන"** යනුවෙන් සිවුදෙනෙකැ යි සාමාන්‍යයෙන් කියති. ථෙරගාථා අටුවාවේ (ත්‍රි: මු: 503 පිට) **"පඤ්චන්නං මාරානං සහනතො"** යනුවෙන් පස්දෙනෙකැ යි සඳහන් කෙරෙති. මේ ඒ ඒ ඇදුරුපරපුරේ එන සැටි යි. සාකල්‍යයෙන් ගත් කල මාරයින් පස්දෙනෙකැ යි ගත යුතු ය.

**මහාලතාපසාධනය:-** **"පඨවිමණ්ඩලස්මිං හි තිස්සො ඉත්ථියො මහාලතාපසාධනං ලභිංසු. විසාඛාමහාඋපාසිකා බන්ධුලමල්ලිකා, බාරාණසී සෙට්ඨිනො ධීතා"** පොළෝ තෙලෙහි ගැහැණු තිදෙනෙක් ම මහාලතාපසාධනය (මෙහෙලපලඳනාව) ලැබූහ. එනම්:- විසාඛා මහාඋපාසිකාව, බන්ධුල මල්ලිකාව, බරණැස් සිටුගේ දුව යන තිදෙනා යි. මෙය දම්පියාටුවාවේ (ත්‍රි: මු: 199 පිට) දක්වෙන පිරිදි යි.

සුමඞ්ගලවිලාසිනියෙහි (ත්‍රි: මු: 419 පිට) පෙණෙනුයේ විසාඛාව, බන්ධුල මල්ලිකාව හා දෙවදහිය සොරුගේ බිරිඳ යන තිදෙන පමණක් මෙහෙලපලඳනාව ලත් බවෙකි. මේ වනාහි දෙපොතෙහි වෙනසක් සේ පෙණෙන නමුදු බරණැස්සිටුගේ දුවත් දෙවදහිය සොරුගේ බිරිඳත් දෙදෙනෙකුන් නොව එක් කෙනෙකු සේ ගත් කල අවුලෙක් නැත්තේ ය.

**දබ්බමල්ලපුත්ත ස්ථවිරයෝ:-** මුන්වහන්සේ මහණවූයේ මවුපියන්ගෙන් අවසර ගෙණ ය යි උදානාර්ථකථාවෙහි (ත්‍රි: මු: 300 පිට) කියන්නේ ය. එහෙත් මැතියන් මළේ මුන්වහන්සේ උපදින්නටත් පෙර ය. සංකිච්ච-සොපාකයන් මෙන් මුන්වහන්සේ උපන්නේ චිතකයෙහි දැවෙන මළ මවගේ කුසයෙනි. එහෙයින් මෙහි මවුපියන්ගෙන් අවසර ගෙණ ය යි කියන ලද්දේ ව්‍යවහාරානුකූල සාමාන්‍යකථාවක් වශයෙනි.

**තිරිසනුන් කථා කිරීම:-** පූර්වයෙහි මිනිසුන් මෙන් තිරිසනුන් ද මිනිස්බසින් කථා කිරීම පිළිබඳ ප්‍රවෘත්ති ජාතකාර්ථකථා ආදී ආගමික ග්‍රන්ථයන්හි සුලභ ව දක්ක හැකි ය. මෙය වනාහි

අවිඥතුන්ගේ මෙන් ම විඥතුන්ගේත් විස්මයට කරුණෙකි. අද මෙන් පෙරත් මෙය විස්මයට කරුණක් ව පැවැත්තේ ය. මෙහි පලවත්නේ එසේ දක්වෙන ප්‍රවෘත්තිවලින් ඛිපයෙකි.

පූර්‍වයෙහි එක් වැද්දෙකුට මුවකු හා මුවදෙනක විසින් ගාථා කීපයක් කියන ලද බව ද ඒ ඇසූ වැද්ද "න මෙ සුතං වා දිට්ඨං වා භාසන්තිං මානුසිං මිගිං" මා විසින් මිනිස්බසින් කථා කරණ මුවකු ගැණ මින් පෙර නො අසන ලදී. නො දක්නා ලදී යනු සුවණ්ණමිග ජාතකයෙහි (ත්‍රි: මූ: තෘතීය භාග 128) කියන ලදී.

තවද මහසත් මුවකු ව ඉපිද එක් බමුණකුගෙන් "ආයඞ්ය, කොහි යන්නෙහි ද?"යි මිනිස්බසින් ඇසූ බව ද එකල සිටි කොසල නම් රජකුට මහා ධර්මාවවාදයක් කොට රාජධර්මයෙහි පිහිටවූ බව ද නන්දිමිග ජාතකයෙහි (ත්‍රි: මූ: ද්වීතිය භාග 191 පිට) පෙණේ.

තවද වඩුවකු දූව සොයමින් කැලයෙහි යන විට කාලසිංහ යකු ඔහුට ගාථාවක් කියන ලද්දේ ය. ඒ ඇසූ වඩුවා "අහෝ! මා මින් පෙර තිරිසනුන් මිනිස්බසින් කථා කරණු නො අසන ලද්දේ ය යි කී බව එඥන ජාතකයෙන් (ත්‍රි: මූ: චතුර්ථ භාග 197 පිට) පෙණේ.

තවද ගොදත්ත තෙරුන් වහන්සේ ගිහි කල බර උසුලනු නො හැකි ව වැටී සිටි ගොනෙකුගේ වලිගය විද්ද කල ගොනා මිනිස්බසින් ඔහුට ආක්‍රොශ කල බව හා එයින් ඒ හිමි කලකිරී මහණ ව රහත් වූ බව ද ථෙරගාථා අටුවාවෙහි (ත්‍රි: මූ: 555 පිට) දක්වේ.

තවද මහසත් තුණ්ඩිල ව (=හූරු ව) ඉපිද බරණැස් රජුට බණ කියා රට ධාර්මික කොට නීතිග්‍රන්ථයක් ද කල බව හා ඒ ධර්මාවවාද සැට දහසක් හවුරුදු පැවැති බව ද තුණ්ඩිල ජාතකයෙන් (ත්‍රි: මූ: ද්වීතිය භාග 202 පිට) පෙණේ.

මෙසේ මිනිස්බසින් කථා කිරීම පමණක් නොව නීතිග්‍රන්ථ පවා සම්පාදනය කල බවත් එය ඒ කාලයෙහි පවා මිනිසුන්ගේ පුදුමයට කරුණු වූ බවත් පැහැදිලිවම කියන ලද තැන් බොහෝ ය. දූරාතීතයේ පමණක් නො ව බුද්ධකාලයෙහි පවා සිවුපාවුන් මිනිස්බසින් කථා කල බව ගොදත්ත තෙරුන්ගේ කථාවෙන් පැහැදිලි ය.

පක්ෂිවිශෙෂයක් වූ කිඳුරන්ට ප්‍රකෘතියෙන් ම කථා කළ හැකි ය යි කියති. ධර්මාශොකකාලයෙහි කිඳුරන් දෙදෙනකුන් ලවා එසේ කථා කරවූ පුවතක් ද මනොරථපූරණීයෙහි (ත්‍රි: මූ: 329 පිට) කියන ලදී. සැලළිහිණි ආදි සතුන්ට පුරුදු කිරීමෙන් දනුදු මිනිස් බසින් කථා කළ හැකි ය. පුරුදු කරවීමෙන් කථා කළ හැකි නම් එසින් පෙණෙනුයේ ඇතැම් පක්ෂීන්ට කථා කිරීමේ ශක්තිය ප්‍රකෘතියෙන් පිහිටි බවෙකි. එය එතරම් විමතියට කරුණු නො වූවත් පුදුමයට හේතු වන්නේ බලු සිවල් ආදි සිවුපාවන් කථා කිරීම ය. එය අද මෙන් එදා ද පුදුමයට හේතු වූ බව මුලින් කීවෙමු.

මේ වනාහි සාමාන්‍ය සිරිතක් නො ව හදිසියෙන් වන විකෘතියක් බව මිනිස්බසිතැ යි වෙසෙසා කීමෙන් පැහැදිලි ය. එපමණක් නො ව පින් පිරුණු බොධිසත්වයෝ තිරිසන් ව උපනත් සාමාන්‍ය තිරිසනුන් තුළ නො පිහිටන ගති වලින් යුක්ත වන්නාහ.

මෙබඳු විශෙෂඅවස්ථාවන් හැර බොහෝ තැන්වල කථා කළ සේ ගාථා කී සේ කියන ලද්දේ ඔවුන්ගේ අදහස ය බුදුරදුන් වහන්සේ පූර්වයෙහි වූ සිද්ධි පාලි ගාථාවලට නගා වදාළසේක. සඞ්ගීතිකාරක හිමියෝ ද එසේ ම වර්ණනා කළහ.

> "න මං සීතං න මං උණ්හං න මං ජාලසමී බන්ධනං,
> යං ච මං මඤ්ඤතෙ මච්ඡී අඤ්ඤං සො රතියා ගතො."

"සීතල හෝ උෂ්ණය හෝ දැලෙහි බැඳීම හෝ මට නො ඉවසිය හැකි නො වේ. "හෙතෙම අනිකකු සමග රතියෙන් ගියේ ය"යි මා ගැණි මැසිය සිතී නම් එය මට නො ඉවසිය හැකි කරුණෙකැ" යි තමන් මැරීම පිණිස ගිනි ගසමින් උල් සසිමින් සිටි මිනිසුන් දැක මසකු වැලපෙමින් කී ගාථාවකැ යි ජාතක අටුවා මච්ඡජාතකයෙහි (ත්‍රි: මූ: 184 පිට) මේ ගාථාව දක්වෙයි.

මෙය මත්ස්‍යයාගේ භාෂිතයක් මෙන් දක්වන ලද නමුදු ඒ එසේ නො වේ. මත්ස්‍යයා කළ නාදය අසා ඔහුගේ විලාසයට අනු ව පුරොහිත බමුණකු සිතා ගත් අදහස බුදුරදුන් වහන්සේ විසින් දෙශිත පරිදි ය. මෙසේ කියන ලද තැන් තවත් බොහෝ යි. එය එසේ නො වේ නම් ශොකජාතක නොයෙක් අවස්ථාවන්හි නොයෙක් දෙනා විසින් කියනලදැ යි දක්වෙන "ආදිත්තං වත මං සන්තං ඝතසිත්තංව පාවකං" යනාදි ගාථා එසේ ම විය හැකි ද?

චරියාපිටකාර්ථ වර්ණනාවෙහි (ත්‍රි:මූ:197 පිට) කාශ්‍යප බුදුරදුන් වහන්සේ විසින් දෙසන ලද සතාරහ ගාථා සතරෙකැයි තබද බමුණා මහා සුතසෝම රජහට කී ගාථාවල **"සකිංදෙව සුතසොම සබ්භි හොති සමාගමො"** යනු පෙණේ. කිමෙක් ද? කාශ්‍යප බුදුන් දෙශනා කරණ කාලයෙහිත් සුතසොම කෙනෙක් සිටියේ ද? මෙය බුදුරදුන් දෙශනා කළ පරිදි ම ද යනු සිතිය යුතු ය. ඒ ගාථාව මහාසුතසෝම රජ පෝරිසාදයාට කියන කල **"සකිංදෙව මහාරාජ"** යනුවෙන් (ත්‍රි: මූ: 199 පිට) වෙනස් කොට කියන ලදි. **එයින්** හැහෙනුයේ බුදුරදුන් වහන්සේ හෝ සඞ්ගීති කාරක හිමියන් විසින් අදහස ගාථාවලට නගන ලද බවෙකි. තවද සීහළ වෙරිකා-තණ්ඩුලකොට්ටිකාදීන් විසින් කියන ලද යි කියන ගාථා ද හෙළු බසින් තුබූ ගීතිකාවන්හි පාලිපරිවර්තනයෝ යි. **"සීහළ කෙනෙව ජාතිජරාමරණසම්පසංයුත්තං ගීතං ගායන්තියා"** යන සුත්තනිපාතට්ඨ කථා පාඨයෙන් (ත්‍රි: මූ: 335 පිට) එය පැහැදිලි වන්නේ යි.

---

## විවේචනය.

—:—

**බුදුරදුන් වහන්සේ**:-ලොකයෙහි ඇති වූ සියලු දර්ශනවාදීන් අතුරෙන් බුදුන්වහන්සේ ශ්‍රෙෂ්ඨස්ථානයට ගැණෙති. කුමක් හෙයින් ද? යත්:- ආගමකර්තෘවරයකුගේ උසස් තත්ත්වය මැන ගැණීමට තිබෙන නියමමාර්ගද්දකින් උන්වහන්සේ සම්පූර්ණ හෙයිනි. එනම්:- චරිතශුද්ධිය හා දෙශනාශුද්ධිය යි. මෙයින් දෙශනාශුද්ධිය පසෙක තිබියදී දූරාතීතයෙහි පටන් පැවති උන් වහන්සේ සම්බන්ධ ක්‍රියාකලාපය වුව ද පරම ශාස්තෘත්වය විදහා දක්වන කදිම කැඩපතෙකි. ශාස්තෘත්වය නොහොත් බුද්ධත්වය පිළිබඳ මූලාරම්භය ම කරුණා මෛත්‍රී දෙකින් යුක්ත ය. මධ්‍යය දාන සීලාදි සම්‍යක්ප්‍රතිපත්තිමාර්ගයෙන් පරිපූර්ණ ය. අවසානය අනම්‍ය මාන සියල්ල දත් නුවණින් කොටිප්‍රාප්ත ය. එපමණක් නො වේ. උන්වහන්සේගේ හැම ඉරියව්වක් ම හැම ක්‍රියාවක් ම හේතු සහිත ය. යුක්තිසහගත ය. සිත ඇද ගන්නා සුළු ය. අතිශයින් ශාන්ත ය. දෙශනාශුද්ධියෙන් නොහොත් උන්වහන්සේගේ ඉගැන්වීම් වලින් යථොක්ත පරමශාස්තෘත්වය මොනවට පැහැදිලි වෙයි. කවරෙකුට නමුත් ඔවුන් වහන්සේගේ තත්ත්වය සම්පූර්ණයෙන් දක්නට තිබෙන නො වරදින මාර්ගයත් ඒ ඉගැන්වීම් ක්‍රම නුවණින් මැනැවින් විමසා බැලීම යි.

**"යො ඛො වක්කලි ධම්මං පස්සති සො මං පස්සති යො මං පස්සති සො ධම්මං පස්සති."** වක්කලිය, යමෙක් ධර්මය දකී ද හේ මා දක්නේ ය. යමෙක් මා දකීද හේ ධර්මය දක්නේ ය යි කවර කලෙක වුවත් තමන් වහන්සේ දක්නට හැකි ක්‍රමය උන්වහන්සේගේ ම වචනයෙන් වක්කලි තෙරුන් අමතා මේ දෙශනා කළ ආකාරය යි. උන්වහන්සේගේ කායසම්පත්තිය- රූපකායසම්පත්තිය ධර්මකායසම්පත්තිය යි දෙපරිදි ය. රූපකායසම්පත්තිය නම් දෙතිස් මහාපුරුෂලක්ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජනයෙන් හෙබියා වූ බුද්ධදෙහය යි. ධර්මකායසම්පත්තිය නම් තද්දෙශිත ත්‍රිපිටක පර්‍ය්‍යාප්තිය යි. රූපකාය සම්පත්තිය දර්ශනපථයෙන් ඉවත් වී දැනට බොහෝ කාලයක් ගත වී ය. ඉන් ශෙෂ ව පවත්නේ ධාතු පූජ්‍ය මාත්‍රයෙකි. ධර්මකායසම්පත්තිය එසේ නො වේ. එය තවමත් පවත්නා හෙයින් කවරෙකුට තමූත් එයින් රූපකායසම්පත්තිය ද නුවණැසින් දැක්ක හැකි ය. ධර්මකාමියාහට මනඃකල්පිත බුදුරුවක් සිතෙහි මවා ගත හැකි ය. ධර්මකායසම්පත්තියෙහි එය සියුම් ක්‍රමයෙන් ප්‍රතිබිම්බිත ව පවත්නා හෙයිනි. සද්ධර්මය අකුටිල ව බලන තැනැත්තේ මේ දෙපරිදි සම්පත්තිය ම එකවිට දක්නේ ය.

**බෞද්ධ ධර්මය:-** විසද පඬිවරයන්ගේ පරීක්ෂණබුද්ධියට හා අනෙක විධ පර්‍ය්‍යෙෂණයන්ට එකසේ ගොචර වූ අතිශයින් තියුණු වූත් සාර වූත් ධර්මයක් වේ නම් ඒ බෞද්ධධර්මය යි. ලොව පහළ වූ නොයෙක් ආගම් කර්තෘවරයෝ ස්වකීය බුද්ධිමහිමය අනුව ලොක ස්වභාවයත් දුකින් මිදීමේ මාර්ගයත් ප්‍රකාශ කළහ. ඔවුනතුරෙන් ආදියෙහි පටන් බල පවත්නා දෘෂ්ටියක් නම් ඊශ්වරනිර්මාණවාදය යි. එහි කා වැදී පවත්නා ආත්මවාදය ද ලෙහෙසියෙන් නො බිඳිය හැකි එකකි. ඉතා ම තියුණු වූ හේතුඵලධර්මයන් මැන වින් විදහා පාමින් බුදුන් වහන්සේ ඒ සියලු වාදයන් නිසරු කොට දැක් වූ හ.

බෞද්ධධර්මයෙහි පරමාර්ථය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලක්ෂණ යන් අවබෝධ කරවීම වුවද පිරිසුදු උසස් ලෞකිකජීවිතයක් ඇති කර ගැණීමට වුවමනා දහසක් කරුණු ද එහි ගැබ් වී ඇත්තාහ. ශිල්පශාස්ත්‍ර- න්‍යායශාස්ත්‍ර- ධර්මශාස්ත්‍ර- සමාජචාරිත්‍රාදි බුද්ධිය පුළුල් කරණ- ජීවිතය හැඩ ගස්සන හැම ඉගැන්වීමකින් පරිපූර්ණ ව පවත්නා බෞද්ධධර්මය තරම් විශාල වූත් ප්‍රයොජනවත්

වූත් ආගමයක් කිසිම සමයාන්තර වාදියෙකුට මෙතාක් ප්‍රකාශ කරණු නො හැකි වීම විස්මයජනක ය. පහසුවෙන් අවබෝධ කළ නො හැකි ධර්මගම්භීරත්වය නිසා නො වේ නම් සකලසමයවාදීන් විසින් උන්වහන්සේගේ චරිතශුද්ධියට දෙස් නොතබන්නාක් මෙන් දේශනාශුද්ධියට ද ඊර්ෂ්‍යා නො කරණු ඒකාන්ත ය.

**ධර්මගම්භීරත්වය:-** නානාවිචිත්‍රදේශනාක්‍රම හා හෙතුඵල සම්බන්ධයෙහි ඇති සියුම් කමත් නිසා බෞද්ධධර්මය අතිශයින් ගැඹුරු ය. ධර්ම- අර්ථ- දේශනා- ප්‍රතිවේධයන්ගේ වසයෙන් ඒ ගම්භීරත්වය සතරාකාරයකින් දක්වති. නානානයක්‍රමයෙන් යුත් පාලිධර්මය ද ගැඹුරු ය. විශෙෂාර්ථවත් හෙයින් ඒ පාලිධර්මයාගේ අර්ථය ද ගැඹුරු ය. තදර්ථය දක්වීමට කළ විසිතුරු දෙශනා ඇති හෙයින් දෙශනා ක්‍රමය ද ගැඹුරු ය. විසිතුරු දෙශනාවෙන් දක්වූ තදර්ථයාගේ අවිපරීතාවබෝධය ද ගැඹුරු ය. එහෙයින් සසකාදීන්ට සමුද්‍රය මෙන් පූර්වොපචිතපුණ්‍යසම්භාරරහිතයන් විසින් සද්ධර්ම සාගරතරණය දුෂ්කරතර ය.

ඒ නිසා පශ්චිමජනතානුකම්පාවෙන් පෙළඹුන පැරණි පර්යාප්තිධර මහපඬිවරයෝ බෞද්ධධර්මය අවබෝධ කර ගැණීමට පහසු වන පරිදි අර්ථකථා කොළෝ ය. ටීකා කොළෝ ය. ටීකානුටීකා කොළෝ ය. ග්‍රන්ථිපද කොළෝ ය. තවත් නොයෙක් ධර්මසංග්‍රහයන් ද කොළෝ ය.

**පර්යාප්ති ප්‍රමාණය:-** පාලි පරීක්‍ෂණයෙන් මේ පිළිබඳ ව හා කුදුගත්සඟිය පිළිබඳ වත් මදවිස්තරයක් ප්‍රකාශ විය. එ ද වනාහි ග්‍රන්ථාගතබහුතරවාදීමතයන් අනු ව කල්පනා කළ යුතු පරිදි මිස පෞද්ගලික හැඟීමෙක් නො වේ. මෙහි දක්වෙන්නේ අපගේ අදහස ය. "පර්යාප්ති ප්‍රමාණය ධර්මස්කන්ධ සුවාසූ දහසෙක" යනු ආනන්දහිමියන්ගේ දේශනා ය. ගොපකමොග්ගල්ලානසූත්‍රයේදී "ඔබවහන්සේ බහුශ්‍රැතයෙක. ධර්මධාරියෙක. කොතෙක් ධර්මයෝ ඔබ විසින් දරණ ලද්දාහු ද"යි බමුණා ඇසූ ප්‍රශ්නයට ආනන්ද හිමියෝ

**"ද්වාසීතිං බුද්ධතො ගණ්හිං ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීතිසහස්සානි යෙමෙ ධම්මා පවත්තිනො."**

යනු වදාළෝ ය. බුදුරදුන් වෙතින් ධර්මස්කන්ධ දෙ අසූදහසක් හා භික්‍ෂූන් වෙතින් දෙදහසක් ද ධාරණය කොට ගත් බව එයින් ප්‍රකාශිත ය. සම්මාදිට්ඨි- සමචිත්තපරියාය සූත්‍රාදිය භික්‍ෂූන්

වෙතින් ධාරණය කොට ගත් ධර්මයෝ ය. "සබ්බමෙව චෙතං බුද්ධවචනං" යනුවෙන් සමන්තපාසාදිකාවෙහි (ත්‍රි: මු: 16 පිට) මේ සියල්ල ම බුද්ධවචන බව කියති. අනඳහිමියන් ඒ ප්‍රකාශය කරණවිට පයර්‍යාප්තියෙහි මේ ප්‍රමාණය සම්පූර්ණ ව පැවතුන බවට කිසි ම සැකයෙක් නැත. ප්‍රථම ධර්මසඞ්ගායනාවට අයත් වූයේ ද මෙපමණෙකි. ඒ අනඳහිමියන්වහන්සේ විසින් ම සම්බුද්ධපරිනිර්වාණයෙන් පසු ව දෙශනා කළ සුභසූත්‍ර ගොපකමොග්ගල්ලාන සූත්‍රයෝ පවා මේ සඞ්ගායනාවට කෙසේ වෙතත් සංඛ්‍යාවට අයත් නො වූහ යි සිතිය යුතු යි. පූර්වාචාර්‍ය්‍යවරයන්ටත් එය අවිනිශ්චිත වූවක් බව සාරත්‍ථදීපනී (මුද්‍රිත 57 පිට) ආදියෙහි ඒ සඳහා කළ විවරණයන්ගෙන් හැඟෙයි.

එපමණක් නො ව පාලිපරීක්‍ෂණයේ දක්වුනපරිදි දූනට අවිද්‍යමාන ය යි සලකන දහම් කොටස් ද මේ සඞ්ඛ්‍යාවට හා සඞ්ගායනාවට ඇතුළත් වූහු ද යනුත් අවිනිශ්චිත ය. පූර්වාචාර්‍ය්‍යවරයෝ ද ඒ පිළිබඳ ව නාම ලේඛනය මිස අන් කිසිවක් නො දක්වති. පූර්වාචාර්‍ය්‍ය කථාවන්හි ඒ ගැණ යම් විස්තරයක් තුබුනේ නම් ඒ ධර්මස්කන්ධයෝ ද අනඳ හිමියන්ගේ ධාරණයට ඇතුළත් වූ බව හා එහෙයින් ධර්මසඞ්ගායනාවටත් නැගුන බව පිළිගත හැකි ය. සෙසු නවීනාචාර්‍ය්‍ය කථාවලට වඩා විශුද්ධිමාර්ගයෙහි පෙණෙන ඇතැම් විස්තර අනුව සලකන විට පූර්වාචාර්‍ය්‍ය කථාවන්හි ඔවුන් පිළිබඳ කිසියම් විස්තරයක් තුබුන බව අනුමාන කළ හැකි නමුත් ඒ පූර්වාචාර්‍ය්‍ය කථා හා ග්‍රන්‍ථපදත් අද අප හමුවෙහි නො තිබීම නිසා සැබවින් ම මෙබඳු කාරුණු නිරාකරණය කර ගැණීමට වූයේ බලවත් බාධාවෙකි. විශුද්ධිමාර්ගයෙහි හා චරියාපිටකඅට්ඨුවාවෙහිත් පෙණෙන කුළුම්බසූත්‍රපාඨය හැර අන්කිසි සඞ්කේතයක් අප විසින් නො දක්නා ලදී.

ඒ කෙසේ වුවත් දෙවන තුන්වන සඞ්ගායනා වන්ගෙන් බොහෝ ධර්මප්‍රදෙශ පයර්‍යාප්තියට එක් කළ බවට කාගේ වත් විවාදයක් නො මැති යි. එහෙත් තුන්වන ධර්මසඞ්ගායනාවෙන් පසු ව එය කරවූ ධර්මාශෝක මහීපාලයන් ධර්මස්කන්ධ කොතෙක් දූ යි භික්‍ෂූන්ගෙන් අසා සුවාසූදහසෙකැ යි දූන ඔවුනට පූජා පිණිස සුවාසූදහසක් විහාරයන් කරවූ බව කියති. මේ හැර මේ කාලයෙහි හා පසු කාලයෙහිත් ලියවුනු බොහෝ විස්තර අනු ව හැඟෙන්නේ සුභ සූත්‍ර කථාවත්‍ථුප්පකරණාදි බොහෝ ධර්මස්කන්ධ පසුව සඞ්ග්‍රහයට ගිය නමුත් මේ සඞ්ඛ්‍යාවෙහි වෙනසක් නොවූ බව ය.

අනඳ හිමියන් යථොක්තප්‍රකාශය කරණවිට ධර්මස්කන්ධ සංඛ්‍යාව සම්පූර්ණ ව තුබුනත් ඒ ප්‍රකාශය ප්‍රසිද්ධතර වූවක් හෙයින් ද **"අප්පකානං උපරිමඨිකානං ගණනූපගං න හොති"** යන න්‍යායානුකූල ව පසු ව ඇතුළත් කළ කොටස් ගණන් නොගෙණ සුවාසූදහසෙක යන්න ව්‍යවහාරප්‍රාප්ත වූයේ ය. එසේ වූයේ නමුදු ධර්මස්කන්ධ සංඛ්‍යාව එයට අධික ය. **"ඉදඤ්ච භගවතො ධරමානකාලෙ උග්ගහිතධම්මක්ඛන්ධවසෙන වුත්තං. පරිනිබ්බුතෙ පන භගවති ආනන්දත්ථෙරෙන දෙසිතානං සුභසුත්තගොපකමොග්ගල්ලානසුත්තානං තතියසඞ්ගීතියං මොග්ගලිපුත්තතිස්සත්ථෙරෙන කථිතකථාවත්ථුප්පකරණස්ස ච වසෙන ධම්මක්ඛන්ධානං චතුරාසීතිසහස්සතොපි අධිකතා වෙදිතබ්බා."**

මේ වනාහි භාග්‍යවතුන්වහන්සේ ජීවත් ව වැඩසිටිය දී උගත් ධර්මස්කන්ධයාගේ වසයෙන් කියන ලදී. භාග්‍යවතුන්වහන්සේ පිරිනිවි කල්හි ආනන්දතෙරුන් දෙසූ සුභසූත්‍ර ගොපකමොග්ගල්ලානසූත්‍රයන්ගේ වසයෙන් හා තුන්වන සඞ්ගායනාවේ දී මොග්ගලිපුත්තතිස්සතෙරුන් වදළ කථාවත්ථුප්පකරණයාගේ වසයෙනුත් ධර්මස්කන්ධසංඛ්‍යාව සුවාසූ දහසට අධික වසයෙන් දත යුතු ය යනුවෙන් විමතිවිනොදනිය ද (මුද්‍රිත 20 පිට) මීට සාක්ෂ්‍ය දෙයි.

දැනට ප්‍රකට ව පවත්නා පෙල පොත් වලින් නම් වැඩියක් තබා යථොක්තසංඛ්‍යාව වත් සම්පූර්ණයෙන් නො මැති ය යි සිතීමට කරුණු බහුල බව මුලින් කීවෙමු. මහරහතන් විසූ කාලයේ පවා ඇතැම් කොටස් විනාශ වී ගියේ නම් නොයෙක් උවදුරු වලින් පීඩිත වූ ඉන් මෙපිට කාලයේ පයර්‍යාප්තියෙන් කිසිවක් ගිලිහී නො ගියේ ය යි කවරකුට නිශ්චය කළ හැකි ද? පූර්වාචාර්‍ය්‍යවරයන් ටත් පයර්‍යාප්තිප්‍රමාණය ගැණ පිරිසුදු විනිශ්චයක් නො කළ හැකි බව කුදුගත් සඟිය පිළිබඳ මතභෙදයන්ගෙන් ඉදුරු දැක්වෙන්නේ ය.

**කුදුගත් සඟිය:--** පයර්‍යාප්තිය පිටක වසයෙන් බෙදන කල කුදුගත් සඟිය ඇතුළත් වන්නේ සූත්‍රපිටකයට ය. එය **"ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්ථු, පෙතවත්ථු, ථෙරගාථා, ථෙරීගාථා, ජාතක, නිද්දෙස, පටිසම්භිදා, අපදාන, බුද්ධවංස, චරියාපිටක"** යන්නේ වසයෙන් පසළොස් ප්‍රභෙදයකින් යුක්ත ය. නිකාය වස යෙන් බෙදන කල විනයාභිධර්ම පිටකදෙකත් මීට ම ඇතුළත් වන්නේ ය යනු සමන්තපාසාදිකාවෙහි (ත්‍රි: මූ: 10-15 පිටු)

කියති. සාරත්ථදීපනියෙහි (මුද්‍රිත 54 පිට) පෙණෙනුයේ ඛුද්දක නිකායාන්තර්ගත ඛුද්දකපාඨාදි ග්‍රන්ථ පසළොස සූත්‍ර පිටකයට ඇතුළත් වන බව මජ්ඣිමභාණකයන් විසින් ද චරියාපිටක බුද්ධවංස යන් හැර සෙස්ස අභිධර්මපිටකයට ඇතුළත් වන්නේ ය යි දීඝ භාණකයන් විසින් ද කියන බව ය. චරියාපිටකය හා බුද්ධවංසය අසුවල් පිටකය ට අයත් වන්නාහ යි දීඝභාණකයෝ වත් විනය පිටකය අසුවල් නිකායට අයත් වන්නේ ය යි ඔව්හු හෝ මජ්ඣිම භාණකයෝ වත් නො කියති. පෙටකොපදෙසය හා නෙත්තිප්ප කරණය ගැණ ඒ කිසිවෙක් සඳහන් නො කළහ. බුදුගොස් මාහිමියෝ ද ඒ ග්‍රන්ථ දෙකේ නාමය හා ඉන් ගත් තැන් විරළ ව දක්වන නමුත් අසුවල් පිටකයට හෝ නිකායට ඇතුළති යි පැහැදිලි කොට නො කියති.

මහාකච්චායන හිමියන් විසින් අර්ථකථාස්වරූපයෙන් කළ ඒ ග්‍රන්ථ දෙක එසේ ම තිබෙන්නට හරිණු මිස පෙළට එකතු කිරීමට පෙරදූරන් විසිනුදු මැළි වූ බවක් මෙයින් නො හැඟෙන්නේ ද? "**පෙටකොති මහා කච්චායනත්ථෙරෙන කතං නෙත්තිප්පකරණනයානුසාරි පකරණං. තං පන පිටකානං වණ්ණනාභූතත්තා පෙටකන්ති වුත්තං.**" පෙටක ය යි කියන්නේ මහා කසයින් තෙරුන් විසින් නෙත්තිප්පකරණයට අනුකූල වන පරිදි කළ ප්‍රකරණයෙකි. එය වනාහි පිටකයන්ගේ වර්ණනාස්වරූප යෙන් කරණ ලද හෙයින් පෙටක ය යි කියන ලදී යන්නෙන් සෙසු ග්‍රන්ථ ගැණ මෙබඳු විවරණයක් නො කරණ විමතිවිනොදනී කර්තෲපාදයෝ නෙත්තිප්පකරණයටත් වඩා පෙටකොපදෙසයාගේ අර්ථකථාස්වරූපය හා අප්‍රකට භාවයක්ද හඟවති.

කෙසේ නමුත් මේ ග්‍රන්ථ දෙකත් කුදුගත් සඟියෙහි සඞ්ග්‍රහ වන්නේ නම් ථෙර-ථෙරීගාථාග්‍රන්ථය දෙකක් වසයෙනුත් සල කන්නේ නම් ඛුද්දකනිකාය ග්‍රන්ථ පසළොසකට අධික ය. එහි ප්‍රමාණය ධර්මස්කන්ධ මෙතෙකැ යි සෙසු නිකායයන් මෙන් ඍජුව දැක්වීම පෙරදූරන්ට ද අපහසු කරුණෙක් විය.

**ධර්මග්‍රන්ථ**:- ලොකනාථයන් වහන්සේ විනෙය ජනයන්ගේ අවබෝධයට සුදුසු පරිදි සුදුසු තැන දී දෙශනා කළ ඒ ඒ දහම් කොටස් හා ශාසනස්ථිතියට වුවමනා ප්‍රඥප්ති ද භික්ෂූහු සිතින් ම ධාරණය කොට ගත්හ. පරිනිර්වාණයෙන් පසු සඞ්ගායනා කිරීමෙන් උචිතස්ථාන පුරවා ග්‍රන්ථ හෝ නිකාය වසයෙන් සකසා පිළියෙල

කොට නො විසිරෙණ පරිදි නො නැසෙන පරිදි ධාරණය ස්ථාවර කළහ. එහෙත් ප්‍රථම සඞ්ගායනා කාලයටත් පෙර සිට ඇතැම් දහම් කොටස් අපවත්වූ සේ පෙණේ. මෙහි පාලි පරීක්ෂණ යෙන් දක්වුන ඒ දහම් කොටස් නියමබුද්ධවචන නම් ඒ කාලය දක්වාත් ඔවුන් නො නැසී පැවත්තේ නම් සඞ්ගායනාවට ඇතුළත් විය යුතුය. අපවත් නො වූයේ නම් **"බුද්ධස්ස භගවතො භාසිතෙ අපනෙතබ්බං නාම නත්ථි. න හි තථාගතා එකබ්‍යඤ්ජනම්පි නිරත්ථකං වදන්ති."** භාග්‍යවත් බුදුන් වහන්සේගේ භාසිතයෙහි ඉවත් කළ යුත්තෙක් නම් නැත. තථාගතයෝ එක අකුරකුදු නිකරුණේ නො වදරති යනු සාරත්ථදීපනීයෙහි (මුද්‍රිත 51 පිට) කීවාක් මෙන් බුඩවචනයෙහි බැහැර ලිය යුතු කිසිවක් නො මැති හෙයින් සඞ්ගීතිකාරක උතුමන්ට ඒ ධර්මයන් බැහැර කිරීමට බල යක් නැත්තේ ය.

පරිනිර්වාණයෙන් පස්වනශතවර්ෂය දක්වා සාට්ඨකථාපාලිය මුඛ පාඨයෙහි ම පැවත්තේ යි. බුද්ධකාලයෙහි ද ඇතම් දහම් කොටස් ලේඛනයෙහි තුබුනේ ය යි අනුමාන කළහැකි නමුත් ප්‍රසිද්ධ වශ යෙන් ලේඛනගත වූයේ පස්වන ශතවර්ෂයේ දී ය. එනම් වළගම්බා රජ සමයේ දී ය. සිව් ශතවර්ෂයක් මුළුල්ලෙහි මුඛපාඨයෙන් ගෙණ ඒම නිසා ඇතම් ග්‍රන්ථස්ථාන ගැණ ආකුලත්වයක් හා සමෘතිවිප්‍රවාස යෙන් සිදු වන අපපාඨත් ඇති වූ බවට සැකයෙක් නොමැති යි. එහෙත් එවකට සිටිය මහාක්ෂීණාශ්‍රවයෝ ඔවුන් බැහැර කොට පිරි සුදු ධර්මලේඛනයක් ඇතිකොළෝය. ත්‍රිපිටක පාලිය හා ප්‍රථම ධර්ම සඞ්ග්‍රාහක උතුමන් විසින් නිෂ්පාදිත මහාට්ඨකථාවත් ඒ ලේඛනයට අයත් වූ හ.

බුද්ධකාලයෙහි ද කිසියම් අට්ඨකථාවක් තුබුන බව දම්පියා ගැට පදයෙන් හැඟෙන නමුත් ඒ පිළිබඳ විස්තරයක් කිරීම අපහසු ය. එබන්දක් වූයේ නම් ඔහු ද යථොක්ත ලේඛනයට අයත් වූ හ යි සිතිය යුතුයි. ඒ ලේඛන කාලයේ පටන් බුදුඝොස් මාහිමියන් දක්වා ශතවර්ෂපසක් පමණ කාලය තුළ දී පච්චරියාදි තවත් අට්ඨ කථා සතරෙක් ඇති වූහ. ආගමට්ඨකථාව මහාට්ඨකථාවේ ම ඡේදයකැ යි සලකන ලද නමුදු **"අයං න සොතවිඤ්ඤෙය්‍යො මනොවිඤ්ඤෙය්‍යොති මහාඅට්ඨකථායං ආගතො. ආගමට්ඨ කථාසු පන විතක්කවිප්ඵාරසද්දොති විතක්කවිප්ඵාරවසෙන උප්පන්නං විප්පලපන්තානං සුත්තප්පමත්තාදීනං සද්දං."** යන අත්ථසාලිනීපාඨයෙන් (මුද්‍රිත 102 පිට) එය මහාට්ඨකථාවෙන්

අන්‍ය වූ අටුවාවෙකැයි කීමට ද කරුණු පෙණේ. එසේ ම පඤ්චප්පකරණ අටුවාවේ (ත්‍රි: මු: 36 පිට) ධම්මසඞ්ගහට්ඨකථාවක් ගැණ ද කියැවේ. මොහු කවර කලෙක කවුරුන් විසින් කොහි දී කෙසේ නිෂ්පාදිත ග්‍රන්ථයෝ දැ යි විස්තර කිරීමට සාක්ෂ්‍ය ප්‍රකට නො වන හෙයින් පූර්වාචාර්‍ය්‍යකථාවෝ ගණනින් පසෙකැයි මෙසේ කියන ලද බව සැලකිය යුතු යි.

මේ කාලයේදී ලාංකික භික්ෂූන් අතරද නිකායභෙදය පැන නැඟීම නිසා ඒ පච්චරියාදි ග්‍රන්ථයෝ ධර්මවිරොධ කරුණු වලිනුදු ගහණ වූහ. පාලිධර්මයේ අවර්ණිතස්ථාන හා ග්‍රන්ථිස්ථාන සම්බන්ධයෙන් නානා ප්‍රකාර මතභෙද ද පහළ කළහ. බුද්ධඝොෂ මාහිමියන් පෙල හා ඒ පැරණි අටුවා පස අලලා බලා හැකි තාක් එකී විරොධ කරුණු බැහැර ලා මතභෙදනිරාකරණය කිරීමෙන් විසිතුරු වර්ණනා වලින් සැදුනු පාලට්ඨකථාපඞ්ක්තියක් සම්පාදනය කොට බෞද්ධධර්මග්‍රන්ථාවලිය තර කළහ. ධම්මපාලාදි ආචාර්‍ය්‍යවරයන් විසිනුදු උන්වහන්සේ අනුගමනය කොට අට්ඨකථා හා ටීකා සම්පාදනය කිරීම නිසා ඒ ග්‍රන්ථමාලාව අති විශාල වූවක් විය.

**ශාසනික පරිහාණි**:- බෞද්ධ ග්‍රන්ථසංඛ්‍යාව විශාල වූවාක් මෙන් ම අභ්‍යන්තර බාහිර වශයෙන් එයට සිදුවූ පරිහාණි ද විශාල ය. වළගම්බා කාලයේ පටන් පැවති නිකායභෙදය දිවුලාගල කාශ්‍යප යතිනාථයන් විසින් එක් ප්‍රමාණයකින් සමථයකට පත් කළ නමුත් එයට සමීප කාලයක පටන් මේ දක්වාත් භික්ෂූන් අතර එය පවත්නා බව නො රහසෙකි එයින් බෞද්ධධර්මයට ද අභ්‍යන්තර වශයෙන් බලවත් පරිහාණියක් වී තිබෙන බව පරීක්ෂාවෙන් බලන කල පැහැදිලි වෙයි. යුක්තිය නො තකා ශක්තියට ගරු කිරීමෙන් තමන්ගේ වාසිය තැනහොත් තමන් ගත් ලබ්ධිය තර කිරීමට සැරසීම නිසා හටගත් විවාදහේතුයෙන් නියමධර්මාර්ගීය අවබෝධ කර ගණු නො හැකි ව ධර්මයට අනුලොම් නො වූ අන්‍යනො මත බහා ලීමෙන් හා තමහට අවිෂය තැන් වසා දැමීමෙනුත් බලා පොරොත්තු විරහිත ව මෙන් පාලිධර්මය කොලෙසීමට තැත් කළ බවක් පෙණේ. එය බොහෝ සෙයින් පෙණෙන්නේ ටීකා හා ධර්ම සංග්‍රහයන්ගෙනි.

මීට වඩා බාහිරවශයෙන් ධර්මග්‍රන්ථයන්ට සිදු වූ පරිහාණි ඛෙදජනක ය. පසමිතුරන් විසින් හා කාලය විසින් කරණ ලද සැහැසිකම් නමැති භයඞ්කර ජනපද රෝගයට වෙසෙසින් ගෝචර වූවෝ

නම් ධර්ම ශාස්ත්‍රීයග්‍රන්ථයෝ යි. සද්ධර්මමාමක ඇතැම් පූර්වාචාර්යවර යන් දිවි දෙවැනි කොට පර්යාප්තිය ආරක්‍ෂා කර ගැණීමට තැත් කිරීම නිසා එතුමෝ ද කොතරම් පීඩාවලට භාජන වූවෝ ද යන්න පුරාවෘත්තයන්ගෙන් පැහැදිලි වන්නේ ය. කල් යත් යත් භික්‍ෂූන් සැහැසි ලෙස විවාදාපන්න වීමෙන් හා පර්යාප්තිය රැක බලා ගැණීමට උත්සුක නො වීමෙනුත් සමයාන්තරවාදීහු එය වෛතුල්‍ය මත හා මිශ්‍ර කිරීමට නොයෙක් වර ඉදිරිපත් වූහ. කොටියෙන් කිය තොත් ස්වදේශීය කැලඹීම් වලින් හා පරසතුරු පීඩාවලින් ද මිසදිටු වන්ගේ දමරිකක්‍රියාවලින් හා ශාසනිකයන්ගේ නොවුවමනා වාද භේද වලින්ද දුර්භික්‍ෂ උවදුරුවලින් හා ධීර වීර උතුමන්ගේ අභාව යෙනුත් ශාසනධර්මයට සිදුවූ පරිහාණි මෙතෙකැයි ප්‍රමාණ කළ නො හැක.

එහෙයින් වර්තමානයට නුදුරු අතීතය පැවැත්තේ ශබ්දශාස්ත්‍ර යෙන් මෙන් ම ධර්මශාස්ත්‍රයෙනුත් බොහෝ දුර්වලතත්වයකය. ධර්ම ශාස්ත්‍රීය උගත්තු අතිශයින් දුර්ලභ වූහ. පාලිධර්මග්‍රන්ථයක නිවැරදි අදහස දක්වනු තබා පැහැදිලි ව කියවියහැකි කෙනෙකු සොයා ගැණීමට අපහසු තරම් කාලයෙක් විය. ග්‍රන්ථලේඛකයන්ගේ තත්ත්වය ද එසේ ය. ගුරුපොතෙහි වැරදී කටු ගා තුබූ තැන තුමූද ලියා කටු ගාතා තරම් "විශාරද" යෝ ද බහුතර වූහ. මේ නිසා ශාස්ත්‍රීයලේඛනයන්හි මෙන් ම ධර්මලේඛනයන්හිත් අනේක අප පාඨයෝ නිතැතින් නිපතිත වූහ.

**වර්ණනා හා විරොධ හැඟීම්:** එසේ පතිත වූ අපපාඨ දුනුදු සාර්ථකථාපාලියෙහි තිබෙනු දක්ම කිසිවකුගේ දෙෂාරොපණයට හා ප්‍රසාදහානියට හේතු වන කාරණෙකි. ඒ සඳහා කරණ උද්ඝො ෂණය යන්තමකින් වත් සහේතුක ය යි කිය හැකි නමුත් ඇතැම් කෙනෙකු දෙස් පහළ කිරීමට යුහුසුලු වන්නේ අර්ථකථාවල එන වර්ණනාක්‍රම නිසි පරිදි වටහා නො ගෙණ වැරදි හැඟීම් ඇති කර ගැණීමෙනි. වස්සකාර බමුණා කිසියම් ධර්මදෙශනාවක් අසා එයින් ගත් ක්‍රමයක් අනුව ලිච්ඡවීන් භෙද කිරීමට සැරසුනාක් මෙන් නුවණින් සලකා මැනවින් අවබෝධය නො ලත් කිසිවෙකුට අර්ථ කථාගතවර්ණනායන්ගෙන් විරොධ අදහස් පහළ වන්නට ද නො හැකි නො වේ.

සුමෙධ තාපසයන් පාරමීධර්ම සම්මර්ශනය කළ අවස්ථාවෙහි සිදුවූ අද්භූත සිද්ධි පිළිබඳ ව ජාතක අටුවාවේ එන වර්ණිත ස්ථාන යෙක් මෙ:- "මහාපඨවියා කම්පමානාය රම්මනගරවාසිනො

**සණ්ඨාතුං අසක්කොන්තා යුගන්තවාතබ්භාහතා මහාසාලා විය මුච්ඡිතමුච්ඡිතා පපතිංසු. සට්ඨාදීනි කුලාලභාජනානි පවට්ටන්තානි අඤ්ඤමඤ්ඤං පහරන්තානි චුණ්ණවිචුණ්ණානි අහෙසුං"** මහපොළොව කම්පිතවන කල්හි රම්මනුවර වාසීහු සිටිනට නො හැක්කෝ යුගාන්තවාතයෙන් මඩනා ලද මහාවෘක්ෂයන් මෙන් මුසපත් වෙමින් පතිත වූවාහු ය. කළ ආදී මැටි බඳුන් පෙරළෙමින් එකිනෙකට ගැටෙන්නාහු සුණු විසුණු වූවාහු ය. යනු මෙහි අදහස යි. ඒ අවස්ථාවෙහි පැවති අද්භූතගුණය දක්වීමට මෙසේ කළ වර්ණනයෙන් රම්ම නගර වැසියන්ට බලවත් හානියක් සිදුවූසේ සිතෙනු හැකි ය.

එසේ ම ආලවක යුද්ධයේ දී අලව් නුවරට බොහෝ අලාභහානි සිදු වූ බව කියන ලදී. සැබවින් ම එය එසේ වී නම් බරපතල වරදෙකි. එපමණක් කියවූ කෙනෙකුට මේ සාවද්‍යවර්ණනයෙකැ යි කියනු රිසි විය හැක. "අටුවා වැලලිය යුතුය"යි අවරදිග කිසියම් වියතෙකුගේ නිග්‍රහයට භාජන වූවාහු ද මෙබඳු වර්ණනයෝයි.

මහාසච්චක සූත්‍රයෙහි කායචිත්තභාවනාවන් ගැණ දක්වන බුදුරදුන් විසින් "ගිහිවෙස්න, ඖලාරික දුර්වල කායභාවනා ගැණ නො දන්නා තෙපි ඉතාමත් සියුම් චිත්තභාවනාවක් ගැණ කෙසේ දැන ගන්නහු දැ"යි කළ මේ දෙශනාවෙන් දහම් දෙසමින් සිටි **ශොණරට්ඨිය** නම් තෙරුන් වහන්සේ "මෙය බුද්ධ වචනයක් නම් නො වේ" යයි විජිනිපතත් දමා නැගිට ගිය ප්‍රසිද්ධියක් ද පපංච සූදනියෙහි (ශ්‍රී: ධ: ස: 463 පිට) පෙණේ.

යථොක්ත වර්ණනාවලින් පහළ විය හැකි විරොධ හැඟීම් දුරු කිරීමට සෑහෙන හේතු යුක්ති ඒ ඒ තන්හි දී ම නො දක්වන ලද නමුත් දක්වන ලද තැන් ඇත්තාහ. මේ එක් තැනෙකි. **"භගවා මා කස්සචි උපරොධො හොතූති අධිට්ඨාසි."** භාග්‍යවතුන් වහන්සේ කිසිවෙකුටත් හානියක් නො වේවා යි ඉටූසේක. යනු එසේ පහළ විය හැකි හැඟීම් ගැණ සැලකූ ටීකාචාර්‍ය්‍යයෝ ආලවකසූත්‍ර ටීකාවෙහි කියති. එහෙයින් මේ වර්ණනාක්‍රම පමණක් සලකා දෝෂාරෝපණයට ඉක්මන් නො විය යුතු යි.

කව්සිළුමිණ–කාව්‍යශෙඛරාදි කාව්‍යග්‍රන්ථයන් දෙස පරීක්ෂාවෙන් බලන්නෙකුට අර්ථකථාවෙන් පිටත් නොයෙක් කරුණු එහි ඇතුළත් වී තිබේදැ යි දත හැකි ය. ගීයෙන් හෝ කවියෙන් කළත් ඔහු ධර්මග්‍රන්ථයෝ ම ය. එලෙසින් ඇතම් පූර්වාචාර්‍ය්‍යවරයෝ ද

යෝග්‍ය පරිදි තත් තත් කාලික වූ කරුණු ද වර්ණනයන්හි ඇතුළත් කළහ. මේ එක් නිදර්ශනයෙකි:- "**ඉමස්මිං ඨානෙ ඉදානෙව මගධභාසාය, සීහළ භාසාය මධුරෙන සරෙන ගායතො කො නු ඛො අයං අනන්තරහිතො කිං දෙවො උදාහු මනුස්සොති එවං විමංසන්තාපි න ජානන්තීති අත්ථො.**" මෙ තැන මේ දැන් මගධ භාෂායෙන් සිංහල භාෂායෙන් මිහිරි ලෙසින් කියමින් අතුරුදන් වූයේ කවරෙක් ද දෙවියෙක් ද නොහොත් මිනිසෙක් දැ යි මෙසේ සොයන්නාහු ද දැන නො ගණිත් යන අර්ථ යි. මනොරථපූරණියෙහි (ත්‍රි: මු: 784 පිට). **කො නු ඛො අයං** යන පාලිපාඨයට මේ අටුවා කළ සැටි ය.

මෙයින් අන් සක්වළ දී බුදුරදුන් හෙළ බසින් බණ දෙසන ලද ය යි තර්ක කළ හැකි ය. මෙය එසේ සැලකීමට කළ යෙදීමක් නො වේ. එහිදී ද බුදුහු මගධභාෂායෙන් ම දම් දෙසති. එහෙත් ඒ සක්වළ වැසියන්ට ගැහෙනුයේ ඔවුන්ට අයත් කිසි යම් බසකින් දෙසන සේ ය. ඔවුන්ගේ බස කුමක් දැ යි විනිශ්චය නො කළ හැකි ආචාර්ය්‍යවරයෝ අර්ථකථා කරණ කාලයේ දී ලක්දිව ප්‍රසිද්ධ ව පැවතුන භාෂා දෙක නිමිත්තකොට ගෙණ වර්ණනය කළහ. මේ වනාහි අපගේ අදහස ය.

කිසිවෙක් සීහළ නම් වූ මගධ භාෂායෙකැ යි මෙතැනට අර්ථ දෙත් ල. මෙය එසේ අර්ථ දීමට හැකි තැනෙක් දැ යි මධ්‍යස්ථ ව කල්පනාකළ යුතු යි. එලෙසින් අර්ථ දෙන්නේ නම් "**පොරාණෙව සීහළ භාසාය ලිඛිතමහාවංසෙ වතුපණ්ණාසාය සද්ධිංනාපි වුත්තං.**" එහෙයින් ම හෙළබසින් ලියන ලද මහාවංසයෙහි සිවුපණස් දෙනෙකුන් සමග ය යි කියන ලදී. යන සාරත්ථදීපනී (මුද්‍රිත 143 පිට) පාඨයේ පෙණෙන "**සීහළභාසාය ලිඛිත මහාවංසෙ**" යන්නට පෙළබසින් ලියූ මහාවංසයෙහි ය යි අර්ථ දිය යුතු ය. ඒ කාලයෙහි සිංහල මහාවංසයක් පැවති බව හා දැනට එය අවිද්‍යමාන බවත් නො දන්නවුන් විසින් එසේ අර්ථ දෙනු නිසැක ය. කරුණ පිරිමසා ගැණීමට කටට තැගෙන කුමක් වුවත් බිහි කිරීම වාතීනමාතික පණ්ඩිතාපණ්ඩිත බොහෝ දෙනෙකුන් ගේ සිරිත වුව ද මෙබඳු කරුණෙහි දී නම් තීරණබුද්ධිය මධ්‍යස්ථ එකක් විය යුතු ය.

තවද අර්ථකථාචාර්ය්‍යවරයෝ බුදුරජුන්ගේ අදහස ශ්‍රීමුඛපාලියක් මෙන් හැඟෙන සේ කිසි තැනෙක වර්ණනා කොළෝය. එයින් මේ එක් තැනෙකි:-

“යො ධම්මවිනයො තුම්හාකං මමච්චයෙන සත්ථා” යන මහාපරිනිර්වාණ සූත්‍රපාඨය වර්ණනා කරණ බුදුගොස් මාහිමියෝ සුමඞ්ගලවිලාසිනියෙහි (ත්‍රි: මු: 414 පිට) මෙසේ දක්වති. “නං සකලම්පි විනයපිටකං සුත්තන්තපිටකං අභිධම්මපිටකං මයි පරිනිබ්බුතෙ තුම්හාකං සත්ථුකිච්චං සාධෙස්සති ඉති ඉමානි චතුරාසීතිධම්මක්ඛන්ධසහස්සානි තිට්ඨන්ති. අහං එකොව පරිනිබ්බායාමි. අහං ච පනිදානි එකොව ඔවදාමි. අනුසාසාමි. මයි පරිනිබ්බුතෙ ඉමානි චතුරාසීතිබුද්ධසහස්සානි තුම්හෙ ඔවදිස්සන්ති අනුසාසිස්සන්ති.” ඒ සියලු විනයපිටකය-සූත්‍රපිටකය-අභිධර්මපිටකය මා පිරිනිවි කල්හි තොපට ශාස්තෲකෘත්‍යය සිද්ධ කරන්නේ ය. මෙසේ මේ සුවාසූදහසක් ධර්මස්කන්ධයෝ සිටිත්. මම හුදකලාව පිරිනිවෙමි. මම දැන් තනි ව ම අවවාද අනුශාසනා කරමි. මා පිරිනිවි කල්හි මේ සුවාසූදහසක් බුදුවරු තොපට අවවාද හා අනුශාසනා කරන්නාහ. යනු එහි අදහස ය.

මෙය දෙශනාපාලියක් නම් මේ මේ පිටකයට මෙතෙක් මෙතෙක් ධර්ම ඇතුළත් වෙති යි. ත්‍රිපිටක පාලිය ද, ධර්මස්කන්ධයෝ මෙතෙකැ යි සංඛ්‍යාප්‍රමාණය ද බුදුරදුන් වහන්සේගේ වචනයෙන් ම බෙදා වදාළෝ ය යි නිශ්චය කළ යුතු ය. එහෙත් ඒ දෙක ම බෙදා ප්‍රමාණ කරණ ලද්දේ සඞ්ගීතිකාරක හිමියන් විසිනි. එපමණක් නො ව යථොක්ත පාඨය දෙශනාපාලියෙහි සඳහන් වූ තැනෙකුදු අපට හමු නො වී ය. එහෙයින් මෙබඳු තැන් තථාගතයන් වහන්සේගේ සම්පූර්ණ අදහස ඒ වාක්‍යලීලායෙන් ම දැක්වීමට කළ වර්ණනා ය යි සිතිය යුතු වේ.

කරුණු මෙසේ වර්ණනා කිරීම් හේතුවෙන් විමති පහළ වන්නේ අනවධානත්වය නිසා මිස පූර්වාචාර්යවරයන්ගේ වරදින් නො වන බව පෙණේ. හැම අර්ථකථාචාර්යවරයෙකුගේ හැම වර්ණනයක් ම එකසේ මැනවැ යි මෙයින් නො කියැවේ. අපගේ හැඟීම් පරිදි ඇතැම් තැනෙක සාමාන්‍යයෙන් කියයුතු දේ නො කියා හළ බව ද නුවුවමනා අධික වර්ණනාවලින් වෙහෙසට පත්වී තිබෙන බව ද කිව යුතු ය. “එවං මෙ සුතං” යන පදත්‍රය පිළිබඳ ව ග්‍රන්ථයකට ප්‍රමාණ වන තරම් විශාල වර්ණනා කළ තැනුදු වෙති. කෞශල්‍යය කොපමණ විශාල වුව ද අනෙකාර්ථ කොතරම් ඇති වුව ද මද මද ප්‍රයොජනත්වයකින් යුතු වුව ද එයට වඩා වෙහෙස ගෙණ වැණිය යුතු තවත් වැදගත් තැන් ඇත්තාහ.

වර්ණනාක්‍රම හරිහැටි අවබෝධ කර නො ගැණීම විරොධ හැඟීම් පහළ වීමට හේතු වන්නාක් මෙන් ම සමාන කථා-සිද්ධි-හා නාම විමසා දැන නො ගැණීමත් බොහෝ දෙනෙකුගේ අවුලට හේතු වන කරුණෙකි. එබඳු ප්‍රවෘත්ති ද ධර්මග්‍රන්ථයන්හි බහුල ය. ජාතක අටුවාවේ නමින් මිස කථාශරීරයෙන් ස්වල්පයක් වත් වෙනස් නොවන තරම් අතිශයින් සමාන කථා හා සිද්ධි මහත් රාශියෙකි. කාෂටවාහන ජාතකය හා කථාව, මට්ටකුණ්ඩලීජාතකය හා කථාව, කුසජාතකය හා පිප්පලී මාණවකයාගේ කථාව යනාදිය කොතරම් සමාන වර්ණනාවලින් යුක්ත දැයි බැලිය යුතු යි. එසේම අජකලාපසමාගමය හා ආලවකසමාගමයත් බෙහෙවින් සමාන ය. සඞ්ගාමජී- රට්ඨපාල- මහාකොට්ඨිත- සුදින්නයන්ගේ පැවිද්ද පිළිබඳ වර්ණනා එකාකාර ය. මෙසේ සමාන ප්‍රවෘත්ති බොහෝ ය. මොවුන්ගේ සමානත්වය වැඩියක් හැඟෙන්නේ වර්ණනා හේතුයෙනි.

සමාන නාමයෝ ද බොහෝ යි. බුද්ධ කාලයෙහි උදායි- නන්ද- නන්ද- කොකාලික- රෙවත- සොපාක- ජන්ත- සුභද්‍ර ආදී සමාන නම්වලින් ප්‍රසිද්ධ කීපදෙනෙක් සිටියහ. පසු කාලයෙහි ද අරිට්ඨ- සුමන- අභය- තිස්සාදි සමාන නමින් ප්‍රසිද්ධ වූවෝ බොහෝ දෙනෙකි. මෙය සදහට ම පවත්නා ලොක ස්වභාවයක් නමුත් සමාන නමින් ප්‍රසිද්ධ වූවන් පිළිබඳ කථාප්‍රවෘත්ති ද නාමයේ සමානත්වය නිසා බොහෝ දෙනෙකුට නොයෙක්විට පැටලෙති.

බුදුරදුන්වෙතින් අන්තිමට රහත් වූ සුභද්‍ර හිමියන් හා බුඩ්ඪපබ්බජිත සුභද්‍ර යනුත් එක්කෙනෙකු සේ ගෙණ කළ වර්ණනා ද "ගිලිය නො දී සැටමහණන් බවමහණ- මලියදෙව් තෙරිඳු වැඩ හිඳ දෙසූ බණ" යනාදීන් දැක්වෙන පූජීයෙහි සිටි මලියදෙව හිමියෝ, අන්තිමට වැඩ සිටි රහත් නම ය යි ජනශ්‍රැතියකින් කියැවෙන මලියදෙව හිමියෝ ය යි වරදවා කළ වර්ණනායදැ යි යනාදි වශයෙන් සමානනාම හා කථාවලින් අවියතුන් මෙන් ම වියතුන් ද භ්‍රාන්තියට පත් වූ අවස්ථා නොයෙක් විට ප්‍රත්‍යක්ෂ වූහ. එබැවින් අතීතකථාගත වර්ණනා ගැණ විරොධය පහළ කිරීමට මත්තෙන් බොහෝ දුරට කල්පනා කර බැලිය යුත්තේ ය.

**ආචාර්‍ය්‍යපරම්පරා හා වාද:-** බෞද්ධ ධර්මය දෙශනා කරණ ලද්දේ මීට සුවිසි ශතවර්‍ෂයකට ඔබ්බෙහි දී ය. එය මේ තාක් පවත්වාලීමේ සුතුකාම ශ්‍රාවක භික්ෂූහු යථාශක්තියෙන් ඉටු කොළෝය. එතුමන් විසින් පස්විසි ශතවර්‍ෂයක ට සීමා කළ හැකි

තරම් කාලයක් මුළුල්ලෙහි එය ආරක්ෂා කර ලීම සැබවින් ම බොහෝ ආයාසයකින් කළ මහා වීරක්‍රියාවෙකි. පූර්වාචාර්යවරයන්ට වාචීතමාතිකායන්ගේ අත්‍යන්ත භක්තිය හිමි විය යුතු වූ ඒ මේ කාර්යය කොතරම් දුෂ්කර වූවත් ද යනු මදක් වත් වැටහෙන්නේ ධර්මයේ ගම්භීරත්වය හා ග්‍රන්ථාවලියේ විශාලත්වය ද කාලයේ ඇති කෂ්ටකම හා මුහුණ පෑ උවදුරු ගැණ ද කල්පනා කරණ කෙනෙකුට ය. ජීවිත පවා ශාසනයට පූජාකළ එතුමෝ අනාගත ලෝකයට නයගැති නො වී ශුද්ධ බුද්ධධර්මය ඔවුන් අත තබනු පිණිස නොයෙක් උපක්‍රම යෙදූහ. ඉන් එක් උපක්‍රමයක් නම් පර්‍යාප්තිය කොටස් කර එක් එක් භික්ෂු පිරිසට භාර දී වෙන් වෙන් වශයෙන් තමන් තමන්හට භාර වූ කොටස් අර්ථකථාත් සමග ඔවුනොවුන් විසින් ධාරණෝද්ග්‍රහණයෙන් ආරක්ෂා කළ යුතු ය යි සම්මත කර ගැණීම ය.

මේ හේතුවෙන් පර්‍යාප්තිය ආරක්ෂා වීම හා සමග ම ථෙරිය ආචාර්‍යපරම්පරාවන්ගේ සම්භවය ද වී ය. දීඝභාණකාදීන්ගේ වශයෙන් දක්වෙන අටළොස් මහාගණයෝ ඒ ආචාර්‍යපරම්පරා වෝ ය. මොවුන් ගණනින් අටළොසෙකැ යි කියනලද නමුත් ග්‍රන්ථාගත සඞ්කේතයන් අනුව ධම්මපදභාණක ය යි තවත් ඇදුරු පරපුරක් ද පැවති බව පෙණේ.

යථොක්ත සම්‍යක් උපායයෙන් බලාපොරොත්තු නො වූ කරුණෙක් ද ඇති වි ය. එනම්:– ආචාර්‍යවාදයන්ගේ සම්භවය හා ව්‍යාප්තිය යි. එක් ඇදුරුපරපුරකට බොහෝ ආචාර්‍යවරයන් ඇතුළත් වන නිසා ඔවුනොවුන් අතරෙහි හෝ එයින් අන්‍ය වූවන් අතරෙහිත් නොයෙක් මතභෙදයෝ ගලා එන්නට වූහ. එයින් කිසිවක් එකදෙශයකින් සමාන වුවද කිසිවක් එකිනෙකට ඉදුරා ම විරුද්ධ ය.

අඞ්ගුත්තරභාණකයෝ අඞ්ග– නයන– ධන– රජ්ජ– පුත්තදාර යන්ගේ වශයෙන් පංච මහාපරිත්‍යාගය දක්වති. අත්තපරිච්චාග යක් නො කියති. දීඝ– මජ්ඣිම භාණකයෝ ද මේ මතයන් දක් වමින් අඞ්ග– පුත්තදාර– රජ්ජ– අත්ත– නයනයන්ගේ වශයෙන් අන්‍ය මතයක් ද කියති. එහි ධනපරිච්චාගයක් නොමැති යි. ඛුද්දකභාණකයෝ මේ මත දෙක ම හැර දමා අඞ්ග– අත්ත– ධන– පුත්තදාර– රජ්ජයන්ගේ වශයෙන් පංචමහාපරිච්චාගය වේ ය යි ඉතිවුත්තක අටුවාවෙන් තම මතයක් ප්‍රකාශ කරති. එහි නයන

පරිච්චාගයක් නො කියති. ජාතකභාණකයෝ මේ තුන් මතය ම අත් හැර දමා අඞ්ග- ධන- පුත්ත- භරියා- ජීවිතයන්ගේ වශයෙන් අන්‍ය වූ මතයක් කියති. එහි නයන- රජ්ජ පරිච්චාග දෙක නො මැති යි. සෙස්සවුන් එකක් වශයෙන් ගත් පුත්තදාරපරිච්චාගය පුත්ත- භරියා ය යි දෙකක් වශයෙන් ද ගත්හ. මෙසේ බලනකල මහාපරිත්‍යාගයෝ පසක් නො ව සතෙකැ යි ගත යුතු යි. එනම්:- අඞ්ග-නයන-ධන-රජ්ජ-පුත්ත-දාර ජීවිතයන්ගේ වශයෙනි.

තවද දීඝ- අඞ්ගුත්තර භාණකයෝ සුමඞ්ගලවිලාසිනී- මනොරථපූරණී ටීකා යන ග්‍රන්ථවලින් පුත්‍රදාරධනාදි උපකරණ පරිත්‍යාගය දාන පාරමී ය, තමන්ගේ ශරීරාවයව පරිත්‍යාග කිරීම දාන උපපාරමී ය, තමන්ගේ ජීවිතය පරිත්‍යාග කිරීම දාන පරමාර්ථපාරමී ය යි කියති. ඛුද්දකභාණකයෝ චරියාපිටකාර්ථකථාවෙන් මේ මතයත් කියන නමුත් බුද්ධවංස අටුවාවෙන් අඞ්ගපරිච්චාගය දාර පාරමී ය, බාහිරභාණ්ඩපරිච්චාගය දානඋපපාරමී ය, ජීවිතපරිච්චාගය දානපරමත්ථපාරමී ය යි අන්‍ය මතයක් ද දක්වති. ජාතකභාණකයෝ ද මේ දෙවන මතයෙහි පිහිටියෝ ය. මේ දක්වන ලද්දේ ආචාර්‍ය්‍යවාදයන්ගේ සමානාසමානත්වය මැන ගැණීමට නිදර්ශන ය.

මොහු පෙලෙහි ආ කරුණු ගැණ නොව ඔක්කාන්තික විනිශ්චයන් හා කථාමාර්ගයන් පිළිබඳ ව පහළ වූවෝ ය. පරමාර්ථ ධර්මාවබෝධයට බාධාවක් නැති වුවත් ආධුනිකයන්ගේ කරදරයට හා ධර්මගවේෂකයන්ගේ අවුලට හේතු වූ මොවුන්ගේ සම්භවය හා ව්‍යාප්තිය කෙසේ වත් නො වැළැක්විය හැකි දෙයකි. ආදියෙහි වූ මහාර්ථකථාවේ පටන් සියලු අර්ථකථාවල මේ මතභේද දක්වන ලද්දේ පරීක්ෂකයන්ගේ විචාරණය සඳහා නම් සත්‍යගවේෂණය කරන්නවුන් විසින් මෙහි දී කළ යුත්තේ මැනවින් විභාග කර බලා යුක්තිතර මතය පමණක් පිළිගැණීම ය. එහෙත් ආචාර්‍ය්‍යවරයන් විසිනුත් කිසිවක මතභේදය පමණක් දක්වා නිශ්ශබ්ද වීමෙන් හැහෙන්නේ එය ඉතා ම පරිස්සමින් කළයුතු කාර්‍ය්‍යයක් බව ය.

**විෂම ස්ථාන:-** අර්ථකථාපරීක්ෂණයේ සඳහන් කළ ඇතම් කරුණු වැනි එකිනෙකට සම නො වූ කථාප්‍රවෘත්ති වලටද ආචාර්‍ය්‍යවාද ය යි කියති. එකක් සත්‍ය නම් අනික අසත්‍ය ය යි තර්කකළ හැකි ඔවුනතුරෙන් කුමක් සත්‍ය වුව ද වරදක් නැති නමුත් සත්‍යය එකක් ම විය යුතු ය. කෙසේ වත් සම්බන්ධ කළ නො හැකි එබඳු

තැන් පූර්වාචාර්යවරයන්ගේ සමාතිවිප්‍රවාසයෙන් වූ ප්‍රමාද ය යි නො කිය හැකි නම් එය පහදා ලීම ධර්මධර පණ්ඩිතයන් විසින් කළයුතු වැදගත් ලොකානුග්‍රහයෙකි. එබඳු තැන් කීපයක් අප විසින් ගෙණ හැර දක්වන ලද්දේ "සදෙස් තැන් මේ ය" යි ඝෝෂණය කිරීමට ඇති කැමැත්තක් නිසා නො ව ආධුනිකයන් විසින් එබඳු තැන් වෙසෙසා දතයුතු හෙයින් හා විමසා බල යුතු හෙයිනි.

**ග්‍රන්ථ ශෝධනය:-** සම්පාදකයන්ගේ හෝ ලේඛකයන්ගේ ප්‍රමාදයෙන් සාර්ථකථාපර්යාප්තියට වැටි චිරප්‍රචලිත වූ අපපාඨ යන්ගේ ශෝධනය වනාහි හුදු ශබ්දශාස්ත්‍රඥතායෙන් ම නො කළ හැකි කාර්යයෙකි. එයට වඩා නිපුණ වූ ධර්මඥතාය ද තිබිය යුතු ය. නො එසේ නම් ව්‍යඤ්ජනච්ඡායාවන්හි එල්බ ගෙණ අනෙකාචාර්යයන් ඔස්සෙහි ගමන් ගෙණ නියම අර්ථය වළහති.

පූර්වයෙහි විජයාරාමවාසි එක් රහත් තෙරනමෙකුන් වහන් සේ භික්ෂූන් දෙනමකට සූත්‍රාන්තයකින් කම්ටහන් වදාරණ සේක් **"සමුද්දො සමුද්දොති භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො භාසති"** යනුවෙන් ශිථිලාක්ෂරය ධනිත කොට වදාළහ. භික්ෂූන් දෙනමෙන් එක් නමෙක් "ස්වාමිනි, සමුද්ධ යනු නො වේ සමුද්ද ය"යි කී ය. "ඇවත! සමුද්ධ ය යි කීවද සමුද්ද යයි කීවද අපි ලවණ සාගරය ම ගණිමු. තෙපි වනාහි අර්ථය නො ව අක්ෂරය ම ප්‍රමාණ කරන්නහු ය. යව. මහාවිහාරයෙහි ප්‍රගුණ වූ ව්‍යඤ්ජන ඇති භික්ෂූන්ගෙන් ව්‍යඤ්ජන සුද්ධ කරව" යි කම්ටහන් නො දී පිටත් කළ සේක. භික්ෂූහු දෙනම මෑත භාගයෙහි මහවෙහෙර ගෙඩිය ගස්වා සඞ්ඝයාට සතරමාර්ගයන්හි ප්‍රශ්න කියා පිරිනිවියාහු ය. (පපංචසූදනී ශ්‍රී: බ: ස: 827 පිට)

තවද ත්‍රිපිටකචූලාභය නම් තෙරුන් වහන්සේ කෙනෙක් පඤ්චනිකායමණ්ඩලයෙහි ධර්මදෙශනා කෙරෙමු යි ගෙඩිය ගැස් සූහ. මහාස්ථවිරවරයෝ "අසුවල් ආචාර්යවරයාගෙන් උගතිම් යි පළමු ව කියව. නැතහොත් දේශනාවට ඉඩ නො දෙමු" යි කීහ. චූලාභයතෙරුන්ගේ උපාධ්‍යායයන් වහන්සේ ද උපස්ථානයට එළඹි ස්වකීය සද්ධිවිහාරික ඒ තෙරුන් අතින් "ඇවත, ගෙඩිය ගැස්සුවෝ තෙපි ද?"යි අසා "එසේ ය" යි කී කල ආචාර්යවරයෝ "මේ පදයට කෙසේ අර්ථ දෙත් ද?"යි ඇසූහ. එවිට මෙසේ කියති යි එක් අර්ථයක් කී ය. උපාධ්‍යාය තෙරණුවෝ ද එය සරිවූවත් වැඩි දුරටත් පිරික්සනුවෝ හුංකාරයෙන් ප්‍රතිබාධනය කළහ.

චූලාභයතෙරණුවෝ ද ශාස්ත්‍රඥතයෙන් සම්පූර්ණ නමුදු ධර්මඥතා යෙන් දුර්වල බැවින් ස්ථිර ව සිටිනු නො හැකි ව "මෙසේ මෙසේ කියති"යි අනෙක් අනෙක් අර්ථයක් කීහ. මහතෙරණුවෝ 'ඇවැත, තොප පළමු කී අර්ථය ම සරි ය. එසේ ද වුව ආචාර්ය මුඛයෙන් ඉගෙණ සුස්ථිර ව සිටිනු නො හැකි ව වෙන වෙන අර්ථ දැක්වූහ. යව. තුලාධාර පබ්බතවාසී ධම්මරක්ඛිත තෙරුන් අතින් උගණුව"යි කියා පිටත් කර යැවූහ. විශුද්ධිමාර්ගයෙහි පෙණෙන මේ පුවතින් හා මුලින් කී කථාවෙනුත් පාඨපති ශොධනයට ශබ්දශාස්ත්‍ර, ධර්ම ශාස්ත්‍ර දෙක්හි ම විසද නිපුණත්වයක් තිබිය යුතු බව පැහැදිලි ය.

**ආශාචනය:**-ප්‍රතිසම්භිදාප්‍රාප්තමහාක්ෂීණාශ්‍රවයන් විසූ කාලයේ පවා සමයාන්තරවාදීන්ගේ ශාසනවිලොප නිසා හෝ ග්‍රන්ථලේඛක යන්ගේ ප්‍රමාදදියත් නිසා බොහෝ අපපාඨ පර්යාප්තියට බැස ගත් බව බුදුගොස් මාහිමියන්ගේ පාල්‍යර්ථකථා සම්පාදනයෙන් හෙලි වී ය. මහාර්ථකථා කාරක මහාපදුම හිමියන්ගේ ඇතම් විවරණ යන්ට පවා විරොධය පළ කළ වජ්‍රඥතයෙන් යුත් උන්වහන්සේ විසින් එකී අපපාඨ මූලොත්පාටනයෙන් බැහැර කරණ ලදැයි කිය යුතු නමුත් එතුමන්ගේ විචාරාක්ෂියටත් හමු නොවූ සැකයට කරුණු වන තැන් අටුවාවල මෙන් ම පෙළෙහිත් තවමත් පව තිතැයි නො සිතිය හැකි නො වේ. අපේ පරීක්ෂණයට හේතු වූ තැන් අතුරෙන් මේ සැලකිය යුත්තෙකි.

**"යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ,**
**තෙසං ච යො නිරොධො එවංවාදී මහා සමණො."**

මහාවග්ගපාලි සාරිපුත්තමොග්ගල්ලානපබ්බජ්ජානිද්දෙසයෙහි (මුද්‍රිත 39 පිට) පෙණෙන චතුරාර්යසත්‍ය ප්‍රකාශක මේ ගාථාවට අර්ථ විවරණය කරණ බුදුගොස්මාහිමියෝ සමන්තපාසාදිකා උපජ්ඣාය වත්තකථාවෙහි (මුද්‍රිත 162 පිට) මෙසේ දක්වති.

**"යෙ ධම්මා හෙතුප්පභවාති හෙතුප්පභවා නාම පඤ්චක්ඛන්ධා, තෙනස්ස දුක්ඛසච්චං දස්සෙති. තෙසං හෙතුං තථාගතො ආහාති තෙසං හෙතු නාම සමුදයසච්චං. තඤ්ච තථාගතො ආහාති අත්ථො. තෙසං ච යො නිරොධොති තෙසං උභින්නම්පි සච්චානං යො අප්පවත්තිනිරොධො, තඤ්ච තථාගතො ආහාති අත්ථො. තෙනස්ස නිරොධසච්චං දස්සෙති. මග්ගසච්චං පනෙත්ථ සරූපතො අදස්සිතම්පි නයතො දස්සිතං හොති. නිරොධෙ හි වුත්තෙ තස්ස සම්පාපකො මග්ගො වුත්තොව හොති. අථවා තෙසංච යො නිරොධොති එත්ථ තෙසං යො නිරොධො ච නිරොධූපායො චාති එවං ද්වෙ සච්චානි දස්සිතානි හොන්තීති"** යනුයි.

මෙහි "යෙ ධම්මා හෙතුප්පභවා" යන්නෙන් දුඃඛසත්‍යයත් "තෙසං හෙතුං තථාගතො ආහ" යන්නෙන් සමුදය සත්‍යයත් දක්වූහ. "තෙසංච යො නිරොධො" යනුවෙන් ඒ දුක්ඛ සමුදය දෙදෙනාගේ ම නිරොධය දක්වති. එහෙත් හේතුව වූ සමුදයයාගේ නිරොධය කී කල ඵලය වූ දුක්ඛයාගේ නිරොධය කිය යුතු නො වේ. සමුදය නිරොධය ඇති කල දුක්ඛනිරොධය සවභාව සිද්ධ හෙයිනි. නිරොධසත්‍යයෙන් සමුදයාගේ ම නිරොධය දක්වීම ආගම නියම ය ද වන්නේ ය. එහෙයින් තෙසං ච යො නිරොධො යන්නට වඩා තෙසඤ්ච යො නිරොධො යන පාඨය යුක්තිතර සේ පෙණේ. එයින් යථොක්ත ගාථාවේ අදහස නිරවුල් ද පැහැදිලි ද වන්නේ ය. මේ ගැණ කරුණු සෙවූ අපට පැරණි ඇතැම් මහපඬිවරයන් විසිනුදු තෙසඤ්ච යො නිරොධො යන පාඨය ම ගෙණ භාවිත කළ බව අසන්නට ලැබුනේ ය. එපමණක් නො වේ. මේ පිළිබඳ ව වැදගත් සාක්ෂ්‍යකුදු අපට හමු විය. එනම්:– කලකට පෙර කීර්ති මත් පුරාවිද්‍යාඥයකු වූ එච්. සී. පී. බෙල් මහතුන් විසින් සවකීය රාජකාරි කාලයේ දී අනුරාධපුරශුද්ධනගරයේ පැරණි නෂ්ටාව ශෙෂයන් අතුරෙන් එකක් වූ විජයාරාමදාගැබෙන් සොයාගත් තාම්‍ර පත්‍රයක යථොක්ත ගාථාව දක්වෙන්නේ මෙසේ යː–

"යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ,
තෙසඤ්ච යො නිරොධො එවං වාදී මහාසමණො."

සෙල් ලිපිවලට සමාන අකුරෙන් දක්වෙන ඒ ලේඛනය සවන හෝ සත්වන ශතවර්ෂයන්ට අයත් බව පුරාවිද්‍යාඥයෝ කියති. හේතු යුක්තීන්ටත් ගැළපේ නම්, පැරණි ලේඛනයකත් පෙණේ නම්, එය කලපනා කළ යුත්තක් නො වන්නේ ද.?

මෙය මෙහි දක්වූයේ අපේ විනිශ්චය මෙසේ යයි පෙන්වීමට වත් අට්ඨකථාව නිසරු කොට හැඟවීමට වත් නො වේ. ධර්මධාරී පඬිවරයන්ගේ නුවණැසට යොමු කර ලනු සඳහා ය. බුද්ධඝොස්හිමි යන්ගේ පරිශොධනයෙන් කලින් පතිතවූ අපපාඨ සර්වප්‍රකාර යෙන් මුලුසුන් වුව ද බලවත් අන්ධකාර කාලයක් වූ සමීප අතීතය යලිත් ඔවුන්ගේ සම්භවයට නො යෙක් ක්‍රමයෙන් හේතු වී ය. කලින් කල ඇතිවූ ශාසනමාමක උතුමන් විසින් බොහෝ පරි ශ්‍රමයෙන් ඒ අවුල් නිරවුල් කර ලීම නිසා වර්තමානයෙහි පවත්නා වැදගත් ධර්මග්‍රන්ථ බොහෝ දුරට පිරිසුදු ය යි කියහැකි නමුත් සර්ව තො භද්‍ර යයි තවමත් නො කිය හැක්ක. දැනට පවත්නා සැලකිය යුතු පරිශොධනයකැයි කිය යුතු හේවාවිතාරණ ත්‍රිපිටකමුද්‍රණ

යෙන් ප්‍රසිද්ධ වන අර්ථකථාවන්හිත් කොතරම් පරිශ්‍රමයකින් හා පරෙස්සමකින් කලත් කලින් බැස ගත් අපපාඨයෝ දැනුදු සැඟවී සිටිනාහ. මේ එක් නිදර්ශනයෙකි:-

**ගණකපුත්තතිස්සත්ථෙරො පන එවමාහ. න තිසහස්සී මහා සහස්සී ලොකධාතුයා එවං පරිමාණං. ඉදං හි ආචරියානං සජ්ඣායන මූළ්හකං වාචාය පරිහීනට්ඨානං. දසකොටි සත සහස්සචක්කවාළපරිමාණං පන ඨානං තිසහස්සී මහා සහස්සී ලොකධාතු නාමා ති.**

ගණකපුත්තතිස්සතෙරුන් වහන්සේ මෙසේ කියති. තිස හස්සී මහාසහස්සී ලොකධාතුවේ මේ ප්‍රමාණය (කොටි ලක්‍ෂයක් සක්වළ) නො වේ. මෙය වනාහි ආචාර්‍ය්‍යවරයන්ට සජ්ඣායනයෙන් මුළා වූ වචනයෙන් පිරිහුනු තැනෙකි. දශකොටි ලක්‍ෂයක් සක් වළ තිසහස්සී මහාසහස්සී ලොකධාතු නම් වේ- යනු මනොරථ පූරණීයෙහි (ත්‍රි: මූ: 439 පිට) එන පාඨයෙකි. සාරත්ථදීපනී ආදී තවත් ග්‍රන්ථයන්හි ද මෙසේ ම එයි මේ පාඨය ම මහානිද්දෙස අටුවාවේ (ත්‍රි: මූ: 272 පිට) පෙණෙනුයේ මෙසේ ය.

**ගණකපුත්තතිස්සත්ථෙරො පන එවමාහ. තිසහස්සී මහා සහස්සී ලොකධාතුයා එතං පරිමාණං. ඉදං හි ආචරියානං සජ්ඣායමූළ්හකං තං වාචාය පරිහීනට්ඨානං. කොටිසත සහස්සචක්කවාළපරිමාණට්ඨානං තිසහස්සිමහාසහස්සි ලොක ධාතු නාමාති.**

පූර්වාචාර්‍ය්‍යවරයන් විසින් තිසහස්සී මහාසහස්සී ලොකධාතුවට කෙළ සියයක් සක්වළ අයත්බව ගණන් ගෙණ තිබුන නමුත් එය එසේ නො ව කෙළලක්‍ෂයක් සක්වළ අයත් වන බව ගණක පුත්ත තිස්ස තෙරුන්වහන්සේ කියන බව මේ දෙවන පාඨයෙන් හැඟේ. එක ම ආචාර්‍ය්‍යවරයකුගේ එක ම වාදයක් ගැණ කියවෙන පාඨයක් ග්‍රන්ථ දෙකක මේ පෙණෙන පරිදි ය. මනොරථපූරණී යෙහි එන පාඨයට වඩා වැකියෙනුත් අදහසිනුත් කොතරම් වෙන සක් නිද්දෙස අටුවා පාඨයෙන් පෙණේ දැ යි විමසා බැලිය යුතුයි. මෙය වනාහි ග්‍රන්ථශොධනයට හසු නො වූ තැනෙකැ යි කියනු මිස ආචාර්‍ය්‍යපරපුරේ එන සැටියෙක කියා හෝ අර්ථකථාසම්පාදක උතුමන් අතින් වූ ප්‍රමාදයෙකැ යි නො කිය හැකි ය. ශබ්දශාස්ත්‍රය අතින් වන අපපාඨ වලට වඩා ධර්මශාස්ත්‍රය අතින් වන අපපාඨ අන්තරාය දායක ය. නානා විමතිවලට හේතු වන හෙයිනි. මේ දෙපසින් ම පතිත වූ සදොස් තැන් තවද අටුවාවල බෙහෙවින් ඇත්තේ ය. මෙහි දැක්වූයේ නිදර්ශන මාත්‍රයෙකි.

සූත්‍රාන්ත සතර මහාපදෙසය හා විනය සතර මහාපදෙසයත් දෙශනා කරණ ලද්දේ ත්‍රිපිටකපර්‍ය්‍යාප්තියට කලින් කල පතිත විය හැකි මෙබඳු සඳෙස් තැන් දුරු කරගැණු සඳහා ය. මහරහතන් විසූ කාල්යේ පවා ලඟලඟ දී ම සඞ්ගායනා කීපයක් කරණ ලද්දේ ද ඉන් පසු රජ ඇමති ආදීන්ගේ සහායත්වය ලැබ හෝ නො ලැබ ධර්‍ම ධාරීන් විසින් වරින් වර පර්‍ය්‍යාප්තිශොධනරාශියක් කරණ ලද්දේ ද ඒ නිසා ම ය.

විද්‍යොදය මහා පරිවෙණාධිශ්වර ව වැඩ විසූ ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය **හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගල** ප්‍රධාන නායකමාහිමියන් වහන්සේ ප්‍රමුඛ විනයධාරී උතුමන් කීපදෙනෙකුන් වහන්සේ විසින් විනය පාලිය පිළිබඳව පමණක් කලකට පෙර කළ පරිශොධනයක් ගැණ ඇසීමු. ඒ හැර ශතවර්‍ෂ ගණනකින් මෙපිට කෙරුණ අන් කිසිවක් ගැණ නො දනිමු. බැහැරින් හෝ ශාසනිකයන් අතින් ප්‍රමාදදි යෙන් පතිතවිය හැකි අපපාඨ ඇද්ද යි දූන්වත් සාර්ථකථා පාලිය සමන්වා බැලීම ශාසන භාරධාරී උතුමන් විසින් ම කළ යුතු මහාකාර්‍ය්‍යයෙකි.

**"පටිවෙධො ච පටිපත්ති ච හොතිපි න හොතිපි සාසනට්ඨිතියා පන පරියත්ති පමාණං."** ප්‍රතිවේධය හා ප්‍රතිපත්තිය ඇතත් නැතත් ශාසනස්ථිතියට පර්‍ය්‍යාප්තිය ම ප්‍රමාණ යයි පපංච සූදනියෙහි කීවාක් මෙන් ශාසනස්ථිතියට හේතු වූ පර්‍ය්‍යාප්තිය ආරක්‍ෂා කර ගැණීමට ශාසනාවචරයන් විසින් හැමවිට ම වෙහෙස ගත යුත්තේ ම ය.

**මෙතෙකින් සාර්ථකථා පාලිය පිළිබඳ පරීක්‍ෂණය නිමියේය.**

---

පාලි අට්ඨකථානෙක-ගණ්ඨට්ඨානං සමාසතො
උද්ධරිත්වා තතො සාරං-දස්සෙත්වා විසදීකතා

රචයනෙනතිමං ගන්ථං-යං පුඤ්ඤං පසුතං මයා
දෙවා තදනුමොදිත්වා-ලද්ධා සම්බුද්ධ සාසනං

තථාවෙරවරෙ චෙව-ජනෙනත්ති ආදරයා පිච
පාලෙනතු තිජ පාණංච-හිතානුග්ගහසාධකා

දෙවො වස්සතු කාලෙන-සස්සසම්පත්ති හෙතුච
පීතොභවතුලොකො ච-රාජා භවතු ධම්මිකො.

---

# ගන්ථකත්තු නිද්දෙසො.

—:—

1 පූතාය මඞ්ගලඞ්කාය–පාදඵස්සෙන සත්ථුනො
ලඞ්කාය දක්ඛිණාසාය–මහාතිත්ථව්හයෙ පුරෙ

2 නානාසාධුජනාකිණ්ණෙ–ගාමෙ හිත්තටි විස්සුතෙ
පුප්ඵාරාමතිහො සිස්ස–ජප්පදෙහි නිසෙවිතො

3 සත්ථාලයො'සි තන්නාමො–තදධිස්සර සාමිනො
සුමන තිස්සථෙරස්ස–සිස්සෙන පිය සීලිනා

4 විජ්ජොදය මහාවිජ්ජා–ලයාධිපති යො'භවි
**රතනසාර** වික්ඛ්‍යාතො–නෙකා පණ්ඩිත සෙඛරො

5 තත්ථාධුනා'ධිපො නෙතා–යො චාපි කවිපුඞ්ගවො
**පියරතන** වික්ඛ්‍යාතො–දයාපූතමනො සදා

6 තෙසං ද්වින්නඤ්ච ථෙරානං–ලද්ධසත්ථෙන සන්තිකෙ
හිත්තටිවිස්සුත ගාමස්මිං–ජාතෙන උදිතෙ කුලෙ

7 උදිතොතිප්පසිද්ධෙන–ථෙරෙන සිව මෙසිනා
නෙත්තනාගණ්ණවක්ඛීහි–සම්මිතෙ මුනිහායනෙ

8 චිත්ත මාසෙ සිතෙ සිත්තු–තිථියං සනිවාසරෙ
පරිනිට්ඨාපිතො ගන්ථො–සරලත්ථො මුදා මයා

9 පමාදබහමතො ජාතො–දොසො යජ්ජත්ථ විජ්ජති
නිවෙදයන්තු තං ධීරා–තුස්සන්තා මෙ පරිස්සමෙ.